


2016 ප්‍රගති වාර්තාව සහ 2017 ක්‍රියාත්මක සැලැස්ම

முன்னேற்ற அறிக்கை 2016 மற்றும் நடவடிக்கை திட்டம் 2017

Progress Report 2016 and Action Plan 2017

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் ரிரதி அமைச்சு

Ministry of Mahaweli Development and Enviroment

SRI LANKA NEXT

පුනරුදය

පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන

2016 - 2018

LIBRARY
MINISTRY OF ENVIRONMENT

2016 ප්‍රගති වාර්තාව

සහ

2017 ක්‍රියාත්මක සැලැස්ම



මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

2016

MINISTRY OF ENVIRONMENT LIBRARY
ACC No.
Class No.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය

ගරු අනුරාධ ජයරත්න මැතිතුමා පා.ම.
මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍ය

අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරින් හා අංශ ප්‍රධානීන්

උදය ආර් සෙනෙවිරත්න මහතා
ලේකම්

ශාන්තා විජේරත්න මිය
අතිරේක ලේකම් i (පාලන)

ආර් ඒආර් ආර් රූපසිංහ මහතා
අතිරේක ලේකම් ii (පාලන)

එන් කේ ජී කේ නැම්මවත්ත මහතා
අතිරේක ලේකම් (ස්වභාවික සම්පත්)

අනුර දිසානායක මහතා
අතිරේක ලේකම්(ඉඩම් හා නීති)

එම් පී ඩී යූ කේ මාපා පතිරණ මහතා
අතිරේක ලේකම්(පරිසර ව්‍යාපෘති හා අධ්‍යාපන පුහුණු)

එම් ජී ඩබ්ලිව් එම් ඩබ්ලිව් ටී බී දිසානායක මහතා
අතිරේක ලේකම් (පරිසර හා ප්‍රතිපත්ති)

ඉංජිනේරු. එන්.ඒ.සිසිර කුමාර
අතිරේක ලේකම් (ජල සම්පත් සැලසුම්)

ඩී අබේසූරිය මහතා
ප්‍රධාන මුල්‍ය නිලධාරි

යූ පී එල් ඩී පතිරණ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

ඩබ්. ටී. එච්. රුවිර විතාන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

එල් ඩී එන් කුමාරසිරි මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණක අංශය

ගාමිණී වික්‍රමපාල මහතා
අධ්‍යක්ෂ
ප්‍රතිපත්ති සැලසුම් හා මෙහෙයුම්

කේ ඒ අයි ඩී සිල්වා මහතා
අධ්‍යක්ෂ
භූමි සම්පත් අංශය

අනුර ජයකිලක මහතා
අධ්‍යක්ෂ
පරිසර දූශන පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණ අංශය

ආචාර්ය ආර් ඩී එස් ජයතුංග මහතා
අධ්‍යක්ෂ
දේශගුණික විපර්යාස අංශය

ලතීෂා පී ලියනගේ
අධ්‍යක්ෂ
වන සම්පත් අංශය

ඒ එච් එල් ඩී ගාමිණී විජේසිංහ මහතා
අධ්‍යක්ෂ
පරිසර අධ්‍යාපන හා ප්‍රවර්ධන අංශය

යූ පී එල් ඩී පතිරණ මිය
අධ්‍යක්ෂිකා
ආයතන අංශය

පී පී එන් මහේෂ් අබේසේකර මහතා
අධ්‍යක්ෂ
විමර්ෂණ හා සේවා අංශය

ඩී එන් ලියනගේ මිය
අධ්‍යක්ෂ
තිරසර පරිසර අංශය

ආර් එච් එම් පී අබේකෝන් මිය
අධ්‍යක්ෂ
ජෛව විවිධත්ව අංශය

ජී එම් ජේ කේ ගුණවර්ධන මහතා
අධ්‍යක්ෂ
ඕසෝන් ඒකකය

ලුම්බිණී කිරිඇල්ල මිය
නීති නිළධාරි
නීති අංශය

පී. පී.චිකාන ගමගේ මයා
ප්‍රධාන ගණකාධිකාරී

ඉංජිනේරු.එල්.ආර්.එච්.පෙරේරා
අධ්‍යක්ෂ
ජල සම්පත් සැලසුම්

එච්.වී.කොඩිතුවක්කු මයා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ප්‍රසම්පාදන හා තාක්ෂණික

ආයතන ප්‍රධානීන්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අනුර දිසානායක මහතා - අධ්‍යක්ෂ ජනරාල්

ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය
ඉංජිනේරු. ජී ඩී ඒ පියතිලක - සභාපති

මහවැලි උපදේශන කාර්යාංශය
ආචාර්ය හර්ෂ සමරවිර මහතා - සභාපති

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අනුර හතුරුසිංහ මහතා - වන සංරක්ෂක ජනරාල්

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා - අධ්‍යක්ෂ ජනරාල්

මධ්‍යම පරිසර අධිකාරිය
මහාචාර්ය මර්වින් ධර්මසිරි මහතා - සභාපති
කේ අයි මුතුකුඩආරච්චි මහතා - අධ්‍යක්ෂ ජනරාල්

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
අද්මිරාල් රෝහන පෙරේරා මහතා - සභාපති
ආචාර්ය පී බී ටර්නි ප්‍රදීප් කුමාර - සාමාන්‍යාධිකාරි

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
අනුර ගුණවර්ධන මහතා. - සභාපති
එම් සී එන් එම් වික්‍රමසිංහ මහතා - අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය දැව සංස්ථාව
පී දිසානායක මහතා - සභාපති
කේ සිරිනිවංශ මහතා - සාමාන්‍යාධිකාරි

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
ආචාර්ය ඩී එම් ඩී ඕ කේ දිසානායක මහතා- සභාපති
ආචාර්ය ඩබ් කේ බී එන් ප්‍රේම් මහතා - අධ්‍යක්ෂ ජනරාල්

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය
නවරත්න බණ්ඩාර අලහකෝන් මහතා - සභාපති
ආචාර්ය ප්‍රශාන් ෆ්‍රැන්සිස් - වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
ඉංජිනේරු. ආචාර්ය සුනිල් ද සිල්වා - ව්‍යාපෘති අධ්‍යක්ෂ

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැළසුම්කරණ ව්‍යාපෘතිය
ඉංජිනේරු එස්. ආර්. කේ. අරුප්පල මහතා - ව්‍යාපෘති අධ්‍යක්ෂ

මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය
ඉංජිනේරු ආර්.බී.තෙන්නකෝන් මහතා - ව්‍යාපෘති අධ්‍යක්ෂ

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය භාරය

- ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා උපයෝගී කර ගැනීම පිණිස පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍ර තුල ඇති ගැටළු හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් සංරක්ෂණයට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අදාල පාර්ශ්වකරුවන්ට දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් සංරක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ උපාය මාර්ගික පරිසර ඇගයීම් සිදු කිරීම

- සංවර්ධන ක්‍රියාවලියේ දී පරිසර තිරසර බව තහවුරු කිරීම් වස් පරිසර ප්‍රතිපත්තියට අනුකූලව අනිකුත් ක්ෂේත්‍ර ප්‍රතිපත්ති සැකසීමට පියවර ගැනීම

- එක් පාර්ශ්වයක් ලෙස ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශ්වික පාරිසරික සම්මුතීන්ගෙන් පැන නගින ශ්‍රී ලංකාව විසින් ඉටු කළ යුතු ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත්වලට අනුකූල වූ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි උපාය මාර්ග හා ක්‍රියාකාරී සැළසුම් පිළියෙළ කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාල නව ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම පිණිස නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාළ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම සහ පසු විපරමෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායයන් යෙදීම

- ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම එම තොරතුරු විශ්ලේෂණය කිරීම සහ එම තොරතුරු මහජනතාව ඇතුළු අදාල අංශ වලට යොමු කිරීම

- යහපත් වූ පරිසර කළමනාකරණයක් සඳහා රාජ්‍ය සහ දේශපාලන අංශවල කැපවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත්වලට අදාල ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සහ වෙනත් ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමෙන් ජනතාව දැනුවත් කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත්වලට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන්නන් සහ අනිකුත් පාර්ශ්වකරුවන්ගේ ධාරිතා ශක්තිමත් කිරීම

- මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය තුළින් ප්‍රශස්ථ ජල කළමණාකරනයක් සහ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීම.

- මහවැලි බල ප්‍රදේශ තුළ වාරි සහ කෘෂි පහසුකම් වැඩිදියුණු කරමින් ජනතාවගේ ජීවන තත්වය දියුණු කිරීම.

- මහවැලි ජනපදිකයින්ගේ ඉඩම් අයිතිය සුරක්ෂිත කිරීම.

දැක්ම

"සෞඛ්‍ය සම්පන්න සහ සුඛදායී තිරසාර පරිසරයක්"

මෙහෙවර

"වර්තමාන සහ අනාගත පරම්පරාවන්ගේ
සුභ සිද්ධිය උදෙසා ධරණීය සංවර්ධනයක් ඇති කිරීම
සඳහා වන ජාතික කැපවීම සහතික කරනු වස්
පරිසර හා ස්වභාවික සම්පත් කළමනාකරණයට
නායකත්වයක් ලබා දීම"

මහවැලි සංවර්ධන හා පරිසර ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය.



2017 වර්ෂයට අදාලව වැය ශීර්ෂය ඉදිරිපත් කිරීමේ දී මාගේ අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත ආයතන මගින් 2015 ජූලි මස සිට 2016 ජූනි මස දක්වා සිදු කරනු ලැබූ සේවාව අන්තර්ගත වූ පසුගිය වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන්වල ප්‍රගතිය සහ ඉදිරි වර්ෂය සඳහා සැළසුම් කර ඇති ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාත්මක සැලැස්ම 2017 වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම ඉතා සතුටු වෙමි.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන පරිසර ආරක්ෂණය හා සංරක්ෂණය සඳහා විවිධ ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ඉටු කර ඇත. තවද අමාත්‍යාංශය උමාඔය, මොරගහකන්ද, කළුගඟ සහ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩ සටහන වැනි විශාල ව්‍යාපෘති ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව හා ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනය වැනි ආයතනවල මූල්‍ය ආධාර ඇතිව පරිසරයට හිතකාමී ආකාරයට ක්‍රියාත්මක කරමින් පවතී. එසේම රටේ මනා පරිසර කළමනාකරණයක් ඇති කිරීමට "පුනරුදය" නමින් කඩිනම් පරිසර සංරක්ෂණ වැඩසටහනක් සම්පාදනය කර ඇති අතර, එය 2016 - 2018 කාලය තුළ ක්‍රියාත්මක කිරීමට මා අදහස් කරමි.


ජල විදුලි උත්පාදන සහ මහවැලි කලාප තුළ ජල කළමනාකරණ සඳහා විවිධ ක්‍රියාකාරකම් ආරම්භ කර ඇති අතර, මෙම කටයුතු ඉදිරි වර්ෂ වලදීද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, මෙම වාර්තාව තුළින් ඒවා පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර ඇත.

මෙම රජය මගින් පරිසර පද්ධති සංරක්ෂණයට, වන සම්පත මෙන්ම රට තුළ අඩංගු ජෛව විවිධත්වය සංරක්ෂණයට හා යහපත් වායු තත්ත්වයක් ගොඩ නැගීමට, දේශගුණ විපර්යාස නිසා ඇතිවන අනිටු විපාක පිටු දැකීමට හෝ ඒවාට අනුගත වීමට, ජල සම්පත දූෂණය වීම පාලනය කිරීමට, රට තුළ ජනනය වන සන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට විශේෂ ව්‍යාපෘති සහ වැඩසටහන් රාශියක් සඳහා විශාල වශයෙන් ආයෝජනයන් කර ඇත.ඉදිරි පරම්පරාවේ සැමට එකසේ ප්‍රතිලාභ අත්කර දීමේ අපේක්ෂාවෙන් පළාත් සභා සහ අනෙකුත් පාර්ශවකරුවන් සමග පාරිසරික ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාවට නැංවීමේදී මනා සම්බන්ධීකරණයක් සහිතව කටයුතු කිරීමට පියවර ගැනීමට මා බලාපොරොත්තු වෙමි. එසේම මහවැලි කළාපීය ප්‍රජාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය හා අභිවෘද්ධිය උදෙසා තිරසාර වැඩපිළිවෙලක් ද මෙම රජය විසින් සකස් කර ඇත. මා ඇතුළු මාගේ අමාත්‍යාංශයත් ඊට අනුබද්ධිත ආයතනයන් සමස්ථ ජනතාවට මෙන්ම ඉදිරි පරම්පරාවට ද තිරසාරව ප්‍රතිලාභ ලැබෙන අයුරින් සියළු සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘතීන් පරිසර සංරක්ෂණයට අනුකූලව මෙහෙයවීමටත්, නියාමනය කිරීමටත් අවශ්‍ය සියලුම පියවර ගනු ලබන බවට සහතික වෙමි

මෛත්‍රීපාල සිරිසේන

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය

මහවැලි සංවර්ධන හා පරිසර ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය.



මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත ආයතන මගින් පසුගිය වසරක කාලය තුළ ශ්‍රී ලංකාවේ පරිසරය හා ස්වභාවික සම්පත් සංරක්ෂණය, ආරක්ෂා කිරීම සඳහා ගනු ලැබූ සේවාව විස්තර කෙරෙන ප්‍රකාශනය වන 2016 ප්‍රගති වාර්තාව හා 2017 ක්‍රියාත්මක සැලැස්ම සඳහා පණිවුඩයක් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම ඉතා සතුටු වෙමි.

මෙම අමාත්‍යාංශය යහපත් පරිසර කළමනාකරණයක් තුළින් පරිසර භායනය අවම කර ගනිමින් හා අරපරිස්සමින් ස්වභාවික සම්පත් භාවිතා කරමින් ජනතාවගේ වත්මන් ජීවන තත්ත්වය නිරන්තරව ඉහළ නැංවීමට ප්‍රතිපත්ති සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මූලිකවම සිදු කරනු ලබයි.

මහවැලි සංවර්ධන ක්ෂේත්‍රයට අදාලව 2016 වසරේ දී රට තුළ ක්‍රියාත්මක වූ වැඩසටහන් වල ප්‍රගතිය සහ 2017 වසර සඳහා ක්‍රියාත්මක සැළැස්ම ද මෙම වාර්ථාව මඟින් සාකච්ඡා කරනු ලැබේ.

අමාත්‍යාංශයට පැවරී තිබෙන කාර්යභාරය ප්‍රාදේශීය හා ජාතික වශයෙන් සීමා වී නොමැති අතර ශ්‍රී ලංකාව විසින් අත්සන් තබන ලද ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන්වල බැඳීම් / පොරොන්දු හරහා ජාත්‍යන්තර හවුල්කරුවන් සමග ද සම්බන්ධ වී ගෝලීය වශයෙන් පරිසර සංරක්ෂණයට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ නායකත්වය සහ මග පෙන්වීම යටතේ මිනිසාට සහ පරිසරයට ප්‍රතිලාභ අත්කර දෙමින් සේවයක් කර නව ශ්‍රී ලංකාවක් බිහි කිරීම සඳහා දායක වන ලෙස මම ඔබ සියලු දෙනාටම ආරාධනා කරමි.

අනුරාධ ජයරත්න (පා.ම)
මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍ය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය



මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වල ප්‍රගතිය විදහා දැක්වෙන මෙම වාර්තාව සඳහා පණිවුඩයක් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම ඉතා සතුටු වෙමි.

මෙහිදී රටතුල ක්‍රියාත්මක වන දැවැන්ත මහවැලි සංවර්ධන ක්ෂේත්‍රයේ 2016 වසරේදී අප ලබා ඇති ප්‍රගතිය සහ 2017 වසරේ ක්‍රියාත්මක වන වැඩසටහන් මෙම වාර්ථාවේ සවිස්තරව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව ද මා ඉතාමත් සතුටු වෙමි.

පරිසර සංරක්ෂණය සඳහා ජාතික කේන්ද්‍රස්ථානය වූ අමාත්‍යාංශය පරිසර සංරක්ෂණය කරනු වස් එහි අනුබද්ධිත ආයතන හා එක්ව පරිසර කළමනාකරණයට හා නියාමනයට සම්බන්ධ ක්‍රියාකාරකම් රාශියක් සිදු කරන ලදී.ශ්‍රී ලංකා රජයේ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙහි පරිසර සංරක්ෂණය කරනුවස් පැහැදිලි සංවර්ධන ඉලක්කයක් අන්තර්ගත කොට ඇත. අමාත්‍යාංශය හා එහි අනුබද්ධිත ආයතන අදාල කාල වකවානුව තුල එම සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

2013 -2016 කාල වකවානුව සඳහා වූ සංයුක්ත සැලැස්ම මගින් පෙව විවිධත්ව සංරක්ෂණය, වන ආවරණ ඉහල නැංවීමට, දැව සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම, භෞමික හා සමුද්‍රීය දූෂණය පාලනයට හා අවම කිරීම, දේශගුණ විපර්යාස වලින් ඇති වන අහිතකර බලපෑම සඳහා මුහුණ දීමේ හැකියාව ගොඩ නැගීම, තිරසාර ලෙස ඛණිජ සම්පත් ගවේෂණය හා කළමනාකරණය කිරීම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසරඅමාත්‍යාංශය ප්‍රමුඛතාවයක් දෙන ලදී.රටේ යටිතල පහසුකම් සහ ඉදි කිරීම් ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය ඉටු කරන කාර්යභාර්ය මා මෙහිදී ඉතා අගය කරමි.

අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතන මගින් එක් එක් වසර සඳහා සැලසුම් කරන ලද සුවිශේෂී අරමුණු ලභා කර ගැනීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර මෙම වාර්තාව මගින් 2015 ජුලි මස සිට 2016 ජුනි මස දක්වා ළඟා කර ගත් ප්‍රගතිය පෙන්නුම් කරනු ලබයි.

මීට අමතරව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය "හරිත ලංකා" ජාතික ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීමේ ප්‍රයත්නයහි අවසාන අදියරට ළඟා වී ඇත. මෙම ජාතික ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාත්මක කරනු ලබන පාර්ශවකරුවන් ලෙස අදාල රේඛීය අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු මෙම ක්‍රියාවලියට සම්බන්ධ වී ඇත. මේ පිළිබඳව අප ඉදිරි කාලයේදී අනෙකුත් රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ආයතන, අනෙකුත් පාර්ශ්වකරුවන් හා මහජනතාව සමග සහයෝගයෙන් කටයතු කිරීමට බලාපොරොත්තු වන්නෙමු.

මනා පරිසර කළමනාකරණයක් ඇති කරනු වස් සම්පාදිත පුනරුදය නම් වූ තුන් අවුරුදු කඩිනම් පරිසර සංරක්ෂණ වැඩසටහන 2016 වසරින් අරඹන බවද සඳහන් කිරීමට මා කැමැත්තෙමි.

මෙම අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා වැඩ සටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉතා වැදගත් වන කාර්ය මණ්ඩලයේ කැපවීම හා අඛණ්ඩ උද්‍යෝගය වෙනුවෙන් කෘතඥතාවය පල කිරීම සඳහා මම මෙය අවස්ථාවක් කර ගනිමි.

උදය ආර් සෙනෙවිරත්න
ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

පටුන

පිටු අංකය

හැඳින්වීම 14

I වන කොටස

පිටු අංකය

2015/2016 මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය අත්කරගත් ප්‍රගතියෙහි සාරාංශය

1.1 සැමට පිවිතුරු වාතය නම් වූ මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 16-19

1.2 ශාක, සත්ව හා පරිසර පද්ධති සුරැකීමේ මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 19-26

1.3 දේශගුණ විපර්යාස අභියෝග ජය ගැනීම මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ 31 ප්‍රධාන ක්‍රියාකාරකම් 27-40

1.4 වෙරළ තීරය හා අවට මුහුදු ඥනාන්විත ලෙස පරිහරණය කිරීම නම් වූ මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 41

1.5 වගකීමෙන් යුතු ඉඩම් පරිහරණය නම් වූ මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 42-45

1.6 කසලින් තොර වටපිටාවක් නම් වූ මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 45-50

1.7 සැමට සැමදා ජලය නම් වූ මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 50-51

1.8 සෞඛ්‍ය හා සමෘද්ධිය උදෙසා හරිත නගර නම් වූ මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 51-52

1.9 කර්මාන්ත හරිතකරණය නම් වූ මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 52-57

1.10 නිවැරදි තෝරා ගැනීම සඳහා දැනුම නම් වූ මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 58-60

1.11 ඕසෝන් ඒකකය 60-66
1.12 නීති අංශය 66-67
1.13 ජාත්‍යන්තර සහයෝගිතාවය 67-70
1.14 අමාත්‍ය මංඩල සංදේශ 70
1.15 අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම - 2016 71-90

II වන කොටස

2. 2015 ජූලි සිට 2016 ජූනි දක්වා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන වල ප්‍රගතිය සහ 2017 ක්‍රියාත්මක සැලැස්ම

2.1 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 92-96
2.2 වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 97-110
2.3 මධ්‍යම පරිසර අධිකාරිය 111-125
2.4 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය 126-154
2.5 මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය 155-165
2.6 සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය 166-179
2.7 රාජ්‍ය දැව සංස්ථාව 180-184
2.8 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය 185-199
2.9 ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය 199-206
2.10 ජාතික මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය 207-222
2.11 උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය 223-232
2.12 මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය 233-243
2.13 වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය 244-253
2.14 ඇමුණුම ,i 254-258

හැඳින්වීම

පූර්ව වර්ෂය තුළ දී ආයතනය විසින් අත්පත් කරගන්නා ලද ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් එම ආයතනයට අදාල වැය ශීර්ෂය ඉදිරිපත් කරන අවස්ථාවේ දී වාර්ෂිකව ඉදිරිපත් කිරීම සෑම රාජ්‍ය ආයතනයකම වගකීමක් වේ. මෙම අවශ්‍යතාවය ඉටු කරනු වස් මහවැලි සංවර්ධන ක්ෂේත්‍රයේ හා පරිසර කළමනාකරණය හා ස්වභාවික සම්පත් සංරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා ප්‍රමුඛත්වය දරණ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය "2016 ප්‍රගති වාර්තාව හා 2017 ක්‍රියාත්මක සැලැස්ම" යන නමින් මෙම වාර්තාව ඉදිරිපත් කරයි. මෙම වාර්තාවෙහි පසුගිය වර්ෂවල ඉදිරිපත් කරන ලද අයුරින් මෙම වර්ෂයේ ප්‍රගතිය හා ලබන වසරේ ක්‍රියාත්මක සැලැස්ම ද ඊට අමතරව වර්තමාන පාරිසරික තත්ත්වය පිළිබඳව යම් අදහසක් ලබාදීමේ අරමුණින් ඒ පිළිබඳ තොරතුරු ද ඇතුලත් කර ඇත.

ඒ අනුව මුළු වාර්තාව ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වන අතර එහි පළමු කොටසින් හරිත ලංකා වැඩසටහන සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් මෙහෙවර දහය යටතේ අමාත්‍යාංශය අත්කරගත් ප්‍රධාන කාර්ය සාධනය දක්වා ඇත. හරිත ලංකා වැඩසටහනට සම්බන්ධ සියළුම පාර්ශ්වකරුවන් ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයෙන් තම වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇත. පලමු කොටසේ අඩංගු තොරතුරු විවිධ ආයතන මගින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තා මගින් සපයා ගන්නා ලද ඒවා වේ.

වාර්තාවේ දෙවන කොටස පරිච්ඡේද දෙකකින් සමන්විත වන අතර එයට අමාත්‍යාංශයේ අනුබද්ධිත ආයතන වල 2015 වර්ෂයේ ජූලි මාසයේ සිට 2016 වර්ෂයේ ජූනි මාසය දක්වා කාලපරිච්ඡේදය තුල කාර්ය සාධනය හා 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන වැඩසටහන් වල සාරාංශයක් ඇතුලත් කර ඇත. මෙම කාලය තුල අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ විවිධ ව්‍යාපෘති මගින් දිවයිනේ විවිධ පෙදෙස් වල පරිසර කළමනාකරණය, සංරක්ෂණයට අදාලව අත්පත් කරගන්නා ලද ප්‍රගතිය පිළිබඳව කරුණු සඳහන් වේ.

I වන කොටස

2015 ජූලි සිට 2016 ජූනි දක්වා අමාත්‍යාංශය අත්කරගත් ප්‍රගතිය

මෙහෙවර 1: සැමට පිරිසිදු වාතය

වාතය මිහිමත වෙසෙන සියළුම ජීවීන්ට අත්‍යවශ්‍ය මූලික අවශ්‍යතාවක් වුව ද, වාතයේ බහුලතාවය හේතුවෙන් අතීතයේ දී එය ජලය හෝ භූමිය මෙන් සම්පතක් ලෙස නොගැනිණි. කෙසේ වෙතත්, වායු දූෂණය දැන් ලොව බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාව තුළ ද වර්ධනය වෙමින් පවතින ගැටලුවක් ලෙස හඳුනාගෙන ඇත. මෙයට ප්‍රධානම හේතුව වී ඇත්තේ වාහන ගමනාගමනය වැඩිවීම සහ ශීඝ්‍ර කාර්මීකරණයි. 1991 සිට 2015 දක්වා වාහන සංඛ්‍යාව විශාල වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2015 වසර අවසාන වන විට ශ්‍රී ලංකාව තුළ ඇති සක්‍රීය වාහන සඛ්‍යාව 3,660,685 ක් වූ අතර එයින් 45% ක් මෝටර් සයිකල් හා 14% ක් ත්‍රිරෝද රථ වේ. එමෙන්ම බලශක්ති පරිභෝජන ප්‍රවනතාව සැලකීමේ දී, පෙව ඉන්ධන සහ ජල විදුලි වැනි අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හා සැසඳීමේ දී ඛනිජ තෙල් පරිභෝජනයේ විශේෂ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

රටේ ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් පදිංචි ස්ථාන මෙන්ම බහුල වශයෙන් කාර්මීකරණය වී ඇති මහ කොළඹ ප්‍රදේශයේ වායුගෝලීය දූෂණය බහුල වශයෙන් දැකිය හැක. ප්‍රවාහන ක්ෂේකත්‍රය විශේෂයෙන්ම කොළඹ ප්‍රදේශය තුළ වායු දූෂණය සඳහා 60% ක් පමණ දායකත්වයක් දරයි. නිමිනයක පිහිටා ඇති මහනුවර නගරයෙහි වායු තත්ත්වය එහි භූ විෂමතාව හේතුවෙන්ම කොළඹ නගරයටත් වඩා නරක තත්ත්වක ඇති බවට අනාවරණය වී තිබේ. එමෙන්ම වාහන සංඛ්‍යාව වැඩිවීම සහ කාර්මික කටයුතු ස්ථාපිත කිරීම හේතුවෙන්, අනෙකුත් ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන වන කුරුණෑගල, අනුරාධපුර, නුවරඑළිය, ගාල්ල ආදී නාගරික මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් වායු තත්ත්ව පිළිබඳවද අධීක්ෂණය සඳහා අවධානය යොමුකළ යුතු වේ.

ගෘහස්ථ වායු දූෂණය යනු විශේෂ අවධානය යොමු කළ යුතු තවත් වැදගත් අංශයකි. දුර්වල ලෙස වාතාශ්‍රය ලැබෙන ලෙස සකසා ඇති උප නාගරික සහ ග්‍රාමීය මුළුතැන් ගෙවල් තුළ දී ආහාර පිසීම පිණිස පෙව ස්කන්ධ බහුල ලෙස භාවිතය, දුම්පානය, සුවඳ විලවුන්, හඳුන්කූරු, මදුරු දහර වැනි දේ භාවිතය ගෘහස්ත වායු දූෂණයට හේතු සාධකවේ. නව සංවර්ධන වැඩසටහන් ඔස්සේ ඉදිකරනු ලබන භූගත සාප්පු මධ්‍යස්ථාන, භූගත වාහන අංගන, උමං ආදියෙහි වායු තත්වය පිළිබඳව තවදුරටත් අවධානය යොමු කළ යුතුය. මීට අමතරව ප්ලාස්ටික් හා පොලිතින් සමන්විත අපද්‍රව්‍ය විවෘත දහනය තුලින් ඩයොක්සීන් සහ ෆියුරාන් වැනි දිගුකල් පවත්නා කාබනික දූෂක වලට නිරාවරණය වීම හේතුවෙන් මහජන සෞඛ්‍යට තර්ජනයක් එල්ලවී ඇත. ඒ අතරින් කුඩා දරුවන්, ගැබිනි මව්වරුන් විශේෂවේ. වායු තත්ත්ව කළමනාකරණ වැඩසටහන යටතේ පරිසර අමාත්‍යාංශය මගින් සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් දැක්වේ. වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන නාගරික ප්‍රදේශවල වායුවල ගුණාත්මකභාවය පාලනය කිරීමේ දී ප්‍රධාන ස්ථානයක් ගනී.

- ***වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන අධීක්ෂණය***

වාහන වායු විමෝචනය කොළඹ හා අනෙකුත් නාගරික ප්‍රදේශ වල වායු දූෂණය ඉහළ නංවන ප්‍රධාන ප්‍රභවය වේ. ශ්‍රී ලංකා රජය විසින් 1980 අංක 47 දරන, ජාතික පාරිසරික පනත යටතේ විමෝචන පාලන රෙගුලාසි 2003 ජුනි 30 දින ගැසට් කරන ලදී. තවද 2008.07.09 දිනැති අංක 1557/14 දරන ගැසට් පත්‍රය මගින් ඉහත රෙගුලාසි සංශෝධනය කරන ලදී. මෙම රෙගුලාසි විවිධ වාහන කාණ්ඩ සඳහා උපරිම විමෝචන මට්ටම් සඳහා සකස් කර ඇත. වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන රාජ්‍ය - පුද්ගලික අංශ දෙකෙහිම හවුල්කාරිත්වය සහිත වැඩසටහනක් වන අතර,වාහන වායු විමෝචන පරීක්ෂණ (VET) සහතික නිකුත් කිරීම සඳහා ගිවිස ගෙන ඇතික්ලීන්කෝ ලංකා (පුද්ගලික) සමාගම හා ලාෆ් ඉකෝ ශ්‍රී (පුද්ගලික) සමාගම යන පුද්ගලික අංශයේ සමාගම් 2ක් සමඟ කේන්ද්‍ර ගත වී ඇත. ශ්‍රී ලංකාවේ සියළුම පලාත් වල වාහන සඳහා වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා

වාහන වායු විමෝචන පරීක්ෂණ සහතිකය ලබා ගැනීම අනිවාර්ය කර ඇත. කෙසේ වෙතත් නවීන වාහන, ලියාපදිංචි දිනයේ සිට වසරක් යන තුරු මෙම පනතින් නිදහස් කර ඇත.

වායු සම්පත් කළමනාකරණ සහ අන්තර් ජාතික සබඳතා අංශය වාහන වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලෙහි මූල්‍ය ප්‍රතිපාදන සමග වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩ සටහන නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම පසුගිය වසර කිහිපය තුළ සිදුකරන ලදි. කෙසේ වෙතත්, පුහුණු කාර්ය මණ්ඩලයන් හිහකම හේතුවෙන් 2015 වසරේ දී ඉහත වැඩසටහන ක්‍රියාත්මක නොවීය. එබැවින්, වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන අධීක්ෂණය කිරීම සඳහා අමාත්‍යාංශයේ සහ මධ්‍යයම පරිසර අධිකාරියෙහි නිලධාරීන් ඇතුළත් විශේෂ විමර්ශන කණ්ඩායමක් ස්ථාපිත කිරීමට මෙම අංශය කටයුතු කරන ලදි.

වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රය සවිබල ගැන්වීම හා වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- මධ්‍යම සහ උඩව පළාත් (නුවර එළිය සහ බදුල්ල) ආවරණය වන පරිදි රථ වාහන සහ පරිසර පොලිස් නිලධාරීන් සඳහා වාහන විමෝචන පරීක්ෂණ වැඩසටහන හා වායු තත්ව කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් 2015 ජූලි මස 9 සහ 10 දෙදින තුල පවත්වන ලදී.

- ගම්පොල, නුවර එළිය සහ ගාල්ල අධ්‍යාපන කළාපයන් හි පවතින පාසල් කේන්ද්‍ර කර ගනිමින් වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් 2015 සැප්තැම්බර් මස 10, 11 සහ 17 දිනයන් තුල දී පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 400 දෙනෙකු සහභාගීත්වයෙන් පවත්වන ලදි.

- වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩ සටහන අධීක්ෂණය කිරීම සඳහා විශේෂ පරීක්ෂණ කණ්ඩායමක් ස්ථාපිත කිරීමේ වැඩසටහනෙහි එක් දින වැඩමුළුවක්(දේශන) අමාත්‍යාංශ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් 15 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2015 නොවැම්බර් 24 දින අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි.

- ඉහත වැඩසටහනෙහි ප්‍රායෝගික සැසිය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි - වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල සමග එක්ව 2015 දෙසැම්බර් මස 31 වැනි දිනදී පවත්වන ලදී.

- හරිත ලංකා වැඩසටහන මෙහෙවර 1 ලෙස - "සැමට පිරිසිදු වාතය", වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රය මගින් සකස් කරන ලද පිරිසිදු වායු 2015 ක්‍රියාකාරී සැලැස්ම (CA2015AP) මත පදනම්ව සකස් කරන ලදී. ඒ අනුව පිරිසිදු වායු 2015 ක්‍රියාකාරී සැලැස්ම ඊලඟ දශකයේ ජාතික අවශ්‍යතාවයන්ට අනුකූලව යාවත්කාලීන කිරීම සහ හරිත ලංකා වැඩසටහන මෙහෙවර 1 'ත්‍රෛයි වාර්ෂික මධ්‍ය කාලීන හා පරිසර සංරක්ෂණ වැඩසටහන' සහ 'අමාත්‍යාංශ ආයතනික සැලැස්ම 2016-2020' අනුව යාවත්කාලීන කිරීම යන කරුණු 2 ඉටු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් ඇති විය.

ඒ අනුව, වායු සම්පත් කළමනාකරණය සහ අන්තර්ජාතික සබඳතා අංශය පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ හරිත ලංකා වැඩසටහන යාවත්කාලීන කිරීම සඳහා පාර්ශවකරුවන් 50 කගේ සහභාගීත්වයෙන් නේවාසික වැඩමුළුවක් 2015 දෙසැම්බර් 9 -11 යනතෙදින තුල තුල්හිරියේදී පවත්වන ලදී. මෙම වැඩමුළුව සාර්ථකව නිම වූ අතර, හරිත ලංකා වැඩසටහන මෙහෙවර 1 2016-2022 දක්වා යාවත්කාලීන කරන ලදී. තවද පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැලැස්ම සකස් කරමින් පවතියි.

- කෙටුම්පත් කරන ලද පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැලැස්ම සකසා අවසන් කිරීම සඳහා අංශය විසින් එක් දින වැඩමුළුවක් සංවිධානය කරන ලදී. එය 2016 මාර්තු මස 8 වන දින ශ්‍රී ලංකා මහ බැංකු, බැංකු කටයුතු අධ්‍යයන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැලැස්ම මෙන්ම එහි වැදගත් කරුණු එක් කොට පිලියෙල කරන ලද සිංහල අනුවාදයක් ද මුද්‍රණය කරන ලදී. එම ප්‍රකාශන 2016 මැයි මස 5 වන දින පැවති වායු සම්පත් කළමනාකරණය පිළිබඳ හය වන ජාතික සමුළුවේ ආරම්භක සැසියේ දී එලිදක්වන ලදී.

- "Air That We Breathe - 2016" තේමාකර ගනිමින් ශ්‍රී ලංකාවේ වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ හය වන ජාතික සමුළුව 2016 මැයි මස 5 සහ 6 දෙදින තුල අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල චෝටර්ස් එජ් හෝටල් පරිශ්‍රයේදී පවත්වන ලදී.

  මෙම සමුළුව ඉමහත් සාර්ථක වූ අතර, විදේශ නියෝජිතයින්ද ඇතුලත්ව සහභාගී වන්නන් 300 කගේ පමණ සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණය රට පුරා පර්යේෂකයන්, විද්‍යාඥයන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, හා අනෙකුත් වෘත්තිකයන් එකට එක්ව විශාල පර්යේෂකයන් පිරිසක් ඉදිරියේවායු දූෂණ ගැටළු සහ වායු සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් ඉතාමත් නවීන තාක්ෂණික, විද්‍යාත්මක හා ප්‍රතිපත්තිමය සංවර්ධනයන් ඉදිරිපත් කිරීමට හා සාකච්ඡා කිරීමට මනා වේදිකාවක් කරගන්නා ලදී.

  මෙය වඩා යහපත් හෙට දවසක් වෙනුවෙන් වායු තත්ත්ව පර්යේෂණ, සංවර්ධන හා ක්‍රියාත්මක කිරීම කටයුතු වල නිරත, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන ගණනාවක තාක්ෂනවේදීන්, විද්යාඥයන් හා අනෙකුත් වෘත්තිකයන් අදහස් ඒකාබද්ධ කරන ලදී.

  තාක්ෂණික සැසිවාර දහයකින් හා විද්වත් සංසදයකින් සමන්විත වූ මෙම සමුළුව ඉදිරිපත් කිරීම් 36 කින් සම්න්විත විය. පර්යේෂණ අධ්‍යයනයන්, මනාපුරුදු, ප්‍රතිපත්තිමය තීරනයන් මෙන්ම සහභාගී වූ විදේශ නියෝජිතයින් විසින් වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ කලාපීය ඉදිරිදර්ශන් පිළිබඳව ද එහිදී ඉදිරිපත් කිරීම් සිදුකරන ලදී.

  මෙම සමුළුව මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ, වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රය මගින් සංවිධානය කළ අතර, ක්ලීන් එයා ශ්‍රී ලංකා ආයතන, දකුණු ආසියා පාරිසරික සහයෝගීතා වැඩසටහන, තිරසර ජෙව ස්කන්ධ බලශක්ති ව්‍යාපෘතිය මූල්‍ය ප්‍රතිපාදනයෙන් ද, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනෙහි සහභාගීත්වයෙන් ද පවත්වන ලදී.

- විවෘත දහනය නිසා නිසා ඇතිවන පරිසර හා සෞඛ්‍යය බලපෑම් තක්සේරු කිරීමට සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. අවසන් වාර්ථාව ඉදිරිපත් කර ඇත.

- වායු සම්පත් කළමනාකරණය සහ අන්තර්ජාතික සබඳතා අංශය, ක්ලීන් එයා ශ්‍රී ලංකා සමඟ එක්ව තෝරා ගන්නා ලද ප්‍රදේශයන් 4 ක, එය ඇවිදීම සඳහා කොපමණ හිතකාමීදැයි පරීක්ෂා කිරීමට සමීක්ෂණ 4 ක් සහ මෝටර් රථ භාවිතා නොකර සිදුකරනු ලබන ප්‍රවාහන විධි සහ යටිතල පහසුකම් පිළිබඳ පරිශීලක මතය සහ අවබෝධය පිරික්සීමේ සමීක්ෂණයක් කොළඹ පුරහල, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මාලබේ සහ කඩුවෙල ප්‍රදේශන් ආශ්‍රිතව සිදු කරන ලදි.

- වායු සම්පත් කළමනාකරණය සහ අන්තර්ජාතික සබඳතා අංශය, ක්ලීන් එයා ශ්‍රී ලංකා ආයතනය සමඟ එක්ව වායු දූෂණය කෙරෙහි වැඩි දායකත්වයක් දක්වන ද්විත්ව පහර එන්ජින් සහිත ත්‍රීරෝද රථ පිළිබඳව සමීක්ෂණයක් සිදු කරන ලදි. එමගින්, වර්තමානයේ ශ්‍රී ලංකාවේ ද්විත්ව පරහ ත්‍රී රෝද රථ 144, 000 ක් පමණ භාවිතයේ ඇති බවත්, නීති විරෝධී ලෙස සිදුකරනු ලබන අමතර කොටස් ආනයනය නතර කලහොත් 2020 වන විට 50% ක් පමණ අඩු වීමක් සිදු වන බවත් පෙන්විය හැක.

මෙහෙවර 2: ශාක සත්ව හා පරිසර පද්ධති සුරැකීම


ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය හා රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨය එක්ව ජෛව තාක්ෂණය හා ජෛව සුරක්ෂිතතාව ප්‍රායෝගික භාවිතාවෙහි ඇති අවධානම තක්සේරුකරණය හා අවධානම කළමණාකරණය කිරීම සඳහා වැඩමුළුවක් ඔක්තෝම්බර් 23 දිනපවත්වන ලදි.

ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ කාටජිනා සම්මුතියට අනුගතව ක්‍රියාත්මක වන රටවල් විසින් පිළියෙල කල යුතු තුන්වන ජාතික තත්ත්ව වාර්තාව සකස් කිරීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව අංශය විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වාර්තාවක් පිළියෙල කිරීම සඳහා විද්වතුන්ගේ අදහස් සහ යෝජනා ලබා ගැනීමට 2015 දෙසැම්බර් 22 දින රාජගිරිය බැංකු විදු පියසේ දී වැඩමුළුවක් පවත්වන ලදි.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් වටිනා පරාගකාරක කෘමි විශේෂයක් වන බඹරාගෙන් සිදුවන අනතුරු වලක්වාලමින් ඔවුන් සංරක්ෂණය කිරීම සඳහා කඳුකර තේවතු වල සේවකයින් දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුවක් 2015ඔක්තොම්බර් 30 දින තලවකැලේ තේ පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදි.

2015 වසරේ ජාත්‍යන්තර කඳුකර දින තේමාව ලෙසින් "වඩාත් හොඳ ජීවනෝපායක් සඳහා කඳුකර නිෂ්පාදන දිරිගන්වමු"යන තේමාව මුල්කර ගනිමින් ඊට සමගාමීව කඳුකරයේ ස්වාභාවික සුන්දරත්වය,ජෛව විවිධත්ව,සංස්කෘතික වැදගත්කම් පාදක කරගනිමින් තම ජීවනෝපායමාර්ගය ගොඩනඟාගෙන ඇති සංචාරක මාර්ගෝපදේශකයන් සඳහා දැනුවත්කිරීමේ වැඩසටහනක් සහ ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් දෙසැම්බර් 10 සහ 11 යන දෙදින කිතුල්ගල Adventure base Camp හි පවත්වන ලදී.

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් අනුරාධපුරදිස්ත්‍රික්කයේ පුරා ජෛව විවිධත්වය සහ වර්තමාන ජෛව විවිධත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2015 දෙසැම්බර් 16 වන දින රජරට විශ්ව විද්‍යාලයෙහි සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේදි පවත්වන ලදි.




අනුරාධපුරදිස්ත්‍රික්කයේ පුරා ජෛව විවිධත්වය සහ වර්තමාන ජෛව විවිධත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව

පුරාජෛව විවිධත්වය සංවරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2015 දෙසැම්බර් 23 බුන්දල ජාතික උද්‍යානයේදී පවත්වන ලදී.මෙම වැඩමුළුව බුන්දල ජාතික උද්‍යානයේ සංචාරක මාර්ගෝපදේශකයන්, ජීප් රථ රියදුරන් , වනජීවී නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු විය.



පුරාජෛව විවිධත්වය පිළිබඳ බුන්දල ජාතික උද්‍යානයේ පැවති දැනුවත් කිරීමේ වැඩසටහන

පරාගකාරක ජීවී විශේෂ සංරක්ෂණය පිළිබඳ පළමු උපදේශක රැස්වීම 2016.04.04 දින පැවැත් වූ අතර එහිදී පර්යේෂණ යෝජනා සාකච්ඡා කරන ලදි.පරිසර දිනයට සමගාමීව සීගිරියේ සිදුවන් බඹර ප්‍රහාර සඳහා භාවිතා කළ හැකි සංරක්ෂණ ක්‍රමවේදයන් සම්බන්ධව රැස්වීමක් 2016/05/05 දින පරිසර අමාත්‍යාංශයේදී පවත්වන ලදි.


වස විසෙන් මිදීමට ජෛව විවිධත්වය අගයමු මැයෙන් ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරන ලද අතර මෙම ප්‍රදර්ශන කුටිය මගින් පහත සඳහන් අංග ඉදිරිපත් කරනු ලැබීය.

i)සූර්යය මණ්ඩලය මුල්කරගනිමින් පිළියෙළ කරන ලද ආහාර මණ්ඩලය

ශ්‍රී ලංකාවේ කාලගුණ , දේශගුණ රටා හා කාලවකවානු ද ප්‍රාදේශිය විශේෂිකරණය ද හේතුවෙන් විවිධාකාර වූ භෝග ඵල දරනු ලබයි. එම භෝග ලබාදීමේ මූලික ප්‍රභවය සූර්යයා බැවින් සූර්යයාට උපහාර දක්වමින් ග්‍රාමීය මට්ටමෙන් වගාකර ඇති භෝග භුවමාරු කරමින් ඒවා ව්‍යාප්ත කිරීම, වසවිස නැති භෝග භාවිතයට හුරුවීම වැනි සංකල්ප වැඩිදියුණු කරවීම මෙහිදී අරමුණු කරයි.

ii)කොස් ආශ්‍රිත ආහාර වන කොස් අයිස්ක්‍රීම් ,හාකොස් කොත්තු ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.

iii)ප්‍රකාශන අලෙවිය හා ශාක බීජ වර්ග භාවිතාකර නිපදවන ලද විසිතුරු කාන්තා ආභරණ ප්‍රදර්ශනය කරන ලදී.



වසවිස නැති ප්‍රදර්ශනය 2016 මාර්තු 06 -08 දින බන්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවැත්විණ

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් පෙබරවාරි 02 දිනට යෙදුණු ලෝක තෙත්බිම් දිනයට සමගාමීව දිස්ත්‍රික්ක මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දැනුවත් කිරීම් සිදුකරන ලදී. ඒ අනුව ඊට සමගාමීව යමින් වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ආදර්ශමත් පෝස්ටර් හා බැනර් ප්‍රදර්ශනය කරමින් මීගමුව කලපුව ආශ්‍රිත පාගමනක් ද පාසැල් සිසුන් හා මහජනතාව දැනුවත් කිරීම උදෙසා වැඩමුළුවක් ද සංවිධානය කරන ලද අතර ඒ සඳහා මූල්‍යාධාර ලබාදීම, සහභාගීත්වය ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය විසින් සිදුකරන ලදි.

2016 ජුනි මස 05 වෙනි දිනට යෙදුණු ජගත් පරිසර දින ජාතික සැමරුම් උළෙල සහ පරිසර සංරක්ෂණ සමුළුව මාතලේ දිස්ත්‍රික්කය පදනම් කරගනිමින් මාතලේ එඩ්වඩ් ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී. ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මෙම උත්සවයේදී පහත සඳහන් ප්‍රකාශනයේ පළමු පිටපත අතිගරු ජනාධිපතිතුමන්ට පිරිනමන ලද අතර පරිසර දිනයට සමගාමීව පහත වැඩමුළු ද සංවිධානය කරන ලදී.

කාලීන මාතෘකාවක් වන රක්ෂිතබිම් පිළිබඳ මෙරට ලියවී ඇති පොත් ප්‍රමාණය අල්පය.ජෛවවිවිධත්වය හා බැඳුණු රක්ෂිතබිම් කෘතිය මගින් පාසැල් දරුවන්ට , පර්යේෂණවලට අත්පොත් තබන්නන්ට හා පොදු මහජනතාවට රක්ෂිතබිම් ආවරණය කරවන විෂය ක්ෂේත්‍රයන් වන ලෝක උරුම රක්ෂිත,ජාත්‍යන්තර ගිවිසුම් හා බැඳුණු රක්ෂිත , රක්ෂිත හා සංරක්ෂිත වනාන්තර,තෙත්බිම් පද්ධති, දැඩි රක්ෂිත,ජාතික වනෝද්‍යාන, අභය භූමි පිළිබඳ සමස්ථ අවබෝධයක් ලබාගැනීමට හැකිවෙයි.පාසල් දරුවන්ගේ පාසැල් විෂය අධ්‍යාපන දැනුම දියුණු කිරීමට උපකාරී වන ලෙස සකසා ඇති මෙම කෘතිය ශ්‍රී ලංකාවේ රක්ෂිත බිම් වෙත සංචාරයට පැමිණෙන ජනතාව උදෙසා පූර්වාබෝධයක් ලබාගැනීමටද හැකිවන අයුරින් , පහසුවෙන් කියවා තේරුම්ගත හැකි ලෙස රචනා කර එළිදක්වන ලදී.


- **ජෛව විවිධත්ව සමීක්ෂණ සහ පර්යේෂන**

ශාක සහ සත්ත්ව සංරක්ෂණය සඳහා ක්ෂේත්‍ර පර්යේෂණ අධ්‍යයන සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කිරීම.ශාක සහ සත්ත්ව පිළිබඳ, පුරාජෛව විවිධත්වය පිළිබඳ සමීක්ෂණ,

ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් ඇතුළුවීම හා පැතිරීම පාලනය සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය

පරිසර රාජ්‍ය අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් ක්‍රියාවට නංවන හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා ගෝලීය පාරිසරික පහසුකම් සැලසීමේ වැඩසටහනේ සහයෝගයෙන් පවත්වාගෙන යනු ලබන "ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් ඇතුළුවීම හා පැතිරීම පාලනය සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය මගින් පළාත් නවයෙහිම ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන්ගේ අවදානම තක්සේරුකරණය කරනු ලබන ක්‍රියාපටිපාටිය (Protocol) පිළිබඳ අවසන් තීරණයට පැමිණීම සඳහා ආගන්තුක ආක්‍රමකාරී ශාක හා සතුන් පිළිබඳ ලැයිස්තුගත කිරීම මුල්කර ගනිමින් 2015 අගෝස්තු 03 සහ 04 දෙදින විද්වතුන්, පළාත් නවයේ ආයතනික නිලධාරීන් හා පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් පවත්වන ලදී.





ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන්ගේ අවදානම තක්සේරුකරණය සහ ශාක සහ සතුන් පිළිබඳ ජාතික ලැයිස්තුව සැකසීමේ වැඩමුළුව

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ පාලනය කිරීම සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය හා,නුවරඑළියේ සඳතැන්න ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනය එක්ව දින හයක නේවාසික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.මෙහිදී ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ පිළිබඳ ජාත්‍යන්තර විද්වතකු වන අචාර්ය ජෝන් මොර මොටෝගේ සහභාගිත්වයෙන් මෙරට දේශීය සම්පත්දායකයින් ද සමඟ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ,වනජීවී දෙපාර්තමේන්තුව,මධ්‍යම පරිසර අධිකාරිය , රේගු දෙපාර්තමේන්තුව,වාරමාර්ග දෙපාර්තමේන්තුව,ජාතික අධ්‍යාපන ආයතනය, වරාය අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය,ඇතුළු රාජ්‍යභා රාජ්‍ය නොවන ආයතන යන්හි නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් 2016 මාර්තු 28 සිට අප්‍රේල් 02 ශ්‍රී ලංකා වනවිද්‍යා පුහුණු ආයතනය ,සඳතැන්න ,නුවරඑළිය හි පවත්වන ලදි.



ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ පාලනය පිළිබඳ හෝටන් තැන්නේ පැවති පුහුණු වැඩසටහන

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය විසින් ආගන්තුක ආක්‍රමණශීලී ජීවීන්පාලනය හා කළමණාකරනය උදෙසා පනතක් සකස් කිරීම සඳහා විද්වත් මණ්ඩලයේ අදහස් ලබාගැනීමට 2016 මාර්තු 04 වෙනි දින වැඩමුළුවක් බැංකු විදු පියසේදී පවත්වන ලදී.මෙම රැස්වීම සඳහා කෘෂි කර්ම දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය , ශ්‍රී ලංකා රේගුව, වනසංරක්ෂණ

දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික උද්භීද උද්‍යාන දෙපාර්තමේන්තුව,ඇතුළු ජෛව විවිධත්ව හා ස්වභාවික පරිසරය සම්බන්ධව වගකිව යුතු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන් සහභාගිවිය.



ආගන්තුක ආක්‍රමණශීලී ජීවීන්පාලනය හා කළමණාකරනය පිළිබඳ පනත සැකසීමේ වැඩමුළුව

ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මකවන ආගන්තුක ආක්‍රමණශීලී ජීවීවිශේෂ පාලනය කිරීම සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය මගින් අදාල සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් ගොඩනැගුණු ආගන්තුක ආක්‍රමණශීලී ජීවීවිශේෂ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපාය මාර්ග හා ක්‍රියාකාරී සැලැස්මඅතිගරු ජනාධිපතිතුමා අතින් පරිසර දිනයට සමගාමීව එළි දක්වන ලදී.ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂවලින් ආර්ථිකයට, පරිසරයට හා සමාජයට ඇති කරන අවදානම් හඳුනා ගැනීම, එම අවදානම වළක්වාලීම, ප්‍රතිචාර දැක්වීම,කළමණාකරණය කරන ලද ආයතනික සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් හරහා ක්‍රියාත්මක කරනු ලබන යෝග්‍ය නෛතික රාමුවක් සකස් කිරීමට මඟ පෙන්වීම ජාතික ප්‍රතිපත්තියේ ප්‍රධාන පරමාර්ථය වේ.

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් පරිසර දිනයට සමගාමීව මාතලේ දිස්ත්‍රික්කයේ 2016 ජුනි 03,10 හා 14 යන දිනයන්හි පාසැල් ළමුන් සඳහා වැඩමුළු සංවිධානය කරන ලදී.මෙහිදී පරිසරයට අදාළ වන්නාවූ මාතෘකාවන් වන ජෛව විවිධත්වය,කසළ කළමනාකරණය හා ආක්‍රමණශීලී ශාක හා සතුන් යන මාතෘකා ඔස්සේ දැනුවත් කිරීම සිදුකරන ලදී. මාතලේ දිස්ත්‍රික්කයේ පාසැල් තුනක් වන නාවුල්ල මහින්ද විද්‍යාලය, මාතලේ පුස්සැල්ල මහා විද්‍යාලය හා මාතලේ සුජාතා බාලිකා විද්‍යාලය යන විද්‍යාලයන්හි මෙම වැඩමුළු සංවිධානය කරන ලදී. එම පාසැල් පුස්තකාල සඳහා ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයෙන් ප්‍රකාශිත ප්‍රකාශන වලට අමතරව පරිසර විෂය ක්ෂේත්‍රයන්ට අදාළවූ පොත් කට්ටලය බැගින් ද ප්‍රදානය කරන ලදී.





මාතලේ දිස්ත්‍රික්කයේ පැවති වැඩමුළුව

➢ කෘෂි ජෛව විවිධත්වය

2016-2017 වසර සඳහා ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර ලබාදීමට අපේක්ෂිත ව්‍යාපෘති පිළිබඳ කරුණු වැඩිදියුණු කිරීම හා අවශ්‍ය වන්නාවූ උපදෙස් ලබාදීම සඳහා වැඩමුළුවක් පේරාදෙණිය , ගන්නෝරුව පැළැටි ජාන තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානයේ 2016 පෙබරවාරි 19 දින පවත්වන ලදී.




මානව පෝෂණ ව්‍යාපෘතියේ පැවති වැඩමුළුවේ විද්වතුන් සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

මෙම වැඩමුළුව සඳහා ව්‍යාපෘතියේ ගෝලීය සම්බන්ධීකාරක ලෙස ආචාර්ය ඩැනී හන්ටර් මහතා සහභාගි විය.මෙහිදී නව ව්‍යාපෘති සැලසුම් පිළිබඳ වැඩිදියුණු කිරීම් සඳහා අදහස් හා යෝජනා ලබාගැනීම හා කණ්ඩායම් ක්‍රියාකාරකම් ද සිදුකරන ලදී.
ව්‍යාපෘතියේ විද්වද් මණ්ඩලයේ ප්‍රධානත්වයෙන් හා රජයේ ආයතනයන්හි නිලධාරීන් විශ්ව විද්‍යාල කථිකාචාරවරුන් ,අධ්‍යාපන,කෘෂි, පාරම්පරික ඥාණය පිළිබඳ විද්වතුන්, ප්‍රතිපත්ති සම්පාදකයින් මාධ්‍යවේදීන්,විෂයානුබද්ධ රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මෙම වැඩමුළුව පවත්වන ලදී.මෙහිදී ආහාරයේ පෝෂණ වටිනාකම පාසැල් ළමුන් වෙත ගෙනයෑම හා ආරක්ෂිත ජීවනෝපාය ගෙවත්තෙන් ඇතිකිරීම යන කරුණු සාකච්ඡා කෙරිණි.

2016 මැයි 19 වන දින තල වගාකිරීමේ නියමු ව්‍යාපෘති වැඩසටහන ක්‍රියාවට නංවන ලද අතර එදින තල වගාකරුවන්ගේ සංගමය මගින් "තල ගොවි සමිතිය" පිහිටුවීම හා කමිටු සමාජිකයින් පත්කිරීමත් සිදුවිය. එදින ගොවීන් උදෙසා තල වගාකිරීම පිළිබඳ කෙටි වාර්තාමය චිත්‍රපටයක් ද ප්‍රදර්ශනය කරන ලදී.





➢ තල වගාව සහ දැනුවත් කිරීමේ වැඩසටහන

කෘෂි ජෛව විවිධත්වය කළමණාකරනය පිළිබඳ යොමු කිරීම උදෙසා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන 2016 අප්‍රේල් 26 සිට 29 දක්වා පේරාදෙනිය,ගන්නෝරුව පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ දී පවත්වන ලද අතර මේ සඳහා "මානව පෝෂණය හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම උදෙසා ජෛව විවිධත්වය සංරක්ෂණය හා තිරසාර භාවිතය අනුප්‍රවාහගත කිරීමේ ව්‍යාපෘතියේ" ක්‍රියාකාරකම් හා සම්බන්ධ වී සිටින නිලධාරීන් පුහුණු කිරීම මෙහිදී සිදුවූ අතර දේශීය හා විදේශීය විද්වතුන්ගේ සහභාගිත්වයෙන් මෙම වැඩසටහන පවත්වන ලදී.

දේශගුණික විපර්යාස සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග තේරීම හා හඳුනා ගැනීම සහ අත්පොත පිළියෙල කිරීම පිළිබඳ වැඩමුළුව 2016 ජූනි 20 සිට 22 දක්වා හොරණ දිපැවැත්විණි. මෙම වැඩමුළුවේ අරමුණ වූයේයෝග්‍ය සම්ප්‍රදායික සහ වැඩි දියුණු කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ අත්පොතක් සකස් කිරීමට විද්‍යාත්මක , දේශගුණික විපර්යාස හා පාංශු සංරක්ෂණය පිළිබඳ හොඳම කළමනාකරණ පිළිවෙත් හඳුනා ගැනීමයි

කෘෂි ජෛව විවිධත්වයේ සංඛ්‍යාන දත්ත විශ්ලේෂනය කිරීම , ව්‍යාපෘති ක්‍රියාකාරකම් , ව්‍යාපෘතියේ ප්‍රගතිය විශ්ලේෂනය කිරීම් සඳහා පුහුණු කිරීමේ වැඩසටහන සහ ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහන 2016 පෙබරවාරි 16- 27 ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප සංරක්ෂණය සහ දේශගුණික විපර්යාසවලට ජනයා අනුගත කිරීමේ ව්‍යාපෘතිය මගින් ඉහත පුහුණු වැඩසටහන පේරාදෙණිය ගන්නෝරුව පැළෑටි ජාන තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානයඅනුරාධපුරමහකන්දරාව යන ආයතනවල ක්ෂේත්‍ර වාරිකාවකින් යුක්තව සංවිධානය කරනු ලැබීය.වැඩමුළුවේ ආරම්භක දිනය විෂයානුබද්ධව දැනට පවතින්නාවූ පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත්කිරීම සඳහා එම වාර්තා සාකච්ඡාකිරීම, එම පර්යේෂණ ක්‍රියාවට නැංවීම 2016 ක්‍රියාකාරී සැලැස්ම සැකච්ඡා කිරීම පැළෑටි ජාන තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානයේදී විද්වතුන්ගේ සහභාගීත්වයෙන් සිදු විය.ඉහත කරුණු පිළිබඳ අවසාන තීරණයන්ට පැමිණීම විද්වත් මණ්ඩලයේ සහභාගිත්වයෙන් අනුරාධපුර දී පවත්වන ලද අතර මෙහිදී වැඩිමනත්ව පර්යේෂණ සංඛ්‍යාන දත්ත විශ්ලේෂණය ආර් මෘදුකාංගය භාවිතා කරමින් සිදුකරන ලදී. මහකනදරාව ක්ෂේත්‍ර අධ්‍යයන වාරිකාවක් සිදුකරන ලද අතර මෙහිදී එය ප්‍රදේශයේ වගාකර ඇති පලතුරු හා ක්ෂේත්‍ර භෝග පිබඳ දත්ත එක්රැස් කරන ලදී





ව්‍යාපෘතියේ ප්‍රගතිය විශ්ලේෂණය කිරීම් සඳහා පුහුණු කිරීමේ වැඩසටහන

කාටිජිනා සම්මුතියට අනුගතව ක්‍රියාවට නංවන ජාතික ජෛව සුරක්ෂිතතා මූලාකෘතිය ක්‍රියාවට නැංවීමේ ව්‍යාපෘතිය GEF මූල්‍යාධර යටතේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන හා ජාතික ජෛව සුරක්ෂිතතා මූලාකෘතිය ක්‍රියාවට නැංවීමේ ව්‍යාපෘතිය සැකසීමේ අවසාන ප්‍රගති සමාලෝචන වැඩමුළුවක් 2015 සැප්තැම්බර්

29 දින බත්තරමුල්ලේ දී පවත්වන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය,සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුව,මත්ස්‍ය හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, විශ්ව විද්‍යාල හා ආයතන විද්වතුන්ගෙන් අදහස් හා යෝජනා ලබාගැනීම සිදුවිය.



ජාතික ජෛව සුරක්ෂිතතා මූලාකෘතිය ක්‍රියාවට නැංවීමේ ව්‍යාපෘතිය-අවසාන ප්‍රගති සමාලෝචන වැඩමුළුව

ජාතික ජෛව විවිධත්ව සම්මුතියේ පාර්ශව කරුවන්ගේ 10 වෙනි සමුළුවේ දී ගත්තීරණයට අනුව,ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම අයිචි ඉලක්කයන් සමඟ සමගාමී වන ලෙස සැකසීමට පාර්ශ්වකාර රටවල් එකඟ විය. මෙම වැඩසටහන සඳහා මූල්‍ය ප්‍රතිපාදන සපයනු ලබන්නේ ගෝලීය පරිසර පහසුකම් මගිනි.ජෛව විවිධත්ව සම්මුතිය ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමට මෙම ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන මෙවලමක් වේ.මෙම ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ගික සහ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ අවශ්‍යතාවය වනුයේ රටවල ක්‍රියාකාරකම් ජෛව විවිධත්වය මත බලපෑම,උපායමාර්ග සැලසුම් වලට අනුප්‍රවාහගත වීම සහතික කිරීමයි.

ඒ අනුව අමාත්‍යාංශය විසින් මෙම 2016- 2022 ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ග ක්‍රියාකාරී සැලැස්ම ගෝලීය සහ ජාතික ප්‍රමුඛතාවලට ගැලපෙන ලෙස ප්‍රධාන උපාය මාර්ග අරමුණු 5 ක් මත ගොඩනගන ලදි. මෙහි ජාතික ඉලක්ක 12ක් සහ ක්‍රියාකාරකම් 84ක් ගෝලීය අයිචි ඉලක්ක සහ තිරසර සංවර්ධන අරමුණු හා ගැලපෙන ලෙස සකසා ඇත.මෙය ශ්‍රී ලංකාවේ ජාතික සහ පළාත් අධිකාරිය සඳහා මෙන්ම සිවිල් සමාජ කණ්ඩායම් සහ පෞද්ගලික අංශ සංවිධාන වලට ජෛව විවිධත්ව සංරක්ෂණය සහ පරිසර පද්ධති කළමණාකරණය සඳහා මහපෙන්වන ප්‍රතිපත්ති රාමුවක් වේ.

ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සඳහා සියළුම රාජ්‍ය ආයතන පාර්ශ්වකරුවන් ,රාජ්‍ය නොවන ආයතන ,පෞද්ගලික ආයතන නියෝජිතයන් සහ ජෛව විවිධත්ව විද්වත් කමිටු සාමාජිකයන් සම්බන්ධ විය.





මෙහෙවර 3: දේශගුණ විපර්යාස මගින් ඇතිවන අභියෝගයන්ට මුහුණදීම

- **දේශගුණ විපර්යාස අභියෝග ජය ගැනීම**

වසර දෙසීයකට වැඩි කාලයක් ගල් අඟුරු සහ ඛනිජ තෙල් වැනි පොසිල ඉන්ධන දහනය හා වනාන්තර එළි කිරීම "හරිතාගාර වායු" වායු ගෝලයේ කැපී පෙනෙන ලෙස ඉහළ යාමට හේතු විය.

හරිතාගාර වායු ජීවය පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය වේ. මන්දයත් එකී වායු මගින් පෘථිවි පෘෂ්ඨය උණුසුම්ව තබා ගැනීමට උපකාර වීමයි. නමුත් වායු ගෝලයේ මෙම වායූන් හි සාන්ද්‍රණය ඉහළ යමින් පැවතීම නිසා පෘථිවියේ උෂ්ණත්වය පසුගිය කාලයේ පැවති තත්ත්වයට වඩා අඛණ්ඩ වැඩිවීමක් දක්නට ලැබේ. මෑත දශකවල පෘථිවියේ උෂ්ණත්වය ඉහළ යාමට බොහෝ සෙයින් බලපා ඇත්තේ මිනිස් ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයන්ය.

මුහුදු ජල මට්ටම ඉහළ යාම, ඉහළ උෂ්ණත්වයන්, නිතර නිතර හා දීර්ඝ කාලීනව පවතින නියඟය, ඉහළ තීව්‍රතාවයක් සහිත වර්ෂාපතනය හා ඉහළ අකුණු සැර ක්‍රියාකාරිත්වයට පෘථිවිය උණුසුම් වීම ආදිය ගෝලීය උණුසුම් වීමේ ප්‍රතිඵලයන්ය. මෙලෙස ඇතිවන දේශගුණික විපර්යාස හේතුවෙන් වෙරළබඩ ප්‍රදේශ වලට, ජාතික ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍රවලට හා මානව සෞඛ්‍යයට සැළකිය යුතු ලෙස බලපෑම් ඇති කරයි.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස හා දිවයිනක් ලෙස ශ්‍රී ලංකාව විශේෂයෙන් මෙම බලපෑම් වලට පහසුවෙන් පාත්‍ර වේ. දේශගුණ විපර්යාස ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් වලට, ආර්ථික ක්‍රියාවලීන්ට හා මිනිසුන්ගේ යහ පැවැත්මට විශාල ලෙස බලපෑම් ඇති කරයි. දේශගුණ විපර්යාස ශ්‍රී ලංකාව කෙරෙහි දක්වන බලපෑම පිළිබඳ කර ඇති අධ්‍යනයන් තුළින් පසුගිය වසර 20 තුල මෙරට අදායම් ඉහළ දැමීම හා දුප්පත්කම අවම කිරීම තුළින් අත්කර ගත් කැපී පෙනෙන ජයග්‍රහණ වලට එම දේශගුණ විපර්යාස වල බලපෑම් තර්ජනයක් එල්ල කරන බව හඳුනාගෙන ඇත. දැනට සිදු කරන ලද මූලික පර්යේෂණ හා ප්‍රක්ෂේපන මගින් ශ්‍රී ලංකාව විශාල වශයෙන් හා විවිධාකාර ඉහළ අවධානම් තත්ත්ව වලට හා බලපෑම් වලට පාත්‍ර වන බව පෙනී යයි.

පරිසර අමාත්‍යාංශයේ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය මෙරට ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රයට දේශගුණ විපර්යාස වලින් සිදු වන අභියෝග වලට මුහුණදීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය පිහිටුවීමේ මූලික අරමුණ වනුයේ දේශගුණ විපර්යාස හා බැඳුණු ප්‍රතිපත්ති හා සැලසුම් නවතම පර්යේෂණ ප්‍රතිඵල වලට අනුකූල වන පරිදි යථාවත් කිරීමයි. හරිත ලංකා ක්‍රියාකාරී සැලැස්මෙහි දේශගුණ විපර්යාස අභියෝග ජය ගැනීම නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

- **දේශගුණ විපර්යාස සඳහා ජාතික අනුහුරු සැලැස්ම සකස් කිරීම**

ජාතික අනුහුරු සැලැස්ම (National Adaptation Plan) සකස් කිරීම ආරම්භ කරන ලද්දේ 2014 වර්ෂයේදීය. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ අනුහුරු ධාරිතාව සහ ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය කිරීම තුලින් දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑමට ලක්වීම අවම කිරීමයි. ජාතික අනුහුරු ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ උපදේශක සේවාව ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (Institute of Policy Studies) වෙත ලබා දී ඇත. මෙම ජාතික අනුහුරු සැලැස්ම යටතේ ශ්‍රී ලංකාව තුළ දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම් වලට වඩාත්ම ලක්විය හැකි ක්ෂේත්‍ර 10 හඳුනාගෙන ඇත.


හඳුනාගත් ක්ෂේත්‍ර: ආහාර සුරක්ෂිතතාව, ආහාර සුරක්ෂිතතාව, ජල සම්පත්, වෙරළ හා සමුද්‍ර අංශය, සෞඛයය, මානව ජනාවාස හා යටිතල පහසුකම්, පරිසර පද්ධති හා ජෛව විවිධත්වය, සංචාරක හා විනෝද ක්‍රීඩා, අපනයන කෘෂි කාර්මික අංශය, කර්මාන්ත බලශක්ති සහ ප්‍රවාහන, එකිනෙක හා සම්බන්ධ වන ජාතික ප්‍රශ්න හා සම්බන්ධ ක්ෂේත්‍ර වේ.

කෘෂිකර්ම, ජල, පරිසර පද්ධති හා ජෛව විවිධත්ව, සංචාරක ව්‍යාපාරය හා පොදු විනෝදාත්මක කටයුතු, සෞඛ්‍යය හා ආපදා, මානව ජනාවාස හා යටිතල පහසුකම්, කර්මාන්ත, බලශක්ති සහ ප්‍රවාහන හා අපනයන, කෘෂිකර්ම හා වැවිලි යන අංශ සඳහා වැඩමුළු 7 ක් පවත්වා ඇත. අනුගත වීම පිළිබඳ ජාතික විද්වත් කමිටු රැස්වීමේදී මෙම කෙටුම්පත සඳහා විශේෂඥයන්ගේ අදහස් ලබා ගන්නා ලදී. පළමු කෙටුම්පත සකස් කර, අදහස් හා යෝජනා සඳහා ජාතික විද්වත් කමිටුවේ පාර්ශ්වකරුවන් හා සාමාජිකයන් අතර බෙදා දෙන ලදී. අවසන් වැඩමුළුව 2015 අගෝස්තු මස 7 සහ 8 යන දිනවලදී ලයා බීච්, වාද්දුව හෝටලයේදී පැවැත්වූ අතර, අදහස් හා යෝජනා අනුව අවසන් කෙටුම්පත සකස් කරන ලදී. අවසන් කෙටුම්පත අවශ්‍ය අනුමැතිය සඳහා ප්‍රකාශන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ජාතික අනුහුරු සැලැස්ම මුද්‍රණය කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර 2016 වර්ෂයේදී එළිදැක්වීමට නියමිතය.

- **"ශ්‍රී ලංකා නෙක්ස්ට්-නීලහරිත යුගයක්" ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සහ ප්‍රදර්ශනය 2016**

ශ්‍රී ලාංකික ජන සමාජයේ සියලු කොටස් දේශගුණික විපර්යාස හා සංවර්ධන උපාය මාර්ග පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් "ශ්‍රී ලංකා නෙක්ස්ට්-නීල හරිත යුගයක්", 2016 ජනවාරි 6 වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී නිල වශයෙන් ආරම්භ කරන ලදී. "ශ්‍රී ලංකා නෙක්ස්ට්-නීල හරිත යුගයක්", යටතේ දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර්ජාතික සමුළුව 2016 ඔක්තෝබර් මස 17-19 දින වලදී පැවැත්වීමට නියමිතය.

දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර්ජාතික සමුළුවේ අරමුණ වන්නේ ලොව පුරා පර්යේෂකයන්, ඉංජිනේරුවන්, අධ්‍යාපනඥයන්ට මෙන්ම කාර්මික වෘත්තිකයන් සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ ඔවුන්ගේ පර්යේෂණ ප්‍රතිඵල සහ සංවර්ධන කටයුතු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමයි.



- **දේශගුණ විපර්යාස පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.**

දේශගුණ විපර්යාස පිලිබඳ මාධ්‍ය ආයතන දැනුවත් කිරීමේ වැඩමුළුව

"දේශගුණ විපර්යාස අභියෝග - පැරිස් සමුළුවෙන් පසුව", මාධ්‍ය ආයතන දැනුවත් කිරීමේ වැඩමුළුවක් 21.12.2015 දින පවත්වන ලදී.






ජෛව විවිධත්වය හා දේශගුණ විපර්යාස" **පිලිබඳ** වැඩමුළුව

ජෛව විවිධත්වය සහ දේශගුණික විපර්යාස පිළිබඳ පාසල් ළමුන් හා අමාත්‍යාංශ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් ගම්පහ උද්භිද උද්‍යානයේදී 18.11.2015 දිනද, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේදී 07.12.2015 දිනද පවත්වන ලදී.

" දේශගුණ විපර්යාස සහ අපගේ අනාගතය" පොත් පිංච නිර්මාණය කිරීම






දේශගුණ විපර්යාස පිලිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීමේ අරමුණින් " දේශගුණ විපර්යාස සහ අපගේ අනාගතය" පොත් පිංච ලෝක පරිසර දිනයේදී එනම් 2016 ජුනි මස 5 වන දින එලිදක්වන ලදී.




දේශගුණ විපර්යාස පිලිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයේ පස්වන ඇගයීම් වාර්තාව සිංහල හා දෙමළ බසට පරිවර්තනය කිරීම

භෞතික විද්‍යා පදනම, බලපෑම්, අනුවර්තනය හා සමනය කිරීම, දේශගුණ විපර්යාස සමනය කිරීම (ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා වූ සංක්ෂිප්තය) යන වාර්තා සිංහල හා දෙමළ බසට පරිවර්තනය කරන ලදී . එම වාර්තා දේශගුණ විපර්යාස අංශයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත.







ශ්‍රී ලංකාව තුළ දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය වීම හා අවම කිරීම පිළිබඳ තාක්ෂණ ඇගයීම් ව්‍යාපෘතියේ අදහස් සාරාංශ කර සකස් කරන ලද පොත නිර්මාණය කිරීම

මෙම පොතෙහි පිටපත් 100 ක් මුද්‍රණය කරන ලද අතර දේශගුණ විපර්යාස අංශයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත.



"හරිතාගාර වායු විමෝචනය පිලිබඳ ද්වි වාර්ෂික යාවත්කාලීන කිරීමේ වාර්තාව" සැකසීම සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම

මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ දේශගුණ විපර්යාස අංශයේ සම්බන්ධීකරණයෙන් හරිතාගාර වායු විමෝචනය පිළිබඳ ද්වි වාර්ෂික යාවත්කාලීන වාර්තා සකස් කිරීමේ පුහුණු වැඩමුළුව 2016 අප්‍රේල් මස 4 සිට 6 දක්වා කොළඹ හිල්ටන් හෝටලයේදී පවත්වන ලදී.

දේශගුණ විපර්යාස 21 වන සියවසේ ප්‍රබලතම පාරිසරික ගැටළුවක් ලෙස හඳුනාගන ඇති අතර, එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවන් වන සියලුම රටවල් හරිතාගාර වායු විමෝචනය පිලිබඳ වාර්තා සකස්කොට, එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිලිබඳ රාමුගත සම්මුතියේ ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ලබා දීම රටකට අයත් වගකීමක් හා බැඳීමක් වේ.

එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය හරහා එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය මගින් හරිතාගාර වායු විමෝචනය අවම කිරීම පිළිබඳ වැඩමුළුව පැවැත්වීම සඳහා පූර්ණ මූල්‍ය සහ තාක්ෂණික අනුග්‍රහය ලබා දෙන ලද අතර මෙම ප්‍රායෝගික වැඩමුළුව සඳහා ආසියා ශාන්තිකර හා නැගෙනහිර යුරෝපීය කලාපීය රටවල් නියෝජනය කරමින් 60 දෙනෙකුගෙන් සමන්විත පිරිසක් සහභාගී වන ලදී.





- **එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ බැඳීමට අනුව 2015 ගිවිසුම සඳහා ශ්‍රී ලංකාවේ යෝජිත ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (INDCs) පිළියෙල කිරීම ක්‍රියාත්මක කිරීම**





- **දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) ක්‍රියාත්මක කිරීමේ ලේකම් කාර්යාලය හා කියතෝ සන්ධානය සමග සම්බන්ධීකරණය**

දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවෙකු වශයෙන් අවශ්‍ය අවස්ථා වලදී කාලීන වාර්තා සහ දත්ත යොමුකිරීමට එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) සහ කියතෝ සන්ධානයේ ජාතික කේන්ද්‍රීය මධස්ථානය ලෙස අප අමාත්‍යාංශය බැඳී සිටියි. එම සම්මුතියේ ADP, SBI, SBSTA වැනි UNFCCC සම්මුතිය යටතේ වූ විවිධ ආයතන වලින් කෙරෙන ඉල්ලීම් වලට අදාලව තොරතුරු සැපයීම ප්‍රධාන අවශ්‍යතාවයකි.

දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ ලේකම් කාර්යාලයට අවශ්‍ය වාර්තා සැපයීම

21 වන පාර්ශවකරුවන්ගේ රැස්වීම සඳහා අවශ්‍ය ජාතික වාර්තා සකස් කරන ලදී. රාමුගත සම්මුතියට හා UNEP ජාතික කේන්ද්‍රීය ස්ථානයක් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කරන ලදී. විවිධ දේශගුණික කලාප සඳහා කෘෂිකර්ම පද්ධති හා සම්බන්ධ ගැටළු පිළිබඳ මුල් වාර්තාව සකස් කරන ලදී. කියෝතෝ සන්ධානයේ දෙවන කාල පරිච්ඡේදය සඳහා කැමැත්ත පළකිරීමට කැබිනට් පත්‍රිකාවක් සකස් කර කැබිනට් අමාත්‍යාංශ අනුමැතිය ලබා ගන්නා ලදී. විවිධ දේශගුණික කලාප කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ගැටළු විද්‍යාත්මක සහ තාක්ෂණික උපදෙස් සඳහා වන අනුබද්ධිත ආයතනය (SBSTA) වෙත ඉදිරිපත් කරන ලදී.

දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ 21 වන පාර්ශවකරුවන්ගේ රැස්වීම සඳහා සුදානම් වීම

දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ 20 වන පාර්ශවකරුවන්ගේ රැස්වීමේ තීරණ අධීක්ෂණය කරන ලදී. ජාත්‍යන්තර දේශගුණික විපර්යාස පිළිබඳ සාකච්ඡා සටහනක් සකස් කර විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. COP 21 සමුළුව සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහභාගිත්වය ස්ථිර කරන ලදී. මෙම සමුළුව නොවැම්බර් මස 30 දින සිට දෙසැම්බර් මස 12 වන දින දක්වා ප්‍රංශයේ පැරිස් නුවරදී පවත්වන ලදී.

- **දේශගුණ විපර්යාස පිලිබඳ ජාතික කමිටු පැවැත්වීම**

දේශගුණ විපර්යාස පිලිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීම

දේශගුණ විපර්යාස පිලිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතන නියෝජනය කෙරෙන කමිටුවකි. මෙය ස්ථාපිත කිරීමේ ප්‍රධාන පරමාර්ථය වුයේ දේශගුණ විපර්යාස පිලිබඳ ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම අදාල ආයතන වල ප්‍රතිපත්ති තුලට ඇතුලත් කර ගැනීමයි.

දේශගුණ විපර්යාස පිලිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටු රැස්වීම 2015 ඔක්තෝබර් 6 වන දින පවත්වන ලදී. 2016 වර්ෂය සඳහා දේශගුණ විපර්යාස පිලිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටු රැස්වීම ජුනි මස 9 වන දින පවත්වන ලදී. මෙහිදී පෙර පවත්වන ලද විශේෂඥ කමිටුවේ රැස්වීම්වලදී ගන්නා තීරණ සාකච්ඡා කිරීම, ශ්‍රී ලංකාවේ යෝජිත ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (INDCs) පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම පිලිබඳ සාකච්ඡා කිරීම, දේශගුණ විපර්යාස සඳහා ජාතික අනුහුරු සැලැස්ම (NAP) පිලිබඳ සාකච්ඡා කිරීම හා COP21 හිදී ගන්නා ලද තීරණ සහ පැරිස් ගිවිසුම පිලිබඳ සාකච්ඡා කිරීම සිදු කරන ලදී.

➢ දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවීම

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ප්‍රකාශිත ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්ති සහ අනුවර්තන උපායන් පදනම් කර ගනිමින් දේශගුණ විපර්යාස අංශය දැනට ජාතික දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම ආරම්භ කර ඇති අතර එම ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා උපදෙස් ලබා ගැනීම සහ ශ්‍රී ලංකාව තුල දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම්වලට අනුවර්තනය වීම සඳහා උපදෙස් ලබා ගැනීමට 2012 සැප්තැම්බර් මස දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුවක් පිහිටුවන ලදී.

දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුවේ පරමාර්ථ.

- දේශගුණ විපර්යාස සඳහා රටේ ප්‍රවනතාව කලින් කලට දැනුවත් කිරීම සහ ඒ පිලිබඳ සංවේදීතාව වැඩි කිරීම.
- දේශගුණ විපර්යාස නිසා ජනතාවට සහ ඔවුන්ගේ ජීවනොපයන් සහ පරිසර පද්ධති සඳහා ඇති අහිතකර බලපෑම් අවම කිරීමට සහ මගහැරවීමට අනුවර්තන ක්‍රියාමාර්ග ගැනීම.
- තිරසාර සංවර්ධනයේදී හරිතාගාර වායු විමෝචනය අවම කිරීම.
- තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය දියුණු කිරීම.
- සමාජයේ පවතින දේශගුණ විපර්යාස වලට සම්බන්ධ විවිධ මුහුණුවරවල් ඇති ගැටළු පිලිබඳ දැනුම වැඩි දියුණු කිරීම සහ තීරණ ගැනීම්වලදී දුරදර්ශී තෝරාගැනීමක් කිරීමට ධාරිතාව වර්ධනය කිරීම.
- දේශගුණ විපර්යාස වල බලපෑම් වලට කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස මුහුණ දීමට රටේ ධාරිතාව වැඩි කිරීම.
- ජාතික සංවර්ධන ක්‍රියාවලියට දේශගුණ විපර්යාස සම්බන්ධ ගැටළු ඇතුලත් කිරීම.

දේශගුණ විපර්යාසවලට අනුවර්තනය වීමට අදාල ගැටළු සඳහා මගපෙන්වීම් ලබාගැනීමේ අරමුණින් දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටු රැස්වීම 2016 මැයි මස 09 වන දින පැවත්වන ලද අතර පහත දැක්වෙන ක්ෂේත්‍ර පිළිබඳ සාකච්ඡා කරන ලදී.

- වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ දේශගුණික හැඩගැසීම සංවර්ධන ව්‍යාපෘතිය (CRIP) පිළිබඳ විශ්ලේෂණය කිරීම
- අනුහුරුවීමේ අරමුදලට අදාලව ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී ඒකකය (National Implementing Entity) පිළිබඳ සාකච්ඡා කිරීම
- තුන්වන ජාතික සන්නිවේදන වාර්තාවේ වර්තමාන තත්ත්වය පිළිබඳ සාකච්ඡා කිරීම
- 2016 වර්ෂයේදී පවත්වනු ලබන ආසියා ශාන්තිකර අනුවර්තන සංසදය පිළිබඳ සාකච්ඡා කිරීම
- COP 21 දී දේශගුණ විපර්යාසවලට අනුවර්තනය වීමට අදාල ශ්‍රී ලංකාවට සම්බන්ධ තීරණ පිළිබඳ සාකච්ඡා කිරීම

දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවීම (NECCC - Mitigation)

ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා ක්‍රියා කිරීමේ දී ඇතිවන ගැටළු වලදී මග පෙන්වීම සඳහා දේශගුණික විපර්යාස අංශය මගින් දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවන ලදී.

දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා ජාතික විශේෂඥ කමිටුවෙහි අරමුණු පහත ලෙස වෙයි.

- දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික සංවර්ධන ක්‍රියාදාමයට අනුකූලව දේශගුණික විපර්යාස අවම කිරීමේ ගැටලු පිලිබඳ මග පෙන්වීම.
- දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ප්‍රතිපත්ති, උපාය මාර්ග, ක්‍රියාකාරකම් සහ නීතිමය මෙවලම් සෑදීමට මග පෙන්වීම
- දේශගුණ විපර්යාස පිලිබඳ ජාත්‍යන්තර කථිකාවතෙහි දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ රටෙහි තත්වය සකස් කිරීමට මග පෙන්වීම
- දේශගුණ විපර්යාස පිලිබඳ ජාත්‍යන්තර කථිකාවතට අනුව රටෙහි දේශගුණික විපර්යාස අවම කිරීමට ජාතික වශයෙන් යෝග්‍ය දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා ක්‍රියාකාරකම් සකස් කිරීම. (NAMAs)
- දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ක්‍රියාකාරකම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම උදෙසා මග පෙන්වීම
- පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රනය සහ කියොතෝ සන්ධානය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රන ක්‍රියා කිරීමට මග පෙන්වීම
- විදේශ ආධාර යටතේ ඇති විදේශ ආධාර ලබන අවම කිරීමේ ව්‍යාපෘති සමාලෝචනය කිරීම

රෙදි පිළි අපද්‍රව්‍ය පිළිබඳ යෝජනාව සමාලෝචනය කිරීම සඳහා රැස්වීමක් 2015.07.16 වන දින පවත්වන ලදී. මෙහිදී රෙදි පිළි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරන ලදී. හරිත දේශගුණ අරමුදල සඳහා ඉදිරිපත් කිරීම සඳහා සංකල්ප සටහනක් සකස් කිරීමට යෝජනා කරන ලදී. COP 21 පිලිබඳ ශ්‍රී ලංකාවේ ස්ථාවරය සාකච්ඡා කිරීම සඳහා දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුවේ සහ අවම කිරීම සඳහා ජාතික විශේෂඥ කමිටුවේ ඒකාබද්ධ කමිටු රැස්වීමක් පවත්වන ලදී. දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ විශේෂඥ කමිටු රැස්වීම 2016 02.25 දින පැවැත්විණි. මෙහිදී දේශගුණ විපර්යාස අංශය මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් හා ව්‍යාපෘති වල ප්‍රගතිය පිළිබඳ සමාලෝචනය කරන ලදී. තවද පැරිස් ගිවිසුමට අනුව දේශගුණික විපර්යාස අවම කිරීම සම්බන්ධයෙන් ගන්නා පියවර සාකච්ඡා කරන ලදී.

- **ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම (NAMAs)**

2007 බාලි නුවර දී පැවති එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 13 වන රැස්වීමේදී පළමු වරට මෙම සංකල්පය ඉදිරිපත් කෙරුණ අතර 16 වන රැස්වීමේදී මේ පිලිබඳව තීරණය කරන ලදී.

ඒ අනුව එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි පාර්ශවකරුවෙකු ලෙස ශ්‍රී ලංකාව ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම බලශක්ති සහ ප්‍රවාහන ක්ෂේත්‍ර 2 සඳහා ආරම්භ කරන ලදී.

බලශක්ති අංශය සඳහා ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම

" ශ්‍රී ලංකාව තුළ බලශක්ති ක්ෂේත්‍රයෙහි හරිතාගාර වායූන් අඩුකිරීමේ ක්‍රියාකාරකම් " ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ කටයුතු 2015 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කරන ලදී. ගෝලීය පරිසර පහසුකම් (GEF) ව්‍යාපෘතිය මගින් මූල්‍යමය ආධාර සපයමින් බලශක්ති උත්පාදනය හා අවසන් පරිභෝජන ක්ෂේත්‍රය සඳහා ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් (NAMA) සකස් කරන ලදී. ව්‍යාපෘතිය කොටස් 4 කින් සමන්විත වේ. ව්‍යාපෘතිය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) මගින් විධායක බල ආයතනය ලෙස බලශක්ති අමාත්‍යාංශය නම් කරන ලද අතර ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මෙහි 4 වන ව්‍යාපෘති කොටස වන මැනිය හැකි, වාර්තාකළ හැකි හා සාක්ෂාත්කරණය (Measurable, Reportable, Verifiable) කිරීම සඳහා මහවැලි හා පරිසර අමාත්‍යාංශයේ, දේශගුණ විපර්යාස අංශය යටතේ ක්‍රියාවට නැංවේ.

ප්‍රවාහන අංශය සඳහා ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම

ලේකම්, අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශය, සභාපති, දේශගුණික විපර්යාස අවම කිරීම පිළිබඳ ජාතික විශේෂඥ කමිටුව සහ විශේෂඥයින්ගේ සහභාගිත්වයෙන් ප්‍රවාහන අංශය සඳහා ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම සම්බන්ධයෙන් රැස්වීමක් 2015 වර්ෂයේ ජූලි මස 29 වන දින පවත්වන ලදී. මෙම වාර්තාව ප්‍රවාහන අමාත්‍යාංශය මගින් සමාලෝචනය කර අනුමත කරන ලදී. මෙම වාර්තාව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ - සහශ්‍ර සංවර්ධන ඉලක්ක වැඩසටහන වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ව්‍යාපෘති වාර්තාව ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද අතර ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීමේ අන්තර්ජාතික ලේඛනයේ ලියාපදිංචි විය.

- **පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණ කතිකාවත (CDM Dialogue Forum)**

එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය සහ කියතෝ සන්ධානය මගින් වායුගෝලයේ අඩංගු හරිතාගාර වායු අවම කිරීම සඳහා පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණ (Clean Development Mechanism) ව්‍යාපෘති හඳුන්වාදෙනු ලැබිණ. පරිසරයේ ඇති හරිතාගාර වායු අවශෝෂණය කරගැනීම සහ හරිතාගාර වායු විමෝචනය පාලනය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම බලශක්තිය, ප්‍රවාහනය, කර්මාන්ත, සන අපද්‍රව්‍ය කළමනාකරණය, කෘෂිකර්මය සහ වනාන්තර යන අංශ යටතේ සිදු කරයි.

පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණ ව්‍යාපෘති යෝජකයින් සඳහා 3 වන කතිකාවත (CDM Dialogue Forum), රාජගිරිය බැංකු අධ්‍යයන ආයතනයේදී 2016 මැයි 31 දින සාර්ථකව පැවැත්විණ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් උදය ආර්. සෙනෙවිරත්න මහතා මූලසුන ගත් මෙම කතිකාවත සඳහා රජයේ නිලධාරීන්, පුද්ගලික අංශය සහ දේශගුණ විපර්යාස අවම කිරීමේ විශේෂඥ කමිටුව ඇතුළුව පිරිසක් සහභාගී විය.

මෙම කතිකාවතෙහි අරමුණු ලෙස පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණයේ වත්මන් ගෝලීය ප්‍රවණතා පිළිබඳව සහ තමන්ට හිමි කාබන් ක්‍රෙඩිට් ස්වකැමත්තෙන් අවලංගු කරගැනීමේ ක්‍රමවේදය (Voluntary Cancellation of Certified Emission Reduction, (CER)) පිළිබඳව ව්‍යාපෘති යෝජකයින් දැනුවත් කිරීම සහ කාබන් ක්‍රෙඩිට් ලබාගන්නා ව්‍යාපෘති යෝජකයින් අතර අත්දැකීම් හුවමාරු කර ගැනීම දැක්විය හැක.

මෙහිදී RCC Bangkok ආයතනයේ කණ්ඩායම් නායක බෙනීටා ගුරුනග් මහත්මිය සහ ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී බුද්ධික හේමශාන්ත මහතා විසින් හරවත් දේශන ඉදිරිපත් කරන ලදී.




ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපදවල වැසි දියෙන් යැපෙන කෘෂිකාර්මික ප්‍රජාව ඵලදායි භූමි සහ ජල සම්පත් කළමනාකරණය තුලින් විවිධාංගිකරණය වූ තිරසාර ජීවනෝපායන් සඳහා යොමුකර, දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් වලට අනුහුරුවීම සිදු කර ඔවුන්ගේ ජීවන රටාවන් ශක්තිමත්ව ගොඩ නැංවීමයි. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන වැඩසටහන් 2ක් ඇත.

- වැසි දියෙන් වගා කරන ගොවි පවුල් සඳහා ගෘහාශ්‍රිත ආහාර සුරක්ෂිතතාව හා නම්‍යශීලි ජීවනෝපායන් ගොඩ නැංවීම හා ප්‍රවර්ධනය කිරීම

- දේශගුණික සාධක වලින් බලපෑමට ලක් වූ වර්ෂාපතන විචල්‍යතාව හා සම්බන්ධ අවදානම අඩු කිරීමට ග්‍රාමීය, දේශීය හා ප්‍රාදේශීය වශයෙන් සේවා සැපයීමේ ආයතනික ශක්‍යතාවය ගොඩ නැංවීම

ඉහත අංග ඉටු කර ගැනීම සඳහා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශවල සහ නුවරඑලිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයෙහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කෙරේ.

2015.07.01 සිට 2016 06.30 දක්වා ක්‍රියාත්මක කල ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

වැව් සහ අමුණු ප්‍රතිසංස්කරණ

නම	පිහිටි ප්‍රදේශය	ගිවිසුම්ගත මුදල	ලබා දී ඇති මුදල	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
අට්ටාලකුඹුර ඇල	වලපනේ	998,451.01	599,070.62	60%	90%
සියඹලාකුඹුර ඇල	වලපනේ	1,620,701.54	977,820.92	60%	100%

මාවුස්සා ඇල	රූපහ, වලපනේ	1,950,140.20	1,170,084.12	60%	98%
යෝඹුවැල්තැන්න ඇල	නිල්දන්ඩාහින්න	1,843,849.35	1,106,309.61	60%	89%
අස්වැල්පොල ඇල	නිල්දන්ඩාහින්න	570,903.66	342,542.19	60%	90%
කිරිවානාමඩිත්ත වැව	මුන්වත්ත	1,883,702 .11	1,130,221.26	60%	95%
අඹගස්පිටිය ඇල	මුන්වත්ත	1,959,355.61	1,175,613.36	60%	95%
හල් මී ඇල	වලපනේ	960,951.89	192,190.38	20%	30%
ඉලුක්පැලැස්ස ඇල	රූපහ	1,452,329.15	290,465.83	20%	30%
කිතුල්පාගමුව ඇල	රූපහ	1,940,287.74	388,057.55	20%	30%
උඩගම ඇල	නිල්දන්ඩාහින්න	943,397.20	188,679.44	20%	30%
නාරංගස්අරාව ඇල	නිල්දන්ඩාහින්න	731,742.90	146,348.58	20%	30%
කිරමනාගලකුඹුර ඇල	තෙරිපැහ	972,637.24	194,527.45	20%	30%
මිගොල්ලෑව වැවෙහි ප්‍රධාන වැඩ	මැදිරිගිරිය	2,598,987.57	960,000.00	37%	40%
මිගොල්ලෑව වැවෙහි පහළ නිමින සංවර්ධනය	මැදිරිගිරිය	700,000.00	210,000.00	30%	85%
පතොක් වැව	මැදිරිගිරිය	4,295,726.41	1,288,717.92	30%	60%

- **පළතුරු පැල ලබා දීම:**

ව්‍යාපෘති බල ප්‍රදේශයේ සියළුම ගොවි සංවිධානවල ගෘහස්ථ ඒකකයන් ඉලක්ක කර ගනිමින් ගෙවතු සැලසුම්කරණය කිරීම සහ ගෙවතු වගාවන් ප්‍රවලිත කිරීමේ අරමුණින් පළතුරු පැල ලබා දීම.

ආයතනය	ඇස්තමේන්තු මුදල (රු.)	ලබා දී ඇති මුදල (රු.)	මූල්‍ය ප්‍රගතිය	**භෞතික ප්‍රගතිය**
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	1,716,500.00	1,716,500.00	100%	90%

පළතුරු පැල වර්ගය	වලපනේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය	මැදිරිගිරිය/ලංකාපුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය
බද්ධ අඹ පැල	-	2 100
බද්ධ දොඩම් පැල	1 100	1 000
බද්ධ රඹුටන් පැල	2 100	-
දෙළුම් බිජ පැල	2 000	3 100
බද්ධ පේර පැල	250	750
මිටි මුරුංගා පැල	-	1 500
කතුරු මුරුංගා පැල	250	750
මිටි අඹරැල්ල පැල	250	750

වලපනේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කෘෂි පාරවල් අලුත්වැඩියාව සහ ගොඩනැගීම

විස්තරය	ගිවිසුම්ගත මුදල	ලබා දී ඇති මුදල	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
කෘෂි මර්ග 17 ක් අලුත්වැඩියා කිරීම	21,500,000.00	4,300,000.00	20%	10%

වලපනේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වන සත්ත්ව හානියට පිළියම් යෙදීම

ආයතනය	ගිවිසුම්ගත මුදල	ලබා දී ඇති මුදල	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	1,183,320.00	236,664.00	20%	10%

අවධානම් කලාප දැක්වෙන සිතියම් සකස් කර ස්ථාන ගත කිරීම

ආයතනය	ඇස්තමේන්තු මුදල	ලබා දී ඇති මුදල	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
ඉඩම් පරිහරණ අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පොලොන්නරුව	724,900.00	362 450.00	50%	25%
ඉඩම් පරිහරණ අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නුවරඑලිය	7,010,000.00	210,300.00	3%	20%

කෘෂි උපකරණ ලබාදීම

විස්තරය	ලබාදුන් ස්ථාන	වැය වූ මුදල (රු.)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
උදැල්ල,කැත්ත, ගල් ඉන්න	වලපනේ,මැදිරිගිරිය,ලංකාපුර ප්‍රාදේශීය ලේ.කාර්යාලය	26,238,730.00	100%	100%
වල්කපන යන්ත්‍ර ලබා දීම	මැදිරිගිරිය,ලංකාපුර ප්‍රාදේශීය ලේ.කාර්යාලය	965,310.00	100%	100%
ආරක්ෂිත සපත්තු	මැදිරිගිරිය,ලංකාපුර ප්‍රාදේශීය ලේ.කාර්යාලය	434,280.00	100%	100%

වැසි ජල ටැංකි ලබා දීම.

ස්ථානය	ප්‍රමාණය	මුදල (රු.)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
මැදිරිගිරිය,ලංකාපුර ප්‍රාදේශීය ලේ.කාර්යාලය	130	10,408,055.00	100%	45%

දැනුවත් කිරීමේ වැඩසටහන්

ආයතනය	මුදල (රු.)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	1,400,000.00	50%	20%

අධ්‍යයන සඳහා

විස්තරය	ආයතනය	ඇස්තමේන්තු මුදල	ලබා දී ඇති මුදල	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
ගොවි පවුල් සමීක්ෂණය සහ අහාර දර්ශකයක් සැකසීමට	හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනය	3,225,083.00	1.935,049.00	60%	80%

කිරි ගොවි ගම්මාන ව්‍යාපෘති සඳහා

ආයතනය	ඇස්තමේන්තු මුදල	ලබා දී ඇති මුදල	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	1,600,000.00	1.600,000.00	100%	20%

මෙහෙවර 4: වෙරළ තීරය හා අවට මුහුදු පරිසර පද්ධති ලෙස පරිහරණය

වාර්ෂික වාර්තාව (2015/2016) සැකසීම සඳහා 2015.07.01 සිට 2016.06.30 දක්වා සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

- අදාල පාර්ශ්ව ආයතනයන්හි විද්වතුන්ගේ සහාය ලබාගනිමින් හරිත ලංකා ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්මෙහි වෙරළ තීරය අවට මුහුදු පරිසර පද්ධති ලෙස පරිහරණය කිරීම මෙහෙවර 4 හි වලංගුභාවය ලබාගැනීම සඳහා 2003 ජාතික පරිසර ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම.

- මාරවිල- තල්විල වෙරළ තීරයේ වෙරළ බාදනය වැලැක්වීම සඳහා වැලිපෝෂණය කිරීමට අදාල ව්‍යාපෘතියෙහි දෙවන අදියර සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක්ඉදිරිපත් කිරීම සම්බන්ධීකරණය කිරීම.

- වෙරළ සංරක්ෂණ කටයුතු යටතේ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි(Port City Development Project) පරිසර ඇගයීම් වැඩසටහන (SupplementaryEnvironment Impact Assessment)විශේෂිත ඇගයීම් කමිටුව සඳහාභූමි සම්පත් අංශයෙහි අධ්‍යක්ෂද මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය නියෝජනය කරමින් කමිටු සාමාජිකයෙකු ලෙසක්‍රියාකිරීම.
- ලෝක පරිසර දිනය සැමරීමට සමගාමීව හරිත වෙරළක් ඇතිකිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කරනු ලබන රුක් රෝපණ වැඩසටහන් හා වෙරළ පවිත්‍ර කිරීමේ වැඩසටහන් වෙරළ සංරක්ෂණ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සමග එක්වක්‍රියාත්මක කිරීම.
- තව ද වෙරළ සම්පත් කළමනාකරණ පනත හා කළමනාකරණ සැලැස්ම සම්බන්ධව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේවැඩසටහනක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයෙහි සහභාගීත්වය ඇතිව සිදුකිරීම.
- ප්‍රධාන පාර්ශ්ව ආයතන දෙකක් ලෙස ක්‍රියාකරනු ලබන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමඟ මෙහෙවර 4 යටතේ සිදුකරනු ලබන විවිධ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- එමෙන්ම වෙරළ කලාපය තුල සිදුකෙරෙන අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සහ පාලනය, පරිසර ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කරන ගැටළු සම්බන්ධව මැදිහත්කරුවකු ලෙස මෙම අමාත්‍යාංශය ක්‍රියාකරන අතර එම ගැටළු සඳහා විසඳුම් ලබාදීමට කටයුතු කරයි.

හරිත ලංකා ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්මෙහි වෙරළ තීරය අවට මුහුදු පරිසර පද්ධති ලෙස පරිහරණය කිරීම යන මෙහෙවර 4 ට අදාල සියලුම ක්‍රියාකාරකම්වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සිදුකරනු ලබන අතර ඇතැම් ක්‍රියාකාරකම් පමණක් සම්බන්ධීකරණය කිරීමේ කටයුතු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ සිදුකරනු ලබයි.

මෙහෙවර 5: වගකීමෙන් යුතු ඉඩම් පරිහරණය

- **භූමි හායනය වැලැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාකාත්මක කිරීමේ ජාතික මෙහෙයුම් කමිටුව**

එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතියට අනුව ශ්‍රී ලංකාවේ භූමි හායනය වැලැක්වීම සහ නියඟයෙන් වන හානිය අවම කිරීම සඳහා 2002 වර්ශයේදී සකස් කර තිබූ ජාතික ක්‍රියාකාරී වැඩසටහන සම්මුතියේ දස අවුරුදු (2008-2018) උපායමාර්ග වලට අනුකූලව 2014 වර්ෂයේදී යාවත්කාලීන කරන ලදී. මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය, පසුවිපරම හා ඇගයීම සිදුකිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සභාපතිත්වයෙන් යුත් ජාතික මෙහෙයුම් කමිටුවක් 2015 ජූලි මස ස්ථාපිත කරන ලදී.

- **" වන රෝපා"ජාතික රුක් රෝපණ මාසය 2015 ඔක්තෝබර්**

ඉදිරි වසර තුනක කාලය තුළ රටේ වන ආවරණය 32% ක් දක්වා වැඩි කරගැනීමේ ඉලක්කය සපුරා ගැනීම පිණිස, රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් විසින් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික වැඩසටහන් යටතේ විශේෂ ක්‍රියාකාරකමක් වශයෙන් රුක් රෝපණය විධිමත් පරිදි හඳුන්වා දීම පිණිස "වන රෝපා" ජාතික රුක්රෝපණ වැඩසටහන 2015 ඔක්තෝම්බර් මාසය තුළ ආරම්භ කිරීමට 2015.09.25 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

මෙහිදී පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ දිස්ත්‍රික් වන නිළධාරීන් සහ මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් ප්‍රධානීන් වෙත උපදෙස් මාලාවක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මඟින් ලබාදුන් අතර පරිසර වක්‍රෙල්ඛයක් මඟින් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් සහ රාජ්‍ය සමාගම්වල සභාපත්වරුන් ට 2015 ඔක්තෝම්බර් මාසය තුළ "වන රෝපා" ජාතික රුක්රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කලයුත්තේ කෙසේද යන්න උපදෙස් ලබා දෙන ලදී.

ඒ අනුව හරිත ශ්‍රී ලංකාවක් බිහි කිරීම යන දැක්ම සහ "වනාවරණය රහිත නිසරු බිම් තීරුවල වන උයන් නිර්මාණය කිරීම" යන තේමාව යටතේ 2015 වසරේ ඔක්තෝම්බර් මාසය තුළ දිවයින පුරා රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශයට අයත් සියළුම ආයතන නිළධාර මහත්ම මහත්මීන්ගේ සහභාගිත්වයෙන් 2015. 10. 11 වන දින ගම්පොල නවදෙවිටහිදී මෙම ජාතික වැඩසටහනේ ප්‍රධාන උත්සවය පැවැත්වූ අතර එහිදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් අක්කර 3.5 ක පළතුරු, ඖෂධ, කොස්, කිතුල් හා අලංකරන පැල 1450 ක් සිටුවන ලදී. තවද එම උත්සවයට සහභාගීවූවන්ට පළතුරු පැල 2000ක් ද බෙදාදෙන ලදී.

- **එක්සත් ජාතීන්ගේ ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දිනය සැමරීම 2016, 17 ජූනි**

එක්සත් ජාතීන්ගේ ජගත් කාන්තාරකරණය වැලැක්වීමේ හා නියඟයේ ආදීනව පිටුදැකීමේ ජාත්‍යන්තර දිනය ජූනි මස 17 දිනට යෙදී තිබුණි. 1994 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කාන්තාරකරණය වැලැක්වීමේ හා නියඟයේ ආදීනව පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය (United Nations Convention to Combat Desertification) සම්මත කරගැනීමෙන් අනතුරුව මෙම දිනය ප්‍රකාශයට පත්කරන ලදී. ශ්‍රී ලංකාවේ කාන්තාරීකරණය වූ බිම් දක්නට නොලැබුන ද දැඩිලෙස සිදුවන පාංශුඛාදනය හේතුවෙන් භූමි හායනය නැතහොත් භූමියෙහි ඵලදායීතාවය අඩුවීම පිළිබඳව මෙම සම්මුතිය මඟින් දක්වන ලද අවධානය හේතුකොට ගෙන 1998 වර්ෂයේදී ශ්‍රී ලංකාව ද මෙම සම්මුතියෙහි පාර්ශ්වකරුවකු බවට පත්විය. එතැන් සිට වාර්ෂිකව මෙම දිනය සැමරීමේ කටයුතු රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම පාසල් සිසුන්ගේ දායකත්වය යටතේ සිදුකරනු ලබයි. මෙම සම්මුතියෙහි ශ්‍රී ලංකාවෙහි නියමු ස්ථානය වශයෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය කටයුතු කරනු ලබන අතර භූමි සම්පත් කළමනාකරණ අංශය විසින් එහි සියලු සම්බන්ධීකරන කටයුතු සිදුකරයි.

මෙවර ජගත් කාන්තාරකරණය වැලැක්වීමේ හා නියඟයේ ආදීනව පිටුදැකීමේ ජාත්‍යන්තර දින තේමාව වූයේ " යොමා සැමගේ දායකත්වය - සුරකිමු මිහිමවගේ තිරසර පැවැත්ම යන්නයි." පසුගිය කාල වකවානුව තුල ඇති වූ අයහපත් කාලගුණික තත්වය හේතුකොටගෙන ඇති වූ හදිසි ආපදා තත්වය හේතුවෙන් දිවයිනපුරා ඇතිවූ නාය යාම් හා භූමි හායන තත්වයන් සැලකිල්ලට ගනිමින් ජනතාව දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම යෝග්‍ය බවට අමාත්‍යාංශය තීරණය කරන ලදී. එහි දී භූමි හායනය අවම කරගැනීම සඳහා ජනතාව දැනුවත් කිරීම හා එම පණිවිඩය සමාජගත කලහැකි යෝග්‍යතම කාණ්ඩය වශයෙන් පාසල් සිසුන් සුදුසු වන බැවින් ආපදා තත්වයට මුහුණදුන් පාසල් දරුවන් අධ්‍යාපනය ලබන පාසලක් වශයෙන් හෙට්ටිමුල්ල බණ්ඩාරනායක මහා විද්‍යාලය තෝරා ගනිමින් මෙවර ජගත් කාන්තාරකරණය වැලැක්වීමේ දින සැමරුම් සිදුකරන ලදී. එහිදී සහභාගීවූ සිසුන්ගේ දැනුම පෝෂණය කිරීමේ අරමුණින් පාංශු සංරක්ෂණ ක්‍රමෝපායන් භාවිතා කරමින් භූමි හායනය වැළැක්වීම, ශ්‍රී ලංකාවේ නාය යෑම් පිළිබඳ වර්තමාන තත්වය හා ඒ සඳහා බලපාන හේතු සාධක හා ශ්‍රී ලංකාවේ භූමි හායනය අවම කිරීම තුලින් ජෛව විවිධත්වය සංරක්ෂණය යන තේමා ඔස්සේ විද්වතුන් කිහිපදෙනකු විසින් හරවත් දේශන පැවැත්වූ අතර පාංශු සංරක්ෂණය පිළිබඳ සිසුන් දැනුවත් කිරීමේ අත්පත්‍රිකාද බෙදා දෙන ලදී. තවද එදින වැඩසටහනෙහි අවසාන අදියර වශයෙන් භූමි හායනය හා නියගයේ ආදීනව පිටුදැකීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් පාසල අසල මාර්ගයේ ධාවනයවූ වාහනවල මෙවර ජගත් කාන්තාරකරණය වැලැක්වීමේ දින තේමාව සහිත ස්ටිකරයක් බැගින් ඇලවීම පාසල් පරිසර නියමුබට කණ්ඩායමේ සිසුන්ගේ දායකත්වය යටතේ සිදුවිය

- **දැනුවත් කිරීමේ වැඩමුළු**

i. ඇඹිලිපිටිය කලාප කාර්යාලයේ ගුරුභවතුන් සඳහා 2015 ඔක්තෝම්බර් මස 05ස් වන දින දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වූ අතර ඒ සඳහා ගුරු භවතුන් 300 ක් පමණ සහභාගී විය.

ii. උසස් පෙළ විෂය නිර්දේශයට අදාළව පරිසර විද්‍යාත්මක මූලධර්ම, ජෛව විවිධත්ව සංරක්ෂණය, ස්වභාවික සම්පත් කළමනාකරණය හා අන්තර්ජාතික සම්මුති,ඕසෝන් ස්ථරය ක්ෂයවීම පාලනය යන විෂයන් පිළිබඳමෙවර උසස් පෙළ විභාගයට මුහුනදෙන සිසුන් දැනුවත් කිරීම සඳහා 2016 මැයි 05 දින කොළඹ නාලන්ද විද්‍යාලයේදී මෙම වැඩමුළුවක් පවත්වන ලදී. වැඩමුළුව සඳහා සිසුන් 150ක් පමණ සහභාගී විය.

iii. 2016 ජූනි 05 දිනට යෙදී තිබූ ලෝක පරිසර දිනයට සමගාමීව සාමාන්‍ය පෙළ විෂය ධාරාවට අදාළ වන පරිදි ජෛව විවිධත්ව සංරක්ෂණය, ස්වභාවික සම්පත් කළමනාකරණය හාඛනිජ සම්පත් තිරසාර භාවිතය සම්බන්ධයෙන් 2016 ජූනි මස 02 දින මාතලේ රත්තොට ශ්‍රී පරාක්‍රම විද්‍යාලයේදී සහ 2016 ජූනි 03 වන දින මාතලේ සිරිමාවෝ බණ්ඩාරනායක මහා විද්‍යාලයේදි දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී. එක් වැඩසටහනකට සිසුන් 150ක් බැගින් සහභාගී විය.

- **ජාතික දැව ප්‍රතිපත්තිය සකස් කිරීම**

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමේ දී අඛණ්ඩව හා තරගකාරී මිල ගණන් වලට අමුද්‍රව්‍ය සැපයීම තහවුරු කිරීම වැදගත් වේ. දැව, ගොඩනැගිලි ඉදි කිරීමේ ක්ෂේත්‍රයේ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වන ප්‍රධාන අමුද්‍රව්‍යයකි. එසේම ගෘහ භාණ්ඩ නිෂ්පාදනය ද දැව සම්පත් මත රදා පවතී. ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ප්‍රධාන ගෘහභාණ්ඩ නිෂ්පාදකයා හා අපනයනකරු වීම තහවුරු කිරීම වස් වානිජ වන වගා සඳහා ආයෝජනය දිරි ගැන්වීම, වාණිජ වන වගාවන්හි පර්යේෂණ හා සංවර්ධන කටයුතු කිරීම හා දැව සංරක්ෂණය හා නව තාක්ෂණය ගෙන ඒම අත්‍යාවශ්‍ය වේ.

ආනයනික දැව සම්බන්ධයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා රේගුව හා අනෙකුත් දේශ සීමා සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආයතන සඳහා නිසි මාර්ගෝපදේශයන් ලබා දීම වැදගත් වේ. එමෙන් ම විවිධ අවශ්‍යතා සඳහා යොදා ගැනෙන ආනයනික දැව වල ගුණාත්මකභාවය තහවුරු කිරීම අත්‍යවශ්‍ය වේ. එම නිසා ඉහත කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික දැව ප්‍රතිපත්තියක අවශ්‍යතාව මතුව ඇත. තවද මෙම අමාත්‍යාංශයේ වන සම්පත් අංශය මූලික වීමෙන් ජාතික දැව ප්‍රතිපත්තියේ එක් අංගයක් වන දැව මිල ප්‍රතිපත්තිය මේ වන විට සකස් කර ඇත. එයට අමතරව ජාතික දැව ප්‍රතිපත්තිය සකස් කිරීමට අවශ්‍ය වන අනුකමිටු පත් කිරීමේ මූලික පියවර ද මේ වන විට ගෙන ඇත.

- **පරිසර සමුළුව - රත්තපුර දිස්ත්‍රික්කය**

2016/03/17 දින රත්තපුර සිවලි ක්‍රීඩාංගනයේ දී රත්තපුර දිස්ත්‍රික්ක් පරිසර සමුළුව පවත්වන ලදී. මෙම සමුළුවේ සම්බන්ධීකරය ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය මගින් සිදුකරන ලදී. සමුළුවට පූරුව වශයෙන් සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරනය, රැස්වීම් සම්බන්ධීකරණය මෙන්ම විශේෂයෙන් එළිදක්වන ලද පුවත් හසුන සහා ලිපි සම්පාදනය සම්බන්ධීකරණය ද මෙම අංශය මගින් සිදුකරන ලදී.

සමුළුවට පූර්ව වශයෙන් සිදුකරන ලද සංවර්ධන වැඩසටහනක් යටතේ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණයට අදාළ ව්‍යාපෘති වාර්තා අධ්‍යනය හා ඒවා අදාළ ආයතන සමග සම්බන්ධීකරණය, අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය, ශ්‍රී පාද වන්දනා ගමන්මගේ පහසුකම් වැඩිදියුනු කිරීමේ කටයුතු ආදියේ සම්බන්ධීකරණ කටයුතු මේ අතරින් ප්‍රමුඛ විය.

මෙහෙවර 6: කසලින් තොර වටපිටාවක්

ශ්‍රී ලංකාව තුල පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කරලීමේ ව්‍යාපෘතිය

කෙටි සාරාංශය :

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රීය සමාජවාදී ජනරජය විසින් ස්ටොක්හෝම් සම්මුතිය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම මඟින් පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල්ස් තුරන් කිරීම හා අවසාන බැහැර කිරීම එක් ප්‍රමුඛතායක් වන බැවින් ඒ සඳහා කඩිනම් අවධානයක් හා ක්‍රියා කිරීම හඳුනාගන්නා ලදී. දිගුකල් පවත්නා කාබනික දූෂක පිලිබඳ ස්ටොක්හෝම් සම්මුතිය සඳහා ශ්‍රී ලංකාව අත්සන් කිරීම 2001 සැප්තැම්බර් මස 05 වැනි දින සිදු කරන ලද අතර එහි අපරානුමත කිරීම 2005 දෙසැම්බර් මස 22 දින සිදු කරනු ලැබීය. ජාතික ක්‍රියාකාරී සැලැස්ම මඟින් ස්ථාපිත මූලික අරමුණු හා ප්‍රමුඛතා මඟින් මෙම ව්‍යාපෘතියේ අරමුණු සහ සාධාරණීකරණයේ මූලාරම්භය වේ.

ශ්‍රී ලංකාව තුල පොලි ක්ලෝරිනේටඩ් බයිෆිනයිල්ස් නිෂ්පාදනය ඉවත් කිරීම සඳහා පොලි ක්ලෝරිනේටඩ් බයිෆිනයිල්ස් කළමනාකරණය, ජාතික ක්‍රියාකාරී සැලැස්ම මඟින් ප්‍රමුඛතා ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇත. පොලි ක්ලෝරිනේටඩ් බයිෆිනයිල්ස් කළමනාකරණය පිලිබඳ විශේෂිත ගැටලුව අනුව ව්‍යාපෘතියේ මූලික අරමුණ ලෙස ඇතුළත්වූයේ (අ) ආනයන පාලනය සඳහා ප්‍රමාණවත් නීති රාමුවක් නොමැති වීම (ආ). පාරිසරික බලපෑම හා මූලික අදියරේ අධ්‍යයනය ප්‍රමාණවත් තරමට සිදු නොකිරීම (ඇ). විශ්ලේෂණය හා හඳුනාගැනීම සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් නොතිබීම (ඈ). පොලික්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් මිශ්‍රිත තෙල් හා උපකරණ පිළියම් කිරීම, ගබඩා කිරීම හා බැහැර කිරීම සඳහා පිළිගත් ක්‍රමවේදයක් නොතිබීම (ඉ). මිශ්‍රිත තෙල් සඳහා වැඩබිමක් හඳුනා ගත යුතු වීම (ඊ). පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල්ස් සහිත තෙල් හා එම සංයෝග අඩංගු නොවන තෙල්

විවිධාකාරයෙන් සිදුවන මිශ්‍රවීම. මේ නිසා රජය විසින් පොලි ක්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් ගැටළුව විසඳීමේදී විවිධාකාර අපහසුතාවලට මුහුණ දී ඇත. ඒවා නම්:
(අ) දැනුවත් කිරීමේ පහළ මට්ටමකින් පැවතීම හා තොරතුරු බෙදා හැරීම සඳහා සම්පත් අඩුකම
(ආ). නීති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා පැවතීම (පොලික්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් භාවිතයේදී පරිසරයට මුදා හැරීම පිළිබඳ නීති හා හඳුනාගැනීම සඳහා තාක්ෂණික හැකියාව නිහකම)
(ඇ). වෙනත් රජයේ ක්‍රියාකාරිත්වයන්ගේ ස්ථීර වගකීමක් නොමැති කම සහ පුද්ගලික අංශයේ සහභාගිත්වය වැඩිකිරීමේ අවශ්‍යතාවය

මෙම ව්‍යාපෘතියේ සමස්ත අරමුණ වූයේ සඳහා පරිසර හිතකාමී කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම මඟින් පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය සංචිත හා පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ වලින් සිදුවන නිකුත් කිරීම් පරිසර හිතකාමී ආකාරයට අඩු කිරීම හා ඉවත් කිරීම සිදුකිරීමයි. තවද, පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා තෙල් හා උපකරණ ආරක්ෂිත /මිශ්‍ර නොවන ලෙස ටොන් 1000ක් බැහැර කිරීම හා ධාරිතා වර්ධනය කිරීම, දැනුවත් කිරීම හා ප්‍රතිපත්තිමය ගැටළු පිළිබඳ යොමු වීම සිදු කෙරේ.

ශ්‍රී ලංකා රජය විසින් ස්ටොක්හෝම් සම්මුතියේ බැඳීම් ළඟා කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර පොලික්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් ඉවත් කිරීම මඟින් ගෝලීය වශයෙන් විෂ රසායන අපද්‍රව්‍ය පාලන කිරීම සඳහා සහයෝගය දක්වනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පහත ප්‍රතිඵල ළඟා කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

- පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් සම්බන්ධ කරුනු පිලිබඳව ආයතනික ධාරිතා වර්ධනය, පාර්ශවකරුවන් දැනුවත් කිරීම හා ශක්තිමත් කිරීම
- පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් සම්බන්ධ ප්‍රතිපත්ති හා නීතිරීති ඇති කිරීම හා බලාත්මක කිරීම
- පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල්ස් අපද්‍රව්‍ය සහ පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අන්තර්ගත උපකරණ බැහැර කිරීම
- ව්‍යාපෘති කළමනාකරණය නියාමනය හා ඇගයීම ඇති කිරීම

ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමරිකන් ඩොලර් 23, 714,752 වන ඉන් ඇමරිකන් ඩොලර් 4, 725,000 ක් ගෝලීය පාරිසරික පහසුකම මඟින් ලබා දෙන අතර ඇමරිකන් ඩොලර් 18, 989,752 දායකත්ව මුදල වේ. මහවැලි සංවර්ධන හා පර්සර අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘතියේ සංරක්ෂක වන 1 හා 2 ක්‍රියාත්මක වන අතර සංරවක 3 හා 4 එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන ආයතනය විසින් වගකීම දරනු ලැබේ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සඳහා වූ කොන්ත්‍රාත් මුළු පිරිවැය ලෙස ඇමරිකන් ඩොලර් 760,000 ක් වේ.

<u>2015 ජූලි 01 වෙනි දින සිට 2016 ජූනි 30 දක්වා වූ ළඟා කර ගත් මූලික ඉලක්ක:</u>

i. ශ්‍රී ලංකාව තුල පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කරලීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතීන් ලැබී ඇත.

ii. ශ්‍රී ලංකාව තුළ පරිසරයට අහිතකර අපද්‍රව්‍ය හා රසායනික කළමණාකරණය කිරීමේ වැඩසටහන පිළිබඳ කැබිනට් පත්‍රිකාවට අනුව එහි සඳහන් ව්‍යාපෘතීන් සඳහා මූල්‍යමය ප්‍රතිපාදන වෙන්කිරීමටත් ජාතික ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය කිරීමත් හා දැනට සේවය කරන නිලධාරීන්ගෙන් තනතුරු පුරප්පාඩි පිරවීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

iii. ශ්‍රී ලංකාවේ පොලික්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් තොග ගණනය කිරීම සකස් කිරීම සඳහා 2016 දෙසැම්බර් 16 වෙනිදා සාකච්ඡාවක් පවත්වන ලදී.

iv. ලංකා විදුලිබල මණ්ඩලයට අයත් තෝරාගත් ට්‍රාන්ස්ෆෝමර් වල පොලික්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් තිබෙදැයි පරීක්ෂා කිරීම (මෙම ක්‍රියාකාරකම සඳහා ව්‍යාපෘති මූලික අදියරේ ඉතිරි වූ මුදල මුදල කාර්මික තාක්ෂණ ආයතනය වෙත ලබා දෙනු ලැබේ.)

v. පොලික්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් මඟින් සිදුවන බලපෑම් අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීම හා වෑල්ඩින් උපකරණවල පොලික්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් තිබෙදැයි පරීක්ෂා කිරීම (මෙම ක්‍රියාකාරකම සඳහා ව්‍යාපෘති මූලික අදියරේ ඉතිරි වූ මුදල පීපල්ස් ට්‍රු පීපල්ස් වොලන්ටීයර්ස් ආයතනයවෙත ලබා දෙනු ලැබේ.)

vi. අභ්‍යාස පොත් (සිංහල මාධ්‍යයෙන් 75000ක පිටපත් හා දෙමළ මාධ්‍යයෙන් 25000 ක පිටපත්) මුද්‍රණය කිරීම හා රෙදි බෑග් 4000ක් නොනැසී පවතින රසායන ද්‍රව්‍ය වලින් බලපෑම සිදුවන දුෂ්කර පාසල් ළමුන් සඳහා බෙදා හැරීම

vii. ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශිය නිලධාරීන් සඳහා පොලික්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

<u>මිනමාටා සම්මුතිය පිළිබඳ ශ්‍රී ලංකාවේ මූලික තක්සේරුව</u>

සාරාංශය:

ශ්‍රී ලංකාව මෙම සම්මුතිය අත්සන් කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2014/10/08 දින ලබා දෙන ලදී.මෙම අමාත්‍ය මණ්ඩල තීරණයට ප්‍රථම මෙම සම්මුතිය අත්සන් කිරීමෙන් ලැබෙන වාසි අවාසි පිළිබඳව නිල කමිටු වාර්තාවක් සකස් කිරීම සඳහා නිර්දේශ කරන ලදි.මෙම සම්මුතිය අත්සන් කිරීමට පෙර මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මඟින් අදාළ පාර්ශවයන් සමඟ වැඩමුළු හා රැස්වීම් පවත්වමින් එකිනෙකට වෙනස් වූ අංශ වලදී මෙම ගැටළුව සම්බන්ධව දැනුවත් කිරීම් හා අදාළ අංශ වල වර්තමාන තත්වය පිළිබඳව ඔවුන්ට අදහසක් ලබාගැනීමට අවස්ථාව සලසන ලදි. එයට අමතරව පහත දැක්වෙන අංශ පිළිබඳව අධ්‍යනයක් සිදු කරන ලද අතර ඒවායෙන් ලබාගත් දත්ත/ තොරතුරු මෙම සම්මුතිය අපරමානුගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කල පසු යොදාගත හැකිවනු ඇත. ඒ හා සමගාමීව අනෙකුත් ක්‍රියාකාරකම් සිදු කළ හැක.

i. රසෞඛ යොදා ගැනීම පිලිබඳ වෙළෙඳපොළ සමීක්ෂණයක් සිදුකිරීම.

ii. රාජ්‍ය සෞඛ්‍යය අංශයේ දන්ත සෞඛ්‍ය ආශ්‍රිත රාජකාරිවල නියැලෙන සේවකයන් අතරින් මිනිස් පටකවල රසදිය තැන්පත් වී ඇති ප්‍රමාණය තිරණය කිරීම.

iii. සිද්දි අධ්‍යනයක් මඟින් (case study) ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය හිසකේ තුළ රසදිය ප්‍රමාණය පිළිබඳව සංසන්ධනාත්මක අධ්‍යනයක් කිරීම.

iv. සෞඛ්‍යය අංශයේ ඇති රසදිය අඩංගු උපකරණ ඉවත් කිරීමේ අවධියක් (Phasing out)ඇති කිරීම.

v. රූපලාවන්‍ය ක්ෂේත්‍රය සඳහා යොදාගන්නා නිෂ්පාදන පිළිබඳ වෙළෙඳපොළ සමීක්ෂණයක් සිදුකිරීම(කොල් ආලේපන, පැහැපත් වීමේ ආලේපන

<u>සම්මුතිය අවසන් කිරීමෙන් පසු ලබාගත් ප්‍රගතිය</u>

i. GEF ආයතනය විසින් මෙම සම්මුතිය අපරමාණුගත කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අනුමැතියමේ සඳහා වන තාක්ෂණික සහය UNIDO ආයතනයෙන් ලැබීමට නියමිත අතර පළමු ජාතික වැඩමුළුව දැනටමත් පවත්වා අවසන්ය.

මෙම ව්‍යාපෘතිය මඟින් පහත සඳහන් ඉලක්ක ලඟ කරගැනීමට අපේක්ෂිතය.

නිමැවුම 01 - රසදිය සම්මුතිය ක්‍රියාත්මක කිරීමට බලපාන්නාවූ ආයතනික අඩු ලුහුඬුකම් හා ජාතික සම්බන්ධීකරණය ඇතිකිරීම.

නිමැවුම 02 -දැනට පවතින රසදිය සම්බන්ධ නීති හා රෙගුලාසි සමාලෝචනය හා මිනමාටා සම්මුතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම

නිමැවුම 03 - ජාතික රසදිය පැතිකඩක් (Profile) ස්ථාපිත කිරීම, එයට සෞඛ්‍ය හා පාරිසරික බලපෑම් ඇගයීමක් ඇතුළත් කිරීම, හඳුනාගත් ඉන්වෙන්ධරි හා ප්‍රධාන අංශ මත පදනම් වී රසදිය භාවිතය අඩුකිරීම සඳහා මැදිහත්වීම හා ඒ සඳහා මූල්‍ය ආධාර සැපයීම සහ හැකිතාක් දුරට රසදිය භාවිතය, මුදා හැරීම හා විමෝචනය අඩුකිරීම.

නිමැවුම 04 -අදාළ පාර්ශවයන් අතර (අධ්‍යනය, මහජන, පෞද්ගලික හා සිවිල් සමාජ) තොරතුරු බෙදාහැරීම,රසදිය නිසා සිදුවන සෞඛ්‍ය හා පාරිසරික බලපෑම පිළිබඳව දැනුවත් කිරීම.

ii. ශ්‍රී ලංකාවේ වැසි ජලයේ ඇති රසදිය නිර්ණය කිරීම සඳහා අප දැනටමත් ආසියානු පැසිෆික් රසදිය මන්තු කිරීමේ ජාලය(Asia Pacific Mercury Monitoring Network (APMMN) සමඟ සන්නිවේදනය කර ඇත. APMMN වලට අයත් ප්‍රවීණයන් ශ්‍රී ලංකාවට කිහිපවරක් පැමිණ ඇති අතර ඔවුන් නුවර පවතින කාළගුණ දෙපාර්තමෙන්තුවට අයත් මහනුවර කටුගස්තොට පරිශ්‍රයේ ඇති වැසි ජලයේ ඇති රසදිය ප්‍රමාණය පරීක්ෂා කිරීමේ අංශයක් ස්ථාපිත කිරීමට එකඟවී ඇත. තවදුරටත් මේ සඳහා APMMN ආයතනය විසින් මිනුම් උපකරණ නොමිලේ ලබාදීමටත් සාම්පල තායිවානයේ පරීක්ෂා කිරීමටත් එකඟවී ඇත. අදාළ පද්ධතිය ස්ථාපිත කළ පසු අපට ශ්‍රී ලංකාව හරහා දේශ සීමා අතර ගමන් කිරීමට හැකි රසදිය පිළිබඳව මන්තු (Monitor) කිරීමට හැකිවනු ඇත.

ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

නාගරික ඝන අපද්‍රව්‍ය උත්පාදනය වීම ඉතාමත් උග්‍ර ලෙස පසුගිය දශක කිහිපය තුළ වැඩිවූයේ ජනගහන වර්ධනය, නාගරීකරණය ආදි හේතූන් වල ප්‍රතිඵලයක් ලෙසයි. වර්තමානයේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය නාගරික ඝන අපද්‍රව්‍ය ගැටළුව සඳහා සමෝධානික ඝන අපද්‍රව්‍ය කළමණාකරණ (ISWM) සැලැස්මක් සකසමින් පවතී අවශ්‍ය අනුග්‍රහය UN-HABITAT මඟින් සැපයේ.ක්ෂේත්‍රයෙන් එකතුකරගත් ඝන අපද්‍රව්‍ය සංයුතිය සම්බන්ධ දත්ත පදනම් කරගනිමින් අපද්‍රව්‍යය කළමනාකරණය සඳහා වැඩ සුදුසු ආර්ථිකමක්‍රමවේදයක් මත පදනම්ව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. එසේම අමාත්‍යාංශය දැනට බස්නාහිර පළාත් සභාවේ හා නුවර දිස්ත්‍රික්කයේ ගොහාගොඩ ප්‍රදේශ සඳහා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩපිළිවෙලක් අදාල ආයතන සමඟ එක්ව ක්‍රියාත්මක කරමින් සිටී.

දිගුකල් පවත්නා කාබනික දූෂක (POPs) පිළිබඳ වූ ස්ටොක්හෝම් සම්මුතිය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NIP) සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම සඳහා වන ව්‍යාපෘතිය -

වැය ශීර්ෂ අංකය: 160-02-03-09-2405-13

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, දිගුකල් පවත්නා කාබනික දූෂක පිළිබඳ වූ ස්ටොක්හෝම් සම්මුතියේ හත්වැනි වගන්තිය යටතේ, පාර්ශවකරුවන් විසින් එම සම්මුතිය යටතේ රට කෙරෙහි වන බැඳීම් ක්‍රියාත්මක කිරීම පිණිස, පාර්ශවය බලාත්මක වූ දින සිට වසර දෙකක් තුල සකසා ඉදිරිපත් කරන ලද ජාතික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය හා යාවත්කාලීන කර පාර්ශව සමුළුව වෙත ඉදිරිපත් කිරීමයි. එමගින් සැලැස්ම සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීමට අවශ්‍ය ඌනතා සම්පූර්ණ වනු ඇත. මෙමගින් නවක කල් පවත්නා කාබනික දූෂක 9 සම්බන්ධ

කරමින් අතිරේක පාර්ශවකරුවන් මගින් ජාතික සම්බන්ධීකරණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම, නවක කල් පවත්නා කාබනික දූෂක පිළිබඳ සම්බන්ධ ගැටළු සඳහා විශේෂඥ දැනුම ඇති (ප්‍රවීණයන්) සමඟ වැඩකරන කණ්ඩායම් පිහිටුවීම, ආරම්භයේ පැවති දිගුකල් පවත්නා කාබනික දූෂක 12 පිළිබඳව ඇති වාර්තා සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම, නවක කල්පවත්නා කාබනික දූෂක කළමනාකරණය කිරීම සඳහා නියාමන හා ප්‍රතිපත්ති රාමුව, ආයතනික ධාරිතාව තක්සේරු කිරීම ඇතුළු අදාල අරමුණු හා ක්‍රියාකාරී සැලැස්ම සඳහා ප්‍රමුඛතාවය දීමෙන් නවක කල්පවත්නා කාබනික දූෂක 9 අඩුකිරීමට හා නිමකිරීම සැලසුම් සකස් කරනු ලබයි.

- ***2015.07.01 දින සිට 2016.06.30 දක්වා කාලය තුළ ඉටුකල ප්‍රධාන ක්‍රියාකාරකම්***

i. **නවක දිගුකල් පවත්නා කාබනික දූෂකවල අවදානම හා ඒ සම්බන්ධ ප්‍රතිපත්ති බලපෑම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ඇති කිරීම.**

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවීම, විශේෂඥයින් බඳවා ගැනීම, ව්‍යාපෘති සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් නැවත ස්ථාපිත කිරීම හා වැඩකිරීමේ කණ්ඩායම් සමඟ හිවිසුම් ගත වීම.

නවක කල්පවත්නා කාබනික දූෂක හා ඒවායේ ඇති අවධානම හා ප්‍රතිපත්ති බලපෑම් පිළිබඳ පාර්ශවකරුවන් හා මහජනතාව දැනුවත්කිරීම හා උපදෙස් ලබා දීම

2015 ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද ජාතික මෙහෙයුම් කමිටුවේ 6වන කමිටු රැස්වීමේදී, දිගුකල් පවත්නා කාබනික දූෂක පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳ උපාය මාර්ගික මාධ්‍ය වැඩසටහන් කෙටුම්පත් කිරීම සඳහා මාධ්‍ය උපදේශකවරයෙකු පත්කරගැනීම සඳහා තීරණය කරන ලදී. ඒ සඳහා Daily News පුවත්පතෙහි දැන්වීමක් පලකරන ලදී.

දිගුකල් පවත්නා කාබනික දූෂක හා අපද්‍රව්‍ය විවෘත දහනය කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන:
මෙමගින් සිදුවන සෞඛ්‍ය, පාරිසරික හා සමාජීය ගැටළු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2015 නොවැම්බර් මස 06 දින පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

ii. **පාර්ශවකරුවන් විසින් නවක කල් පවත්නා කාබනික දූෂක පිළිබඳ වාර්තා (හා ආරම්භයේ පැවති දිගුකල් පවත්නා කාබනික දූෂක 12) යාවත්කාලීන කිරීම.**

දිගුකල් පවත්නා කාබනික දූෂක පිළිබඳව (අනභිප්‍රායික දිගුකල් පවත්නා කාබනික දූෂක uPOPs, පලිබෝධනාශක, පොලිබ්‍රෝමිනීනේටඩ්ඩයිපෙනිල් ඊතර් PBDE, පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් PCBs, පර්ෆ්ලුවොරොඔක්ටෙන් සල්ෆොනික් අම්ලය PFOS) වාර්තා හා ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අවසාන වාර්තා සාදන ලදී.

සාම්පල කීපයක පොලිබ්‍රෝමිනීනේටඩ්ඩයිපෙනිල් ඊතර් (PBDE) පරීක්ෂා කිරීම/ විශ්ලේෂණය කිරීම සඳහා, එක්ස් කිරණ ප්‍රතිදීප්ත විශ්ලේෂක යන්ත්‍රය (XRF) යොදා ලබාගන්නා ලද ප්‍රතිපල
PBDEs වාර්තාව සඳහා ඇතුලත් කර ඇත.

iii. **ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 4ක් පහත දැක්වෙන දිනවලදී පවත්වන ලදී.**
2015 අගෝස්තු 04, 2015 අගෝස්තු 25, 2015 ඔක්තෝබර් 13 හා 2016 ජනවාරි 14

iv. **හඳුනාගන්නා ලද නවක කල්පවත්නා කාබනික දූෂක කළමනාකරණය සඳහා ජාතික හැකියාව හා පාර්ශවකරුවන් විසින් පෙන්වාදෙන ලද දිගුකල්පවත්නා කාබනික දූෂක වල අවදානම් අඩුකිරීමේ විකල්ප සඳහා ප්‍රමුඛත්වය:**

දිගුකල් පවත්නා කාබනික දූෂක සඳහා වූ වාර්තාවලදී හඳුනාගත් අදාල අඩුපාඩු හා නිර්දේශ ඇතුලත්කරන ලද අතර, අවසානයේදී ඒවා ජාතික ක්‍රියාකාරී සැලැස්මට ද ඇතුළත් කරන ලදී.

යාවත්කාලීන කරන ලද ජාතික ක්‍රියාකාරී සැලැස්ම රජය විසින් අනුමැතිය සඳහා ස්ටොක්හෝම් සම්මුතියේ සමුළු පාර්ශවකරුවන් වෙත ඉදිරිපත්කරන ලදී.

අමාත්‍යාංශය විසින් පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් සඳහා දීපව්‍යාප්ත සමීක්ෂණයක් සේවා මධ්‍යස්ථාන හා වෙල්ඩින් ශාඛා හා වතු අංශය ආශ්‍රිතව සම්බන්ධීකරණය කරන ලදී.

මෙහෙවර 7: සැමට සැමදා ජලය

පවිත්‍ර ගංගා වැඩසටහන

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් 1998 වර්ෂයේදී මෙම පවිත්‍ර ගංගා වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙස කැළණි ගඟ සඳහා ආරම්භ කරන ලදී. මෙහි මූලික අරමුණ වුයේ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් කැළණි නදී ජල තත්ත්වයට හා ඒ අවට පරිසරයට සිදු වන බලපෑම් පාලනය කිරීම සඳහා ඒ හා සම්බන්ද රාජ්‍ය ආයතන සහභාගිත්වයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරීමයි.

I. කැළණි ගංගා ද්‍රෝණියේ පරිසර හූමී පරිභෝජන රටා හා දූෂණ ප්‍රභව හඳුනා ගැනීම හා සිතියම් ගත කිරීම.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණික දැනුම උපකාරයෙන් කැළණි ගංගා ද්‍රෝණියේ භූමී පාරිභෝජන රටා හා පරිසර දූෂක ප්‍රභව හඳුනාගැනීම හා සිතියම් ගත කිරීම සිදු කරන ලදී. මෙහි මූලික අරමුණ වුයේ මෙම භූමී පරිභෝජන රටා හා පරිසර දූෂක ප්‍රභව හඳුනාගෙන සිතියම් ගත කිරීමෙන් භූගෝලීය තොරතුරු දත්ත පද්ධතියක් සැකසීම හා ඒ මඟින් ලැබෙන තොරතුරු කැළණි නදියේ දූෂණ පාලනය සම්බන්ද තීරණ ගැනීමේදී දායක කර ගැනීම.

II. ජල තත්ත්ව වාර්තා සකස් කිරීම හා ඒවා ඇතුලත් කොට වෙබ් අඩවියක් හා දත්ත පද්ධතියක් සකස් කිරීම.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ තාක්ෂණික දැනුම ආධාරයෙන් ජල තත්ත්ව වාර්තා වල ඇති තොරතුරු එක් රැස් කොට තොරතුරු දත්ත පද්ධතියක් ගොඩනැගීම තුලින් කැළණි නදියේ ජල තත්ත්වයන්ගේ අවකාශීය හා කාලීන වෙනස් වීම් දැනගැනීමේ අරමුණින් එම දත්ත ඇතුලත් කොට වෙබ් අඩවියක් හා තොරතුරු දත්ත පද්ධතියක් සකස් කිරීම.

III. පවිත්‍ර ගංගා වැඩසටහන සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම.

IV. Every Drop Matters ව්‍යාපෘතිය.

ජල ප්‍රභව නිසියාකාරව කළමනාකරණය කිරීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ Every Drop Matters ව්‍යාපෘතිය දියත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය මඟින් වර්ෂ 2012 සිට පවිත්‍ර ගංගා වැඩසටහනේ ක්‍රියාකාරකම් සිදු කිරීමේදී දායකත්වය සපයන ලදී.

- පළාත් පාලන ආයතන 13 සඳහා පරිසර විසඳුම් සැලසුම් කරන ලදී.(සමෝධානික පාරිසක විසඳුම් සැලසුම්)
- පළාත් පාලන ආයතන මූලික කර ගනිමින් පරිසර දූෂණය අවම කර ගැනීම පිළිබඳව රාජ්‍ය නිලධාරීන්, ප්‍රජා සංවර්ධන නිලධාරීන් සඳහා වැඩමුළු පවත්වන ලදී.
- දිගුකාලීන හෝ මාධ්‍ය කාලීන ප්‍රතිපත්ති සකස් කිරීමේදී ඒ සඳහා නිර්දේශ ලබා ගැනීමේ අරමුණින් කැළණි ගඟේ අවිස්සාවේල්ලේ සිට මෝදර දක්වා අප ජල පියසටහන පිලිබඳ අධ්‍යනයක් සිදු කරන ලදී.
- පරිසර දූෂණ පාලන සඳහා කැළණි ගඟ ආශ්‍රිතව කාර්මික ජල දූෂණය හා රසායනික දූෂක පළිබඳ අධ්‍යනයක් සිදු කරන ලදී.

V. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් කැළණි ගඟේ පවතින පරිසර ගැටළු අවම කරගැනීමේ අරමුණින් නව ව්‍යාපෘති යෝජනාවක් සකස් කරමින් පවතී. මෙම යෝජනාව තුලින් ජල දූෂණය අවම කරමින් ජෛව විවිධත්වය ආරක්ෂා කර ගනිමින් කැළණි නදියේ පුළුල් තිරසර සංවර්ධන සහිත වැඩසටහනක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

මෙහෙවර 8: සෞඛ්‍ය හා සමෘද්ධිය උදෙසා හරිත නගර

නීල හරිත ලස්සන ලංකා හරිත සුහුරු ගම්මාන 10000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ 21 සැසිය , නොවැම්බර් මස 30 වැනි දින සිට දෙසැම්බර් 11 වන දක්වා ප්‍රංශයේ පැරිස් නුවර පැවති අතර 2015 පැරිස් ගිවිසුම එහිදී ලෝකයේ ජාතීන් විසින් ප්‍රකාශයට පත් කරන ලදි. ඒ අනුව, ඉහත ගිවිසුම මත ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම පාලනය හා සමගාමීව කටයුතු කිරීමට මෙම රටවල් විසින් විවිධ උපායමාර්ග අනුගමනය කිරීමට නියමිතව ඇත. පැරිස් රාජ්‍ය නායක සමුළුව පෙර හා පසු පවත්වන ලද අංශයේ විශේෂඥ සමුළුවක් හා වැඩමුළු හරහා, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම පාලනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂිත ජාතික වැඩසටහන් තීරණය කිරීම සඳහා කටයුතු කරනු ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ දේශගුණික වෙනස්වීම් හා අනාගත සංවර්ධන උපාය මාර්ග පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් - Sri Lanka Next නීල හරිත යුගයක් ජාතික වැඩසටහන ඉදිරිපත් කරන ලදී.එම වැඩසටහනේ අංගයක් ලෙස නීල හරිත ලස්සන ලංකා හරිත සුහුරු ගම්මාන 10000ක් වසර 2016 – 2020 තුලදී සංවර්ධනය කිරීමේ වැඩසටහන සනස, සර්වෝදය, දිවිනගුම වැනි ප්‍රජා සංවිධාන වල සහභාගීත්වය ඇතුව ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.මේ සඳහා කැබිනට් අනුමැතිය 2016 මාර්තු 26 දිනැති CM/16/0377/704/011 අංක දරන කැබිනට් පත්‍රිකාව මගින් ලබාදී ඇත.
මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.


- සියබලාගමුව ප්‍රදේශයේ ජනතාවගේ සහභාගීත්වයෙන් ග්‍රාමීය ඇගයුම් වැඩසටහනක් පවත්වන ලදී.





- විපර්යකාරකයන් 100ක් පුහුණු කිරීමේ වැඩමුළු දෙකක් සනස විශ්ව විශ්ව විද්‍යාලය තුල පවත්වන ලදී.





මෙහෙවර 9: කර්මාන්ත හරිතකරණය

ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය සහ මාර්ගෝපදේශ සැදීම

ශ්‍රී ලංකාවේ 2006 සිට දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී පාරිසරික බලපෑම් සැලකිල්ලට නොගනී.හරිත ප්‍රසම්පාදනය යනු රජයේ භාණ්ඩ ප්‍රසම්පාදනයේදී ඇතිවන පාරිසරික බලපෑම් සැලකිල්ලට ගනිමින් කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලියක් වේ.

හරිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා කැබිනට් අනුමැතිය 2012 වසරේදී ලැබුණු අතර එහි දී විශේෂයෙන් දේශීය නිෂ්පාදන සඳහා ප්‍රමුඛ ස්ථානයක් සැපයීමට ද තීරණය වුනි.මේ අනුව තිරසර සංවර්ධන අංශය විසින් 2015 වසරේදී අදාල පාර්ශවකරුවන් හා සම්බන්ධීකරණයෙන් හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති මූලික කෙටුම්පතක් සකස් කරන ලදී. මෙම මූලික කෙටුම්පත අදාල පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම් වල අදහස් අනුව ප්‍රධාන තේමා අංශ නවයක් යටතේ වැඩි දුරටත් දියුණු කරන ලදී.
ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය රාජ්‍ය දැව සංස්ථාවේ "සප්ත පරිසර මණ්ඩපයේ " ට සමුළුවේ දී 12.05.2016 දින පැවති වැඩමුලුවකින් හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 29.03.2016 දින පැවති වැඩමුලුවකින් අදාළ පාර්ශවකරුවන් සමග තහවුරු කරන ලදී.





ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පැවති ප්‍රතිපත්ති තහවුරු කිරීමේ වැඩමුළුව

LIBRARY
MINISTRY OF ENVIRONMENT

සම්පත් කාර්යක්ෂමතා සහ සුපිරිසුදු නිෂ්පාදන ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම

තිරසර නොවන පරිභෝජන රටා හේතුවෙන් ස්වාභාවික සම්පත් කෙරෙහි ඇති ඉල්ලුම් දිනෙන් දින වැඩි වෙමින් පවතී.එනමුදු සුපිරිසිදු නිෂ්පාදනය ක්‍රියාත්මක කිරීම මගින් සම්පත් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිකර ස්වභාවික සම්පත් ක්ෂයවීම අඩු කර දූෂණය සහ නිෂ්පාදන පිරිවැය අවම කරගත හැකිබව ගෝලීයව පිළිගෙන ඇත. එමෙන්ම මෙය ජාත්‍යන්තර වෙළඳ පොළ තුළ තරඟකාරී වීම සඳහා කාර්මික හා සේවා අංශ සඳහා පහසුකම් සලසනු ඇත.

ඒ අනුව සුපුරිසිදු නිෂ්පාදනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ග වසර 2005 දී ජාතික සුපිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානය ඇතුළු සියලු පාර්ශවකරුවන් හා එක්ව සකසන ලදී.මෙම සකසන ලද ජාතික සුපිරිසිදු නිෂ්පාදන ප්‍රතිපත්තියේ අරමුණු වන්නේ තිරසර සංවර්ධනය ලගා කර ගැනීම, පාරිසරික ගුණාත්මකභාවය වැඩි කිරීම, පරිසර කාර්යක්ෂමතාවය වැඩි කිරීම, ජීවන තත්වය උසස් කිරීම හා දිළිඳුකම තුරන් කිරීමයි.සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වූ සුපුරිසිදු නිෂ්පාදනය ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය වසර 2007 දී සකසන ලද අතර සංචාරක හා ඩීවර ක්ෂේත්‍රයන් සඳහා වූ සුපුරිසිදු නිෂ්පාදනය ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය වසර 2008 දීත් කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා වූ ප්‍රතිපත්තිය හා උපායමාර්ගය වසර 2010 දීත් සකසන ලදී.

➢ මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- **සුපිරිසිදු නිෂ්පාදනය සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුවේ දෙවැනි රැස්වීම**

සුපිරිසිදු නිෂ්පාදනය සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටු දෙවන රැස්වීම නාගරික සංවර්ධන අධිකාරියේ සම්මන්ත්‍රණ ශාලාවේදී 29.12.2015 පැවත් විය. සෞඛ්‍ය සංචාරක ව්‍යාපාරය , ඩීවර හා කෘෂිකර්ම යන අංශවල ආංශික සුපිරිසිදු නිෂ්පාදන ප්‍රතිපත්ති සහ උපාය මාර්ගයන්හි ප්‍රගති සමාලෝචනය සහ වැවිලි ක්ෂේත්‍රය සඳහා ජාතික සුපිරිසිදු නිෂ්පාදන ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම පිළිබඳ සාකච්චාවක් මෙම රැස්වීමේදී සිදු කරන ලදී.







සුපිරිසිදු නිෂ්පාදනය සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුවේ දෙවැනි රැස්වීම

- **ශ්‍රී ලංකාව තුළ සුපිරිසිදු නිෂ්පාදන වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා අත් පත්‍රිකාවක් නිර්මාණය කිරීම**

සුපිරිසිදු නිෂ්පාදන ජාතික පනිපත්ති සහ උපාය මාර්ග පිළිබඳව හා සුපිරිසිදු නිෂ්පාදන සංකල්පය, අරමුණු, ප්‍රතිලාභ හා උපාය මාර්ග පිලිබඳව දැනුවත් කිරීම සඳහා අත් පත්‍රිකාවක් කර්මාන්ත ප්‍රජාව, රජයේ ආයතන හා අනෙකුත් පාර්ශවකරුවන් අතර බෙදා දීමට 2015 දී නිර්මාණය කරන ලදී ,





ශ්‍රී ලංකාව තුළ සුපිරිසිදු නිෂ්පාදන වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා සකසන ලද අත් පත්‍රිකාව

- **වැවිලි ක්ෂේත්‍රය සඳහා ජාතික සුපිරිසිදු නිෂ්පාදන ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග සැකසීම**

වැවිලි ක්ෂේත්‍රය සඳහා වූ ජාතික සුපිරිසිදු නිෂ්පාදන ප්‍රතිපත්තිය සහ උපායමාර්ග කෙටුම්පත 21.08.2015 හා 16.10.2015 යන දිනයන්හි දී කෘෂිකර්ම අමාත්‍යංශයේ අපනයන කෘෂිකර්ම අංශයේ රැස්වීම් ශාලාව තුල පැවති වැඩමුළු තුලින් තවදුරටත් වැඩි දියුණු කරන ලදී.තවද ප්‍රතිපත්ති තහවුරු කිරීමේ වැඩමුළුවක් 02.12.2015 දින රාජ්‍ය දැව සංස්ථාවේ සප්ත පරිසර මණ්ඩපය තුල දී සකස් කරන ලදී.තහවුරු කරන ලද ප්‍රතිපත්තිය 29.12.2015 දින පැවති ජාතික මෙහෙයුම් කමිටු රැස්වීමේ දී ඉදිරිපත් කරන ලදී.


මෙහි දී ලැබුණු අදහස් හා යෝජනා ප්‍රතිපත්තියට අන්තර්ගත කොට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් සමග ප්‍රතිපත්ති කෙටුම්පත වැඩි දියණු කිරීමේ සාකච්ඡාවක් 06.06.2016 දින පවත්වන ලදී.





- **දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

ප්‍රතිපත්තිය තහවුරු කිරීමට හා වැඩිදියුණු කිරීම සඳහා පැවති වැඩමුළු සුපිරිසිදු නිෂ්පාදනය පිලිබඳව ජාතික මෙහෙයුම් කමිටු සාමාජිකයන් හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 20.06.2016 දින මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.





සුපිරිසිදු නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

- **ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම**

පරිසර රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රයන්හි තිරසර කාර්ය සාධනය වාර්තා කිරීම පිණිස වර්ෂ 2011 දී ජාතික හරිත වාර්තාකරන ක්‍රමවේදය ස්ථාපිත කරන ලදී.නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රයන්හි තිරසර කාර්ය සාධනය සන්නිවේදනය කිරීම සඳහා ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය උපයෝගී කොට ගනී .

මෙම වැඩසටහනේ මූලික අරමුණ වනුයේ කර්මාන්ත හා සේවා සපයන්නන්ගේ තිරසර කාර්ය සාධනය ඇගයීමට ලක් කිරීමත් හා තිරසර කාර්ය සාධනය වාර්තා කිරීමේ ධාරිතා වර්ධනයත්ය.ජාතික හරිත වාර්තාකරණය යටතේ මේ වන විට නිෂ්පාදන හා සේවා ආයතන 120ක් පමණ අනුගත වී ඇති අතර හරිත වාර්තා වාර්ෂිකව ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබයි.

- **ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.**

ශ්‍රී ලංකා ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ හරිත වාර්තාකරුවන්ගේ ධාරිතා වර්ධනය - ධාරිතා වර්ධන වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් 2011 දී ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය ආරම්භ කරන ලදී.මේ වනවිට මෙහි පුද්ගලික ආයතන 120ක් පමණ ලියාපදිංචි වී ඇති අතර ඔවින්ගේ වාර්තාකරණය වැඩිදියුණු කිරීම සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීමට තීරණය විය. ඒ අනුව මෙම ධාරිතා වර්ධන වැඩසටහන් ජාතික හරිත වාර්තාකරන ක්‍රමවේදයේ ස්ථර 1 හා 2 හි ලියාපදිංචි ආයතනවලට පැවැත්වීමට තීරණය විය.ඒ අනුව ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදයහි ආයතනවල නිලධාරින් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

SWITCH – Asia, තිරසර පරිභෝජන හා නිෂ්පාදන පිළිබඳ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යුරෝපා සංගමය මගින් පරිසර රාජ්‍ය අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අංශයේ ඉල්ලීම මත ප්‍රදානය කරනු ලැබූ ව්‍යාපෘතියකි.මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, පාර්ශවකරුවන් සහ මහජනතාවගේ දැනුම සහ ධාරිතාව වර්ධනය කිරීමේ වසර 4 ක පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි.

මේ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මේ සඳහා ව්‍යාපෘති විශේෂඥ කණ්ඩායමක් පරිසර රාජ්‍ය අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අංශය කේන්ද්‍රස්ථානය කරගනිමින් 2015 ජනවාරි මස 26 වන දින සිට ව්‍යාපෘති මෙහෙයුම් ආරම්භ කරන ලදී.ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව ස්ථාපිත කිරීම සහ ජාතික පාර්ශවකරුවන්ගේ රැස්වීමක් 2015 මාර්තු මස 23 වන දින පවත්වන ලදී.

මෙම ව්‍යාපෘතිය පාලනය කරනු ලබන්නේ ප්‍රධාන අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන වලින් සැදුම් ලත් සහ පරිසර රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ යුරෝපා සංගමයේ ශ්‍රී ලංකාව සහ මාලදිවයින් නියෝජිත ප්‍රධානී සෑම සභාපතීත්වය දරණ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් මගිනි.

මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් 2016 වසරේ සිදු කරන ලදී.

- පවතින ප්‍රතිපත්ති 80ක් හඳුනාගන්නා ලදී
- තිරසර පරිභෝජන හා නිෂ්පාදනය සම්බන්ධ ප්‍රතිපත්ති 46ක් සමාලෝචනය කරන ලදී
- සහල්, තේ සහ කිරි නිෂ්පාදන ක්ෂේත්‍ර විශේෂ අවධානය යොමු කල යුතු ක්ෂේත්‍ර ලෙස හඳුනාගන්නා ලද අතර ඒ පිලිබඳව මූලික අධ්‍යනයක් සිදු කරන ලදී
- ජාතික සහ ආංශික තිරසර පරිභෝජන හා නිෂ්පාදන දර්ශක නිර්මාණය කිරීම
- දෙවැනි ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව පවත්වන ලදී
- තිරසර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රතිපත්ති කෙටුම්පත සකසමින් පවතී
- තිරසර පරිභෝජන හා නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීම් සිදු කිරීම
- ව්‍යාපෘති විශේෂඥ කමිටුව Sri Lanka Next-Blue Green Era වැඩසටහනේ මෙහෙයුම් කමිටුවට සහ අමාත්‍යාංශයේ වෙනත් කමිටුවලට දායකත්වය දක්වයි
- නීල හරිත ලස්සන ලංකා හරිත සුහුරු ගම්මාන 10000 වැඩසටහනට තාක්ෂණික සහ මූල්‍යමය දායකත්වය දක්වයි.
- තිරසර පරිභෝජන හා නිෂ්පාදනය පිළිබඳ දැනුවත්කිරීමේ වැඩමුළුවක් වයඹ පළාතේ රාජ්‍ය නිලධාරීන් සඳහා පවත්වන ලදී.








- **යහපත් සෞඛ්‍ය සහ සෞභාග්‍ය සඳහා හරිත නගර මෙහෙවර යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්**

පරිසර මාවත වැඩසටහන

<u>මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පරිසර හිතකාමී මාවතක් නිර්මාණය කිරීම</u>

මාර්ගය ඉහලින් ආරුක්කුමය ආකාරයට සුදුසු රුක් වියනක් සහිත රළු ගෘහ නිර්මාණ සෘජු රේඛාවල බලපෑම අවම කරන ලද සෙවන සහ පිරිසිදු වාතය සහිත, විවේක ගැනීම, ව්‍යායාම කිරීම සඳහා සීමිත පහසුකම් සහිත සහ අදාළ විශේෂිත මාර්ග නීති තුලින් අනෙකුත් මහජන පීඩා ඉවත් කරන ලද මාර්ගයක් "පරිසර මාවතක්" ලෙස හඳුන්වා දිය හැකිය.

මෙවැනි පරිසර මාවත් 100 ක් වසර 4 ක් තුල දී අදාල පළාත් පාලන ආයතන සමග සම්බන්ධ වී ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත.ඒ අනුව මෙවර ජගත් පරිසර දිනය නිමිති කර ගනිමින් මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ සමන්දරාව පාර පරිසර මාවතක් ලෙස නිර්මාණය කරන ලදී.







මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ සමන්දරාව පාර පරිසර මාවතක් ලෙස නිර්මාණය කිරීම

- **හරිත ගිනුම්කරණය ශ්‍රී ලංකාව**

හරිත ගිණුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ පත්‍රිකා මුද්‍රණය

වන ක්ෂේත්‍රයේ තක්සේරු අධ්‍යනය සහ හරිත ගිණුම්කරණය පිළිබඳ කරුණු ඇතුලත් දැනුවත් කිරීමේ පත්‍රිකා 3000 ක් මුද්‍රණය කරන ලදී.






වන ක්ෂේත්‍රයේ තක්සේරු අධ්‍යනය පිළිබඳ මුද්‍රණය කරන ලද දැනුවත් කිරීමේ පත්‍රිකා මුද්‍රණය

හරිත ගිණුම්කරණය පිලිබඳව ප්‍රතිපත්ති ලුහුඬුවක් සකස් කිරීම ලදී.

ඛනිජ ,ඩිවර හා ජල ක්ෂේත්‍රයන් තක්සේරු කිරීම සදහා සංකල්ප පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

මෙහෙවර 10: නිවැරදි තෝරා ගැනීම සඳහා දැනුම

➢ **සොබා සඟරාව**



පරිසරය පිළිබඳ උනන්දුවක් දක්වන අය, පරිසර සංවිධාන, විශ්ව විද්‍යාල, පාසැල් හා පුස්තකාල මෙන්ම වෙනත් බොහෝ ආයතන අතර පරිසරය පිළිබඳ දැනුම බෙදා හැරීම සඳහා අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ අංශය මගින් වර්ෂයකට දෙවරක් 'සොබා' නමින් සඟරාවක් මුද්‍රණය කර බෙදා හරිනු ලැබේ.

මෙහි පළමු කලාපය වසර මැද හා (ජූනි - ජූලි) දෙවන කලාපය වර්ෂ අවසානයේ (දෙසැම්බර් - ජනවාරි) මුද්‍රණය කෙරේ.

ඒ අනුව, 2015 වර්ෂයේ දෙවන කලාපය පිටපත් 3000 බැගින් මුද්‍රණය කර බෙදාහරින ලද අතර 2016 වර්ෂයේ පළමු කලාපය පිටපත් 3000 බැගින් මුද්‍රණය කර ජගත් පරිසර දින උත්සවය හා සමගාමීව බෙදා හරින ලදී.


➢ **සොබා පුවත් හසුන**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ විවිධ අංශ මගින් සිදුකරනු ලබන පාරිසරික වැඩසටහන් පිළිබඳ තොරතුරු දක්වමින් කාර්තුවකට වරක් මෙම අංශය මගින් මුද්‍රණය කරනු ලැබේ. 2015 වර්ෂය සඳහා තුන්වන සහ හතරවන කාර්තු වලදී පුවත් හසුන මුද්‍රණය කරන ලද අතර 2016 වර්ෂය සඳහා එක් කලාපයක් මුද්‍රණය කරන ලදී.

➢ **පුස්තකාලය සඳහා ප්‍රකාශන සහ පොත්පත් මිළට ගැනීම**

පාඨකයන්ගේ කියවීමේ රුචිකත්වය ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශයේ දැනට පවතින පොත්පත් හා සඟරා ප්‍රමාණය වැඩි කරන ලදී. මෙහිදී පරිසර දැනුම ඇතුළුව වර්තමාන ප්‍රවනතාවයන්ට අනුව නව පොත්පත් හා සඟරා මිළට ගැනීමෙන් පුස්තකාලයේ පොත් එකතුව විවිධාංගීකරණය කරන ලදී.

➢ **"සොබා වලන සිතුවම්" කෙටි චිත්‍රපටි තරඟාවලිය**




පරිසර සංරක්ෂණය හා ඊට අදාළ අභියෝග තම නිර්මාණවලට විෂය කර ගැනීම සඳහා තරුණ නිර්මාණකරුවන් පෙළඹවීම සඳහා අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ අංශය මගින් "සොබා වලන සිතුවම්" නමින් දීප ව්‍යාප්ත කෙටි චිත්‍රපට තරඟාවලියක් වාර්ෂිකව සංවිධානය කරනු ලැබේ. ඒ අනුව මෙවරද කෙටි චිත්‍රපටි තරඟාවලිය පවත්වන ලද අතර ජයග්‍රාහකයින් සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා අතින් තිළිණ ප්‍රදානය කරන ලදී.අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් වල දී පරිසර සංරක්ෂණය කිරීම පිළිබඳ විවිධ පාර්ශව දැනුවත් කිරීමට හා ආකල්ප වර්ධනය සඳහා යොදා ගැනීමට මෙම කෙටි චිත්‍රපට එකතුවක් තබා ගැනීමට අපේක්ෂිතය.

➢ **පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්**

2015 වර්ෂයේදී මෙම අංශය මගින් පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසහටන් පහක් පවත්වන ලද අතර තිරසර සංවර්ධනය සඳහා පරිසර අධ්‍යාපනය ව්‍යාපෘතිය යටතේ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් හතරක් පවත්වන ලදී. 2016 වර්ෂයේ දී මැදවච්චියේ එක් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

➢ **පරිසරය පිළිබඳ කෙටි පණිවුඩ රැගත් ස්ටිකර් මුද්‍රණය කර බෙදා හැරීම**




පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳ දැනුම හා ආකල්ප වර්ධනය කිරීම සඳහා පරිසරය පිළිබඳ කෙටි පණිවුඩ රැගත් ස්ටිකර් වර්ග දෙකක් පහත පරිදි මුද්‍රණය කර බෙදා හරින ලදී.



i. පොදු ප්‍රවාහන සේවාවල, ත්‍රී රෝද රථවල හා පෞද්ගලික ප්‍රවාහන සේවාවල ඇලවිය හැකි පටි ආකාරයේ ස්ටිකර් 20,000 ක්

ii. පාසල් ළමුන්ගේ පොත්වල පිටකවරවල ඇලවිය හැකි ආකාරයේ ස්ටිකර් 75,000 ක්

➢ **ජගත් පරිසර දිනය සැමරීම - 2016**



ජගත් පරිසර දිනය සැමරීමේ කේන්ද්‍රීය ආයතනය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වන අතර එම උත්සවය සංවිධානය කිරීමේ හා පැවැත්වීමේ කාර්යය අධ්‍යාපන, පුහුණු හා පර්යේෂන අංශය වෙත පැවරී ඇත. මෙවර තේමාව වී ඇත්තේ "වනජීවී සම්පත් නීති විරෝධී ලෙස අළෙවි කිරීමට එරෙහි වෙමු" යන්නයි.

මෙවර ජගත් පරිසර දින ප්‍රධාන උත්සවය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016 ජූනි මස 05 දින මාතලේ එඩිවඩ ක්‍රීඩාංගනයේ දී පවත්වන ලදී. මෙම ප්‍රධාන උත්සවය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාශයත් ඒ යටතේ ඇති අනෙකුත් ආයතන හා එක්ව සංවිධානය කරන ලදී.



මෙහිදී අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ අංශය මගින් හරිත රැකියා ප්‍රවර්ධනය සඳහා හරිත රැකියා පොළක් සහ ප්‍රදර්ශනයක් ද පවත්වන ලදී.

මෙවර ජගත් පරිසර දින සැමරුමට සමගාමීව 2016 මැයි මස 30 දින සිට ජූනි මස 05 දින දක්වා "පරිසර සතිය" ක් අතිගරු ජනාධිපතිතුමා විසින් පොළොන්නරුව පළුගස්දමන සේවාමුක්ත කඳවුර විද්‍යාලයේ දී ප්‍රකාශයට පත් කරන ලද අතර එම කාලය තුල දී විවිධ පාරිසරික වැඩසටහන් රැසක් සිදු කරන ලදී. එම කාලසීමාවෙහි දින පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කරන ලදී.

- මැයි 30 - පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ දිනය, පරිසර සතිය ප්‍රකාශයට පත් කිරීම හා පාසල් දරුවන් ඇතුළු සියලු ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මැයි 31 - තිරසර ඉඩම් කළමනාකරණ දිනය, හායනයට පත්වූ භූමි පුනරුත්ථාපනය
- ජුනි 01- වෙරළ පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සහ වෙරළ හා සාගරික පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීමේ දිනය
- ජුනි 02 - පරිසරය පවිත්‍ර කිරීම, කසල කළමනාකරණ හා පරිසර දූෂණය පාලනය කිරීමේ දිනය
- ජුනි 03 - වන ආවරණය වර්ධනය කිරීමේ දිනය, රුක් රෝපණය ඇතුළු පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පාසල් සහ රාජ්‍ය ආයතනවල රුක් රෝපණය කිරීම
- ජුනි 04 - දේශගුණික විපර්යාස ඇතිවීම වැළැක්වීමේ හා පෙව විවිධත්ව සංරක්ෂණ වැඩසටහන්,පරිසර හිතකාමී වායුසමීකරණ හා ශීතකරණ ක්‍රමවේදයන් හඳුන්වා දීමේ දිනය
- ජුනි 05 - ජගත් පරිසර දිනය සැමරීම හා හරිත රැකියා ප්‍රවර්ධනය, සියලුම ආගමික ස්ථානවල රුක් රෝපණය කිරීමේ දිනය

ඕසෝන් ඒකකය

➢ **ඕසෝන් ක්ෂයකාරක**

ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය සඳහා වූ මොන්ට්‍රියල් සන්ධානයට අනුව ජාතික ඕසෝන් ඒකකය මගින් ඕසෝන් ක්ෂයකාර ද්‍රව්‍යක් වන හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් භාවිතයට ගැනෙන උපකරණ වෙනුවට ඕසෝන් හිතකාමී උපකරණ හඳුන්වාදීමට ගෙන තිබෙන අතර ඕසෝන් ස්ථරයට හානිකර හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් වල විමෝචන වායුගෝලයට එක්වීම අවම කරමින් ඕසෝන් ස්ථරය සුරැකීමට පියවර ගෙන තිබේ.

මොන්ට්‍රියල් සන්ධානය විසින් නිර්දේශිත ක්‍රියාකාරකම් වලට සමාන්තරව ජාතික ඕසෝන් ඒකකය විසින් මේවනවිට රාජ්‍ය අංශයේ මෙන්ම පුද්ගලික අංශයේ ද කාර්මික ක්ෂේත්‍රය දැනුවත් කිරීමට පියවර ගෙන තිබේ.

ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍යයක් වන හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් තවමත් ශීතකරණ හා වායුසමීකරණ ක්ෂේත්‍රයන්හි බහුල වශයෙන් භාවිතාවන බැවින් මෙම ක්ෂේත්‍රයන්හි නියැලී සේවා කාර්මිකයනට වඩාත් යහපත් දේ හඳුන්වා දෙමින් ඒ පිළිබඳව ඔවුන්ගේ දැනුම වඩාත් පුළුල් කිරීම වැදගත්වේ. එබැවින් ශ්‍රී ලංකා රේගුව, ආනයන අපනයන පාලක දෙපාර්තමේන්තුව හා ආයෝජන මණ්ඩලය වැනි ආයතන වල නිළධාරීන් මෙන්ම ආනයනකරුවන් සඳහා ධාරිතා වර්ධන වැඩමුළු පැවැත්වීම මගින් ආනයන පාලන යාන්ත්‍රණය නිරතුරුවම යාවත්කාලීන කිරීමට පියවර ගෙන තිබේ.

- **රේගු නිළධාරීන්ගේ ධාරිතා වර්ධන වැඩමුළු**

අද වන විට ලෝකයේ බොහොමයක් පාරිසරික ප්‍රශ්න වලට මුල් වී තිබෙන්නේ දේශ සීමා මායිම් ස්වභාවය සහ ගෝලීය බලපෑමයි. මෙම පාරිසරික ප්‍රශ්න සඳහා කාර්යක්ෂම විසඳුම් ලබාදිය හැකි

වන්නේ බහුපාර්ශවීය පාරිසරික ගිවිසුම් හරහා අන්තර්ජාතික සහයෝගීතාවය සහ වගකීම් බෙදාහදා ගැනීම තුලිනි.

ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය නිෂ්පාදනය සහ පරිභෝජනය යන ක්‍රියාවලීන් දෙකෙන්ම බැහැරවෙමින් ඕසෝන් ස්ථරය සුරැකීමේ අරමුණින් මොන්ට්‍රියල් සන්ධානය නම් වූ බහුපාර්ශවීය පාරිසරික ගිවිසුම බිහිවිය.

ශ්‍රී ලංකාව මේවන විට ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍යයක් වන හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් බැහැර කරලීමේ කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කරමින් පවතින අතර ඉහත රසායනික ද්‍රව්‍ය බැහැර කරලීම 2013 ජනවාරි 1 වෙනි දින සිට ආරම්භ කරන ලදී. මෙම ඕසෝන් ප්‍රභීන කාරක ද්‍රව්‍ය රට තුලට ඇතුළුවීම වලකාලීමට ශ්‍රී ලංකා රේගුව වඩා වැදගත් මෙහෙයක නිරත වීසිටින බැවින් මේ පිළිබඳව රේගු නිළධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම වඩා වැදගත් බැවින් ජාතික ඕසෝන් ඒකකය විසින් රේගු නිළධාරීන් සඳහා ධාරිතා වර්ධන වැඩමුළුවක් 2015 නොවැම්බර් 24 වන දින රේගු මන්දිරයේ දී පවත්වනු ලැබූ අතර මේ සඳහා මූල්‍ය මය දායකත්වය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ලැබිණි.

- **ශීතකරණ සහ වායුසමීකරණ සේවා කිරීමේදී පරිසරයට වඩාත් උචිත වූ ක්‍රමවේදයන් පිළිබඳ එම ක්ෂේත්‍රයේ නියැලී කාර්මිකයින් පුහුණු කිරීමේ වැඩමුළු පැවැත්වීම**

නවින තාක්ෂණය භාවිතය පිළිබඳව ශීතකරණ සහ වායුසමීකරණ සේවා ක්ෂේත්‍රයේ නියැලී කාර්මිකයින් කාර්යක්ෂම ලෙස පුහුණු කිරීම මොන්ට්‍රියල් සන්ධානයේ බැඳීම් වලට අනුව සිදු කළ යුතුව තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන සහ අනෙකුත් ඒ හා සම්බන්ධ ආයතන වලට අනුයුක්ත ශීතකරණ හා වායුසමීකරණ ක්ෂේත්‍රයේ උපදේශකවරුන් සහ කාර්මිකයින් කාලානුරූපීව පුහුණු කෙරෙන අතර මේ සඳහා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන යටතේ මූල්‍යාධාර ලබාදෙනු ලබයි. මෙලෙස තෙදින වැඩමුළු කිහිපයක් පහත සඳහන් පරිදි 2015 සහ 2016 වසර වලදී ජාතික ඕසෝන් ඒකකය මගින් සංවිධානය කර පවත්වනු ලැබීය.

- ශ්‍රී ලංකා නාවුක හමුදාවේ ශීතකරණ සහ වායු සමීකරණ ක්ෂේත්‍රයේ ඉංජිනේරුවරුන් සහ නාවුකයින් වෙනුවෙන් 2015 දෙසැම්බර් මස 17 – 19 දින වල ත්‍රීකුණාමල නාවුක හමුදා කඳවුරේ දී පවත්වනු ලැබීය.

- ශීතකරණ සහ වායු සමීකරණ ක්ෂේත්‍රයේ නියැලී තාක්ෂණික නිළධාරීන් සහ මාතර තාක්ෂණ විද්‍යාලයේ සිසුන් සඳහා තෙදින වැඩමුළුවක් 2016 මාර්තු 10 – 12 යන දින වල මාතර තාක්ෂණික විද්‍යාලයේ දී පවත්වනු ලැබීය.

- ශීතකරණ සහ වායු සමීකරණ ක්ෂේත්‍රයේ නියැලි තාක්ෂණික නිළධාරීන් සහ මහනුවර තාක්ෂණ

විද්‍යාලයේ සිසුන් සඳහා තෙදින වැඩමුළුවක් 2016 මැයි 12 - 14 යන දින වල මහනුවර තාක්ෂණික විද්‍යාලයේ දී පවත්වනු ලැබීය.

- ඕසෝන් ක්ෂය කාරක විභවය ශූන්‍ය වූ ද ගෝලීය උණුසුම් විභවය අඩු ශීතකාරකයන් සහ R-22 තාක්ෂණය පිළිබඳ කොළඹ දිස්ත්‍රික්කයේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ශීතකරණ සහ වායු සමීකරණ ක්ෂේත්‍රයේ නියැලි ඉංජිනේරුවරුන් සහ තාක්ෂණික නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2016 ජුනි 23 වන දින පවත්වනු ලැබීය.

මෙම වැඩමුළු වලදී සාකච්ජාවට බඳුන් වූ ප්‍රධාන කරුණු වූයේ;

- ඕසෝන් වියන පිළිබඳ තොරතුරු, ඕසෝන් වියන ක්ෂයවීම පිළිබඳව සහ දේශගුණික විපර්යාස වල බලපෑම
- හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් වෙනුවට විකල්ප ශීතකාරක හඳුන්වාදීම.
- අපවිත්‍ර හෝ අනෙකුත් දෑ මිශ්‍ර වූ ශීතකාරක හඳුනා ගැනීම.

➢ **දැනුවත් කිරීමේ වැඩසටහන්**

දැනුවත් කිරීමේ වැඩසටහන් වල මූලික අරමුණ වන්නේ ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීමේ අභිමථාර්මුදුන් පමුණුවා ගැනීම සහ අනෙකුත් ප්‍රතිලාභ ලෙස දේශගුණ විපර්යාස අවම කර ගැනීම සහ සෞඛ්‍ය සම්පන්න වායුගෝලීය පරිසරයක් අනාගත පරපුරට උරුම කර දීමයි.

ඉහත අරමුණු පෙරදැරිකරගනිමින් ජාතික ඕසෝන් ඒකකය විසින් විවිධ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් විද්වත් පිරිසකගේ දේශන ඇතුලත් දැනුවත් කිරීමේ වැඩමුළු ගණනාවක් පවත්වනු ලැබීය. මෙහිදී ඕසෝන් ස්ථරය පිළිබඳ විද්‍යාත්මක තොරතුරු, ඕසෝන් ස්ථරය විනාශවීම හා එමගින් ඇතිවන බලපෑම, බහුපාර්ශවීය අරමුදල, දේශගුණ විපර්යාස හා ස්වභාවික ආපදා, ලෝක උරුම විටිනාකමක් ඇති වගුරු බිම් ආරක්ෂා කිරීම සහ ඊට අදාළ තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරන ලදී.

2015.07.01 සිට 2016.06.30 දක්වා විවිධ කණ්ඩායම් ඉලක්ක කරගනිමින් පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ වැඩමුළු පහත පරිදිවේ.

අධ්‍යාපන කළාපයේ විද්‍යා විෂයය ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන් මෙන්ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා

- 2015ඔක්තෝබර්02 වන දින මාතලේ කළාප අධ්‍යාපන කාර්යාලයේදී
- 2016 ජනවාරී 22 වන දින අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේදී
- 2016මැයි 27 වන දින මොනරාගල කළාප අධ්‍යාපන කාර්යාලයේදී

- 2016ජුනි 02 වන දින මාතලේ ශාන්ත තෝමස් විද්‍යාලයේදී
- 2016 ජුනි 03 වන දින නාවුල තරුණ මධ්‍යස්ථානයේදී
- **රාජ්‍ය නිළධාරීන් සඳහා**
- 2015 දෙසැම්බර් 15 වන දින මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී
- 2016 පෙබරවාරි 26 වන දින මුලතිව් ආරක්ෂක සේනා මුලස්ථානයේදී
- 2016 මැයි 20 වන දින දන්කොටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදී

මාතලේ දිස්ත්‍රික් සංචාරක සහ ශීතකරණ සහ වායුසමීකරණ ක්ෂේත්‍රයේ නිළධාරීන්

- 2016 මැයි 31 වන දින මාතලේ මහ නගර සභා ශ්‍රවණාගාරයේදී

දකුණු පලාත් සංචාරක කර්මාන්තය සඳහා

- 2015 නොවැම්බර් 19 දින දකුණු පලාත් සභා ශ්‍රවණාගාරයේදී

➢ දේශගුණ විපර්යාස අභියෝගයන්ට මුහුණදීම

ශ්‍රී ලංකාවට **හයිඩ්‍රොෆ්ලෝරෝකාබන්** (HCFC) ආනයනය සහ පරිභෝජනය පාලනය කිරීම

ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍යයන් සඳහා වූ මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධානයන්ට අනුකූලව **හයිඩ්‍රොෆ්ලෝරෝකාබන්** සහ ඒවායේ මිශ්‍රිත ශීතකාරක ආනයනය සඳහා වාර්ෂික කෝටා ක්‍රමයක් එහි පාර්ශව රටවලට හඳුන්වා දී තිබේ. මොන්ට්‍රියල් සන්ධානයේ ශ්‍රී ලංකාවේ කේන්ද්‍රීය ආයතනය වශයෙන් මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය මේ පිළිබඳව කටයුතු කරනු ලබයි.

- 2016 වර්ෂයට හිමි කෝටා ආනයනකරුවන්වෙත බෙදාදීමේ රැස්වීමක් 2015 දෙසැම්බර් මස 03 වන දින අමාත්‍යාංශයේ "සප්ත පරිසර මණ්ඩපයේ දී" පවත්වනු ලැබීය. මෙම රැස්වීම මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබීය.
- මොන්ට්‍රියල් සන්ධානය ක්‍රියාත්මක කිරීමේ දී ඇති වගකීම් පිළිබඳ ශීතකරණ සහ වායුසමීකරණ උපකරණ සහ උපාංග ආනයනකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2015 දෙසැම්බර් 08 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වනු ලැබීය.
- රාජ්‍ය ආයතනවල වායුසමීකරණ ප්‍රසම්පාදනය පිළිබඳ රාජ්‍ය නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2016 මැයි මස 26 වන දින අමාත්‍යාංශයේ "සප්ත පරිසර මණ්ඩපයේ දී" පවත්වනු ලැබීය. මේ සඳහා රාජ්‍ය නිළධාරීන් 150ක පමණ පිරිසක් සහභාගී වුහ.

ශ්‍රී ලංකාවේ ශීතකාරක ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන පිහිටුවීම

HCFC ශීතකාරකය භාවිතයෙන් බැහැර කිරීමේ කළමනාකරණ සැලැස්මට අනුව HCFC ආනයනය පාලනයට යටත්වන අතර ජාතික ඕසෝන් ඒකකය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා

සහයෝගීතාවයෙන් මොන්ට්‍රියල් සන්ධානයේ බහුපාර්ශවීය අරමුදල යටතේ ශීතකාරක පවිත්‍රකිරීමේ මධ්‍යස්ථාන 8ක් මුළු රටම ආවරණය වන පරිදි තාක්ෂණික හා වෘත්තීය පුහුණු ආයතනයන්හි ස්ථාපිත කර ඇත.

- 2015 අන්තර්ජාතික ඕසෝන් දින සැමරුම් ජාතික උත්සවය පැවැති මොරටුව ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනයේදී පළමු ශීතකාරක පවත්‍රකිරීමේ මධ්‍යස්ථානය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් නිල වශයෙන් විවෘත කරන ලදී.
- උතුරුමැද පලාත සඳහා ස්ථාපිත කරනු ලැබූ ශීතකාරක පවිත්‍රකිරීමේ මධ්‍යස්ථානය 2015 ඔක්තෝබර් 9 වන දින පොළොන්නරුව තාක්ෂණික විද්‍යාලයේ දී නිල වශයෙන් විවෘත කරන ලදී.

- ස්ථාපිත කරනු ලැබූ R-22 ශීතකාරක ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානවල මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම පහත පරිදි සිදු කර ඇත.
  - 2015 ඔක්තෝබර් 15 වන දින ගාල්ල තාක්ෂණික විද්‍යාලයේ දී
  - 2016 ජනවාරී 28 – 29 මඩකලපුව තාක්ෂණික විද්‍යාලයේ දී
  - 2016 මාර්තු 18 – 19 කුරුණෑගල බිරේවෝ කරකාර හෝටලයේ දී
  - 2016 මැයි 13 – 14 මහනුවර තාක්ෂණික විද්‍යාලයේ දී
  - 2016 මැයි 19 – 20 වව්නියාව වෘත්තීය පුහුණු අධිකාරියේ දී

ඉහත මධ්‍යස්ථානයන්හි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමේදී එම මධ්‍යස්ථානයන්හි වායු සමීකරණ සේවා ක්ෂේත්‍රයේ නියැලීතාක්ෂණික නිළධාරීන් සහ තාක්ෂණික විද්‍යාල සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණුවක් ද ලබාදෙනු ලැබුහ.

- 2016 පෙබරවාරී 2 වන දින ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානවල ප්‍රධානීන් සහ ඉහළ කළමනාකාරීත්වය සඳහා රැස්වීමක් මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ "සප්ත පරිසර මණ්ඩපයේදී" පවත්වනු ලැබීය.
  ශීතකරණ හා වායුසමීකරණ ක්ෂේත්‍රයන්හි භාවිතාරන ලද ශීතකාරක, අතිපිරිසිදු (නොඉදුල්) තත්ත්වයට පත් කිරීම ප්‍රධාන අරමුණ කොට ගනිමින් මෙම මධ්‍යස්ථාන පිහිටුවනු ලැබූ අතර මෙමගින් පහත අරමුණු ද සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තුවේ. ශීතකාරක පවිත්‍රකිරීමේ ක්‍රියාවලිය පරිසර සංරක්ෂණයට මෙන්ම වත්මන් ආර්ථිකමය ප්‍රතිලාභ රැසක් හිමිකර දීමටද ඉවහල්වේ.
- ශීතකරණ හා වායුසමීකරණ යන්ත්‍ර සේවා හා නඩත්තු කිරීමේ දී වායුගෝලයට මුදාහරින ශීතකාරක විමෝචනයන් අවම කිරීම.
- මෙම පද්ධතීන් මගින් ශීතකාරක පිරිසිදු කිරීම.
- පිරිසිදු කරනු ලැබූ ශීතකාරක නැවතත් පද්ධතීන්ට හඳුන්වාදීම තුලින් නව ශීතකාරක නිකුත් කිරීම අඩු කිරීමට හැකිවීම තුලින් ආනයනය ද සීමා කිරීමට එමගින් හැකිවේ. මෙමගින්HCFC ශීතකාරකය භාවිතයෙන් බැහැර කිරීමේ කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී අදාළ ඉලක්ක නියමිත කාල වකවානුවලදී සම්පූර්ණ කර ගැනීමටද මෙය ඉවහල් වනු ඇත.

ශ්‍රී ලංකාවේ හයිඩ්‍රොෆ්ලෝරෝකාබන් භාවිතය පිළිබඳ ජාතික සමීක්ෂණය

හයිඩ්‍රොෆ්ලෝරෝකාබන් ලෝකයේ වේගවත් වර්ධන හරිතාගාර ආවරණ වායුවක්වේ. වායුගෝලය හා මුසුවුණු **හයිඩ්‍රොෆ්ලෝරෝකාබන්** වේගවත්ලෙස වැඩිවෙමින් පවති. වායුගෝලයේ පවතින කාබන්ඩයොක්සයිඩ් හා සැසඳීමේ දී **හයිඩ්‍රොෆ්ලෝරෝකාබන්** හි ගෝලීය උණුසුම්වීමේ ප්‍රවණතාවය සියයේ සිට දහස් ගුණයකින් පමණ බලසම්පන්න වන අතර ගෝලීය දේශගුණය කෙරෙහි ද අනිසි බලපෑම් ඇතිකරයි. සාමන්‍ය භාවිතයේ පවතින **හයිඩ්‍රොෆ්ලෝරෝකාබන්** කාණ්ඩ අතර 134a, R404A, R407C, R507C, R410A, R152A යන කාණ්ඩයන් ගෝලීය උණුසුම්වීම කෙරෙහි වඩාත් බලසම්පන්නවේ.

ඒ අනුව මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය මොන්ට්‍රියල් සන්ධානයේ කේන්ද්‍රීය ස්ථානය වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා එක්ව ශ්‍රී ලංකාවේ **හයිඩ්‍රොෆ්ලෝරෝකාබන්** භාවිතය පිළිබඳ ජාතික මට්ටමේ සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙය ස්වාධීන සමීක්ෂණයක් වූ අතර මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ දායකත්වය ලබාදෙන ලදී. ජාතික ඕසෝන් ඒකකය විසින් මෙහි අවසන් වාර්තාව 2015 ඔක්තෝබර් මස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වෙත බාරදෙන ලදී.

රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි පුළුල් ලෙස පරිසර හිතකාමී වූ හරිත ගොඩනැගිලි ලෙස ඉදිකිරීම හා පවත්වාගෙනයාම සඳහා වූ මාර්ගෝපදේශ හඳුන්වාදීම

ශ්‍රී ලංකාවේ නීල හරිත යුගයක් ඇති කරලීම පෙරදැරි කර ගනිමින් පරිසරයට ඇතිවන අහිතකර බලපෑම්
අවම කිරීමේ අරමුණින් හරිත ගොඩනැගිලි සංකල්පය හඳුන්වා දී ඇත. අවම බලශක්තිය, ජලය හා අනෙකුත් අවශ්‍යතාවල පරිභෝජනයක් සමග නැවුම් හා සුවදායී පරිසරයක් ගොඩනැගිලි තුල ඇති කිරීම සඳහා 'හරිත ගොඩනැගිලි' සංකල්පය බිහිවී ඇත. හරිත ගොඩනැගිලි සංකල්පය යොදාගැනීම මගින් බලශක්තිය හා අනෙකුත් ස්වභාවික සම්පත් සංරක්ෂණය තුලින් හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම, ගොඩනැගිලි වල අභ්‍යන්තර සහ බාහිර වායු තත්ත්වයන් වැඩි දියුණු කිරීම, මෙන්ම ගොඩනැගිලි තුළ සෞඛ්‍ය සම්පන්න, ප්‍රීතිමත් හා සුවදායී පරිසරයක් බිහිකළ හැකිය.

එබැවින් මේ පිළිබඳව ගරු මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යතුමා විසින් කෙටුම්පත් මාර්ගෝපදේශ
ඇතුලත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අනුමැතිය සඳහා අමාත්ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.
මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර ඉන් අනතුරුව මෙම අමාත්‍යාංශය මගින් අදාළ පාර්ශව ආයතනවල සහභාගීත්වයෙන් නිර්දේශිත මාර්ගෝපදේශ හා එම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රධාන ක්‍රියාකාරකම් 22කින් සමන්විත 2016 මැයි සිට දෙසැම්බර් දක්වා ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

➢ හරිත කාර්මීකරණය

මොන්ට්‍රියල් සන්ධානයට අනුව ඕසෝන් ක්ෂයකාරක රසායනිකයන් පාලනය කරමින් ඒ වෙනුවට පරිසර හිතකාමී රසායනිකයන් සහ තාක්ෂණයන් හඳුන්වාදෙමින් අනාගත තිරසාර ගෝලීය පාරිසරික අභිමථාර්තයන් අත්පත් කරගැනීමට මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශව රටවල් අපේක්ෂා කෙරේ.

ඒ අනුව අනාගත පරපුර වෙනුවෙන් ඕසෝන් ස්ථරය සුරක්ෂිත කිරීමේ අරමුණ ඉපරදැරි කරගෙන ශීතකරණ සහ වායුසමීකරණ ක්ෂත්‍රයන් සඳහාද පරිසර හිතකාමී තාක්ෂණයන් කෙරෙහි වඩාත් නැඹුරුවීමට ගෝලීය කාර්මික ක්ෂේත්‍රය වැඩි අවධානයක් යොමුකර තිබේ. කර්මාන්තයන්හි දී HCFC සහ HFC මුලික කරගත් ශීතකාරකයන් නිෂ්පාදන සහ සේවා සඳහා වැඩිවශයෙන් භාවිතා කරන බැවින් ඔවුන්ගේ කාර්යභාරයේ දී මේ සඳහා අවධානය යොමු කිරීම ප්‍රධාන වේ. මෙම රසායනිකයන්ගේ විමෝචනයන් ඉතා අහිතකර ලෙස ගෝලීය උණුසුම්වීම සහ ඕසෝන් ස්ථරය ක්ෂයවීම කෙරෙහි බලපෑම් ඇති කරනු ලබයි. මෙය අවම කිරීම සඳහා ඕසෝන් ක්ෂයකාරක විභවය ශූන්‍ය වුද ගෝලීය උණුසුම්වීමේ ප්‍රවණතාවය අඩු විකල්ප හඳුන්වාදෙමින් පවතී.

ඕසෝන් ක්ෂයකාරක විභවය ශූන්‍ය වුද ගෝලීය උණුසුම් විභවය අඩු වායුසමන යන්ත්‍ර හඳුන්වාදීමේ දිරිදීමනා ව්‍යාපෘතිය

රජයේ ආයතන සඳහා වායුසමන යන්ත්‍ර මිලදී ගැනීමේ දී ඕසෝන් ක්ෂයකාරක විභවය ශූන්ය වුද ගෝලීය උණුසුම් විභවය අඩු වායු සමන යන්ත්‍ර මිල දී ගැනීම සඳහා දිරිදීමනා ලබාදීම.මේ යටතේ ජාතික ඕසෝන් ඒකකය විසින් ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයට ඉහත ආකාරයේ වායුසමන යන්ත්‍ර 28ක් මිල දී ගැනීම සඳහා දිරිදීමනා ලබාදෙන ලදී.

ඕසෝන් ක්ෂයකාරක වෙනුවට භාවිතාවෙන විකල්ප පිළිබඳ සමීක්ෂණය දැනටමත් ජාතික ඕසෝන් ඒකකය විසින් ආරම්භ කර ඇත. මේ සඳහා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන මගින් මුල්‍යාධාර සපයනු ලබයි.

නීති අංශය

2015/07/01 සිට 2016/06/30 දක්වා සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්.

- පරිසර නීතිය සම්බන්ධයෙන් මාතලේ හා යාපනය යන දිස්ත්‍රික්ක සඳහා වැඩමුළු 02ක් පවත්වන ලද අතර එහිදී පොලිස් නිළධාරීන් 120ක් දැනුවත් කරන ලදී.
- ජාතික පාරිසරික පනත, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත, පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ ඉදිරිපත්වන අභියාවනා විභාග කිරීම. මෙහිදී අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අභියාවනා 170ක් සඳහා තීරණ ලබා දී ඇති අතර ඉන් තීරණ 26ක් ජාතික පාරිසරික පනත යටතේ ද තීරණ 44 ක් පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ ද තීරණ 12ක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනත යටතේ ද තීරණ 87ක් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ ද ලබා දී ඇත. අභියාවන පටිපාටියට අදාල සියළු ලේඛන කටයුතු අමාත්‍යාංශයේ නීති අංශය විසින් සිදු කරනු ලැබේ.

- අධිකරණයේ, මානව හිමිකම් කොමිෂන් සභාවේ, ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ පවරන නඩු පවත්වාගෙනයාමට අදාල ආයතනවලට සහාය ලබා දීම. මෙහිදී නඩු 25ක කටයුතු සිදු කර ඇත.
- පනත් කෙටුම්පත් සැකසීම හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වලින් අමාත්‍යාංශය වෙත එවනු ලබන ගැසට්පත්‍ර සම්බන්ධව අදහස් ඉදිරිපත් කිරීම, නීති කෙටුම්පත් සම්පාදක වෙත යැවීම හා අවශ්‍ය අවස්ථාවල නීතිමය උපදෙස් මෙහිදී අදාල කාල සීමාව තුල නීතිමය ලේඛන 16 ක් සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
- අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සඳහා අවශ්‍ය ගිවිසුම් සකස්කර දීම හා පරීක්ෂාකර නිවැරදිභාවය තහවුරුකර දීම. මේ යටතේ ගිවිසුම් 22ක කටයුතු සිදු කර ඇත.
- නීති අංශය වෙත ලැබුණු මහජන පැමිණිලි 79ක් අදාල අංශ වලට යොමුකර අගතියට පත් පාර්ශවයන්ට ලබා දීමට කටයුතු කර ඇත.

ජාත්‍යන්තර සහයෝගිතාවය

පරිසරය සම්බන්ධ සම්මුතීන්හි කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාකිරීම

පරිසරය සම්බන්ධ බොහෝමයක් සම්මුතීන්හි ජාතික කේන්ද්‍රස්ථානය වශයෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය කටයුතු කරයි. මෙහිදී ශ්‍රී ලංකාව අත්සන් තබන ලද සම්මුතීන්/ ගිවිසුම් ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් අදාළ සම්මුතීන්හි ලේකම් කාර්යාල, එක්සත් ජාතීන්ගේ පරිසර සම්බන්ධ අනුබද්ධ ආයතය දකුණු ආසියානු සහයෝගිතා පරිසර වැඩසටහන සඳහා වාර්ෂිකව දායකත්ව මුදල් ගෙවීම සිදුකරයි. 2016 වසර සඳහා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන, හැරුණු විට සෙසු ආයතන සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

ආයතනය	**2016** වසර සඳහා ගෙවන ලද වාර්ෂික දායකත්ව මුදල රු.	
1. දකුණු ආසියානු සහයෝගිතා පරිසර වැඩසටහනේ ලේකම් කාර්යාලය ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යාම වෙනුවෙන් ලංකා රජය එකඟ වී ඇති ප්‍රදානය.	Rs.3million	රු.3 million
2. දකුණු ආසියානු පරිසර වැඩසටහන සඳහා වාර්ෂික දායකත්ව මුදල.	USD 17842.00	රු..2610284.60
3. දකුණු ආසියානු කලාපයේ සමුද්‍ර වැඩසටහන සඳහා වාර්ෂික දායකත්ව මුදල.	USD 14668.00	රු.2145928.40
4. එක්සත් ජාතීන්ගේ	EURO 1867	රු.. 299597.49

කාන්තාරකරණය වැළැක්වීම පිළිබඳ සම්මුතියේ වාර්ෂික දායකත්ව මුදල.		
5. සොබාදහම සුරකීම පිළිබඳ අන්තර්ජාතික සංගමය සඳහා වාර්ෂික දායකත්ව මුදල.	CHF15501.29	රු..2284270.00
6. බාසල් සම්මුතියේ වාර්ෂික දායකත්ව මුදල.	USD 1494	රු.218392.92
7. ජෛව විවිධත්ව සම්මුතියේ වාර්ෂික දායකත්ව මුදල.	USD3968	රු..580042.24
8. ජෛව සුරක්ෂිතතාව පිළිබඳ සන්ධානය සඳහා වාර්ෂික දායකත්ව මුදල.	USD 979	රු..143110.22
9. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය වාර්ෂික දායකත්ව මුදල.	EURO 5711	රු.9,48,482.88
10. කියතෝ සන්ධානය සඳහා වාර්ෂික දායකත්ව මුදල.	EURO 3078	රු.5,11,194.24

දායකත්ව මුදල් ගෙවීම සිදුකර ඇත.

➢ **අන්තර්ජාතික ඕසෝන් දින සැමරුම් ජාතික උත්සවය 2015:**

2015 වර්ෂයේ දී ඕසෝන් ස්ථරය සුරැකීම සඳහා බිහි වූ වියනා සම්මුතියට වසර 30ක් සැපිරීම නිමිත්තෙන් එහි 30 වන සැමරුම් සමරනු ලැබූ අතර ශ්‍රී ලංකාව ද එම සම්මුතියේ පාර්ශවකරුවකු වශයෙන් 2015 වසරේ අන්තර්ජාතික ඕසෝන් දින සැමරුම් සැප්තැම්බර් මස 16 වන දින අන් වසර වලට වඩා වැදගත් විය. එම වසරේ තේමාව වූයේ "30 වසරක එකමුතුවෙන් ඕසෝන් වියන සුරක්ෂිතවිය "යන්නයි.

2015 වර්ෂයේ අන්තර්ජාතික ඕසෝන් දින සැමරුම් ජාතික උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමා, ගරු. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා,ගරු උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා, ගරු නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු දෙස් විදෙස් සම්භාවනීය

අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් මොරටුව ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනයේදී පවත්වනු ලැබීය.ඒ අතර රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල නිළධාරීන් මෙන්ම 700ක් පමණ වන පාසල් සහ තාක්ෂණික විද්‍යාල සිසුන් ද මෙම අවස්ථාවට සහභාගී වුහ.

අන්තර්ජාතික ඕසෝන් දින සැමරුම් ජාතික උත්සවයේ ප්‍රධාන අංගයන්:

- පළමුවන ශීතකාරක ප්‍රතිවක්‍රීකරණ මධ්‍යස්ථානය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනයේ දී නිල වශයෙන් විවෘත කිරීම.
- වියානා සම්මුතියට වසර 30ක් සැපිරීම නිමිත්තෙන් මෙන්ම පළමුවන ශීතකාරක ප්‍රතිවක්‍රීකරණ මධ්‍යස්ථානය නිල වශයෙන් විවෘත කිරීම නිමිත්තකරගෙන පුවත්පත් දැන්වීමක් පළ කිරීම.
- මුළු දිවයිනම ආවරණය කරමින් චිත්‍ර තරගයක් පැවැත්වීම හා ජයග්‍රහණය කරනු ලැබූ චිත්‍ර ප්‍රදර්ශනය කිරීම.
- කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඕසෝන් නිරීක්ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට අදාළව නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීම.
- ඕසෝන් ස්ථරය සුරැකීමට අදාළ වියානා සම්මුතිය සහ මොන්ට්‍රියල් සන්ධානයේ වගකීම් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට අදාළව විද්වත් පිරිසක් විසින් ලියනු ලැබූ හරවත් ලිපි ඇතුලත් ග්‍රන්ථයක් මුද්‍රණය කිරීම.

ජාත්‍යන්තර රැස්වීම්, සමුළු සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීම:

මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශවකරුවකු වශයෙන් ශ්‍රී ලංකාව පහත සඳහන් ජාත්‍යන්තර සමුළු, රැස්වීම් සඳහා ඉහත කාල සීමාව තුල දී සහභාගී විය.

- 2015 ජුලි මස 20 සිට 24 දක්වා ප්‍රංශයේ පැරිස් නුවර දී 36 වන වියානා සම්මුතියේ පාර්ශවකරුවන්ගේ රැස්වීම පවත්වනු ලැබීය.
- 2015 ඔක්තෝබර් මස 22 සිට 23 දක්වා තායිලන්තයේ බැංකොක් නුවර දී හරිත ශීතකාරක පිළිබඳව පුහුණු වැඩමුළුවක් පවත්වනු ලැබීය.
- 2015 නොවැම්බර් මස 01 සිට 05 දින දක්වා ඩුබායිහි දී වියානා සම්මුතියේ පාර්ශවකරුවන්ගේ රැස්වීම පවත්වනු ලැබීය.
- ආසියානු පැසිෆික් කලාපීය වායුසම්කරණ නිෂ්පාදන පිළිබඳ වැඩමුළුවක් 2016 පෙබරවාරී 29 සිට මාර්තු මස 3 වන දින දක්වා චීනයේ දී පවත්වනු ලැබීය.
- 2016 අප්‍රේල් මස 4 සිට 8 දක්වා 37 වන පාර්ශවකරුවන්ගේ රැස්වීම පවත්වනු ලැබීය.
- 2016 ජුනි මස 14 සිට 20 දින දක්වා ආසියානු පැසිෆික් කලාපීය රැස්වීම පවත්වනු ලැබීය.

අමාත්‍ය මංඩල සංදේශ

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ 2015 ජූලි මාසයේ සිට 2016 ජූනි කාලය තුළ අමාත්‍යාංශ සංදේශ 42ක පමණ ප්‍රමාණයක් සඳහා අමාත්‍ය මංඩල අනුමැතිය ලබා ගන්නා ලදි, *ඇමුණුම i*

2017- යෝජිත ක්‍රියාකාරී සැළැස්ම - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

2017- ක්‍රියාකාරී සැළැස්ම - සැමට පිවිතුරු වාතය

ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	2017 වර්ෂය සඳහා ඉලක්ක	
		භෞතික	මූල්‍ය
වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රය (MAC) හරහා වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ සියලු වැඩසටහන් සම්බන්ධීකරණය	වායු සම්පත් කළමනාකරණ කමිටු රැස්වීම් 6 ක් පැවැත්වීම • ස්ථානීය ප්‍රභවයන්ගෙන් සිදු වන වායු විමෝචන පාලනය සඳහා වන ප්‍රමිතීන් පිළිබඳ කර්මාන්ත අංශය දැනුවත් කිරීම සඳහා පුළුල් වැඩසටහනක් ඇති කිරීම සඳහා. • ගෘහස්ථ වායු දූෂණය සම්බන්ධ ගැටළු පාලනය කිරීම සඳහා සැලැස්මක් සංවර්ධනය කිරීම සඳහා. • සුපිරිසිදු තාක්ෂණ ක්‍රමවේදයන් ප්‍රවර්ධන ක්‍රමවේදය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා • ඉන්ධන තත්ත්ව මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම පිළිබව සාකච්ඡා කිරීම සඳහා.	රැස්වීම් 6 ක් පැවැත්වීම	600
වායු සම්පත් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශන	• ශ්‍රී ලංකාවේ ඉන්දන තත්ත්ව මාර්ග සිතියම මුද්‍රණය සහ එලි දැක්වීම. • තිරසාර ප්‍රවාහනය පිළිබඳ දැනුවත් කිරීමේ උපාංග.	ඉන්දන තත්ත්ව මාර්ග සිතියම/දැනුවත් කිරීමේ පත්‍රිකාව	300
දැනුවත් කිරීම, අධ්‍යාපන, තොරතුරු හා දැනුම කළමනාකරණය	• වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම. • කොළඹ සහ මහනුවර දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 3 ක් පැවැත්වීම. • ස්ථානීය ප්‍රභවයන්ගෙන් සිදු වන වායු විමෝචන පාලනය සඳහා වන ප්‍රමිතීන් පිළිබඳ කර්මාන්ත අංශය දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම.	මාධ්‍යවේදීන්, පාසල් සිසුන් සහ කර්මාන්ත අංශය දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 6 ක් පැවැත්වීම	1400
පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කිරීම	• රාජ්‍ය සහ පෞද්ගලික හවුල් වැඩසටහනක් ලෙස හදුනාගත් පාසල් සඳහා පාසල් ළමුන් අතර පාපැදි ප්‍රවර්ධනයට වැඩසටහනක් පැවැත්වීම.	වැඩසටහන් 1ක් පැවැත්වීම	800
ගෘහස්ථ වායු දූෂණය	• ගෘහස්ථ වායු තත්ත්වය පිළිබඳව පාදීය දත්ත රැස්කිරීම සඳහා අධ්‍යයනයන් 2ක් පැවැත්වීම.	වාර්තා 2 ක්	800
සුපිරිසිදු තාක්ෂණය	• විද්‍යුත් වාහන ආරෝපණය සඳහා සූර්ය	රැස්වීම් 4 ක්	250

ප්‍රවර්ධනය	බලශක්තිය යොදා ගැනීම ප්‍රවර්ධනය • ඒ සඳහා කැබිනට් මණ්ඩල පත්‍රිකාවක් සකස් කර අනුමැතිය ලබා ගැනීම	පැවැත්වීම කැබිනට් මණ්ඩල පත්‍රිකා 1	
වායු තත්තව කළමනාකරණ කේන්ද්‍රය නඩත්තු කටයුතු	• දුරකථන බිල් පත් ගෙවීම්		50
සදාචාර විරෝධී සහ නොදැනුවත්ව භාවිතයන් කළමනාකරණ	• මාර්ග ඉදිකිරීම් කටයුතු හේතුවෙන් සිදුවන වායු දූෂණය අවම කිරීම සඳහා ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ සකස් කිරීම.	රැස්වීම් 6 ක් පැවැත්වීම	500

2017 ක්‍රියාකාරී සැලැස්ම ශාක සත්ව හා පරිසර පද්ධති සුරැකීම

වැය විෂය	ව්‍යාපෘති නම	2017 සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්	වෙන් කරන ලද මුදල (රු.) මිලියන
13 -GEF	ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් ඇතුළුවීම හා පැතිරීම පාලනය සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය	නියමු ප්‍රදේශ වලආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් පාලනය සහ කළමණාකරනයට අදාල වන ක්‍රියාකාරකම් පසුවිපරම් කිරීම,ජාතික සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, ජාතික ක්‍රියාකාරී සැලැස්මට අනුව එහි පවතින ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.	10
58 - GEF	මානව පෝෂණ ය හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ජෛව විවිධත්වය හා කිරසාර භාවිතය අනුප්‍රවහගත කිරීම	* දේශීය ප්‍රජාව සමඟ ආහාර සම්බන්ධ කටයුතු වල බලපෑම අධ්‍යයනය සහ තක්සේරු කිරීම, * ප්‍රජාව තුලින් ලබා ගත් පර්යේෂණ ,තොරතුරු ලේඛණ ගත හා ප්‍රකාශයට පත් කිරීම, * අන්තර්ජාතික පෝෂණ දත්ත ගබඩා සහ තොරතුරු පද්ධති හා සම්බන්ධ වූ ජාතික දත්ත ගබඩා හා තොරතුරු පද්ධතිපිළියෙල කිරීම, * තොරතුරු සහ ප්‍රවීනතාවන් හුවමාරු කර ගැනීම සඳහා GEF රටවල් අතර සබඳතා ශක්තිමත් කිරීම, * තෝරාගත් ක්ෂේත්‍ර තුල ජෛව විවිධත්වය හා මානව පෝෂණයට වඩාත් යෝග්‍ය ක්‍රියාමාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, * ජෛව විවිධත්වය හා මානව පෝෂණ තෝරාගත් ජාතික තොරතුරු ක්‍රියාකාරකම් ලෙස ක්‍රියාත්මක කිරීම, * නවීන ජීවන රටාවන්ට ගැලපෙන ආහාර වට්ටෝරු සහ පෝෂණ ගුණයෙන් අනූන දේශීය ආහාර වට්ටෝරු ප්‍රකාශ කිරීම. * තෝරාගත් පෝෂණ ගුණයෙන් බහුල දේශීය ආහාර භාවිතය සඳහා අන්තර් ජාතික	37

		ප්‍රකාශන නිතුක් කිරීම. * අන්තර්ජාතික සහ ජාතික රැස්වීම් සහ සම්මේලන සඳහා සහභාගිවීම	
60- GEF	ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප සංරක්ෂණය සහ දේශගුණික විපර්යාස වලට ජනයා අනුගත කිරීම	* ගොවීන් විසින් භාවිතා කරන පාරම්පරික ජාන සම්පත් ලැයිස්තු ගත කිරීම,ව්‍යාපෘති ක්ෂේත්‍ර තුන තුල ජෛව විවිධත්ව ලේඛන පිළියෙල කිරීම සහ පවත්වාගෙන යාම,බෝග පශු සම්පත් සම්බන්ධ ජෛව විවිධත්වය සහ අදාල කළමණාකරන ක්‍රියාමාර්ග ලැයිස්තුගත කිරීම සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම, *ජෛව විවිධත්ව පොළ පැවැත්වීම, *ප්‍රජා බීජ බැංකු ස්ථාපිත කිරීම, * ව්‍යාපෘති ක්ෂේත්‍ර 03 තුල ගොවීන්/ප්‍රජාව විසින් භාවිතා කරන සම්ප්‍රදායික බෝග ,සත්ව ප්‍රභේද සහ අනෙකුත් ශාක විශේෂ සහභාගිත්ව ප්‍රවේශ මගින් නැවත හඳුන්වාදීම සහ විනිශ්චය කිරීම, * සහභාගිත්ව ප්‍රභේද තෝරා ගැනීමේ ප්‍රවේශ සහ ගොවි එකමුතු වැනි අනෙකුත් අදාල ප්‍රවේශ භාවිතයෙන් ගොවි බිම් තුල අත්හදා බැලීමෙන් නව විවිධත්ව අත්හදා බැලීම සහ විනිශ්චය කිරීම. * ස්වාභාවික සහ වගා පද්ධති වල තරහය අඩු කිරීම සඳහා අත්හදා බැලීමේ සහ ස්ථාපිත කිරීමේ ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම, * ව්‍යාපෘති ක්ෂේත්‍ර 03 තුල දේශීය වෙළඳපොළ හරහා සාම්ප්‍රදායක සහ නව බීජ ප්‍රභේද වැඩි දියුණු කිරීම, * අගය එකතු කල කෘෂි ජෛව විවිධත්ව නිෂ්පාදන සඳහා දේශීය වෙළඳපොල යාන්ත්‍රණය ඇති කිරීම. * දැනුවත් කිරීමේ උපායමාර්ග සහ ප්‍රතිපත්ති සහ අනුප්‍රවාහගත කිරීමේ ක්‍රියාමාර්ග සහ තොරතුරු බෙදා හැරීම සඳහා පුහුණු වැඩමුළු ඇතුලත් ක්‍රියා සැලැස්ම වැඩිදියුණු කිරීම.	35
නව	ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ කාටජීනා සංධානයට අනුකූලව ජාතික ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ කාර්ය රාමුව ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය	දැනට GEF සඳහා ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කර ඇති අතර 2017 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.	
ජෛව විවිධත්ව සහ ස්වාභාවික සම්පත් තිරසර කළමණාකරනය160-02-03-104-2502-11-BD			18.55

104-2502-11-BD- (a)		ගෝලීය සහ ජාතික රතු දත්ත යාවත් කාලීන කිරීම, රතු දත්ත ලේඛනය ඇගයීමේ වැඩමුළු පැවැත්වීම, තර්ජනයට ලක් වූ සහ දත්ත ඌන ශාක සහ සතුන් පිළිබඳ පර්යේෂන සම්බන්ධීකරනය, GIS සිතියම් ගත කිරීම , තර්ජනයට ලක් වූ ජීවී විශේෂ සහ සමනල උද්‍යාන පිහිටුවීම,ජෛව විවිධත්ව මූලික සමීක්ෂණ සිදු කිරීම, ප්‍රකාශන, ක්ෂේත්‍ර අධ්‍යයන, ධාරිතා වර්ධනය සහ දැනුවත් කිරීමේ වැඩමුළුව, පරාගකාරක පර්යේෂන අධ්‍යනයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඊට අදාල ප්‍රකාශ,ජෛව විවිධත්ව පැතිකඩ ක්‍රියාත්මක කිරීම,කඩොලාන ජාතික ප්‍රතිපත්තිය සැකසීම, තර්ජනයට ලක්වූ කඩොලාන පුනරුත්තාපනය කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක්ව සිදු කිරීම, ක්ෂේත්‍ර වාරිකා,ජාතික දත්ත පද්ධතිය සැකසීම,පර්යේෂන දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම, ප්‍රකාශන,පුරාජෛව විවිධත්ව ප්‍රදේශ හඳුනා ගැනීම, ගුහා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම, ජෛව විවිධත්ව සහ කඳුකර දින	
104-2502-11-BD- (b)		පරිසර පද්ධති සේවා සඳහා ගෙවීම් ක්‍රම ආයතන ගත කිරීම,එහිදී පරිසර පද්ධති සේවා හා ජෛව විවිධත්ව වටිනාකම් ගණනය කිරීම සඳහා පරිසර පද්ධති සේවා වෙළඳපොළක් නිර්මානය කෙරේ, පුහුණුවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම,පරිසර පද්දති සේවා ආයතන ගත කිරීම සඳහා සරසවි සිසුන්ට පර්යේෂණ මුදල් සැපයීම,ඒවා ආයතන ගත කිරීම සඳහා සංනිවේදන සහ සමාජගත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,ජාන සම්පත් වෙත ප්‍රවේශ සහ එහි ප්‍රතිලාභ බෙදාදීම පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්ති සහ අමුද්‍රව්‍ය හුවමාරුව සඳහා වන ගිවිසුම් අවසන් කිරීම.	
104-2502-11-BD- (c)	පර්යේෂණ, සංවර්ධනය සහ තාක්ෂණය හුවමාරුව	ජෛව සුරක්ෂිතතාව පිළිබඳ අවධානම් තක්සේරුව සහ අවධානම් කළමණාකරනය පිළිබඳ වැඩමුළු/ප්‍රකාශන, පර්යේෂන	
පරිසර ප්‍රතිපත්තීන් සැකසීම, සමාලෝචනය සහ අඩුපාඩු විශ්ලේෂණය**160-02-03-01-2502-11-BD 01**			
160-02-03-01-2502-11-BD(01)	පාරම්පරික දැනුම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම	ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම,ප්‍රකාශන, පාරම්පරික දැනුම පිළිබඳ දැනුවත් කිරීම	1

2017- ක්‍රියාකාරී සැළැස්ම - දේශගුණ විපර්යාස මඟින් ඇතිවන අභියෝගයන්ට මුහුණ දීම

ප්‍රධාන ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	ඉලක්කය	
		භෞතික	මූල්‍ය (රු.)
දේශගුණික විපර්යාස වලට අනුහුරුවීමේ ක්‍රමෝපායන් සහ අවම කිරීමේ විකල්ප ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීම	1.1 දේශගුණ විපර්යාස පිළිබඳ අනුගත වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ පළාත් සඳහා දේශගුණික විපර්යාස අනුවර්තන සැලසුම් සකස් කිරීම	සම්බන්ධීකරණ කමිටුව පිහිටුවීම සහ කමිටු රැස්වීම් පැවැත්වීම	100,000.00
		ආංශික දේශගුණික සේල්ස් 10 පිහිටුවීම සහ පැවැත්වීම	100,000.00
		පළාත් සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ අනුවර්තන සැලසුම් සකස් කිරීම සඳහා සහාය ලබා දීම	300,000.00
	1.2 දේශගුණ විපර්යාස වල අභිතකර බලපෑම් අවම කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය හඳුනා ගැනීම සහ ප්‍රවලිත කිරීම	දැනුවත් කිරීමේ හා ධාරිතා වර්ධනය තුලින් ව්‍යාපෘති යෝජනා කැඳවීම	40,000.00
		තාක්ෂණය හඳුනා ගැනීමේ කමිටුව (Review Committee on Climate Change Development and Transfer) පැවැත්වීම සහ යෝග්‍ය තාක්ෂණික ක්‍රමවේද හඳුනා ගැනීම	60,000.00
		මූල්‍යාධාර ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කර ඉදිරිපත් කිරීම	_
	1.3 දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික කමිටු පැවැත්වීම	දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් ආයතනික කමිටුව පැවැත්වීම	80,000.00
		දේශගුණ විපර්යාස වලට අනුහුරු වීම පිළිබඳ විශේෂඥ කමිටුව පැවැත්වීම	80,000.00
		දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවීම	110,000.00
	1.4 දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත් කිරීම සහ ධාරිතා වර්ධනය	දේශගුණික විපර්යාස මැගසින් 2 වන වෙළුම ප්‍රකාශයට පත් කිරීම	300,000.00
		දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත් කිරීමේ මෙවලම් සකස් කිරීම	100,000.00
		දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත් කිරීමේ හා ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම	100,000.00
	1.5 දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම	දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලයේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම සහ වසම් ලියාපදිංචි කිරීම	30,000.00
	1.6 කාබන් විමෝචනය අවම කිරීමේ උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම	කාබන් විමෝචනය අවම කිරීමේ උපායමාර්ගික සැලැස්ම මුද්‍රණය කිරීම	100,000.00
		අදාළ අංශ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	150,000.00
		අදාළ අංශ සඳහා ක්‍රියාකාරී සැලසුම් ඒකාබද්ධ රැස්වීම	80,000.00
	1.7 දේශීයව තීරණය කරන ලද දායකත්වය (INDCs) ක්‍රියාත්මක කිරීම සඳහා පෙර සුදානම් සැලසුම (Readiness Action Plan)	අධීක්ෂණය හා ඇගයුම් යාන්ත්‍රනය ස්ථාපිත කිරීම	80,000.00
		පෙර සුදානම් සැලසුම ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන සමාලෝචනය කිරීම	40,000.00
	1.8 හරිත දේශගුණ අරමුදල සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම	ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	120,000.00
		ජාතික බලාත්මක අධිකාරියේ අනුමැතිය ලබා දීම	_
	1.9 දේශගුණික අවධානම පිළිබඳ ජගත් සංසදය	රැස්වීම්, වාර්ෂික සංසද, පාර්ශව රාජ්‍යයන්ගේ ඉරිරිපත් කිරීම්, සාමාජිකත්වය යාවත්කාලීන කිරීම් සඳහා ක්‍රියාකාරිව මැදිහත්වීම්	_
	1.10 දේශගුණ විපර්යාස පිළිබඳව	දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ ලේකම් කාර්යාලයට අවශ්‍ය	_

	එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) ක්‍රියාත්මක කිරීමේ ලේකම් කාර්යාලය හා කියෝතෝ සන්ධානය සමග සම්බන්ධීකරණය	වාර්තා සැපයීම	
		දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ 23 වන පාර්ශවකරුවන්ගේ රැස්වීම සඳහා සුදානම් වීම	30,000.00
	1.11 දේශගුණික විපර්යාස පිළිබඳ තිම්පු ප්‍රකාශය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කටයුතු පසු විපරම් කිරීම	සාර්ක් ලේකම් කාර්යාලය වෙත වාර්තා ඉදිරිපත් කිරීම	–
	1.12 දේශගුණික විපර්යාස අංශයේ මාසික ප්‍රගති වාර්තා/ කාර්තුමය වාර්තා/ ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය සහ වෙනත් වාර්තා සකස් කිරීම	මාසික ප්‍රගති වාර්තා, ක්‍රියාකාරී සැලැස්ම 2017 සහ වෙනත් වාර්තා පිළියෙල කිරීම	–
	1.13 ද්වි වාර්ෂික යාවත්කාලීන කිරීමේ වාර්තාව (BURs) සකස් කිරීම	ද්වි වාර්ෂික යාවත්කාලීන කිරීමේ වාර්තාව ඉදිරිපත් කිරීම	–
		ද්වි වාර්ෂික යාවත්කාලීන කිරීමේ වාර්තාව ක්‍රියාත්මක කිරීම සඳහා මූලික සැකැස්ම සකස් කිරීම	
	1.14 ශ්‍රී ලංකාවේ පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය සඳහා වූ ජාතික බලාත්මක අධිකාරිය ලෙස නව පවිත්‍ර සංවර්ධන ව්‍යාපෘති ඇගයීම හා අනුමත කිරීම (DNA)	PIN අංකය සහ PDDs ඇගයීම සහ සත්කාරක රට සඳහා අනුමැතිය ප්‍රකාශයට පත් කිරීම	–
	1.15 දකුණු ආසියාතික දේශගුණ විපර්යාස ක්‍රියාකාරකම් සඳහා ධාරිතා වර්ධන තාක්ෂණික සහයෝගිකතාව [(R-CDTA) Action on Climate Change in South Asia]	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම	ආසියානු සංවර්ධන බැංකුවේ සෘජු ආධාර යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියකි
	1.16 "පුනරුදය" වැඩසටහන ක්‍රියාත්මක කිරීම	ආදර්ශ දේශගුණික් පසන් නගර (Climate Smart Cities) පිහිටුවීම	*ව්‍යාපෘති වාර්තාව පිළියෙල කර දේශීය අරමුදල් ලබා ගැනීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම
		ආදර්ශ දේශගුණ අනුහුරු ගම්මාන (Climate Resilient Villages) ස්ථාපිත කිරීම	
	1.17 "ගෝලීය දේශගුණික විපර්යාස පිළිබඳ ගිවිසුම හා දේශීය උපායමාර්ගික සම්මුතිය" යන අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම	දේශගුණික විපර්යාස පනත සකස් කිරීම	*ව්‍යාපෘති වාර්තාව පිළියෙල කර දේශීය අරමුදල් ලබා ගැනීම සඳහා ජාතික සැලසුම්
		දේශගුණික විපර්යාස කොමිසම පිහිටුවීම	

			දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම

ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්

නව වැව් සහ අමුණු ප්‍රතිසංස්කරණ

නම	පිහිටි ප්‍රදේශය	ඇස්තමේන්තුගත මුදල
කන්දේ ඇල	නිල්දන්ඩාහින්න	1,986,855.58
මොර බැද්ද ඇල	නිල්දන්ඩාහින්න	1,990,150.55
ගොඩමඩ ඇල	නිල්දන්ඩාහින්න	1,989,729.28
තඹාල වැව	ලංකාපුර	6,000,000.00
පුලුටුමාන් වැව	මැදිරිගිරිය	5,700,000.00
වඩිග වැව ප්‍රධාන කාර්යයන්	මැදිරිගිරිය	9,100,000.00
වඩිග වැව පහළ නිම්න සංවර්ධනය	මැදිරිගිරිය	1,600,000.00
උල්කටු ඇළ අමුණ	මැදිරිගිරිය	3,950,000.00
නෙළුම් වැව	මැදිරිගිරිය	4,000,000.00
දිවුලන්කඩවල වැව	මැදිරිගිරිය	9,600,000.00
පුලුටුමාන් ඉහළ වැව	මැදිරිගිරිය	5,500,000.00
සින්නකොලනි ඇළ මාර්ගය	මැදිරිගිරිය	1,100,000.00
තන්තුනේරිය අමුණ	ලංකාපුර	5,900,000.00

2017 ක්‍රියාකාරී සැලැස්ම

ප්‍රධාන ක්‍රියාකාරකම	අනු ක්‍රියාකාරකම	අරමුණ	
		භෞතික	මූල්‍ය (රු.මි.)
1.ගෘහාශ්‍රිත ආහාර සුරක්ෂිතතාව දියුණු කිරීම හා වර්ෂා	1.1. දේශගුණ විපර්යාස වලට අනුහුරුවීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා ඉලක්ක ගත ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ තුල විවිධාංගීකරණයෙන් යුතු ගෙවතු වගාවන්		70

ජලයෙන් වගා කරන ගොවි පවුල් සඳහා නම්‍යශීලි ජීවනෝපාය ක්‍රම හඳුන්වාදීම.	පාදක කර ගත් කෘෂි වන වගා ඇති කිරීම		
	1.2.වර්ෂාපතන රටාවන්ගේ වෙනස්වීම්වලට අනුකූල වන පරිදි නියගයට ඔරොත්තු දෙන කෘෂි බෝග විශේෂ සහ ඒවායේ වගා ක්‍රම/ වගා කටයුතු හඳුන්වාදීම හා ප්‍රවර්ධනය කිරීම.		20
	1.3. වැසි දියෙන් ගොවිතැන් කරන ගොවි ජනතාවට දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තු දිය හැකි විකල්ප ආදායම් මාර්ග හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීම		60
	1.4.ගොවි කාන්තාවන් සඳහා දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තුදෙන ජීවනෝපාය ක්‍රමයක් ලෙස පසු අස්වනු තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම හා ප්‍රවර්ධනය කිරීම		60
	1.5 දේශගුණ විපර්යාසයන් අවම කිරීමට කෙරෙන ක්‍රියාකාරකම්වලට මූල්‍යමය සහය ලබා දීම තුලින් සාමාජීය වත්කම් හා ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම		70
2.දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන වර්ෂාපතන විචලයතාවය හා බැදි අවධානම අඩු කිරීමට ග්‍රාමීය, ප්‍රාදේශීය හා පළාත් මට්ටමින් ආයතනික සේවා සැපයීමේ ශක්‍යතාවය දියුණු කිරීම.	2.1 ස්ථානීය මට්ටමේ අනුහුරුවීමේ ක්‍රියා මාර්ගයන් නිර්මාණය කිරීමට ග්‍රාමීය, කලාපිය හා පළාත් මට්ටමින් නිලධාරීන් පුහුණු කිරීම හා යෙදවීම		17
	2.2 අනුහුරුවීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු, පුහුණුව සහ මෙවලම් තුලින් ගොවි සංවිධාන ශක්තිමත් කිරීම		28
	2.3. දේශගුණ විපර්යාස වලට සංවේදී ජීවනෝපායන් සඳහා වූ වත්කම් වන භූමිය සහ ජලය ආරක්ෂා කිරීමට ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ වල ඒකාබද්ධ ජල පෝෂක කළමනාකරණ ආකෘති ඇති කිරීම.		84
	2.4. තෝරාගත් සමාජ කොටස් සමග අවධානම් තත්ත්වයන් ඇගයීම සහ අනුහුරු වීමේ සැලසුම් සකස් කිරීම		7
	2.5. දේශගුණ විපර්යාස වලට ඔරොත්තුදෙන ප්‍රජා පාදක ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණයට අදාළ උගත් පාඩම් වාර්තා කිරීම හා තොරතුරු ලබා ගැනීම		17
	2.6.මහවැලි ද්‍රෝණියේ දේශගුණික බලපෑමෙන් වන අවධානම් නිසා ඇතිවන නායයාම් හා නියග තත්ත්වයන් සඳහා අනතුරු ඇගයීමේ සංඥා පද්ධති නිර්මාණය කිරීම සහ ක්‍රියාවට නැංවීම		21

2017- ක්‍රියාකාරී සැළැස්ම- වගකීමෙන් යුතු ඉඩම් පරිහරණය

ප්‍රධාන ක්‍රියාකාරකම්	අනු ක්‍රියාකාරකම්	ඉලක්කය	
		භෞතික	මූල්‍ය
1. ලංකාවේ තිරසර භූමි කලමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය පැවැත්වීම	1. පුවත්පත් දැන්වීම්පළකිරීම	සම්මන්ත්‍රණය පැවැත්වීම,සම්මන්ත්‍රණ පත්‍ර ප්‍රකාශයට පත්කිරීම	950,000.00
	2. පර්යේෂණ සංෂිප්තයඑකතු කිරීම		
	3. තෝරාගත් සංෂිප්ත විශ්ලේෂණය		
	4. සම්පූර්ණ පර්යේෂණපත්‍ර එකතුකිරීම		
	5. සම්මන්ත්‍රණය පැවැත්වීම		
	6. සම්මන්ත්‍රණ පත්‍ර ප්‍රකාශයට පත්කිරීම		
2. ගුරු භවතුන් හා පාසල් සිසුන් සඳහා තිරසර භූමි කළමනාකරණය පිළිබඳ දැනුවත් වීමේ වැඩසටහන් පැවැත්වීම	1.යෝජනා සකස් කිරීම	දැනුවත් වීමේ වැඩසටහන් 4ක් පැවැත්වීම	250,000.00
	2. දැනුවත් වීමේ වැඩසටහන් පැවැත්වීම		
3. ඛනිජ සම්පත් සම්බන්ධයෙන් තාක්ෂණික පැතිකඩ පිළිබඳ ග්‍රන්ථයක් මුද්‍රණය කිරීම	1. කොරතුරුඑක්රැස්කිරීමසඳහා වැඩමුළු 2 ක්පැවැත්වීම	දළ ග්‍රන්ථය සකස් කිරීම	150,000.00
	2. දළ පරිච්ඡේදයන් පිළියෙළ කිරීම සහ අදහස් ලබා ගැනීම		
4. ශ්‍රී ලංකාවේ ඛණිජ සම්පත සම්බන්ධ පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම	පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම	පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම	100,000.00

5. ලෝක කාන්තාරකරණය වැලැක්වීමේ දිනය සැමරීම	1. සංකල්ප පත්‍රය සකස් කිරීම	ජාතික වැඩසටහන පැවැත්වීම	800,000.00
	2. සහයෝගී ආයතන හඳුනාගැනීම සහ වැඩසටහන් සකස් කිරීම		
6. කාන්තාරකරණය වැලැක්වීම සඳහා සකස්කල ජාතික වැඩසටහන ක්‍රියාවට නැංවීම	ජාතික මෙහෙයුම් කමිටුව, තාක්ෂණික සමාලෝචන කමිටුව සහ ජාතික විශේෂඥ කමිටුවේ රැස්වීම් පැවැත්වීම සහ රැස්වීම් වලදී ගත් තීරණ අනුව වැඩසටහන් ක්‍රියාවට නැංවීම	ජාතික මෙහෙයුම් කමිටුව, තාක්ෂණික සමාලෝචන කමිටුව සහ ජාතික විශේෂඥ කමිටුවේ රැස්වීම් පැවැත්වීම, පාර්ශවකරුවන්ගේ වැඩමුළුවක් පැවැත්වීම	950,000.00
	ජාතික වැඩසටහන ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පාර්ශවකරුවන්ගේ වැඩමුළුවක් පැවැත්වීම		
7. තිරසාර භූමි කළමනාකරණය සහ භූමි හායනය සම්බන්ධයෙන් සම්බන්දයෙන් දැනුවත් කිරීමේ මෙවලම් සකස් කිරීම සහ මුද්‍රණය කිරීම	භූමි හායනය උදාසීන කිරීම සම්බන්ධයෙන් භාෂා 3න් පෝස්ටරයක් නිර්මාණය හා මුද්‍රණය කිරීම	2000 පෝස්ටර්– සිංහල 500 පෝස්ටර් - දෙමළ 2500 අත්පොත් - සිංහල 1500 අත්පොත් - දෙමළ।	750,000.00
	පස සංරක්ෂණය සම්බන්ධ අත්පොත මුද්‍රණය කිරීම		
8. ජාතික මැණික් ප්‍රතිපත්තියක් සකස් කිරීම	ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා කමිටුවක් ස්ථාපිත කිරීම	ප්‍රතිපත්තියේ දළ සැකැස්ම සකස් කිරීම	150,000.00
	ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම		
	ප්‍රතිපත්තියේ දළ සැකැස්ම සකස් කිරීම		
9. ඛනිජ ආයෝජකයින් සඳහා මාර්ගෝපදේශ අත්පොතක් සකස් කිරීම සහ පිටපත් මුද්‍රණය කිරීම	තොරතුරු රැස්කිරීම	අත්පොත් 300 ක් මුද්‍රණය කිරීම	200,000.00
	මාර්ගෝපදේශ කෙටුම්පත සැකසීම		
	අවසන් පිටපත සැකසීම සහ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනය කිරීම		
	අත්පොත මුද්‍රණය කිරීම		

2017 ක්‍රියාත්මක සැලැස්ම- කසළින් තොර වටපිටාවක්

ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	ඉලක්ක	
		භෞතික	මූල්‍ය 000
පොලි ක්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් පරිසර හිතකාමී කළමනාකරණය සම්බන්ධ රෙගුලාසි සකස් කිරීම	පොලි ක්ලෝරිනේටඩ් බයිෆිනයිල්ස් සම්බන්ධව රෙගුලාසි සැකසීම සඳහා වූ ජාතික විශේෂඥයක් සඳහා විෂය නිර්ණායක පත්‍රිකාවක් කෙටුම්පත් කිරීම ජාතික උපදේශකයෙකු බඳවා ගැනීම ජාතික වාර්තාව කෙටුම්පත් කිරීම	-විෂය නිර්ණායක පත්‍රිකාව/දැන්වීම/බඳවාගැනීම -වැඩමුළු/රැස්වීම් සංඛ්‍යාව -සකස් කරන ලද වාර්තා ගණන	8500
පොලි ක්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් අඩංගු උපකරණ පරිසර හිතකාමී ආකාරයට භාවිතා කිරීම සම්බන්ධව අදාල ආයතන සඳහා තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම	ජාතික උපදේශකයෙකු බඳවා ගැනීම පොලික්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් පරිසර හිතකාමී කළමනාකරණය සම්බන්ධ පුහුණු වාර්තාවක් සැකසීම පුහුණු වැඩසටහන්/වැඩමුළු සංවිධානය කිරීම	-විෂය නිර්ණායක පත්‍රිකාව/දැන්වීම/බඳවාගැනීම -වැඩමුළු/රැස්වීම් සංඛ්‍යාව -සකස් කරන ලද පුහුණු වාර්තා ගණන	8500
තොග ගණනය කිරීමේ නියැදි සැලැස්ම සැකසීම	ලංකා විදුලි බල මණ්ඩලය තුල තොග ගණනය කිරීමේ කණ්ඩායමක් ස්ථාපිත කිරීම තොග ගණනය කිරීමේ පුහුණු වැඩමුළු සංවිධානය කිරීම තොග ගණනය කිරීමේ නියැදි සැලැස්ම සැකසීම	-වැඩමුළු/රැස්වීම් සංඛ්‍යාව -තොග ගණනය කිරීමේ සැලැස්ම	1200
ට්‍රාන්ස්ෆෝමර් අවම වශයෙන් 2000ක් නියැදි පරීක්ෂාව හා විශ්ලේෂණය (නැවත පරීක්ෂාව 5%)	කොන්ත්‍රාත් ගිවිසුම සකස් කිරීම රසායනාගාරයක් තෝරා ගැනීම	-කොන්ත්‍රාත් ගිවිසුම -පුවත් දැන්වීම -විශ්ලේෂණය කරන ලද නියැදීන් සංඛ්‍යාව -වාර්තා වී ඇති නියැදීන් සංඛ්‍යාව	2400

	ප්‍රතිඵල විශ්ලේෂණය තොග ගණනය කිරීමේ ප්‍රතිඵල සකස් කිරීම		
දැනුවත් කිරීමේ මූලාශ්‍ර ලියවිලි සැකසීම හා බෙදා හැරීම	-පුවත් වාර්තා සැකසීම - දැනුවත් කිරීමේ ද්‍රව්‍යයන් සැකසීම - ව්‍යාපෘති වෙබ් අඩවිය සැකසීම	- සකසන ලද ද්‍රව්‍යයන් - දැනුවත් කිරීම සඳහා වූ සකසන ලද ද්‍රව්‍යයන් - ව්‍යාපෘති වෙබ් අඩවිය	3500
දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම	මහජනතාව සඳහා නොනැසී පවතින රසායනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පරිසරි අධිකාරිය, රේගුව, පර්යේෂණ ආයතන හා කසල කළමනාකරණය සඳහා වූ කළමනාකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්	-සහභාගිත්ව පුද්ගලයින් ගණන -දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව - පැමිණි නිලධාරී සංඛ්‍යාව	1500
පවතින රෙගුලාසි වල හිඩැස් හා බාධා විශ්ලේෂණය කිරීම	විශේෂඥයෙකු බඳවා ගැනීම වාර්තා සැකසීම	-බඳවා ගැනීම - සකස් කරන ලද වාර්තා ගණන	
ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ගුණාත්මක භාවය, අපද්‍රව්‍ය කළමනාරණය සඳහා වූ පිළිවෙත් සංශෝධනය කිරීමට පොලි ක්ලෝරිනේටඩ් බයිෆිනියිල්ස් රෙගුලාසි කෙටුම්පත් කිරීම හා ඇතුළත් කිරීම	රසායනික කළමනාකරණය සම්බන්ධයෙන් වූ රෙගුලාසි කෙටුම්පත් කිරීම	- වැඩමුළු/රැස්වීම් සංඛ්‍යාව -සකස් කරන ලද රෙගුලාසින්	1200

ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	භෞතික ඉලක්ක	මූල්‍යමය
1. මිනමාටා සම්මුතිය පිළිබඳවූ ජාතික මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීම.	- අදාළ පාර්ශව කරුවන් හා අදාළ අංශ හඳුනාගැනීම.	- වැඩමුළු/ රැස්වීම්	
2. ව්‍යාපෘති කළමණාකරන අංශයක් ස්ථාපිත කිරීම.	- ව්‍යාපෘති කාර්යය මණ්ඩලය සඳහා ගිවිසුම් සැකසීම. - ව්‍යාපෘති කළමණාකරන අංශය සඳහා ඉඩ ප්‍රමාණ වෙන් කිරීම.	- ව්‍යාපෘති කාර්යය මණ්ඩලය බඳවා ගැනීම.	

		- ව්‍යාපෘති කළමණාකරන අංශය සඳහා මිලදී අවශ්‍ය අයිතම ගැනීම.(ලී බඩු/ ලිපි ද්‍රව්‍යය)	
3. ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරකවරයෙකු පත්කිරීම.	- අදාළ තනතුර සඳහා පුවත්පත් දැන්වීමක් සකස් කිරීම. - ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරකවරයෙකු බඳවා ගැනීම.	- TOR අත්සන් කිරීම	
4. දැනට පවතින රසදිය සම්බන්ධ නීති රෙගුලාසි හා ප්‍රතිපත්ති සමාලෝචනය.	- දත්ත රැස් කිරීම.	- වාර්තා - රැස්වීම් - වැඩමුළු - සමීක්ෂණ - ප්‍රශ්නාවලි	
5. Inventory හා ප්‍රධාන අංශ මත පදනම් ව සිට රසදිය පිළිබඳ පැතිකඩක් සැකසීම.	- දත්ත රැස්කිරීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන්/ප්‍රධාන ආයතන හඳුනාගැනීම. - පැතිකඩක් සැකසීම	- වාර්තා - රැස්වීම් - වැඩමුළු - සමීක්ෂණ - ප්‍රශ්නාවලි	
6. දැනුවත් කිරීමේ ද්‍රව්‍ය සකස් කිරීම හා බෙදාහැරීම.	- පොස්ටර්/ රචනා තරඟ දීප ව්‍යාප්තව පාසල් සිසුන් අතරේ සංවිධානය කිරීම - තොරතුරු පත්‍රිකා සකස් කිරීම. - දැනුවත් කිරීමේ අත් පත්‍රිකා / පොත් පිංච පිළියෙල කිරීම. - දැනුවත් කිරීමේ වැඩමුළු අදාළ අංශ වලට හා සෙසු ජනතාවට සංවිධානය කිරීම. - දැනුවත් කිරීම සඳහා ජනමාධ්‍ය යොදාගැනීම.	1. වාර්තා 2. අත්පත්‍රිකා/ පොත් පිංච 3. රැස්වීම් 4. වැඩමුළු	
ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	භෞතික ඉලක්ක	මූල්‍යමය
1. ශ්‍රී ලංකාවේ තෝරාගත් පළාත්	- රැස්වීම් සංවිධානය - රැස්වීම් සඳහා සහභාගි වීම.	- රැස්වීම් - වාර්තා	

සඳහා සමෝධානික සන අපද්‍රව්‍ය කළමණාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.	- දත්ත හා තොරතුරු අදාළ අංශ වලට යොමු කිරීම. - ක්ෂේත්‍ර නිරීක්ෂණය	- ක්ෂේත්‍ර අධ්‍යනය	
2. බස්නාහිර පළාතේ සන අපද්‍රව්‍ය කළමණාකරණ	- රැස්වීම් සංවිධානය - රැස්වීම් සඳහා සහභාගි වීම. - දත්ත හා තොරතුරු අදාළ අංශ වලට යොමු කිරීම. - ක්ෂේත්‍ර නිරීක්ෂණය	- රැස්වීම් - වාර්තා - ක්ෂේත්‍ර අධ්‍යනය	
නුවර දිස්ත්‍රික්කයේ සන අපද්‍රව්‍ය කළමණාකරණ	- රැස්වීම් සංවිධානය - රැස්වීම් සඳහා සහභාගි වීම. - දත්ත හා තොරතුරු අදාළ අංශ වලට යොමු කිරීම. - ක්ෂේත්‍ර නිරීක්ෂණය	- රැස්වීම් - වාර්තා - ක්ෂේත්‍ර අධ්‍යනය	
ඉදිකිරීම් සම්බන්ධ අපද්‍රව්‍ය කළමණාකරණ	- රැස්වීම් සංවිධානය - රැස්වීම් සඳහා සහභාගි වීම. - දත්ත හා තොරතුරු අදාළ අංශ වලට යොමු කිරීම. - ක්ෂේත්‍ර නිරීක්ෂණය	- රැස්වීම් - වාර්තා - ක්ෂේත්‍ර අධ්‍යනය	

2017- ක්‍රියාකාරී සැළැස්ම- අධ්‍යාපන ප්‍රහුණු හා පර්යේෂණ

ප්‍රධාන ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	ඉලක්ක	
		භෞතික	මූල්‍ය '000
ප්‍රධාන පාරිසරික සිද්ධීන් සැමරීම	ප්‍රකාශන මුද්‍රණය කිරීම	සොබා සහරාව වෙළුම් දෙකකින් මුද්‍රණය කිරීම	1000
		සොබා පුවත් හසුන වෙළුම් 4 කින් මුද්‍රණය කිරීම	125
		අමාත්‍යාංශයේ පුස්තකාලයට පොත් මිලදී ගැනීම	200
	ජගත් පරිසර දිනය	උත්සව කළමනාකරණය	1500
		මාධ්‍ය ප්‍රචාරණය - ගුවන්විදුලිය - රූපවාහිනිය - පුවත්පත්	5000
		පරිසරය ආශ්‍රිත දේ සකස් කිරීම (පොත්, බැනර්, සහතික, ඵලක, ආරාධනාපත්‍ර සහ දැනුවත් කිරීමේ උපාංග)	1500

		වාර්තාමය වැඩසටහන් සකස් කිරීම	2000
		කෙටි චිත්‍රපට තරඟාවලිය සංවිධානය කිරීම	1000
		ජගත් පරිසර දිනය හා සම්බන්ධ වෙනත් කාර්යයන් (සංග්‍රහ, කෑමබීම, ප්‍රවාහන පහසුකම්, නවාතැන්....)	800
		පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන්	3500
		දැනුම මිනුම වැඩසහටන්	5500
පරිසරය පිළිබඳ අධ්‍යාපන හා දැනුවත් කිරීම ඇති කිරීම		පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් 12 ක් පැවැත්වීම	7412

2017- ක්‍රියාකාරී සැළැස්ම ජාතික ඕසෝන් ඒකකය

ප්‍රධාන ව්‍යාපෘතිය	ක්‍රියාකාරකම්	ඉලක්ක	
		භෞතික	මුල්‍ය (රු. මිලියන)
ශ්‍රී ලංකාවේ මොන්ට්‍රියල් සන්ධානය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය		**100**	**25.16**
මොන්ට්‍රියල් සන්ධානය යටතේ වූ ආයතනික ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය	- සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම. - පාර්ශව කමිටු රැස්වීම් පැවැත්වීම. - අධ්‍යාපන උපදේශකවරුන්, විද්‍යා විෂයය භාර ගුරු භවතුන්, පාසල් සිසුන් තාක්ෂණ විද්‍යාල සිසුන් ,රජයේ නිළධාරීන් ඇතුළු	රැස්වීම් 2 රැස්වීම් 1	

	විවිධ කණ්ඩායම් ඉලක්ක කරගනිමින් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. -අන්තර්ජාතික ඕසෝන් දින සැමරුම් ජාතික උත්සවය සැප්තැම්බර් 16 වන දින පැවැත්වීම. - දැනුවත් කිරීමේ මෙවලම් සකස් කිරීම සහ මුද්‍රණය කිරීම. - ඕසෝන් ප්‍රභීනකාරක ද්‍රව්‍ය පිලිබඳ ඕසෝන් ලේකම් කාර්යාලයට සහ බහුපාර්ශවීය අරමුදල වෙත වාර්තා කිරීම. - ජාත්‍යන්තර සමුළු, රැස්වීම් සදහා සහභාගීවීම.	අවම රැස්වීම් 3	
හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් බැහැරකරලීමේකළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ.	- සහනාධාර ගෙවීම් ක්‍රමයක් යටතේ අඩු ගෝලීය උණුසුම් විභවයක් සහිත නව වායුසමීකරණ යන්ත්‍ර 200 ක් රජයේ ආයතන වලට හඳුන්වාදීම. - අන්තර්ජාතික ඕසෝන් දින සැමරුම් ජාතික උත්සවය සැප්තැම්බර් 16 වන දින පැවැත්වීම. - ශීතකාරක පවිත්‍ර කිරීමේ මධ්‍යස්ථාන වල ක්‍රියාත්මකවීම		

	අඛණ්ඩව පවත්වාගෙනයාම. - **හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන්** මගින් ක්‍රියාත්මක වන නව උපකරණ ආනයනයේ දී නීති කෙටුම්පත් හදුන්වාදීම.		
හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් බැහැරකරලීමේ කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන යටතේ.	-ශීතකරණ සහ වායුසමීකරණ සේවා කිරීමේ තාක්ෂණික නිළධාරීන් සඳහා යහපත් පුරුදු පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම. - ශ්‍රී ලංකා රේගුව, ආනයන අපනයන පාලක දෙපාර්තමේන්තුව සහ ආයෝජන මණ්ඩලය වැනි ආයතන නිළධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. - **හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන්** ආනයනය සඳහා 2017 වර්ෂයට ආනයනකරුවන් වෙත කෝටා ලබාදීම. - පුහුණු වැඩමුළු, සම්මන්ත්‍රණ සඳහා දැනුවත් කිරීමේ මෙවලම්		

	සකස් කිරීම සහ මුද්‍රණය කිරීම. - ශ්‍රී ලංකාවේ ඕසෝන් ප්‍රභීන කාරක නොවන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම.		

ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	භෞතික ඉලක්ක	මූල්‍යමය
*වාර්ෂික දායකත්ව මුදල් ගෙවීම.		සෑම අයතනයක් සඳහාම දායකත්ව මුදල් ගෙවීම	රු..25M
බාසල්,රොඩර්ඩෑම්,ස්ටොක්හෝම් සහ මිනමාටා සම්මුතීන් සඳහා වන ජාතික සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීම			
ප්‍රවීණයන් සඳහා වන ගෙවීම් වෙනුවෙන් කළමණාකරණ සේවා දෙපාර්තමෙන්තුවේ අනුමැතිය ලබාගැනීම.			
කමිටු රැස්වීම් සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන්කර ගැනීම.			
කමිටු රැස්වීම් සඳහා අදාළ ප්‍රවීණයන් තෝරා ගැනීම.(බාසල්තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා ජාතික ගැටලු සැලකිල්ලට ගෙන) වර්ෂයක් සඳහා කමිටු රැස්වීම් පැවැත්වීම.			
පරිසර සම්මුතින් හා සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ආයතන සඳහා වාර්ෂිකව අදාළ සම්මුතීන්ගේ ජාතික කේන්ද්‍රස්ථානය පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම.			

2017 වර්ෂය සඳහා නීති අංශය සැළසුම් කරන ලද කාර්යයන්

ප්‍රධාන ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	ඉලක්කය	
		භෞතික	මූල්‍ය
1.පරිසර නීතිය පිළිබඳ වැඩමුළු පැවැත්වීම	පොළොන්නරුව, මඩකලපුව, රත්නපුරය හා ගාල්ල යන දිසාත්‍රික්ක සඳහා පොලිස් නිළධාරීන් පරිසර නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම	04	රු.800,000.00
2. අභියාචනා විභාග කිරීම	ජාතික පාරිසරික පනත, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනත, පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ ඉදිරිපත්වන අභියාචනා විභාග කිරීම	ජාතික පාරිසරික පනත -40 ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනත- 30 පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත- 25 වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත - 130	-
3. අධිකරණයේ, මානව හිමිකම් කොමිෂන් සභාවේ, ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ පවරන නඩුකටයුතු පවත්වාගෙනයාමට සහාය ලබා දීම		නඩු - 24	-
4. පනත් කෙටුම්පත් සැකසීම හාඅමාත්‍යාංශය යටතේ පවතින ආයතන වලින් අමාත්‍යාංශය වෙත එවනු ලබන ගැසට්පත්‍ර		ගැසට්පත්‍ර /පනත් කෙටුම්පත් - 25	-

සම්බන්ධව අදහස් ඉදිරිපත් කිරීම, නීති කෙටුම්පත් සම්පාදක වෙත යැවීම හා ගරු අමාත්‍යතුමා ගේ අත්සන ලබා ගැනීම තෙක් කටයුතු කිරීම			
5. අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින අනෙකුත් ආයතන සඳහා අවශ්‍ය ගිවිසුම් සකස්කර දීම හා පරීක්ෂාකර නිවැරදිභාවය තහවුරුකර දීම.		ගිවිසුම් - 34	-
6. මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු සිදු කිරීම.		පැමිණිලි - 40	-

II වන කොටස

2015 ජූලි සිට 2016 ජූනි දක්වා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය

01.වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණ

2015.07.01 – 2016.06.30

හැඳින්වීම

වර්තමාන සහ අනාගත පරම්පරාවල යහපත උදෙසා වන සම්පත් ඵලදායී ලෙස සහ කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ අරමුණින් වන ආඥා පනතේ විධි විධාන වලට යටත්ව 1887 දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදි. වන විද්‍යා හා වන කළමනාකරණ, වන සංගනණ හා භූ විද්‍යා තොරතුරු, වන පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන, සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති, සැලසුම් හා ප්‍රගති පාලන, ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීම් සහ පරිසර සංරක්ෂණ සහ කළමණාකරණ යන තාක්ෂණික අංශ හතක් යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් සංවිධානය කර තිබේ.

ප්‍රධාන වගකීම්

- දේශගුණික තත්වයන් වඩාත් සතුටුදායක තත්වයකට පත් කිරීම, ශාක සහ සතුන් සංරක්ෂණය කිරීම, පාංශු සහ ජල සම්පත් සංරක්ෂණය කිරීම සහ සෞන්දර්යාත්මක, ඓතිහාසික, විනෝදාත්මක, සමාජ සහ ආර්ථිකඅරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් වන ආවරණයක් සංරක්ෂණය කිරීම සහ නඩත්තු කිරීම.
- වනාන්තර වලින් ලබා ගැනීමට හැකි ප්‍රයෝජන පිළිබඳව සලකා බලා ඒකාබද්ධ සහ බහු ආංගික ඉඩම් පරිහරණ ක්‍රම තුලින් වනාන්තර වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම තහවුරු කිරීම.
- රටේ දැව අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකිවන පරිදි වන සම්පත් වල විද්‍යාත්මක කළමනාකරණය සහ තිරසාර සංවර්ධනය තහවුරු කිරීම.
- ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි වනාන්තර හා සම්බන්ධ සියළු සංවර්ධන කටයුතු වලදී හා ඉන් ප්‍රයෝජන ලබා ගැනීමේදී පාරිසරික ආරක්ෂණ ක්‍රම වේදයන් යොදා ගැනීම.
- වනාන්තර සංරක්ෂණය සහ සංවර්ධනය ප්‍රවර්ධනය කරන ආයතන අතර සමීප සම්බන්ධතා ගොඩ නංවා ඔවුන්ගේ කටයුතු වඩාත් ඵලදායී අන්දමට සිදු කිරීමට සහාය දැක්වීම.
- ප්‍රජාමූල වන විද්‍යා වැඩසටහන් මගින් වන සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ සංරක්ෂණය සඳහා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.
- වනාන්තර සංරක්ෂණය සහ සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා වන විද්‍යා අධ්‍යාපන සහ ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම.

ප්‍රධාන අභියෝග

- ජාතික වන ආවරණය වත්මන් මට්ටමේ පවත්වා ගන්නා අතරතුර එය මුළු බිම් ප්‍රමාණයෙන් 32% ක් දක්වා ඉහල නැංවීම.
- වන නීතිය කඩකරන්නන්ගෙන් විරුද්ධව වන සංරක්ෂණ පනත යටතේ නීතිය ක්‍රියාත්මක කිරීම.
- ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම.
- විවිධ ඉඩම් පරිභෝජන ක්‍රම සඳහා වනාන්තර ඉඩම් පරිවර්තනය කිරීම වැලැක්වීම.
- වන සම්පත් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මෙන්ම පාරිසරික සංවාරක කර්මාන්තය සඳහාද ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගිත්වය තහවුරු කිරී

ප්‍රගතිය : 2015 ජූලි - 2016 ජූනි

නැවත වන වගා කිරීම	රටේ දැව අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා හෙළීම් සිදු කර තිබෙන හෙක්ටයාර් 612.3 ක ආර්ථිකමය වටිනාකමකින් යුක්ත දැව විශේෂ නැවත වගා කරන ලදි.
මිනුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම	වනාන්තර ඉඩම් වල කි.මී.2894.34ක මිනුම් කටයුතු සහ මායිම් සලකුණු කිරීමේ කටයුතු සිදු කරන ලදි.
වන වගා බිම් වල වන විද්‍යාත්මක මෙහෙයුම්	අදාළ කාල පරිච්ඡේදය තුල තෝරාගත් වන වගා හෙක්ටයාර් 2574.15 කවන විද්‍යාත්මක මෙහෙයුම් සිදු කරන ලදි.
නව ගොවි වන වගා ස්ථාපනය කිරීම	මෙම කාල පරිච්ඡේදය තුලදී ගොවි වන වගා හෙක්ටයාර 115ක් ස්ථාපනය කරන ලදි.
පැරණි ගොවි වන වගා නඩත්තු කිරීම.	වන වගාහෙක්ටයාර 721.6කපිරිසිදු කිරීමේ සහ වල් නෙලීමේ කටයුතු සිදු කරන ලදි.
ගෙවතු සංවර්ධනය සහ රුක් කළමනාකරණය	අදාළ කාල පරිච්ඡේදය තුලදී රුක් කළමනාකරණ වැඩසටහන් 100 ක් සඳහාබීජ පැල සහ තාක්ෂණික සහාය ලබා දෙමින් ගෙවතු 5239ක් සංවර්ධනය කරන ලදි.
පරිසර කළමනාකරණය හා පාරිසරික සංචාරක කර්මාන්තය	සිංහරාජ, නකල්ස්, උඩවත්තකැලේ, ඔලියගන්කැලේ, කුරුළුකැලේ සහ කන්නෙලිය සංරක්ෂණ වනාන්තර නඩත්තු කරන ලදි. මෙහිදී පාරිසරික සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා සිදුකල ක්‍රියාකාරකම් වලට ස්වභාවික මංපෙත් විවෘත කිරීම සහ නඩත්තු කිරීම, වැටවල් සකස් කිරීම, යටි වගාව සහ නාම පුවරු ඉදි කිරීම අයත් වේ. තවද ඩිස්ටන්, ඉලුක්කුඹුර, කන්නෙලිය සහ පිටදෙනිය සංරක්ෂණ මධ්‍යස්ථාන ද නඩත්තු කරන ලදි. පාසැල් සිසුන්, ප්‍රජා සංවිධාන සහ ගම්වැසියන් සඳහා (සිංහරාජ, නකල්ස් සහ කන්නෙලිය සංරක්ෂණ වනාන්තර අවට වෙසෙන) වනාන්තර සංරක්ෂණය සහ පරිසර කළමනාකරණය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.
වන වගා කළමනාකරණය	මෙයට පෙර වසර තුනක කාලයකදී ස්ථාපනය කරනලද නොමේරූ වන වගා හෙක්ටයාර

	4004.18ක කළමනාකරණ කටයුතු අදාළ කාල පරිච්ඡේදය තුල දී සිදුකර එම ශාක වල වර්ධනය සඳහා පහසුකම් සලසා දෙන ලදි.
පැල තවාන් නඩත්තු කිරීම සහ බීජ පැල නිෂ්පාදනය	දෙපාර්තමේන්තු පැල තවාන් වල බීජ පැල 500,000 ක් නිෂ්පාදනය කරන ලදි. මෙමගින් රුක් රෝපණ වැඩසටහන් සඳහා නිරෝගි මෙන්ම මනාව නඩත්තු කල බීජ පැල තොග අඛණ්ඩව සැපයීමේ හැකියාවන් පවතී.
මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම.	මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය සඳහා පහත සඳහන් ක්‍රියා කාරකම් සිදු කරන ලදි. මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය : 1. ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම - හෙක්ටයාර 417.8
පයිනස් වන වගා පුළුල් පත්‍ර සහිත ශාක විශේෂ බවට පරිවර්තනය කිරීම	1. ස්ථාපනය කිරීම් - හෙක්ටයාර 30.0 2. ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම - හෙක්ටයාර 281.5
	වන සංරක්ෂණය පිළිබඳව සාමාන්‍ය මහජනයා අතර පවත්නා අවබෝධය ඉහල නැංවීම සඳහා වනව්‍යාප්ති වැඩසටහන් 965 ක් සංවිධානය කරන ලදි.

වියදම් සහ මූල්‍යමය සැලැස්ම

	2015 ජූලි සිට 2016 ජූනී අවසානය දක්වා වියදම(රු. 000)	**2017 දී අපේක්ෂිත ප්‍රමාණය (රු. 000)**
ප්‍රාග්ධන	932,174	2,232,220
පුනරාවර්තන	1281,641	1,419,400

1.2 ක්‍රියාකාරී සැලැස්ම 2017 - සාරාංශය

ප්‍රධාන ඉලක්ෂ්‍ය	ප්‍රධාන ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	ඉලක්කය	
			භෞතික	මූල්‍යමය (රු. 000)
වන ආවරණය අඩු වීම	වනාන්තර කළමනාකරණය	වන විද්‍යාත්මක ප්‍රතිකර්ම	හෙක්. 3,250	278,000
		නැවත වන වගා කිරීම සඳහා පුනර්ජනනීය හෙළීම්	හෙක්. 900	
		නොමේරූ වන වගා නඩත්තු කිරීම	හෙක්.2036	

		හායනයට පත් වූ වන වගා පුනරුත්ථාපනය කිරීම	හෙක්.50	
		පුනරුත්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම	හෙක්.25	
		බීජ සහ පොලිතීන්	පොලිතීන් බෑග් මිලියන 03	
		කාර්මික වන වගා ස්ථාපනය කිරීම	හෙක්. 500	
		පැරණි ගොවි වන වගා නඩත්තු කිරීම	හෙක්.215	2,400
		බීජ පැල සහ තවාන්	1,000,000	26,200
		පරීක්ෂණ, පර්යේෂණ සහ නව පර්යේෂණ	හෙක්.142	12,000
		ගොවි වන වගා ස්ථාපනය කිරීම	හෙක්. 100	4,000
		පරිසර කළමනාකරණය	ලෝක උරුම ස්ථාන කළමනාකරණය	20,000
		අධ්‍යාපන සහ වන ව්‍යාප්ති	වැඩසටහන් 1,200	10,000
		ගෙවතු සංවර්ධනය සහ රුක් කළමනාකරණය	10,000 (සංඛ්‍යාව) වැඩසටහන් 100	10,000 500
		ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම. 1. ස්ථාපනය කිරීම 2. නඩත්තු කිරීම	 හෙ.50 හෙ.118	 10,000
		පයිනස් වගාවන් පුළුල් පත්‍ර සහිත ශාක බවට පත් කිරීම. 1. ස්ථාපනය කිරීම 2. නඩත්තු කිරීම	 හෙ. 50 හෙ. 185	 12,000
		32% දක්වා වන ආවරණය ඉහල නැංවීම		
		(අ) නැවත වන වගා කිරීම 1. ස්ථාපනය කිරීම 2. නඩත්තු කිරීම	 හෙ.20 හෙ.420	
		(ආ) ස්වභාවික පුනර්ජනනය ප්‍රවර්ධනය කිරීම. 1. ස්ථාපනය කිරීම 2. නඩත්තු කිරීම	 හෙ.10,000 හෙ.9341	545,620
		(ඇ) වතු ඉඩම් වල වන වගා ස්ථාපනය කිරීම	හෙ.300	
		(ඈ) රක්ෂිත වනාන්තර සඳහා	255	

		කළමනාකරණ සැලසුම් සකස් කිරීම	(සංඛ්‍යාව)	
		(ඉ) වන වගා කළමනාකරණ සැලසුම් යාවත්කාලීන කිරීම.	2 (සංඛ්‍යාව)	
		(ඊ) කැලෑ ගිනි වලින් ආරක්ෂා වීම 1.දැනුවත් කිරීමේ වැඩසටහන් 2.කැලෑ ගිනි වලින් ආරක්ෂා වීම සඳහා ප්‍රදේශ සකස් කිරීම සහ නඩත්තු කිරීම.	 50 (සංඛ්‍යාව) 100 (සංඛ්‍යාව)	
		(ඔ)මෙහෙයුම් සහ නඩත්තු කිරීම්	-	
		(ඕ) මිනුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම 1. මිනුම් කිරීම 2. මායිම් සලකුණු කිරීම -	 කි.මී.1800 කි.මී. 6000	614,000

2017 වර්ෂයේදී අපේක්ෂිත ආදායම :

2017 වර්ෂයේදී ආදායම ලෙස රුපියල් මිලියන 1600ක් රැස්කර ගැනීමට අපේක්ෂිතයි.

02. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

හැඳින්වීම.

කොළඹ වරාය කොමිසම යටතේ වෙරළ ආරක්ෂණ ඒකකයක් 1963 දී ස්ථාපිත කරන ලද අතර, 1978 දී ධීවර කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යාංශය යටතේ වෙරළ සංරක්ෂණ අංශය පිහිටුවන ලදී. ආර්ථික සම්පත් බහුල ශ්‍රී ලංකාවේ වෙරළ තීරය සංරක්ෂණය කිරීම මඟින් වෙරළබඩ සම්පත් මත පදනම් වූ ආරක්ෂිත හා තිරසාර සංවර්ධනයකට ඉඩ ප්‍රස්ථා සැලසීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව, වෙරළ සංරක්ෂණ අංශය,1984.01.01. දින සිට "ඒ ශ්‍රේණියේ " දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරන ලදී. දිවයිනේ වෙරළ තීරය සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවට ඇති වගකීම අනුව දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන වාර්ෂික ප්‍රතිපාදන වලින් වැඩි ප්‍රමාණයක් යෙදවීමට සිදුව ඇත්තේ වෙරළ තීරයේ ස්ථායිකරණ වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වේ. වෙරළ ස්ථායිකරණ වැඩසටහන් මඟින් වෙරළබඩ ක්‍රියාවලිය කළමනාකරණය කර වෙරළ කලාපයේ සිදුකරන සංවර්ධන කටයුතු වල තිරසාර බව පවත්වා ගන්නා ලෙසම වෙරළබඩ සංවර්ධන කටයුතු හා වෙරළ සම්පත් කළමනාකරණය කිරීම මඟින් පරිසරයේ ගුණාත්මක බව පවත්වා ගැනීම ද වැදගත් වන බැවින් 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත මඟින් ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයේ පරිපාලනය, පාලනය, භාරකාරිත්වය සහ කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය වෙත පවරන ලදී. 1981 අංක 57 දරණ පනත 1988 අංක 64 සහ 2011 අංක 49 පනත් මඟින් සංශෝධිත අතර, පනතේ විධිවිධාන පරිපාලනය කිරීම, වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය සඳහා වූ වැඩ යෝජනා සකස් කිරීම හා ඒවා ක්‍රියාවෙහි යෙදවීම, වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇතුලු පනතේ 4 වන වගන්තියේ සඳහන් කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත්කෙරිණි.

අරමුණු :

1. වෙරළබඩ පරිසරයේ තත්ත්වය වැඩි දියුණු කිරීම.
2. වෙරළ තීරය සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම.
3. වෙරළබඩ යටිතල පහසුකම් ආරක්ෂණය කිරීම සහ වෙරළබඩ ප්‍රජාව සතු අවදානම් අඩු කිරීම.
4. වෙරළබඩ ප්‍රජාවගේ සහ සම්පත් භාවිතා කරන්නන්ගේ ජීවන තත්වය උසස් කිරීම.
5. වෙරළ සම්පත් මත පදනම් වූ ආර්ථික සංවර්ධනය පහසු කර වීම සහ ප්‍රවර්ධනය කිරීම.

ප්‍රධාන වගකීම්:

1. හදිසි වෙරළ බාදන තත්ත්වයන්ගේ බලපෑම අවම කිරීම.
2. දීර්ඝ කාලීන වෙරළ ආරක්ෂණ විසඳුම් ලබාදීම.
3. වෙරළතීර කළමනාකරණ ක්‍රමෝපායන් සැකසීම.
4. වෙරළ විමර්ශනය කිරීම.

5. සාගර තරංග මැනීම අධ්‍යනය කිරීම.
6. වෙරළ පර්යේෂණ ව්‍යාපෘති සකස් කිරීම.
7. අක්වෙරළ (near-shore) කලාපයේ සාගර පතුලේ වෙනස්කම් අධීක්ෂණය කිරීම.
8. වෙරළ සැලසුම් මාර්ගෝපදේශනය යාවත්කාලීන කිරීම.
9. වෙරළ අධීක්ෂණය සහ ඇගැයීම.
10. වෙරළ පරිහරණය කරන්නන්ට හිතකර තිරසාර වෙරළ ඉදිකිරීම් ඇති කිරීම.
11. වෙරළ කලාපය තුල වෙරළ ව්‍යුහ ඉදිකිරීමට මඟ පෙන්වීම.
12. වෙරළ ආපදා සිතියම් සැකසීම.(සුනාමි, සාගර මට්ටම ඉහළ යාම,සුළි කුණාටු සහ වෙරළ ඛාදනය)
13. වෙරළ ආරක්ෂණ සැලසුම් බාහිර ආයතන සඳහා ලබාදීම.
14. ගංඟා මුවදොර කළමනාකරණය සඳහා ව්‍යුහ සැලසුම් කිරීමට සහය වීම.
15. වෙරළ ජල තත්ත්ව අධීක්ෂණ ව්‍යාපෘතිය සිදුකිරීම.
16. ජාතික වෙරළ කලාප සහ වෙරළ සම්පත් කලමනාකරණ සැලැස්ම (NCZ&CRMP) යාවත්කාලීන කිරීම.
17. මුහුදු හිරිගල් ඉවත් කිරීම සහ මුහුදු වෙරළින් වැලි ඉවත් කිරීම පාලනය කිරීම.
18. වෙරළබඩ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් පාරිසරික තක්සේරු ලබා ගැනීම.
19. සංවර්ධන කටයුතු බලපත්‍ර වල අඩංගු කොන්දේසි වලට අනුකූල වන බව සහතික කිරීම.
20. පාඨශාලා සඳහා විෂයය මාලාවන් සංවර්ධනය කිරීම ඇතුලත්ව වෙරළබඩ ගැටළු පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම.
21. වෙරළබඩ සම්පත් කළමනාකරණයේ දී ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.
22. විශේෂ වෙරළ කලාප කළමනාකරණ සංකල්පය යටතේ වෙරළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සියළුදෙනාගේ සහභාගීත්වය මඟින් වෙරළබඩ කළමනාකාරිත්වය සඳහා යොමු කිරීම.
23. බලපෑමට ලක්වන ප්‍රදේශ, සංරක්ෂණ ප්‍රදේශ හා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා එම ප්‍රදේශ නිසි කලමනාකරණය කිරීම.
24. වෙරළ උද්‍යාන ඇති කිරීම.
25. වෙරළ ප්‍රවේශ සැලැස්මක් සකස් කිරීම මඟින් වෙරළ පිවිසුම් පහසු කිරීම.
26. වෙරළ කලාපයේ අනවසර ඉදිකිරීම් හා අනවසර ඉඩම් හෝ ජලස්කන්ධ ගොඩකිරීම් පාලනය කිරීම.

ප්‍රධාන අභියෝග:

1. කාලගුණික වෙනස්වීම් හේතුවෙන් සිදුවන වෙරළ ඛාදනය සඳහා ක්ෂණිකව පිළියම් යෙදීම.
2. වෙරළ කළාපයේ සිදු කරන සංවර්ධන ක්‍රියා හේතුවෙන් සිදුවන පාරිසරික බලපෑම් පාලනය කිරීම.


ප්‍රධාන කාර්යය සාධනය : 2015 ජූලි 01 – 2016 ජුනි 30 දක්වා


ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය	ප්‍රධාන කාර්යය සාධනය
වෙරළ බාදන බලපෑම් අවම කිරීම සඳහා ආරක්ෂක දෘඩ ව්‍යුහ ඉදිකිරීම මෙම ක්‍රියාකාරකම පුනරුදය වැඩසටහනේ කිරසාර ඉඩම් කලමනාකරණ ක්ෂේත්‍රය යටතේ ගෙන ඇත. **වෙරළ කලාපයේ කිරසාර ඉඩම් කළමනාකරණය සඳහා ඇති එක විකල්ප ක්‍රමවේදයක් වනුයේ කළු ගල් වැනි දැඩි ද්‍රව්‍ය භාවිතා කර දෘඩ වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම වේ.** මේ ආකාරයට වෙරළට යාබදව ආරක්ෂා කර ඇති හෝ සුදුසු බිම්කඩවල්හි ස්වාභාවිකත්වය සහ අලංකාරය වැඩිදියුණු වන පරිදි වෙරළ උද්‍යාන ඉදිකිරීම හෝ දැනට ඇති වෙරළ උද්‍යාන වැඩිදියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. වෙරළ වැලි පෝෂණ ව්‍යාපෘති වලට සාපේක්ෂව දෘඩ වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම සඳහා යන වියදම අඩුවුවද, මෙවන් බොහෝ ඉදිකිරීම් වලට පසු ඉදිකරනු ලබන දෘඩ ව්‍යුහයේ ගැටී පරාවර්තනය වන රළු රළ මඟින් යාබද වෙරළ තීර වලට සිදුවන බාදනය සහ වෙරළබඩ වැලි ප්‍රවාහය මඟින් සපයනු ලබන වැලි එම වෙරළ ආරක්ෂක ව්‍යුහ මඟින් රඳවා ගැනීමෙන් යාබද වෙරළ තීරයන්ට වැලි හිඟ වීම, දෘඩ වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීමෙන් සිදුවන අවාසියකි.	**රිවට්මන්ට් බැම් ඉදිකිරීම - මීටර් 575 ක් සම්පූර්ණ කර ඇත.** මෙම කාලපරිච්ඡේදයේදී, • අරිප්පු, ලන්සියාවත්ත, අහංගම සහ වැලිපටන්විල වෙරළ තීර 04 ක ආරක්ෂාව සඳහා රිවට්මන්ට් බැම් මීටර් 527 ක් ඉදි කර අවසන් කරන ලදී. • පටබැඳිමුල්ල මීටර් 100, දික්වැල්ල මීටර් 280 සහ කප්පරතොට සුසාන භූමිය පිටුපස මීටර් 80 ක රිවට්මන්ට් බැම් ඉදිකිරීම් කරමින් පවතී. පටබැඳිමුල්ල මීටර් 8 ක් සහ මීටර් 20 ක බැවුම් කොටස, කප්පරතොට මීටර් 10 ක් සහ දික්වැල්ල පිවිසුම් මාර්ගයෙන් 3% ක ඉදිකිරීම් අවසන් කර ඇත. • දැනට සම්පූර්ණ කර ඇති මාතර වෙරළ උද්‍යානයේ මීටර් 500 ක රිවට්මන්ට් බැම්ම සඳහා අවසන් ගෙවීම් කරන ලදී. • රිවට්මන්ට් බැම් ඉදිකිරීම් සඳහා කරන ලද මුළු වියදම රු. 24,680,223 කි.
	ග්‍රොයින බැම් ඉදිකිරීම - මීටර් 210 ක් සම්පූර්ණ කර ඇත. මෙම කාලපරිච්ඡේදයේදී, • අඹකඳවිල මීටර් 45 ග්‍රොයින 4ක් සහ තල්විල උතුර මීටර් 40 ග්‍රොයින 6 ක ඉදිකිරීම් කරමින් පවතී. • ග්‍රොයින බැම් ඉදිකිරීම් සඳහා කරන ලද මුළු වියදම රු. 16,796,662.89 කි.
	ඔලුවිල් මීටර් 175 ක ග්‍රොයිනය (fishtail Groin) ඉදි කිරීම. මෙම කාලපරිච්ඡේදයේදී, • ඔලුවිල් වරාය ඉදිකිරීමෙන් පසු වරායෙන් උතුරු පස (lee side) වෙරළ තීරයේ ඇති අධික වෙරළ බාදන තත්ත්වයට ඔරොත්තු දීම සඳහා මීටර් 175 ග්‍රොයිනයක (fishtail Groin) ඉදිකිරීම් සම්පූර්ණ කරන ලදී. හදිසි වෙරළ බාදන ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීමට අමතරව ඇති ගල් ප්‍රමාණය භාවිතා කරන ලදී. • මෙම ග්‍රොයිනය ඉදිකිරීම සඳහා කරන ලද මුළු වියදම රු. 31,037,550.12 කි.
	දියකඩන බැම් ඉදිකිරීම - මීටර් 472 ක් සම්පූර්ණ කර ඇත. මෙම කාලපරිච්ඡේදයේදී,

ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය	ප්‍රධාන කාර්යය සාධනය
 මුතූර් - මීටර් 80 දිය කඩනය (BW 03)	• උතුරු මුදුකටුව, පයාගල, සහ මුතූර් ස්ථාන 02ක් සඳහා දියකඩන බැම් 04ක් ඉදිකරන ලදී. සම්පූර්ණ කරන ලද දියකඩන බැම් වල මුළු දිග මීටර් 400 කි. • කප්පල්අඩිය මීටර් 50 ක දියේ ගිලී ඇති දියකඩනය ඉදි කිරීම් කරමින් පවතී. මීටර් 20 ක් සම්පූර්ණ කර ඇත. • උණුවටුන සඳහා ඉදි කරන ලද මීටර් 200 ක් වූ දියේ ගිලී ඇති දියකඩනයේ වෙනස් කිරීම් කරන ලද්දේ, දියකඩනය ඉදිකිරීමෙන් පසු එක්තැන් වූ වැලි ප්‍රමාණය වෙරළ තීරය තුළ පැතිරී යාම සඳහාය. • උතුරු මුදුකටුව මීටර් 80 ක දියකඩනය සහ එගොඩඋයන මීටර් 80 දියකඩනයක් ඉදිකිරීම් කරමින් පවතී. මුදුකටුව මීටර් 52 ක් සහ එගොඩ උයන ඉදිකිරීම සඳහා පිවිසුම් මාර්ගයෙන් මීටර් 80 ක ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත. • පෙරදී සම්පූර්ණ කරන ලද එගොඩඋයන මීටර් 80 දියකඩනය සහ මුතූර් මීටර් 80 දියකඩනය සඳහා අවසාන ගෙවීම් කරන ලදී. • දියකඩන බැම් ඉදිකිරීම සඳහා කරන ලද මුළු වියදම රු. 167,791,601.67කි.
	ගේබියන් රිවට්මන්ට් බැම් ඉදි කිරීම - මීටර් 285 ක් සම්පූර්ණ කර ඇත. • සිලාවතුර, කහව සහ කප්පරතොට වෙරළ ආරක්ෂාව සඳහා ගේබියන් රිවට්මන්ට් බැම් ඉදිකරන ලදී. සම්පූර්ණ කරන ලද මුළු දිග මීටර් 230 කි. • මාතර තානායමට යාබද වෙරළ ආරක්ෂාව සඳහා ගේබියන් මීටර් 100ක ඉදිකිරීම් කටයුතු කරමින් පවතී. මීටර් 55 ක ඉදිකිරීම් අවසන් කර ඇත. • ගේබියන් රිවට්මන්ට් බැම් ඉදිකිරීම් සඳහා මුළු වියදම රු.10,033,829.43 කි.
	වෙරළ උද්‍යාන ඉදි කිරීම් සහ සංවර්ධනය කිරීම මෙම කාලපරිච්ඡේදයේදී, • සීතගල්ල වෙරළ උද්‍යානය සහ සාගර තටාකය ඉදිකිරීම් අවසන් කර ඇත. • වැලිගම වෙරළ උද්‍යානයේ ඉදිකිරීම් කරමින් පවතී

ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය	ප්‍රධාන කාර්යය සාධනය
	වෙරළ උද්‍යාන ඉදිකිරීම් සඳහා කරන ලද මුළු වියදම රු. 19,034,646.80 කි.
	පල්ලිකුඩාව - කංගල්ල මීටර් 220 ක් වූ වෙරළ ආරක්ෂිතය සහ ඇවිදින මංතීරුව සම්පූර්ණ කිරීම. • මේ සඳහා කරන ලද මුළු වියදම රු. 8,031,256.19 කි.
	බලපිටිය අම්බයේ කලමනාකරණය • ධීවර බෝට්ටු ප්‍රවාහනය සඳහා ඇළ මාර්ගය සකස් කර ගැනීමට සහ ගං වතුර පාලනය සඳහා ගංගා මෝයෙන් වැලි ඉවත් කිරීම් කටයුතු ආරම්භ කර සම්පූර්ණ කරන ලදී. • මේ සඳහා කරන ලද මුළු වියදම රු. 580,394.67 කි.
ඉහත සඳහන් මෙම කාලපරිච්ඡේදයේදී මෙම වැඩසටහන සඳහා වැය වූ මුළු වියදම රු. 277,986,164.73 කි.	


ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය	ප්‍රධාන කාර්යය සාධනය
වෙරළ ස්ථාවර කිරීමට සහ වෙරළ ආරක්ෂක මෘදු විසඳුමක් ලෙස ස්ථාවර කරමින් වැලි පෝෂණය කිරීම. මෙම ක්‍රියාකාරකම පුනරුදය වැඩසටහනේ තිරසාර ඉඩම් කලමනාකරණ ක්ෂේත්‍රය යටතේ ගෙන ඇත. වෙරළ ඉංජිනේරුමය සිද්ධාන්ත අනුව වෙරළ බාදනය සඳහා වූ අනර්ඝතම පරිසර හිතකාමී විසඳුම වනුයේ ගැඹුරු මුහුදේ වැලි මඟින් වෙරළ වැලි පෝෂණය කිරීමයි. වෙරළ කලාපයේ ඇති ආර්ථික කටයුතු වන ධීවර, සංචාරක, වරාය, බලශක්ති සහ වෙනත් යටිතල සංවර්ධන ව්‍යාපෘති වලට අයත් වත්කම්, ආර්ථික වගාවන් සහ ඉඩම්, පොදු හා පුද්ගලික දේපලවල වටිනාකම් පිළිබඳව සැළකිලිමත් වූ විට වෙරළ වැලි පෝෂණය (එක් වරක් හෝ කීප වරක්) කිරීම සඳහා යන වියදම සාධ්‍ය (feasible) වේ. එබැවින් වෙරළ වැලි පෝෂණය පාරිසරික වශයෙන් පමණක් නොව ආර්ථික වශයෙන් සහ සාමාජීය වශයෙන් ද අනර්ඝතම විසඳුම වේ.	• අමාත්‍ය මණ්ඩල උපදෙස් අනුව පත් කරන ලද විද්වත් කමිටුව මඟින් වෙරළ සංරක්ෂණ තිරසාර විසඳුම් සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී. එය සලකා බැලීමෙන් අනතුරුව මාරවිල - තල්විල වෙරළ තීරයට ගැඹුරු මුහුදෙන් පොම්ප කරන ලද වැලි මීටර් කියුබ් 300,000 ක් තැන්පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ජාත්‍යන්තර ලංසු කැඳවීම සඳහා කටයුතු කරමින් පවතී. මෙම වැලි පෝෂණය සැලසුම් කර ඇත්තේ වසරේ 4 වන කාර්තුවේ (මුහුදු රළු නොමැති කාල පරිච්ඡේදයේ) කරගෙන යාම සඳහාය. මේ සඳහා මුළු ප්‍රතිපාදනය රු. මිලි. 850 කි. • වර්ෂ 2015 වසරේ 3 වන කාර්තුවේදී උණවටුන වෙරළ වැලි පෝෂණ ව්‍යාපෘතිය සඳහා කල යුතුව තිබූ අවසන් ගෙවීම කරන ලදී  උණවටුන - වෙරළ වැලි පෝෂණය
ඉහත සඳහන් මෙම කාලපරිච්ඡේදයේදී මෙම වැඩසටහන සඳහා වැය කල මුළු වියදම රු. 18,391,276.55කි.	
හදිසි වෙරළ ආරක්ෂක ව්‍යුහ පිළියම්. කාළගුණ වෙනස්වීම් අනුව සිදුවන රළ රළුවීම්, කුණාටු තත්ත්ව හේතුවෙන් ජල මට්ටම වැඩිවීම සමඟ වන කැළඹීම මඟින් සහ පාරිසරිකව වන අන්තගාමී වෙනස්වීම් හේතුවෙන් සිදුවන හදිසි බාදන තත්ත්ව වලින් ආරක්ෂාව සඳහා කරනු ලබන ඉදිකිරීම් සහ පිළියම්	මෙම කාලපරිච්ඡේදයේදී, • තල්විල උතුර, මාරවිල - තල්විල, පානම, ඔලුවිල්, මුතුපංතිය - නගුල්එළිය, උණවටුන, පයාගල- ඇතගම, කාන්තන්කුඩි, ඉලන්තන්ඩිය, තංගල්ල - මැඩිල්ල වශයෙන් වෙරළ තීර 10 ක් ආරක්ෂා කරන ලදී. • නිල්වලා ගං මෝය, කොලින්ජාඩිය - උල්හිටිය නැංගුරම්තොට ඇතුළතින් ඉවත් කල වැලි ආසන්න වෙරළේ තැන්පත් කරන ලදී.

ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය	ප්‍රධාන කාර්යය සාධනය
 ඔලුවිල් - වරාය ප්‍රදීපාගාරය අසල හදිසි වෙරළ ආරක්ෂිතය	
ඉහත සඳහන් කාලපරිච්ඡේදයේදී මෙම වැඩසටහන සඳහා වැය කල මුළු වියදම රු. 40,905,355.87කි.	
වෙරළ ආරක්ෂක ව්‍යුහ නඩත්තු කිරීම මඟින් වෙරළ ඛාදන බලපෑම් අවම කිරීම මෙම ක්‍රියාකාරකම පුනරුදය වැඩසටහනේ තිරසාර ඉඩම් කලමනාකරණ ක්ෂේත්‍රය යටතේ ගෙන ඇත. වෙරළ කලාපයේ තිරසාර ඉඩම් කළමනාකරණය සඳහා දැනට පවතින වෙරළ ආරක්ෂක ව්‍යුහ වල ක්‍රියාකාරිත්වය සහ පවත්නා තත්ත්වය අධීක්ෂණය කිරීමේ සහ දෙපාර්තමේන්තුව මඟින් අදාල නඩත්තු කටයුතු සහ පුනරුත්ථාපන කටයුතු කිරීම.	මෙම කාලපරිච්ඡේදයේදී, වෙරළ ආරක්ෂක ව්‍යුහ 11ක් නඩත්තු කරන ලදී. • දූව, බණ්ඩාරමුල්ල සහ ලන්සියාවත්ත ස්ථාන වල රිවට්මන්ට් බැම් 3 ක් අවසන් කරන ලදී. අකුරල, බෙරුවල - මරදාන ස්ථාන වල රිවට්මන්ට් බැම් 2 ක නඩත්තු කටයුතු කරමින් පවතී. සම්පූර්ණ කරන ලද මුළු දිග ප්‍රමාණය මීටර් 1853 වන අතර වියදම රු.53,467,111.03 කි. • පයාගල ග්‍රොයින 02 ක් සහ මැඩිල්ල - තංගල්ල ග්‍රොයිනයක නඩත්තු කටයුතු සම්පූර්ණ කරන ලදී. බණ්ඩාරමුල්ල මීටර් 80 ක ග්‍රොයිනයේ නඩත්තු කටයුතු කරමින් පවතී. සම්පූර්ණ කරන ලද මුළු ග්‍රොයින දිග ප්‍රමාණය මීටර් 158 ක් වන අතර වියදම රු. 13,282,680.24 කි. • උල්හිටිය සහ කටුනේරිය දියකඩන 02 ක් රු. 7,486,692.27 ක වියදමින් පුනරුත්ථාපනය කරන ලදී. මෙම කාලපරිච්ඡේයේ දී ඉදි කල දියකඩන වල සම්පූර්ණ දිග මීටර් 180 ක් වේ.
මෙම වැඩසටහන සඳහා වැය වූ මුළු වියදම රු.74,236,483.54 කි.	
වෙරළ ඉංජිනේරුමය විමර්ශන විශේෂයෙන් වෙරළ ඉංජිනේරුමය ව්‍යාපෘති සැළසුම් සඳහා අදාල අධ්‍යන සහ විමර්ශන, වෙරළ සංරක්ෂණ සහ ස්ථායීකරණ ව්‍යාපෘති, මුහුදු ජලයේ සහ මුහුදට එකතු වන ජල තලයන්හි පාරිසරික වශයෙන් සිදු වන අපවිත්‍ර	**වෙරළ ඉංජිනේරුමය විමර්ශන** මෙම කාලපරිච්ඡයේ දී, • මාරවිල - තල්විල සහ මඩකලපුව - ත්‍රිකුණාමලය වෙරළ තීර වලට යාබද මුහුදු පතුලේ මිනුම් කටයුතු සම්පූර්ණ කරන ලදී. • කටුනේරිය - තොඩුවාව වෙරළ තීරයේ විමර්ශන සහ අධීක්ෂණ කටයුතු කරන ලදී.

ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය	ප්‍රධාන කාර්යය සාධනය
කිරීම් පාලනය කිරීම සඳහා මුහුදු ජලය පිළිබඳ අධීක්ෂණ වැඩසටහන් පවත්වාගෙන යාම, වෙරළ දත්ත සහ එම ජාලය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම, පරිසර සහ වෙරළ ඉංජිනේරුමය ක්ෂේත්‍රයන්හි දැනුම සහ අත්දැකීම් යාවත්කාලීන කිරීමට, වැඩිදියුණු කිරීමට සහ බෙදා ගැනීමට සම්මන්ත්‍රණ සහ වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම මේ යටතේ කරනු ලැබේ.  **වෙරළබඩ ජලයේ ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය**	• නැගෙනහිර වෙරළෙහි අවධානම තක්සේරු කිරීමේ ව්‍යාපෘතියේ වෙරළබඩ විමර්ශන කටයුතු කරමින් පවතී. • නැගෙනහිර වෙරළෙහි වැලි නියැදි පරීක්ෂණ කටයුතු කරමින් පවතී. • ඒ අනුව මෙම වැඩසටහන සඳහා වැය වූ මුළු වියදම රු. 6,851,263.59 කි. **වෙරළ සැලසුම්** • අරිප්පු, ඔලුවිල්, පානම, මාරවිල, උතුරු තල්විල, අඹකඳවිල, මොදරවැල්ල, කප්පල්අඩි, රත්මලාන සහ ගිංතොට වෙරළ ආරක්ෂාව සඳහා සැලසුම් 10 ක් සම්පූර්ණ කරන ලදී. • මෙම වැඩසටහන සඳහා වැය වූ මුළු වියදම රු. 934,731.59 කි. **වෙරළබඩ ජලයේ ගුණාත්මක තත්ත්වය අධීක්ෂණ වැඩසටහන** **මෙම අයිතමය පුනරුදය වැඩසටහනේ පරිසර දූෂණය පාලන ක්ෂේත්‍රය යටතේ ඇත.** • ගල්කිස්ස, නිලාවැලි, ආරුගම්බේ, පොල්හේන, උණවටුන සහ හික්කඩුව වෙරළ තීරයන් හි ජලයේ ගුණාත්මක තත්ත්වය අධීක්ෂණ කටයුතු පවත්වාගෙන යනු ලැබේ. • මෙම වැඩසටහන සඳහා වැය වූ මුළු වියදම රු. 1,344,370.03කි. **වෙරළ ඉංජිනේරු සම්මේලනය** • **“ කාළගුණික අවදානම් අඩු කිරීම සඳහා වෙරළ ඉංජිනේරු ක්ෂේත්‍රය”** තේමාව යටතේ වෙරළ ඉංජිනේරු සම්මේලනය 2015 නොවැම්බර් 06 දින බත්තරමුල්ල “වෝටර්ස් එජ්” හෝටලයේදී පවත්වන ලදී. • **“වෙරළ ඉංජිනේරු සම්මේලනය - 2016”**, වර්ෂ 2016 ඔක්තොම්බර් මාසයේදී පැවැත්වීමට සැලසුම් කර ඇත. • **“වෙරළ ඉංජිනේරුමය යෙදීම්”** යටතේ දේශනයක් නැගෙනහිර ලන්ඩන් විශ්ව විද්‍යාලයේ සහභාගීත්වයෙන් 2016.07.04 දින පැවැත්වීමට සංවිධානය කර ඇත. • මෙම කාලපරිච්ඡේදය තුළ කල මුළු වියදම රු. 283,910.00 කි.
ඉහත සඳහන් කාලපරිච්ඡයේදී මෙම වැඩසටහන සඳහා වැය කල මුළු වියදම රු. 9,414,275.21 කි	
වෙරළ කලාප කළමනාකරණ වැඩසටහන වෙරළ කලාපයේ තිරසාර ඉඩම් කළමනාකරණය සහ සංවර්ධන ව්‍යාපෘති	**හරිත වෙරළ තීරය ස්ථාපිත කිරීම** මෙම කාලපරිච්ඡයේ දී, • පොල්, මූදිල්ලා, කඩොලාන, වැටකෙයා, කොට්ටම්බා සහ කස යන නොයෙකුත් ශාක වර්ග සම්පූර්ණ දිග කිලෝ මීටර් 7 ක් ආවරණය වන පරිදි කැපුන්ගොඩ, සින්ද්‍රාන්ත්‍රිය,

ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය	ප්‍රධාන කාර්යය සාධනය
හේතුවෙන් සිදුවන පාරිසරික දූෂණය පාලනය කිරීම සඳහා හරිත වෙරළ තීරය ස්ථාපිත කිරීම, වෙරළ පිවිසුම් මාර්ග වැඩ සටහන, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ වැඩසටහන සහ පාරිසරික බලපෑම් තක්සේරුව ඇතුලත් වන පරිදි සංවර්ධන කටයතු සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය, සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ ගැසට් කිරීම සහ විශේෂ කලමනාකරණ ප්‍රදේශ පවත්වා ගැනීම යනුවෙන් වෙරළ කලාප කළමනාකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. කි. මී. 15 ක හරිත වෙරළ තීරය ස්ථාපිත කිරීම, බලපෑමට ලක් වන සහ සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ ගැසට් කිරීම සහ විශේෂ කලමනාකරණ ප්‍රදේශ ආරම්භ කර පවත්වා ගැනීම පුනරුදය වැඩසටහනේ තිරසාර ඉඩම් කලමනාකරණ ක්ෂේත්‍රය යටතේ ගෙන ඇත.  අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම	හාතගල, කොග්ගල, වාකරේ, මොරගල්ල, කයිට්ස්, මාතර වෙරළ උද්‍යානය, කාක දූපත වෙරළ උද්‍යානය, බුස්ස, වැල්ලමඩම, තංගල්ල නාවික හමුදා මුලස්ථානය, කටුනේරිය සහ කල්පිටිය යන වෙරළ තීර 16 ක සිටුවන ලදී. මේ සඳහා රු. 6,791,025.17 ක් වැය විය. **වෙරළ පිවිසුම් මාර්ග වැඩ සටහන** මෙම කාලපරිච්ඡේදයේ දී, • කල්පිටිය වෙරළ තීර පිවිසුම් වැඩසටහනේ ඉදිකිරීම් කරනු ලැබ ඇත. වෙරළ පිවිසුම් 2 ක සම්පූර්ණ කරන ලද මුළු දිග ප්‍රමාණය මීටර් 350 ක් වූ අතර වියදම රු. 5,428,649 ක් විය. **අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම** මෙම කාලපරිච්ඡේදයේ දී, • අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීමේ නියෝග 157 ක් නිකුත් කර ඇත. තංගල්ල දෙමහල් නිවසක්, වැලිගම වෙරළ තීරයේ ස්ථීර සහ තාවකාලික ගොඩනැගිලි 12 ක් සහ දෙහිවල ඉදිකිරීම් 10 ක් ඉවත් කරන ලදී. සමාජික ප්‍රශ්න හේතුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අපහසුතා පවතී. වියදම රු. 2,138,129.81 ක් විය. **සංවර්ධන බලපත්‍ර ක්‍රියාවලිය** • මෙම කාලපරිච්ඡේදයේදී සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉල්ලුම් පත්‍ර 2193 ක් ලැබී ඇති අතර ඒ සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සහ විශ්ලේෂණ කල පසු බලපත්‍ර 2325 ක් නිකුත් කර ඇත. අවශ්‍ය ස්ථාන සඳහා පාරිසරික බලපෑම් තක්සේරු කරන ලදී. වරාය නගර ව්‍යාපෘතියද ඇතුළුව පාරිසරික ඇගයීම් (EIA / IEE) 22 ක් නිම කර ඇති අතර, අධ්‍යන 21 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. සම්පූර්ණ වියදම රු. 6,660,764.65 කි. **වෙරළ කලාපයේ බලපෑමට ලක් වන සහ සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ හඳුනා ගැනීම** • වෙරළ කලාපයේ බලපෑමට ලක් වන සහ සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ අදාළ පරිදි ගැසට් කිරීම සඳහා හඳුනා ගැනීමේ වැඩසටහන් කරනු ලැබේ. මේ සඳහා වියදම රු.563,683 කි.
මෙම වැඩසටහන සඳහා වැය වූ මුළු වියදම රු. 21,582,311.03 කි.	
පාරිසරික අධ්‍යාපන වැඩසටහන **පාසල් ශිෂ්‍යයින් සහ මහජනතාව දැනුවත් කිරීම්.**	• මහජන දැනුවත් කිරීම් පුවරු 16ක් සවිකරන ලදී. • මහජන දැනුවත් කිරීම් සඳහා පොත් පිංචවල් සහ මාධ්‍ය මඟින් දැනුවත් කිරීම් වැඩසටහන් කිරීමට කටයුතු කරමින් පවතී. • පොලිස් සහ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලදී. • ලෝක පරිසර දිනය සඳහා පාසල් සිසුන් අතර චිත්‍ර, රචනා, කථික තරඟ, වීදි නාට්‍ය, සජීවී රූපවාහිනී සාකච්ඡා සහ

ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය	ප්‍රධාන කාර්යය සාධනය
	වෙරළ භාවිතා කරන්නන්ගේ සහභාගීත්වයෙන් වෙරළ පවිත්‍රතා වැඩසහන් 3 ක් විශාල මාධ්‍ය ආවරණයක් ද සහිතව ජුනි මුල සතිය තුළ පවත්වන ලදී. • 'වස විස නැති රටක්' තේමාව යටතේ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද ප්‍රදර්ශනයට සහභාගී වන ලදී.
මෙම වැඩසටහන සඳහා වැය වූ මුළු වියදම රු. 1,193,114.85 කි.	
2015 ජූලි 1 සිට 2016 ජුනි 30 දක්වා උක්ත වැඩසටහන් යටතේ රජයේ අයවැය ප්‍රතිපාදන මඟින් රු. 443,708,981.78 ක් වැය කර ඇත. 2015 වර්ෂයේ අගභාගයේ වෙරළ සංරක්ෂණ ඉදිකිරීම් සහ සමහරක් වෙරළ විමර්ශන කටයුතු සඳහා අයහපත් කාළගුණික තත්ත්වයේ බලපෑම් නිරතුරුව ඇති විය. මෙම කාලවකවානුව තුළ දී තිබූ සුපුරන ද්‍රව්‍ය භිඟකම ඉදිකිරීම් සඳහා කලු ගල් සැපයීම ප්‍රමාද වීම හේතුවෙන් වෙරළ ආරක්ෂණ ඉදිකිරීම් වල ප්‍රගතිය සඳහා අහිතකර බලපෑම් ඇති කරන ලදී.	
නැගෙනහිර පළාත් වෙරළ කලාපයේ පුනරුත්තාපන සහ තිරසාර කලමනාකරණ සහභාගීත්ව ව්‍යාපෘතිය ගෝලීය පරිසර අරමුදල (GEF) සහ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර අරමුදල (IFAD) මඟින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලැබේ.වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ ව්‍යාපෘති කලමනාකරණ ඒකකය (PMU) පිහිටුවා ඇත. දිස්ත්‍රික් ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරීන් විසින් ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව යන දිස්ත්‍රික් වල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම සහ එම ව්‍යාපෘති අධීක්ෂණය කිරීම කරනු ලැබේ. නිස් අවුරුදු යුද්ධයෙන් පසු උතුරු හා නැගෙනහිර පළාතේ වෙරළ කලාපයේ කරන ලද විශ්ලේෂණ සහ අධීක්ෂණ මත පදනම් වූ වෙරළ පසසිටු පිහිටුවීම මෙම දෙපාර්තමේන්තුවට ඉතා වැදගත් විය. එබැවින් වෙරළ කලාප කලමනාකරණ සැලසුම - 2016 පිළියෙල කිරීම සඳහා අදාල පහසුකම් සහ අරමුදල් මෙම ව්‍යාපෘතිය මඟින් ලබා දෙන ලදී.	**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය** • හදිසි ව්‍යසනයකදී තෙන්නමාවඩි ජනතාව එක්රැස් කිරීමට ඇති මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සම්පූර්ණ කර ඊට අවශ්‍ය උපකරණ ද සමඟ කුච්චවේලි ප්‍රාදේශිය ලේකම්ට භාර දෙන ලදී. • කුච්චවේලි සහ කින්නියා කාබනික අංගන 2 ක් සාදා නිමකොට කුච්චවේලි ප්‍රාදේශිය සභාවට සහ කින්නියා නගර සභාවට ද ෆයිබර් බෝට්ටු 26 ක් නිලාවේලි සංචාරක බෝට්ටු සංගමය වෙත ද භාර දෙන ලදී. • ලෝක පරිසර දිනය අරමුණු කර ප්‍රදර්ශනයක් සහ පාසල් සිසුන් සඳහා චිත්‍ර තරඟයක් පවත්වන ලදී. • උප්පාරු, සම්පල්තිව් සහ ඉරක්කන්ඩි කලපු වල මායිම් සඳහා මිනුම් ගැනීම සහ කොන්ක්‍රීට් කණු යොදා මායිම් ලකුණු කිරීම් කරන ලදී. • ඉරක්කන්ඩි කලපුවේ හෙක්ටයාර් 1 ක හරිත තීරයක් ස්ථාපිත කරන ලදී. • උප්පාරු, සම්පල්තිව් සහ ඉරක්කන්ඩි කලපු වල හෙක්ටයාර් 1000 ක ඇති කඩොලාන ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන ලදී. • පරෙව් දූපත සමුද්‍ර උද්‍යානයේ සාමූහික කලමනාකරණ යාන්ත්‍රණය ස්ථාපිත කරන ලදී. • පරෙව් දූපත කොරල් පර මඟින් යැපෙන සාමාජීය කණ්ඩායම් සඳහා රු. මි. 5 ක් අරමුදලක් ස්ථාපිත කර සභය දක්වන ලදී. **අම්පාර දිස්ත්‍රික්කය** • කෝමාරි කි.මී. 2.5 ක් ආවරණය වන පරිදි ජීව වැටක් ද ඉදි

ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය	ප්‍රධාන කාර්යය සාධනය
	කරන ලදී. • කි.මී. 15 ක වැලි වැටිය කොන්ක්‍රීට් කණු යොදා සලකුණු කරන ලදී. • පානම හෙක්ටයාර් 50 ක හරිත තීරයක් ස්ථාපිත කරන ලදී. • ඌරනි වල විවේක ශාලාවක් සහ පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා පාවෙන තොටමුණක් ඉදිකිරීම සම්පූර්ණ කරන ලදී.
	මඩකලපුව දිස්ත්‍රික්කය • වාකරේ කලපුව වටා ජීවත් වන පවුල් සඳහා වැසිකිලි 120 ක් සාදා නිම කරන ලදී. • කඩොලාන අධ්‍යයන මධ්‍යස්ථානයක් සාදා නිම කර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී. මඩකලපුව කලපුවෙහි කි. මී. 300 ක් ආවරණය වන පරිදි කණු 10,000 ක් සිටුවා සලකුණු කිරීම අවසන් කරන ලදී. • වාකරේ පනිවිඩවන්කර්නි සඳහා බෝට්ටු ගාල් කිරීමේ පහසුකම් සංවර්ධනය කරන ලදී.
	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) • පාරිසරික සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා සැලසුමක් සකස් කරවන ලදී.
	ජාතික වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම (NCZ&CRMP) 2016 ජාතික වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මෙහි පරිච්ඡේද 5 සඳහා කටයුතු කිරීමට මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් පස්දෙනෙකුගේ නායකත්වයෙන් හෙබි විද්වත් කමිටු 5 ක් මඟින් කටයුතු කරනු ලැබේ. • 2016 වෙරළ කලාප කළමනාකරණ සැලැස්මෙහි කෙටුම්පත් වාර්තා මුද්‍රණය කර අවසන් අතර, මහජන අදහස් විමසීම සඳහා අදාල පුවත්පත් වාර්තාව සකස් කර ඇත.

2017 වර්ෂ සඳහා සැලසුම් කළ වැඩසටහන්

	ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	අරමුණු	
			භෞතික(වාර්ෂික ඉලක්ක වලින් ප්‍රතිශතයක් ලෙස)	මූල්‍ය රු. '000
1.	වෙරළබඩ විමර්ශන, පර්යේෂණ, අධීක්ෂණ සහ සැලසුම්	1.1වෙරළබඩ ඉංජිනේරුමය විමර්ශන, පර්යේෂණ, අධීක්ෂණ සහ සැලසුම්	100%	35,550
		1.2වෙරළබඩ ජල තත්ත්වය අධීක්ෂණය කිරීම.	100%	1,450
2.	වෙරළ සංරක්ෂණය සහ ස්ථාවර කිරීම	2.1ඔලුවිල් වෙරළෙහි කි.මී. 2 ක වැලි පෝෂණය සහ තිරසාර වෙරළ සංරක්ෂණය සඳහා අදාල අධ්‍යන කිරීම.	100%	820,000
		2.2වෙරළ සංරක්ෂණ දෘඩ ව්‍යුහ ඉදිකිරීම.	100%	385,000
		2.3දෘඩ වෙරළ සංරක්ෂණ ව්‍යුහ පුනරුත්තාපනය කිරීම	100%	75,000
		2.4වෙරළ උද්‍යාන ඉදි කිරීම සහ වැඩිදියුණු කිරීම.	100%	60,000
		2.5 හදිසි වෙරළ සංරක්ෂණය	100%	25,000
3.	වෙරළ කලාප කලමනාකරණය	3.1කි.මී. 7 ක හරිත වෙරළ තීරයක් ස්ථාපනය කිරීම	100%	7,000

		3.2වෙරළ පිවිසුම් මාර්ග ස්ථාපනය කිරීම	100%	5,000
		3.3අනවසර ඉදි කිරීම් ඉවත් කිරීම සහ වෙරළ පවිත්‍රතා වැඩසටහන්	100%	1,000
		3.4වෙරළ බලපත්‍ර ක්‍රමවේදය පරිසර ඇගයීම් අධ්‍යන ඇතුළත් වන පරිදි	100%	2,000
		3.5බලපෑමට ලක් වන සහ සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්ණායක සකස් කිරීම	100%	1,000
		3.6විශේෂ කලමනාකරණ ප්‍රදේශ ස්ථාපිත කිරීම සඳහා ප්‍රජා සම්බන්ධීකරණ සංවිධාන පිහිටුවීම	100%	2,000
4.	පරිසර අධ්‍යන සහ දැනුවත් කිරීම් වැඩසටහන්		100%	2,000
5.	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම	5.1 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	100%	18,000
		5.2 පිරිවිත, යන්ත්‍ර සහ උපකරණ	100%	1,000
		5.3 වාහන	100%	9,000

6.	ප්‍රාග්ධන වත්කම් පවරා ගැනීම	6.1 ලී බඩු සහ කාර්යාලීය උපකරණ	100%	1,000
		6.2 පිරිවිත, යන්ත්‍ර සහ උපකරණ	100%	1,000
		6.3 ගොඩනැගිලි	100%	20,000
7.	හැකියා ගොඩනැගීම	7.1 කාර්ය මණ්ඩලයේ පුහුණු කිරීම්	100%	500
	මුළු එකතුව			1,472,500

03. මධ්‍යම පරිසර අධිකාරිය

වාර්ෂික වාර්තාව 2016

හැඳින්වීම

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ පරිසරය කළමනාකරණය සහ ප්‍රවර්ධනය කරමින් එහි සාර්ථක 36 වන වසර සම්පූර්ණ කර ඇත. මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණු වූයේ ;

- පරිසර ආරක්ෂණය, කළමනාකරණය හා නඟා සිටුවීම
- රෙගුලාසි පැනවීම හා පරිසරයේ තත්වය පවත්වාගෙන යාම
- පරිසර දූෂණය පාලනය, ආරක්ෂාව හා අවම කිරීම

ජාතික පාරිසරික පනත 1988 සහ 2000 යන වසර වලදී සංශෝධනය කළ අතර, එහි ආරම්භයේ සිටම පරිසර නියාමන කටයුතු සිදු කරනු ලබයි. මෙම සංශෝධනය මඟින් අනුමත ප්‍රමිතීන්, උපමාන හා නියම යටතේ පහත සඳහන් අවශ්‍යතාවයන් නියම කර ඇත.

අ) පරිසරය කෙරෙහි අහිතකර බලපෑම් ඇති වන්නා වූ යම් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියට ලක් කිරීම.

ආ) නිශ්චිත කටයුතු ලෙස පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින, තැන්පත් කරන හෝ පිටකරන කටයුතු ගැසට් කිරීමට සහ මෙම පනතේ සඳහන් උපමාන සහ ප්‍රමිතීන් වලට අනුකූලව කටයුතු කිරීමටත්, අධිකාරිය විසින් නිකුත් කරන ලද පාරිසරික අරක්ෂණ බලපත්‍රයක් නොමැතිව කිසිම පුද්ගලයෙකු කිසිම නිශ්චිත කටයුත්තක් සිදු නොකිරීම.

2015 ජූලි සිට 2016 ජුනි දක්වා ප්‍රගතිය වාර්තා කිරීම

➢ පරිසර කළමනාකරණය සහ ඇගයීම

පරිසර බලපෑම් ඇගයීම / මූලික පාරිසරික පරීක්ෂණ (EIA/IEE) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

මධ්‍යම පරිසර අධිකාරියේ නියාමන ක්‍රියාවලිය යටතේ, ව්‍යාපෘති මඟින් ඇති වන පාරිසරික බලපෑම් ඇගයීමේ අරමුණින් නියමිත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ පරිපාලන ක්‍රියාදාමය පවත්වාගෙන යනු ලබයි.

EIA/IEE ක්‍රියාවලිය බලාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජකයා විසින් පසු විපරම් ක්‍රියාකාරකම් ඇතුලත් පරිසර කළමනාකරණ සැලැස්මක් (EMP) ඉදිරිපත් කළ යුතුය යන නව විධි විධාන සහිතව EIA/IEE රෙගුලාසි සංශෝධනය කිරීම සිදු කරමින් පවතියි. එසේම මධ්‍යම පරිසර අධිකාරියේ

ප්‍රාදේශීය නිලධාරීන්ගේ සහ අනෙකුත් නියෝජිත ආයතනයන්ගේ අදහස් වලට අනුකූලව නියමිත ව්‍යාපෘති ලැයිස්තුව සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන ඇතුලත් ලැයිස්තුව සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතියි.

වාර්තා කරනු ලබන කාලය තුලදී, මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්ගේ EIA/IEE ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ දැනුම වැඩි දියුණු කිරීම අරමුණු කොටගෙන EIA ආශ්‍රිත පතල් හා කැණීම් සම්බන්ධ වැදගත් අංශ පිළිබඳව සහ අපජලය පිරියම් කිරීම හා ආරක්ෂාකාරී බැහැරලීම පිළිබඳව පුහුණු වැඩ සටහන් දෙකක් පවත්වන ලදි.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ව්‍යාපෘති 7 ක් සඳහා EIA අනුමැතිය සහ ව්‍යාපෘති 333 ක් සඳහා IEE අනුමැතිය වාර්තා කරනු ලබන කාලය තුලදී ලබා දී ඇත.

උපාය මාර්ගික පාරිසරික ඇගයීම ක්‍රියාත්මක කිරීම

උපාය මාර්ගික පාරිසරික ඇගයීම (SEA) යනු පරිසර ප්‍රතිපත්ති, සැලසුම් හෝ වැඩ සටහන් සහ එහි විකල්පයන් මඟින් පරිසරයට ඇති වන බලපෑම් ක්‍රමානුකූලව සහ විස්තරාත්මකව ඇගයීමේ ක්‍රියාවලියයි. උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යය වන්නේ පරිසර බලපෑම් පරීක්ෂා කිරීම වුවත් බොහෝ උපාය මාර්ගික පාරිසරික ඇගයීම් තුලින් ව්‍යාපෘති මඟින් සිදුවන ආර්ථිකමය හා සමාජීයමය බලපෑම් ද හඳුනාගනු ලබන අතර, එමඟින් සියළු කරුණු ඒකාබද්ධ කොටගෙන තීරණ ගැනීම සඳහා පහසුකම් සැපයීම සිදු කරයි.

මධ්‍යම පරිසර අධිකාරිය, බස්නාහිර පළාත් මහානගර සැලසුම්කරණ ව්‍යාපෘතිය සමඟ සහයෝගීත්වයෙන් බස්නාහිර පළාත් මහානගර සැලසුම් සඳහා උපාය මාර්ගික පාරිසරික ඇගයීමක් සිදු කිරීම ආරම්භ කර ඇති අතර, මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය නිර්ණය විෂයන් (ToR) කෙටුම්පත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සහාය ලබා දෙන ලදි.

➢ ස්වභාවික සම්පත් කළමනාකරණය

මධ්‍යම පරිසර අධිකාරිය, අනෙකුත් අදාල ආයතන සහ මහජනතාවගේ සහභාගීත්වය හා සම්බන්ධීකරණය යටතේ රටෙහි ස්වභාවික සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම දරනු ලබයි.

වාර්තා කරනු ලබන කාලය තුළ ස්වභාවික සම්පත් කළමනාකරණය සඳහා පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදි.

- **ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ ගුරු උපදෙස්, තොරතුරු ප්‍රකාශන, අත් පත්‍රිකා, පොත් පිංච යනාදිය සකස් කිරීම**

  පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ, ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත්, ගෙවතු හා නාගරික ප්‍රදේශ වල රුක් රෝපණය හා දේපල සංවර්ධන කටයුතු වල නිරතව සිටින ව්‍යාපෘති යෝජකයන් සඳහා මාර්ගෝපදේශ යන මාතෘකා යටතේ පොත් පිංච 04 ක් සකස් කරන ලදි. මෙම තොරතුරු ප්‍රකාශන සාමාන්‍ය ජනතාවගේ, පාසල් ප්‍රජාවගේ හා අනෙකුත් ආයතනයන්ගේ භාවිතය සඳහා හා ස්වභාවික සම්පත් පිළිබඳ දැනුම වර්ධනය කිරීම අරමුණු කොට සකස් කරන ලදි.

ඛණිජ කැණීම් සිදුකර අතහැර දමන ස්ථාන නැවත පුනරුත්ථාපනය කිරීම සඳහා ගුරු උපදෙස් සකස් කිරීම මොරටුව විශ්ව විද්‍යාලයේ විශේෂඥයන්ගේ සහාය ඇතිව ආරම්භ කරන ලදි. එසේම, දිවයිනේ ඛණිජ කැණීම් කටයුතු වලට අදාලව මෙම ගුරු උපදෙස් සකස් කිරීම කාලීන අවශ්‍යතාවයකි.

- **ශ්‍රී ලංකාවේ දිය ඇලි සංරක්ෂණය**

දිවයින පුරා විසිරී ඇති දිය ඇලි අවහිර කොට ඉදිකරනු ලබන කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති හේතුවෙන් මෙම වටිනා ස්වභාවික සම්පතට සිදුවන නොයෙකුත් හානි හා වක්‍ර බලපෑම් අධ්‍යයනය කළ මධ්‍යම පරිසර අධිකාරිය 2011 වසරේ දී තවදුරටත් මෙවැනි ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා නොදීමට ප්‍රතිපත්තිමය තීරණයකට එළඹෙන ලදි.

මෙහි දී, මේ සම්බන්ධව පවතින දත්ත ඌනතාවය හඳුනාගෙන මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වල නිලධාරීන්ගේ ශ්‍රම දායකත්වයෙන් දිය ඇලි සංගණනයක් සිදු කල අතර, දිය ඇලි 512 ක් එමඟින් හඳුනා ගන්නා ලදි. එහිදී, ලබාගත් තීරණය අනුව ඉදිරියේ දී සංරක්ෂණය කළ යුතු දියඇලි හඳුනාගෙන ඒවා ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

- **පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සහ කළමනාකරණය**

ශ්‍රී ලංකාව පුරා විසිරී ඇති පාරිසරික වශයෙන් වැදගත්කමක් ඇති ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජාතික පාරිසරික පනතේ 24ඇ සහ 24ඈ යන වගන්ති යටතේ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමේ වගකීම භාරගෙන ක්‍රියාත්මක කරනු ලැබේ. යම් ප්‍රදේශයක් පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, එම ප්‍රදේශයන්හි භෞතික සැලසුම් පිළියෙල කිරීම හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය වගකීම උසුලනු ලබයි.

වාර්තා කරනු ලබන කාලය තුල, පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශ 05 ක පසුවිපරම් කටයුතු සිදුකරන ලද අතර, පන්සල්තැන්න, දැඩිගමුව කන්ද, වරාතැන්න - හක්කින්ද සහ ගිං ඔය යන යෝජිත පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ සඳහා ගැසට් නිවේදන කෙටුම්පත් සකස් කරන ලදි. එසේම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ලෙස නම් කිරීමට සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා මතුගම ප්‍රදේශයේ හේවගේ දොල, "කුම්කුක් වැටිය" වනය, "ගෝනමරියාව" ජල උල්පත, අනුරාධපුරයේ "කැබිතිගොල්ලෑව" ජල උල්පත සහ මන්නාරමේ "කොරවක්කුලම ජලාශය" යන ප්‍රදේශයන්හි පරීක්ෂණ කටයුතු සිදුකරන ලදි.

- **ලෝක තෙත්බිම් දිනය සැමරීම**

2016 පෙබරවාරි 02 වන දිනට යෙදුනු ලෝක තෙත්බිම් දින ජාතික වැඩ සටහන කුඩා මත්ස්‍ය පදනම සතු කඩොලාන සංරක්ෂණ ව්‍යාපෘති භූමියෙහි දී අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් සමරන ලදි.

මෙම වැඩ සටහනේ දී පහත කාර්යයන් සිදු කරන ලදි.

- රාමසාර් තෙත්බිම් පිළිබඳව මුද්දර 04 ක් නිකුත් කිරීම
- "තෙත්බිම් අසිරිය" තුන්වන මුද්‍රණය සහ "ශ්‍රී ලංකාවේ කලපු" යන පොත් ප්‍රකාශයට පත් කිරීම

- රාමසාර් වෙබ් අඩවිය වෙත "ලෝක තෙත්බිම් දිනය" යන වාර්තාව ඇතුලත් කිරීම

- **කැළණි ගංඟා ද්‍රෝණිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය**

  කැළණි ගංඟා ද්‍රෝණිය ආරක්ෂා කිරීම සියළු පාර්ශවකරුවන්ගේ මැදිහත්වීම තුලින් සිදුකළ යුතු කාලීන අවශ්‍යතාවයක් ලෙස හඳුනාගත් මධ්‍යම පරිසර අධිකාරිය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) සමඟ ඒකාබද්ධව කැළණි ගංඟා ද්‍රෝණිය කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය දියත් කරන ලදි.

  වාර්තා කරනු ලබන කාලය තුල කැළණි ගංඟා ද්‍රෝණිය සංරක්ෂණය සඳහා වන ප්‍රධාන ක්‍රියාකාරී සැලසුම සකස් කරන ලදි.

පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියට යටත් නොවන ව්‍යාපෘති සඳහා පාරිසරික නිර්දේශය ලබාදීම

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ස්වභාවික සම්පත් කෙරෙහි යම් බලපෑමක් සිදුවිය හැකි එහෙත් පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියට යටත් නොවන ව්‍යාපෘති සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම සිදු කරනු ලබයි. ගස් කැපීම, දුරකථන කුළුණු ස්ථාපනය කිරීම, කැණීම් සිදු කිරීම (වැලි, මැණික්, ක්වාට්ස් ආදී), ඉඩම් කට්ටි කිරීම, ඉඩම් පිරවීම හා ඉඩම් හැරීම, කුඹුරු ඉඩම් ගොඩකිරීම සහ කුඩා ප්‍රමාණයේ හෝටල් මෙම ව්‍යාපෘති යටතට අයත් වේ.

වාර්තා කරනු ලබන කාලය තුලදී මෙවැනි ව්‍යාපෘති 5,843 ක් සඳහා අනුමැතිය මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ උපදෙස් පරිදි පළාත් කාර්යාල විසින් ලබා දෙන ලදි.

දුරස්ථ සංවේදනය හා භූගෝලීය තොරතුරු තාක්ෂණය ආශ්‍රයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ භූමි භාවිතයට ලක් වූ ස්ථාන හඳුනාගැනීම

අනාගත පරපුරට භාවිතා කිරීම සඳහා භූමි භාවිතයට ලක් වූ ප්‍රදේශ කළමනාකරණය යෝග්‍ය හා තිරසර අයුරින් සිදු කිරීම පිණිස භූමි භාවිතයට ලක් වූ ප්‍රදේශ හඳුනා ගැනීමේ වැදගත්කම අවබෝධ කර ගැනීමෙන් අනතුරුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් විවිධ අවශ්‍යතාවයන් සඳහා භාවිතයට ගතහැකි සහ සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හැකි භූමි භාවිතා කළ හැකි භූමි භාවිතා සිතියමක් මහනුවර දිස්ත්‍රික්කයේ භූමි භාවිතයට ලක් වූ ප්‍රදේශ හා මුඩුබිම් ඇතුලත් කොට සැකසීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි.

එම ව්‍යාපෘතිය මඟින් සකස් කරන ලද මහනුවර දිස්ත්‍රික්කයේ භෞතික භාවිත සිතියමට අනුව, අධික වශයෙන් පාංශු හායනය සිදුවන ප්‍රදේශ ලෙස වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ අභය භූමි, හන්තාන හා නක්ල්ස් කඳුකර කලාපය, ගලහ, දොළුව හා දෙල්තොට ආන්තික තේ වගා සහ නාවලපිටිය උස් කඳුකර බිම් යන ප්‍රදේශ හඳුනා ගන්නා ලදි. උක්ත පර්යේෂණ පත්‍රිකාව 2016 වර්ෂයේ ජාතික විද්‍යා පදනමෙහි පර්යේෂණ සමුළුව සඳහා ඉදිරිපත් කල අතර, එම සමුළුව විසින් පිළිගන්නා ලදි.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ භූමි පරිභෝග රටාවේ වෙනස්වීමක් සමඟම ඇති වන ආර්ථික සමාජීය හා පාරිසරික ගැටළු පිළිබඳ ඇගයීමේ පර්යේෂණ වාර්තාවක් සැකසීම

1972 සිට 2015 දක්වා කාලය තුල භූමි පරිභෝග රටාවේ සිදු වූ වෙනස්වීම් පිළිබඳව මෙම පර්යේෂණය මඟින් අධ්‍යයනය කරන ලද අතර, ඒ සඳහා භූමි පරිහරණ සිතියම් සකස් කරන ලදි. එහිදී වැඩි අවධානයක් යොමු කරන ලද්දේ වනාන්තර, ජනාවාස හා කුඹුරු ඉඩම් වල වෙනස්කම් සඳහාය.

මෙම පර්යේෂණයට අනුව, 1972 සිට 1985 දක්වා වනාන්තර වල අඩුවීමක් පෙන්නුම් කළ ද, 2001 වන විට නැවත එම ප්‍රමාණයේ වර්ධනයක් දක්නට ලැබුණි. යුධමය වාතාවරණයෙන් පසු නව සංවර්ධන කටයුතු ආරම්භ වීමත් සමඟම නැවතත් වානාන්තර අඩු වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණි. තවද, ජනාවාස භූමි ප්‍රමාණය හා කුඹුරු ඉඩම් ප්‍රමාණය කාලයත් සමඟම ක්‍රමානුකූල වර්ධනයක් පෙන්නුම් කරන ලදි.

දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ අඩංගු සංයුක්ත තැටි සැකසීම හා මුද්‍රණය කිරීම

මධ්‍යම පරිසර අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන ඒකකය මඟින් ස්වභාවික සම්පත්, පරිපාලනමය සීමාවන්, සමාජීය හා ආර්ථිකමය, ජන විකාශන හා පුරා විද්‍යාත්මක තොරතුරු සහ අනෙකුත් තොරතුරු ඇතුලත් මධ්‍යගත අවකාශීය දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබන අතර, එය යාවත්කාලීන කිරීම සිදු කරනු ලබයි. දැනට පවතින තොරතුරු භාවිතා කරමින් ඩිජිටල් දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ පහසු පරිශීලනය සඳහා සකසා ඇත. මෙම සංයුක්ත තැටි වල අඩංගු සිතියම් ප්‍රාදේශීය සහා මට්ටමින් සකස් කර ඇත.

මෙම ක්‍රියාවලියේ දී ගාල්ල, මාතර, පොළොන්නරුව සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක සඳහා වන දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ මුද්‍රණය කර ඇති අතර මහනුවර, යාපනය සහ රත්නපුර දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩයන් සකස් කරමින් පවතී.

➢ පරිසර දූෂණ පාලනය

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPL) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

2008.01.25 දිනැති හා 1533/16 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පලකර ඇති නියමිත ක්‍රියාකාරකම් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා දීමේ ක්‍රමවේදය මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.

එම නියමිත ක්‍රියාකාරකම් මඟින් සිදුවන පරිසර දූෂණය ප්‍රමාණාත්මකව නිර්ණයකොට එම ක්‍රියාකාරකම් ගැසට් නිවේදනයේ කාණ්ඩ "අ", "ආ" හා "ඇ" වශයෙන් ලැයිස්තුගත කර ඇත. ඒ අනුව, මහා පරිමාණ දූෂකාරක ක්‍රියාකාරකම් සහිත කර්මාන්තයන් "අ" කාණ්ඩයට ද මධ්‍යම පරිමාණ දූෂකාරක ක්‍රියාකාරකම් සහිත කර්මාන්තයන් "ආ" කාණ්ඩයට ද සුළු පරිමාණ දූෂකාරක ක්‍රියාකාරකම් සහිත කර්මාන්තයන් "ඇ" කාණ්ඩයට ද ලෙස වෙන්කර ගැසට් නිවේදනයේ සඳහන්ව ඇත. "අ" හා "ආ" කාණ්ඩ වල ක්‍රියාකාරකම් සිදු කරන කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල මඟින් ක්‍රියාත්මක කරනු ලබන අතර, "ඇ" කාණ්ඩයේ ක්‍රියාකාරකම් සිදු කරන කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පළාත් පාලන ආයතන මඟින් සිදු කරනු ලබයි.

	"අ" කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම	"ආ" කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම
නව බලපත්‍ර	1,464	1,127
බලපත්‍ර අළුත් කිරීම	5,363	1,139

2015.07.01 - 2016.06.30 දක්වා පහත සඳහන් පරිදි පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ඇත.

- **නව කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීම**

මධ්‍යම පරිසර අධිකාරිය විසින් නව කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා නිර්දේශ නිකුත් කරන අතර, එය කර්මාන්තයක් ආරම්භ කිරීමට ප්‍රථම එයින් සිදුවන පරිසර දූෂණය වැළැක්වීම සඳහා භවිතා කල හැකි මෙවලමක් ලෙස හැඳින්විය හැක. 2015.07.01 - 2016.06.30 දක්වා කාලය තුලදී මෙම පාරිසරික නිර්දේශ ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද කර්මාන්තකරුවන් ගණන හා ලබා දුන් නිර්දේශ ගණන පහත වගුවේ දැක්වේ.

අයදුම්පත් ගණන	ලබාදුන් නිර්දේශ ගණන
2,114	1,563

- **ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතීන් සඳහා පාරිසරික එකඟතාවය ලබාදීම**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත / ව්‍යාපෘති සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව අදාල පාරිසරික නිර්දේශ හා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නිකුත් කරනු ලබයි.

වාර්තා කරනු ලබන කාලය තුල, මධ්‍යම පරිසර අධිකාරිය විසින් කර්මාන්ත 253 ක් සඳහා පාරිසරික එකඟතාව ලබා දී ඇත. එනම්, නව කර්මාන්ත 82 ක් ස්ථාපනය කිරීම සඳහා ද, නව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර 32 ක් සඳහා ද, පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීම් 139 ක් සඳහා ද එකඟතාවය ලබා දෙන ලදි.

- **"ජාතික හරිත සම්මාන" වැඩ සටහන**

"ජාතික හරිත සම්මාන" මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පරිසර හිතකාමී ලෙස කටයුතු කරන ව්‍යවසායකයන් හට පිරිනමනු ලබන එකම සම්මානය වේ. පරිසර හිතකාමී ලෙස පවත්වාගෙන යනු ලබන පුද්ගලික හා රාජ්‍ය අංශයේ ව්‍යවසායකයින් ඇගයීම මෙම වැඩ සටහනේ මුඛ්‍ය පරමාර්ථය වේ. මෙම වැඩ සටහන හරිත ශ්‍රී ලංකාවක් කරා යන ගමනට මහත් පිටුවහලක් වන අතර, කර්මාන්ත ප්‍රජාව පරිසරය සුරැකීමේ මහඟු සත්කාරයට දායක කර ගැනීමේ ප්‍රායෝගික ක්‍රමයක් ද වේ. 2015 ජාතික හරිත සම්මාන වැඩ සටහන ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සිදුකරන ලදි. මෙහිදී රන් සම්මාන 06 ක් ද, රිදී සම්මාන 18 ක් ද, ලෝකඩ සම්මාන 13 ක් ද හා කුසලතා සම්මාන 17 ක් ද ලබාදෙන ලදි.

- **රසායනික අනතුරු වැලැක්වීමේ හා පෙර සූදානම් වැඩ සටහන**

නිරන්තර සුපරීක්ෂාකාරීත්වය සමඟ විධිමත් ආරක්ෂණ මිනුම් කාලානුරූපීව ලබාගැනීම තුලින් බොහොමයක් රසායනික ව්‍යසනයන් හෝ අනතුරු මඟහරවා ගත හැක. ජාත්‍යන්තර නියමයන්ට අනුකූලව එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහනේ (UNEP) අධාර ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

වාර්තා කරනු ලබන කාලය තුල පහත සඳහන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.

1. රසායනික ද්‍රව්‍ය සුරක්ෂිතව භාවිතා කිරීම, ගබඩා කිරීම හා වර්ගීකරණය කිරීම, රසායනික ද්‍රව්‍ය ලේබල් කිරීම හා උපද්‍රවකාරී රසායන ද්‍රව්‍ය මඟින් ඇතිවන සෞඛ්‍ය ගැටළු යන අංශයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් කෝස්වේ ජේන්ට් හා මල්ටිලැක් කර්මාන්ත ආයතනයන්ගේ නිලධාරීන් සහ සේවකයන් සඳහා පවත්වන ලදි.

2. රසායනික කර්මාන්ත සඳහා රසායනික ද්‍රව්‍ය වර්ගීකරණය හා රසායනික ද්‍රව්‍ය ගබඩා කළමනාකරණය කිරීම සම්බන්ධව මාර්ගෝපදේශ සකස් කරමින් පවතී.

- **ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩ සටහන**

පසුගිය අවුරුදු 05 ක කාලය තුල දී මධ්‍යම පරිසර අධිකාරිය විසින් රට තුල පවතින ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා ඉතාමත් සාර්ථක පියවර කිහිපයක්ම ආරම්භ කරන ලදි. ජාතික සහයෝගීතා හවුල් වැඩ සටහන්, එකතු කිරීමේ වැඩ සටහන්, දැනුවත් කිරීමේ වැඩ සටහන් ඒවායින් කිහිපයකි.

මෙම වැඩ සටහන "පවිත්‍ර ගංඟා - සියළු බිඳුවක්ම වටියි" යන වැඩ සටහන යටතේ මධ්‍යම පරිසර අධිකාරිය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) හා සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදි.

මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩ සටහන වාර්තා කරනු ලබන කාලය තුලදී ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස්වීම ඉහළ අගයක් ගන්නා කඩුවෙල මහ නගර සභාව, වත්තල නගර සභාව, සීතාවක ප්‍රාදේශීය සභාව හා කැළණිය ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතන බල ප්‍රදේශ වල ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩ සටහන් 04 ක් නොවැම්බර් මස 06 දින සිට 13 වන දින දක්වා පවත්වන ලදි. මෙම වැඩ සටහන් වලදී මෙට්‍රික් ටොන් 6.8 ක පමණ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රමාණයක් එකතු කර ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රලාභීන් හරහා බැහැරලීම සිදුකරන ලදි.

- **උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය**

උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසි (අංක 1534/18 දරණ 2008 පෙබරවාරි 01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය) ක්‍රියාත්මක කිරීමේ එක් කොටසක් ලෙස ලැයිස්තුගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර 101 ක් 2015.07.01 සිට 2016.06.30 දින දක්වා නිකුත් කරන ලදි.

- **තුනී පොලිතීන් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම**

තුනී පොලිතීන් රෙගුලාසි බලාත්මක කිරීම සඳහා 2016 ජනවාරි 01 වන දින සිට අදාල පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම සඳහා රැස්වීම් කිහිපයක් පවත්වන ලද අතර, මෙම රෙගුලාසිය සම්බන්ධයෙන් මහ ජනතාව දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් ද පලකරන ලදි. පොලිතීන් වල ඝනකම මැනීම සඳහා භාවිතා කරන උපකරණ (Polythene gauge meters) මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ඇති අතර, පොලිතීන් සඳහා විකල්පයන් හඳුන්වාදීම සඳහා අදාල පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් කිහිපයක් ද පවත්වන ලදි.

වාර්තා කරනු ලබන කාලය තුලදී, පොලිතීන් නිෂ්පාදනය කරනු ලබන ආයතන 500 ක් පසුවිපරම් කරන ලද අතර, තුනී පොලිතීන් රෙගුලාසි උල්ලංඝණය කල ආයතන 43 කට විරුද්ධව නීතිමය පියවර ගන්නා ලදි.

- **වායු සම්පත් කළමනාකරණය සහ පසු විපරම් කිරීම**

කොළඹ කොටුව දුම්රිය ස්ථානය අසල පිහිටා ඇති නිරීක්ෂණ මධ්‍යස්ථානයේ දී කොළඹ නගරයේ සංසරණ වායු ඝනත්වය පිළිබඳ පසුවිපරම් කිරීම සඳහා රසායනික විශ්ලේෂණ ක්‍රම භාවිතා කරමින් සල්ෆර් ඩයොක්සයිඩ් (SO_2) සහ නයිට්‍රජන් ඩයොක්සයිඩ් (NO_2) වායු සාන්ද්‍රණය මිනුම් කරන ලදි.

කොළඹ නගරයේ ඉතා සීඝ්‍රයෙන් ඉහළ යන වාහන සංඛ්‍යාවත් සමඟ වායු තත්වය වෙනස්වීමේ නැඹුරුතාවය විශ්ලේෂණය කිරීම සඳහා වායු ගතික විශ්කම්භය මයික්‍රොමීටර් 10 ට අඩු ක්ෂුද්‍ර අංශූන් (PM_{10}) සාන්ද්‍රණය මිනුම් කරන ලදි.

සංසරණ වායු තත්ව කළමනාකරණ ක්‍රියාවලියේ සඵලතාවය හා ඒ පිළිබඳව ජනතාවගේ දැනුවත් භාවය විනිශ්චය කිරීම සඳහා දිවයින පුරා සංසරණ වායු තත්වයන් පසුවිපරම් කිරීමේ වැඩ සටහන යටතේ බදුල්ල, නුගේගොඩ, නුවර හා සාලාව යන ප්‍රදේශ වල සංසරණ වායු තත්වයන් නිරීක්ෂණය කිරීම සිදුකරන ලදි.

- **ජල තත්ව පසුවිපරම් කිරීම**

මධ්‍යම පරිසර අධිකාරිය දිවයින පුරා පවතින කර්මාන්තයන්ගෙන් මුදාහරින කාර්මික අපසන්දන/ අපවාහයන් පසුවිපරම් කිරීම, විශ්ලේෂණය කිරීම හා වාර්තා කිරීම සිදුකරනු ලබයි.

මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය විසින් ජල නියැදි සාම්පල එක්රැස් කර විශ්ලේෂණය කරනු ලබයි. මෙම විශ්ලේෂණයන් සිදු කරනු ලබන්නේ පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලියේ දී එකතු කරගන්නා කාර්මික අපසන්දනයන් සඳහා, වාණිජමය කටයුතු සඳහා, දෛනික පසුවිපරම් සඳහා හා නීතිමය අවශ්‍යතා මත විවිධ ජල මූලාශ්‍රයන්හි මතුපිට හා භූගත ජල තත්වයන් පරීක්ෂා කිරීම සඳහා ය.

වාර්තා කරනු ලබන කාලය තුල දිවයින පුරා කාර්මික අපසන්දනයන් එක්රැස් කරනු පිණිස කර්මාන්ත පරීක්ෂාවක් සිදුකරන ලද අතර, විවිධ අවශ්‍යතාවන් සඳහා පරීක්ෂා කරන ලද නියැදි සාම්පල ප්‍රමාණයන් පහත වගුවේ දැක්වේ.

නියැදි සාම්පල ලබා ගැනීමේ අරමුණු	ලබා ගන්නා ලද නියැදි සාම්පල ගණන
නව හා අළුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා	96
නීතිමය අවශ්‍යතා සඳහා	16
පැමිණිලි විභාග කිරීම සඳහා	89
පසු විපරම් කිරීම සඳහා	111
වාණිජමය කටයුතු සඳහා	109
වෙනත් කටයුතු සඳහා	55
එකතුව	**476**

කාර්මික ජල තත්වයන් පසුවිපරම් කිරීමට අමතරව, කැළණි ගඟ, මහ ඔය, බෙන්තොට ගඟ සහ දඩුගම් ඔය යන ජල මූලාශ්‍රයන්හි මතුපිට ජල තත්වය පසුවිපරම් කිරීම මාසිකව සිදුකරනු ලබන අතර, බොරලැස්ගමුව වැවෙහි මතුපිට ජල තත්වය පසුවිපරම් කිරීම මාස 3 කට වරක් ද සිදුකරනු ලබයි.

- **පාරිසරික පැමිණිලි මෙහෙයවීම**

මධ්‍යම පරිසර අධිකාරිය ලබාදෙන සේවාවන් සම්බන්ධව හෝ මධ්‍යම පරිසර අධිකාරියේ ක්‍රියා පටිපාටිය සම්බන්ධව ප්‍රජාවගේ අකමැත්ත පැමිණිල්ලක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබේ. එම පැමිණිලි මෙහෙයවීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විවිධ වූ ක්‍රියාමාර්ග ගනු ලබයි.

වාර්තා කරනු ලබන කාලය තුලදී මධ්‍යම පරිසර අධිකාරිය වෙත පැමිණිලි 2,573 ක් ලැබී ඇති අතර, එයින් පැමිණිලි 353 ක් විසඳා ඇති අතර අනෙකුත් පැමිණිලි විසඳමින් පවතී.

➢ පාරිසරික අධ්‍යාපනය හා දැනුවත් කිරීම

- **අන්තර්ජාතික පාරිසරික අධ්‍යාපන මධ්‍යස්ථානය (ICES)**

විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවන්ට අනුකූලව පාරිසරික අධ්‍යාපනය ලබා දීම හා පාරිසරික අධ්‍යාපනය හා දැනුවත් කිරීමේ වැඩ සටහන පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය යටතේ අන්තර්ජාතික පාරිසරික අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටුවන ලදි.


රට තිරසාර සංවර්ධනය කරා යන්නා වූ මාර්ගය එළිපෙහෙලි කරනු වස් පරිසර ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා මහජනයාගේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම පිණිස ඔවුන්ගේ දැනුම හා ආකල්ප වැඩි දියුණු කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ.

වාර්තා කරනු ලබන කාලය තුලදී, "පරිසර දූෂණ පාලනය හා කළමනාකරණය" යන මාතෘකාව යටතේ විවිධ අංශයන්හි නිරතවූවන් 37 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව සහතික පත්‍ර පාඨමාලාව පවත්වන ලදි.

- **ලෝක පරිසර දිනය 2016**

2016 වසරේ ලෝක පරිසර දිනයේ "වන ජීවී සම්පත නීති විරෝධී ලෙස අලෙවි කිරීමට එරෙහි වෙමු" යන තේමාව යටතේ ජාතික වැඩ සටහන මාතලේ දිස්ත්‍රික්කයේ දී 2016 ජුනි මස 05 වන දින පවත්වන ලදි. මෙම උළෙලට සමගාමීව මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් හා දිස්ත්‍රික් කාර්යාලයන්හි මැයි මස 30 දින සිට ජුනි මස 05 වන දින දක්වා පරිසර සතිය ක්‍රියාත්මක කරන ලදි. එම සතිය තුල දී පැල සිටුවීමේ වැඩ සටහන්, පාරිසරික පා ගමන්, කසළ බහාලුම් බෙදාහැරීම, ශ්‍රමදාන වැඩ සටහන්, පාරිසරික පදක්කම් ප්‍රදානය කිරීමේ වැඩ සටහන්, ප්‍රදර්ශන සහ පරිසර සංරක්ෂණය පිළිබඳ පුහුණු වැඩ සටහන් හා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම සිදුකරන ලදි.





➢ පුනරුදය ජාතික වැඩ සටහන යටතේ ක්‍රියාත්මක ක්‍රියාකාරකම්

"පුනරුදය 2016 - 2018" ජාතික පාරිසරික සංරක්ෂණ වැඩ සටහන ප්‍රධාන තේමාවන් 05 ක් යටතේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මඟින් අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ ආරම්භ කරන ලදි. පරිසර දූෂණය පාලනය යන තේමාව යටතේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත බලතල පවරා ඇත.

මධ්‍යම පරිසර අධිකාරිය පුනරුදය ජාතික වැඩ සටහන යටතේ නව ව්‍යාපෘති යෝජනා 04 ක් පහත සඳහන් මාතෘකා යටතේ ඉදිරිපත් කරන ලදි.

01. පොලිතීන් හා ප්ලාස්ටික් ඒකාබද්ධ කළමනාකරණ වැඩ සටහන
02. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය
03. ගෘහස්ථ වායු තත්වය ඉහලනැංවීම
04. වේලි ඔය ජලාධාර ප්‍රදේශය සඳහා භූමි පරිහරණ කලාපීය සිතියමක් සකස් කිරීම

වාර්තා කරනු ලබන කාලය තුලදී පුනරුදය වැඩ සටහන යටතේ පහත ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදි.

- **විද්‍යාගාර ප්‍රතීතකරණය**

විද්‍යාගාර ප්‍රතීතකරණය මඟින් විශේෂිත වූ පරීක්ෂණ සිදුකිරීම, මිනුම් ලබාගැනීම හා ක්‍රමාංකනය කිරීම සඳහා විද්‍යාගාරයේ තාක්ෂණික යෝග්‍යතාව නිර්ණය කිරීම සිදුකරයි. එමෙන්ම, සේවාදායකයාගේ අවශ්‍යතාවන් ළඟාකර ගැනීමට නිවැරදි පරීක්ෂණ, මිනුම් හා ක්‍රමාංකන සේවාවන් හඳුනාගැනීම හා තෝරා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙන්ම කාර්යක්ෂම විද්‍යාගාර විධිමත්ව හඳුනාගැනීම සඳහා ද මෙම විද්‍යාගාර ප්‍රමිතිකරණය උපකාරී වේ. විද්‍යාගාර යෝග්‍යතාව පවත්වාගැනීම සඳහා මිනුම් පරිමාණයක් (Bench Mark) ලබාදීම හා විද්‍යාගාරය මඟින් සිදුකරන ක්‍රියාකාරකම් නිවැරදිව හා නිසි ප්‍රමිතියට අනුකූලව සිදුවේ ද නැද්ද යන්න නිර්නය කිරීම සඳහා පහසුකම් සැපයීම විද්‍යාගාර ප්‍රමිතිකරණ ක්‍රියාවලියේ දී විද්‍යාගාරයට ලැබෙන ප්‍රතිලාභ වේ.

වාර්තා කරනු ලබන කාලය තුලදී, මධ්‍යම පරිසර අධිකාරියේ විද්‍යාගාර උපකරණ ක්‍රමාංකනය කිරීම, ප්‍රතීතකරණය වූ විද්‍යාගාරයක් (SGS විද්‍යාගාරය) මඟින් සිදු කරන ලද අතර, ඒ පිළිබඳ සහතිකය ලබාගෙන ඇත. තවද, තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීමක් පවත්වන ලද අතර, විද්‍යාගාර ප්‍රතීතකරණය සම්බන්ධව මාර්ගෝපදේශ සකස් කරන ලදි. ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය හා රසායනික අංශයට අදාල රාක්ක මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම සඳහා ඊට අදාල නිමානයන් හා තාක්ෂණික සැලැස්ම සකසමින් පවතී.

- **පිළිසරු ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය**

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුල කාර්යක්ෂම හා ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ගොඩනැගීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කොටගෙන "පිළිසරු" ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන 2008 වසරේ සිට ක්‍රියාත්මක කරනු ලබයි.

වාර්තා කරනු ලබන කාලය තුලදී, පිළිසරු ව්‍යාපෘතිය යටතේ පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- කසළ වෙන් කිරීම දිරිමත් කිරීම සහ කසළ කළමනාකරණය හා කොම්පොස්ට්කරණය ගෘහස්ථ මට්ටමින් ප්‍රවර්ධනය කිරීම

- "මිටියාවත" කසළ කළමනාකරණ ගුවන් විදුලි වැඩ සටහන් 55 ක් ප්‍රචාරය කිරීම හා ජයග්‍රාහකයින් සඳහා තෑගි ලබාදීම සිදුකරන ලදි.
- තෝරා ගන්නා ලද සංස්කෘතික උත්සව, පළාත් පාලන ආයතන හා අනෙකුත් විවිධ ආයතන සඳහා එකතු කිරීමේ බහාලුම් 693 ක් බෙදාදෙන ලදි.
- විවිධ නාලිකා හා පුවත්පත් වල පොලිතීන් භාවිතය පාලනය සම්බන්ධව මාධ්‍ය දැන්වීමක් ප්‍රවර්ධනය කරන ලදි.
- තත්වයෙන් බාල පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා විවිධ වූ පුවත්පත් වල දැන්වීම් පලකරන ලදි.
- කැළණි විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන සංගමය විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනයේ දී හා නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ පාසල් 04 කදී කසළ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් කිහිපයක් පවත්වන ලදි.
- තෝරාගන්නා ලද පළාත් පාලන ආයතන කිහිපයක කොම්පෝස්ට් නිපදවීමේ පුහුණු වැඩ සටහන් 20 ක් පවත්වන ලදි.

- ජාතික කසළ කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම හා දත්ත පද්ධතිය පිළියෙල කිරීම

- ප්‍රශ්නාවලිය හා දත්ත පද්ධතිය සඳහා වූ ආකෘතීන් සකස් කරන ලදි.
- පළාත් පාලන ආයතන මඟින් දත්ත එක්රැස් කිරීම සිදුකරමින් පවතී.

- කසළ කළමනාකරණ ව්‍යාපෘති පිහිටුවීම

- නව කොම්පෝස්ට් අංගන 07 ක හා ජීව වායු අංගන 06 ක ඉදිකිරීම් කටයුතු නිම කොට ඇත.
- මාතලේ ප්‍රාදේශීය සභාව තුල කසළ දාහකයක් (Incinerator) ස්ථාපනය කරන ලදි.
- කොම්පෝස්ට් අංගන 21 ක වැඩි දියුණු කිරීමේ කටයුතු සිදුකරන ලදි.
- මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ ඒකාබද්ධව දෙමුහුන් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් බස්නාහිර පළාත තුල ක්‍රියාත්මක කරන ලදි.

➢ මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති

- **මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය**

පළාත් මට්ටමින් දූෂණ පාලන අවශ්‍යතා සපුරාලීම පිණිස මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල සඳහා විද්‍යාගාර ස්ථාපනය කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් සැලසුම් කරන ලදි. එහිදී, කාර්මික දූෂණ පාලනය සඳහා වැදගත් මූලික පරාමිතීන් මිනුම් කිරීමට අවශ්‍ය පහසුකම් ඇතුලත්ව පළාත් කාර්යාල සඳහා විද්‍යාගාර ස්ථාපනය කිරීමට තීරණය කරන ලදි.

වාර්තා කරනු ලබන කාලය තුලදී, පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- විද්‍යාගාර උපකරණ, වීදුරු භාණ්ඩ සහ විෂ රසායනික ද්‍රව්‍යයන්හි ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සම්පූර්ණ කරන ලද අතර, ගම්පහ දිස්ත්‍රික් විද්‍යාගාරය හැර අනෙකුත් පළාත් කාර්යාලයන්හි ස්ථාපිත විද්‍යාගාරයන් සඳහා සියළු විද්‍යාගාර උපකරණ ලබා දී ඇත.
- පළාත් මට්ටමින් සියළු යටිතල පහසුකම් සම්පූර්ණ කරන ලදි.

- වායු තත්ව පිරික්සුම් උපකරණ සඳහා හා ජල තත්ව පිරික්සුම් උපකරණ සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර වායු තත්ව පිරික්සුම් උපකරණ 02 ක් පමණක් ලැබී ඇත.
- ව්‍යාපෘතිය යටතේ දඩුගම් ඔය, බෙන්තොට ගඟ හා මා ඔය ජල මූලාශ්‍රයන්හි ජල තත්වය පසු විපරම් කරනු ලබන අතර, විශ්ලේෂණය කිරීම සඳහා දඩුගම් ඔයෙන් හා බෙන්තොට ගඟෙන් ජල සාම්පල 24 ක් බැගින් ද මා ඔයෙන් ජල සාම්පල 32 ක් ද ලබා ගන්නා ලදි.

- **JICA ආයතනයේ මූල්‍යාධාර යටතේ ප්‍රධාන ජලාශ වල ජල තත්ව පසුවිපරම් කිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාවේ ජල දේහයන් මද වශයෙන් හෝ දූෂණයට ලක් වී ඇත. ගම්පහ ප්‍රදේශය හරහා ද ගලා බසින කැළණි ගංගාව, ගංගා ද්‍රෝණිය අවට අධික ජන ඝණත්වයක් පැවතීම හේතු කොට ගෙන කාර්මික හා ගෘහස්ථ අපද්‍රව්‍ය ගංගාවට එකතු වීම තුලින් අධික ලෙස දූෂණයට ලක් වී ඇත. බොහෝ පර්යේෂකයින් විසින් කැළණි ගංගාව පිළිබඳව කෙටි කාලීන අධ්‍යයනයන් සිදුකර ඇති නමුත් කැළණි ගංගාවෙහි ජල තත්වය පිළිබඳ ක්‍රමානුකූල දත්ත පද්ධතියක් නිර්මාණය වී නොමැත. එබැවින්, කැළණි ගංගාවේ ජල තත්වය පාලනය කිරීම හා ආරක්ෂා කිරීම ජාතික ප්‍රශ්නයක් බවට කාලානුරූපීව පත්වී ඇත.

පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා ප්‍රධාන නියාමන ආයතනය ලෙස ක්‍රියා කරන මධ්‍යම පරිසර අධිකාරිය විසින්, පවතින සංසරණ ජල තත්ව ප්‍රමිතීන් හා අපවාහයන් පිළිබඳ ප්‍රමිතීන් වලට අනුකූලව ජල තත්ව පසු විපරම් කිරීම හා පාලනය කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ (JICA) මූල්‍ය සහාය ඇතිව ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි.

ජල තත්වය අනුව කැළණි ගංගාව වර්ගීකරණය කිරීම, දූෂකාරක ප්‍රභව හඳුනා ගැනීම, දූෂකාරක ප්‍රභව නාමාවලිය (PSI) සැකසීම හා ජල තත්ව පසු විපරම් කිරීම සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරියේ අදාල නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් වේ.

වාර්තා කරනු ලබන කාලය තුල පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- විද්‍යාගාර උපකරණ වර්ග 23 ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදි.
- පාරිසරික ජල පද්ධතිය හා පරිපාලනමය කළමනාකරණය සහ පිරික්සුම් හා විද්‍යාගාර විශ්ලේෂණ ඇතුලත් පාරිසරික ජල කළමනාකරණය යන මාතෘකා ඔස්සේ පුහුණු වැඩ සටහන් දෙකක් ජපානයේ දී පවත්වන ලදි.
- ශ්‍රී ලංකාවේ සංසරණ ජල තත්ව ප්‍රමිතීන්ට අනුකූලව ජල තත්ව වර්ගීකරණය පිළිබඳව මාර්ගෝපදේශ සකස් කිරීම සිදු කරමින් පවතියි.
- ශ්‍රී ලංකාවේ දූෂකාරක ප්‍රභව නාමාවලිය සඳහා වූ ආකෘතිය සකස් කිරීම සම්පූර්ණ කර ඇත.

- **ඝන අපද්‍රව්‍ය බැහැරලීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

අවිධිමත් ලෙස බැහැර කිරීම තුලින් පාරිසරික හා සෞඛ්‍යමය ගැටළු බොහොමයක් ඇති කරන නාගරික ඝණ අපද්‍රව්‍ය සඳහා අවසාන බැහැරලීමේ පහසුකම් උදෙසා විද්‍යානුකූලව පිළිගත් ඒකාබද්ධ කසළ කළමනාකරණ විසඳුම් ලෙස, සනීපාරක්ෂක කසළ රඳවනයන් කිහිපයක් ඉදි කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

ව්‍යාපෘතිය මඟින් පහසුකම් සලසන නගර පවිත්‍රව තබා ගැනීමට අවශ්‍ය වන යටිතල පහසුකම් ගොඩ නැගීම සඳහා මෙම ව්‍යාපෘතියේ ඝණ අපද්‍රව්‍ය පිරියම් කිරීමේ පහසුකම් උපකාරී වනු ඇත. එසේම ව්‍යාපෘතිය නිම වීමත් සමඟ රැකියා අවස්ථා උත්පාදනය සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතික ප්‍රතිරූපය ඉහළ නැංවීම සිදු වනු ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් නගර සභාවලට අයත් ඝන අපද්‍රව්‍ය ක්‍රමානුකූලව අපහරණය සහ කළමනාකරණය කිරීම හරහා වඩා හොඳ මහජන සෞඛ්‍ය

හා සනීපාරක්ෂක මට්ටමක් සුරක්ෂිත කෙරෙන අතර එමඟින් රෝගී තත්වයන්ට ගොදුරුවීමේ සම්භාවිතාව අඩුවන අතර, ඒ හරහා ආදායම් සුරැකීමට උපකාරී වේ.

මෙම ව්‍යාපෘතිය මඟින් අනුරාධපුර - කීරක්කුලම, හික්කඩුව - මොන්රෝවියාවත්ත, මැදිරිගිරිය - යුධනාව සහ යාපනය - කීරිමලෙයි යන ස්ථානයන්ගේ සනීපාරක්ෂක කසළ රඳවන ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, අදාළ පළාත් පාලන ආයතනවලින් බැහැරලන අවශේෂ කසළ සඳහා පොකුරු ක්‍රමය යටතේ අවසාන බැහැරලීමේ පහසුකම් ලබාදීමට අපේක්ෂිතය.

වාර්තා කරනු ලබන කාලය තුල ව්‍යාපෘතිය විසින් පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- අනුරාධපුර - කීරක්කුලම සහ හික්කඩුව - මොන්රෝවියාවත්ත යන ස්ථාන දෙක සඳහා සවිස්තර සැලසුම් (Detailed Design) සකස් කිරීම
- මැදිරිගිරිය - යුධගනාව සහ යාපනය - කීරිමලෙයි යන ස්ථාන සඳහා අදාල සංකල්පිත සැලසුම් වාර්තා (Conceptual Design Report) සකස් කර ඇති අතර සවිස්තර සැලසුම් සකස් කිරීම ආරම්භ කර ඇත.
- මිල ගණන් කැඳවීම සම්බන්ධ ලියකියවිලි සකස් කිරීම ආරම්භ කර ඇත.

- **ජාතික පරිසර නියමු වැඩ සටහන**

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාසල් ළමුන් සඳහා විවිධ වූ පාරිසරික වැඩ සටහන් සංවිධානය කරනු ලබන අතර, ජාතික පරිසර නියමු වැඩ සටහන මේ සම්බන්ධව ඇති ප්‍රධාන වැඩ සටහනවේ. පාසල් ළමුන්ට පරිසරයේ ඇති වටිනාකම වටහා ගැනීමට, ඔවුන්ගේ පාරිසරික දැනුම වැඩි දියුණු කිරීමට හා පරිසරය කෙරෙහි ඔවුන්ගේ ඇති ආකල්ප වෙනස් කිරීමට මෙම වැඩ සටහන උපකාරී වේ. තවද, පරිසර සංරක්ෂණය සඳහා ළමුන්ගේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම ප්‍රායෝගිකව ඉතාමත් වැදගත් වේ.

වාර්තා කරනු ලබන කාලය තුල, මෙම වැඩ සටහන මඟින් පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- පාසල් ගුරුභවතුන්, පෙර පාසල් ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ කලාප අධ්‍යාපන මට්ටමින් පරිසර නියමු වැඩ සටහන් භාර ගුරුවරුන් සඳහා පුහුණු වැඩ සටහන් 22 ක් පවත්වන ලදි.
- බදුල්ල දිස්ත්‍රික්කය සඳහා කඳවුරු 02 ක් ද, ගාල්ල දිස්ත්‍රික්කය සඳහා කඳවුරු 02 ක් ද සහ වවුනියා දිස්ත්‍රික්කය සඳහා එක් කඳවුරක් ද වශයෙන් දිස්ත්‍රික් කඳවුරු 05 ක් පවත්වන ලදි.
- 2015 ඔක්තොම්බර් 22 දින ජනාධිපති පදක්කම් ප්‍රදාන උළෙල අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති නිල නිවසේ දී පැවැත්විනි.
- මාතලේ, බදුල්ල, අනුරාධපුර, යාපනය හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි විශිෂ්ඨ දක්ෂතා පෙන්නුම් කල පරිසර නියමු පාසල් 05 ක් සඳහා පුස්තකාල ද්‍රව්‍ය (පොත්, සඟරා, පෝස්ටර්, අත්පත්‍රිකා සහ අනෙකුත් පාරිසරික අධ්‍යාපන ද්‍රව්‍ය) ලබාදෙන ලදි.
- ජනාධිපති පදක්කම්ලාභී සිසුන් 16 දෙනෙකු සඳහා පාරිසරික අධ්‍යාපනය පිළිබඳ විදේශීය පුහුණුවක් ඉන්දියාවේ දී ලබාදෙන ලදි.
- පරිසර නියමුවන්ගේ ජයග්‍රහණ සඳහා ජනාධිපති පදක්කම් 36 ක් ද, රන් පදක්කම් 436 ක් ද, රිදී පදක්කම් 1,359 ක් ද, හරිත පදක්කම් 6,017 ක් ද සහ පරිසර නියමු පදක්කම් 24,197 ක් ද ප්‍රදානය කරන ලදි.

- **පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාව තුල ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලිය නිවැරදි ලෙස කළමනාකරණය කිරීම තුලින් හරිත පරිසරයක් රටතුල නිර්මාණය කිරීමේ අරමුණින් පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

වාර්තා කරනු ලබන කාලය තුලදී පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- නුවර මහ නගර සභාවට අයත් ගොහාගොඩ ප්‍රදේශයේ ස්ථාපනය කරන ලද ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය 2015 ඔක්තෝම්බර් මස 12 වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදි.
- ඉපලෝගම ප්‍රාදේශීය සභාව තුල ප්ලාස්ටික් අපද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකරන ලදි.
- නුවරඑළිය මහ නගර සභාව තුල ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ආකෘති අංගනයක් ඉදිකරන ලද අතර, යාපනය මහ නගර සභාව තුල ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ආකෘති අංගනයක් ඉදිකරමින් පවතී. නුවරඑළිය සහ යාපනය මහ නගර සභාව සඳහා ප්ලාස්ටික් කුඩුකරන යන්ත්‍රයක් (Crusher machine) හා කසළ ප්‍රවාහන කම්පැක්ටරයක් ලබාදෙන ලදි.
- අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පෙළඹවීම අරමුණු කොටගෙන දැනුවත් කිරීමේ වැඩ සටහන් 39 ක් පවත්වන ලදි.
- ශ්‍රී පාද හා කතරගම පූජා භූමීන් වලදී කසළ කළමනාකරණ වැඩ සටහනක් 02ක් පවත්වන ලදි.

2.1 ක්‍රියාකාරී සැලැස්ම - 2017

මධ්‍යම පරිසර අධිකාරිය
ක්‍රියාකාරී සැලැස්ම - 2017
පුනරාවර්තන හා ප්‍රාග්ධන

ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	මූල්‍ය ඉලක්කය (රු. "000")
1.පරිසර කළමනාකරණය හා ඇගයීම		
	1.1 පරිසර බලපෑම් ඇගයීම	2,000
	1.2 ස්වභාවික සම්පත් කළමනාකරණය හා පසු විපරම් කිරීම	1,500
	1.3 පර්යේෂණ හා සංවර්ධන	2,500
2. පරිසර දූෂණ පාලන		
	2.1.පරිසර දූෂණ පාලන	750
	2.2 ප්‍රධාන පාරිසරික පරාමිතීන් පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය	2,500
	2.3 අපද්‍රව්‍ය කළමනාකරණය	750
3. පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම		
	3.1 මාධ්‍ය ඒකකය	500

4. පාරිසරික නීතිය බලාත්මක කිරීම	**1,500**
5. සැලසුම් හා පසු විපරම්	**250**
6. පාරිසරික සේවා සැපයුම කළමනාකරණය	**3,000**
පුනරාවර්තන එකතුව	**15,250**
ප්‍රාග්ධන එකතුව	**188,710**
විශේෂ ව්‍යාපෘති	
පිළිසරු වැඩ සටහන	462,000
පරිසර නියමු වැඩ සටහන	69,000
මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාර ශක්තිමත් කිරීම හා පරිසර ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	30,000
ප්‍රධාන ජලාශවල ජල තත්ව පසු විපරම් කිරීමේ ව්‍යාපෘතිය	31,500
ඝන අපද්‍රව්‍ය බැහැරලීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	2,007,350

04. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

➢ *සමස්ත මූල්‍ය ප්‍රගතිය*

වර්තමාන ජාතික සංවර්ධන සැලැස්ම යටතේ අපේක්ෂා කෙරෙන වාරිමාර්ග, කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධන ඉලක්කයන් සපුරාගැනීමේලා මහවැලි සංවර්ධන වැඩ සටහන දශක හතරක් පුරාවට අති විශේෂ දායකත්වයක් දෙනු ලබයි.

මහවැලි ව්‍යාපාරයේ යටතේ වන විශාල ජලාශ හා අනෙකුත් ඉදි කරන ලද වාරිමාර්ග යටිතල පහසුකම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරීම,මහවැලි ප්‍රදේශයන්හි කෘෂිකාර්මික නිෂ්පාදන කලාපීය ආර්ථිකය හා සාමාජීය සංවර්ධනය ඉහළ නැංවීම හා මහවැලි මහ සැලැස්ම යටතේ යෝජිත ව්‍යාපෘතීන්හි සියලු සංවර්ධන කටයුතුසම්පූර්ණ කර ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ සශ්‍රීකත්වය උදෙසා වාරි ජලය සුරක්ෂිත කිරීම පදනම් කොටගෙන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වර්තමාන ක්‍රියාත්මක සැලසුම් ප්‍රමුඛ වශයෙන් සකස් වී ඇත.

ජාතික වාරිප්‍රතිපත්තිය ප්‍රකාරව (1) ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය (2) වාරි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා නවීකරණය (3) ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණය (4) ආයතන ප්‍රතිසංවිධානය හා (5) පර්යේෂණ හා සංවර්ධනය යන ඉලක්කයන් 5 සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරයි.එම ප්‍රතිපත්ති මාර්ගෝපදේශ මත පදනම්ව පසුගිය දශක තුනක් පුරාවට පැවතුනු අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් සංවර්ධන කටයුතු අඩාලව පැවතුනු උතුරු නැගෙනහිර ප්‍රදේශයන් සංවර්ධනය කර කෘෂි ආර්ථික පුනර්ජීවනයක් ඇති කිරීම කෙරෙහි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මේ යටතේ උතුරු මැද පළාත් ස්වාභාවික ඇල, මාදුරුඔය දකුණු ඉවුර, කාලිංග නුවර-අංගමැඩිල්ල පොම්පාගාර සංකීර්ණය වැනි වාරිමාර්ග හා සංවර්ධන ව්‍යාපෘතීන්වල සැලසුම්කරණ කටයුතු සිදු කරන අතරඅති විශාල ප්‍රමාණයක් වූ ග්‍රාමීය ජනතාවගේ තිරසාර රැකියා අවස්ථා තහවුරු කරන අතරම රටේ කෘෂි කර්මාන්තයට හා ආහාර සුරක්ෂිතතාවට දායක වන මොරගහකන්ද/කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය, උමාඔය සංවර්ධන ව්‍යාපෘතිය, වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය-එල් කලාපය, රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය, මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය-බී කලාපය සහ මාදුරුඔය ගංගාඉවුරු සංවර්ධන ව්‍යාපෘතියවැනි ව්‍යපෘතීන්ද සිදු කෙරෙමින් පවතී.මහවැලි බහුකාර්ය සංවර්ධන ව්‍යාපාරයෙන් කොටසක් සම්පූර්ණ කර සිටියද එමගින් ප්‍රතිලාභ රැසක් ජාතික සමෘද්ධිය උදෙසා ලබා දී තිබේ. සංවිධිත වාරි කළමනාකරණය, වඩාත් පිළිගත් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන්, ඵලදායීතාව ඉහළදැමීම මඟින් තිරසාර ලෙස රටේ ආහාර නිෂ්පාදනය වැඩිකිරීම සහ ජාතික විදුලිබල පද්ධතියට ජල විදුලිය සැපයීම හරහා විශාල ප්‍රතිලාභ ලබාදීමට දායක වේ.සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා මෙරට ග්‍රාමීය ප්‍රදේශවල සැලකියයුතු

ප්‍රමාණයක සම්පත් ඒකරාශි කිරීම අත්‍යවශ්‍ය බැවින් අවශ්‍ය ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය මහවැලි සංවර්ධන වැඩසටහනේ තවත් එක් ප්‍රධාන කාර්යයක් වේ. නව අදායම් මාර්ග විවර කරදීම හා වියළි කලාපීය ග්‍රාමීය ප්‍රජාවගේ ව්‍යවසායකත්ව හැකියාව ශක්තිමත් කිරීම තුළින් ග්‍රාමීය ගෘහ ආර්ථිකයේ සැලකියයුතු වර්ධනය තහවුරු කරමින් විශ්වාසයක් ගොඩනැගීමට මෙම ජාතික වැඩසටහනට හැකි වී ඇත. මෙම වැඩසටහන යටතේ යෝජිත ව්‍යාපෘති මඟින් මහවැලි ගඟ හා ඒ ආශ්‍රිතගංගා ද්‍රෝණිවල භාවිතයට නොගත් ජල සම්පත් භාවිතයට ගැනීමට අපේක්ෂාකරයි.

මහවැලි සංවර්ධන මහ සැලැස්ම යටතේ දක්වා ඇති මහවැලි කලාප 13 කින් කෘෂිකාර්මික කටයුතු සඳහා සංවර්ධනය කිරීමට අපේක්ෂිත මුළු ඉඩම් ප්‍රමාණය හෙක්. 365,000 ක් පමණ වේ. මහවැලි ජලය බහුකාර්ය සංවර්ධනයට යොදා ගැනීම සඳහා ජල විදුලි බලාගාර සහිත ජලාශ ස්ථාපනය කිරීම, වාරි පද්ධතිය, අවශ්‍ය සමාජීය ආර්ථික යටිතල පහසුකම් සහිතව මිනිසුන් පදිංචි කරවීම තුළින් කෘෂිකාර්මික ඉඩම් සංවර්ධනය මෙයට ඇතුළත් වේ. මෙම යෝජිත සංවර්ධනය වැඩපිළිවෙල වියළි කලාපයේ 58% ක ප්‍රමාණයක් ආවරණය කරන අතර එමගින් ජාතික ජල විදුලිපල උත්පාදනයට වැදගත් දායකත්වයක් ලබා දේ.

කෘෂිකර්මදෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය රටේ කෘෂිකාර්මික නිෂ්පාදනය හා සංවර්ධනය කෙරෙහි විශාල දායකත්වයක් දක්වයි. 2016 ජුනි මස අවසාන වනවිට වී නිෂ්පාදනය 18% කට වඩා වැඩියෙන්ද සෝයා 55% ක්ද , මුං ඇට 7%ක් ද සහ මිරිස් නිෂ්පාදනය 28%ක් ලෙස ජාතික නිෂ්පාදනයට දායකත්වය ලබාදෙයි.

2016 වර්ෂය තුළදී සිදු කරන ලද සංවර්ධන කටයුතු

සමස්ත මූල්‍ය ප්‍රගතිය

2016 වර්ෂයේ ලැබුණු මුළු ප්‍රාග්ධන අයවැය (සංශෝධිත) රු. මි. 3,775.00 වේ. මෙයට අමතරව මහවැලි සංවර්ධන විදේශ ආධාර ව්‍යාපෘති වන මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය, වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය සඳහා අතිරේක අරමුදල් සැපයීම, උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සහ කාලගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (මහවැලි කොටස) යන ව්‍යාපෘතීන් මහවැලි බල ප්‍රදේශ තුල ක්‍රියාත්මක වේ. ඒ අනුව 2016 වර්ෂයේ මුළු ආයෝජනය රු. මි. 40,798.00 වේ. 2016 ජුනි මස අවසන් වන විට මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

විස්තරය	අයවැය ප්‍රතිපාදන	නිදහස් කරන ලද මුදල (2016 ජුනි අවසානය දක්වා)	වියදම (2016 ජුනි අවසානය දක්වා) රු.මි.
මහවැලි ව්‍යාපෘති	**38,798.00**	**9,595.70**	**9,221.77**
මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය	500.00	152.00	156.56
බී කලාපයේ මාදුරුඔය ගංගා ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය	300.00	45.60	35.88
රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය	150.00	30.29	18.07
වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය - L කලාපය	500.00	94.47	57.49
මහවැලි ගැටඹේ හා ඉවුර ආරක්ෂාකිරීමේ වැඩසටහන	125.00	25.00	33.98
හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යපෘති ප්‍රතිසංස්කරණය කිරීම	200.00	25.00	35.24
**මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය*	16,550.00	5,877.27	5,542.08
** වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය සඳහා අතිරේක අරමුදල් සැපයීම(මහවැලි කොටස)*	659.40	334.40	334.40
** උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය*	19,373.00	2,750.47	2,746.87
*** කාලගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (මහවැලි කොටස)*	440.60	261.20	261.20
පරිපාලනය හා නඩත්තු	**2,000.00**	**824.18**	**725.52**
එකතුව	**40,798.00**	**10,419.88**	**9,947.29**

*මෙම ව්‍යාපෘතීන් මහවැලි සංවර්ධන ප්‍රදේශවල ක්‍රියාවට නැංවෙන අතර මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් අධීක්ෂණය කරනු ලැබේ. මෙම ව්‍යාපෘතීන් අවසන් කළ පසුව ඒවා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාර දෙනු ඇත.

**මෙම ව්‍යාපෘතිය වාරි මාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර මහවැලි ප්‍රදේශවල කොටස් වශයෙන් ක්‍රියාත්මක වේ.


මහවැලි ව්‍යාපෘති


- මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය

මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය 2007 වර්ෂයේ දී වාරි ජලය සුරක්ෂිත කර කෘෂි ආර්ථිකය නැංවීම හරහා මාදුරුඔය වම් ඉවුර ප්‍රදේශයේ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම අරමුණු කර ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතියට (අ) වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ කි. මී. 52 ක් වන ප්‍රධාන ඇල, කි. මී. 65 ක් වන ශාඛා ඇලවල්, කි. මී. 459 ක් වන බෙදාහැරීමේ ඇලවල්,කි. මී. 1,138 ක් වන කෙත් ඇලවල්,කි. මී. 54 ක් වන පරිවහන ඇලවල්,කි. මී. 80 ක් වන මෙහෙයුම් හා නඩත්තු මාර්ග හා කුඩා වැව් ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළුව ජල කළමනාකරණය සඳහා මාදුරුඔය වම් ඉවුරේ 1981 – 1986 කාලය තුල ඉදිකරන ලද වාරිමාර්ග ජාලය ප්‍රතිසංස්කරණය කිරීම (ආ) ග්‍රාමීය ස්වයං ආධාරක ව්‍යාපෘති යටතේ ගොඩනගන ලද තෝරාගත් ජල සැලයුම් සේවා විධිමත් කර ප්‍රවර්ධනය කිරීම (ඇ) කෘෂිකාර්මික සංවර්ධනය උපකාරී වීම හා ගොවි සංවිධාන ශක්තිමත් කිරීම මෙන්ම (ඈ) පාරිසරික සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (සංශෝධිත) රු.මි. 4,910ක් වේ.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මී. 500 ක් වන අතර ජුනි වස අවසානය වන විට රු. මී. 156.56 ක් භාවිතා කර ඇත. 2016 මෙම කාලය තුලදී කෙත්ඇල කි. මී. 50.3 ක්ද බෙදුම් ඇල කි. මී. 4.6 ක්ද හා පරිවහන ඇලවල් කි. මී. 10.1 කද ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇත. තවද සිංහපුර හා දිඹුලාගල කොට්ඨාසවල

කුඩා වැවක ප්‍රතිසංස්කරණ කටයුතුද දම්මින්න සහ විජබාපුර ජල සැපයීම් යෝජනා ක්‍රම 2 ක්ද ප්‍රතිසංස්කණ කටයුතු සිදුකර ඇත.






මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය

- **බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය**

මහවැලිතැන්න ඒකකය හා මල්වැන්න ඒකක පොලොන්නරුව හා මඩකලපුව දිස්ත්‍රික්කවලට අයත් මහවැලි බී කලාපයේ සිංහපුර කොට්ඨාසයේ ඉහළ කොටසේ පිහිටා ඇත. එම ප්‍රදේශය තුළ පැතිර පැවති අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් එම ප්‍රදේශයේ විසූ බොහෝ නිවැසියන් අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් එසේ අවතැන් වූ 1200 කට අධිකපුද්ගලයින් සංඛ්‍යාවක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඔවුන්ගේ මුල් පදිංචි ස්ථාන කරා නැවත හරවා යවා ඇත. පැවති අර්බුදකාරී වාතාවරණයෙන් අනතුරුව 2014 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචිකිරීමේ හා ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කෙරිණ.

එහෙත් සාමය උදාවීමත් සමග නැවත පදිංචි කිරීම සහ වාරිමාර්ග පුනරුත්ථාපන කටයුතු ආරම්භ කළ අතර ව්‍යාපෘතිය හරහා පවුල් 859 ක් වාරි ඉඩම් ලබාදෙමින් සිංහපුර කොට්ඨාසයේ මල්වැන්න හා මහවැලිතැන්න ඉතිරි කෘෂි සංවර්ධන කටයුතු ආරම්භ කෙරිණි.මෙහිදී සිංහපුර කොටසේ මහවැලිතැන්න හා මල්වැන්න ඒකකවල ගෙවතු ඉඩම් 859ක් හා වාරි ඉඩම් 859 සංවර්ධනය සංවර්ධනය කිරීමට යෝජනා විය. ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් වශයෙන් (අ) පවුල් 859ක් සිංහපුර කොටසේ නැවත පදිංචි කිරීම හා පදිංචිය ස්ථාපිත කිරීම (ආ)හෙක්ටයාර 521 ක් පමණ වූ දැනට පවත්නා වාරි පදනම් වූ කෘෂිකර්මාන්තය සඳහා සංවර්ධනය කිරීම (ඇ) හෙක්ටයාර 174 ක් වූ ගෙවතු ඉඩම් සංවර්ධනය සහ (ඈ) මහවැලිතැන්න වැව හා වාරි පද්ධතිය ඉදි කිරීම දක්වා ඇත. ව්‍යපෘතියේ මුලු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 935.49 කි.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මි. 300 ක් වන අතර ඉන් රු. මි. 35.88 ක් මෙම කාලය වනවිට වියදම් කර ඇත. මේ වර්ෂයේ ජුනි මස අවසානය වනවිට හෙක්. 37.06 ක කැළෑ එළිකිරීම් සහ රළු මට්ටම් කිරීමේ කටයුතු අවසන් කර ඇත. කෙත්ඇල කි. මී. 0.69 ක්ද පරිවහන ඇල කි. මී. 1.75 ක ඉදිකිරීමේ කටයුතුද මහවැලි තැන්න ඒකකයේ කි. මී. 1.34 ක මාර්ගයක ඉදිකිරීමේ කටයුතුද අවසන් කර ඇත.






බී කලාපයේ මාදුරුඔය දකුණුඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය

- **රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉතා දුර බැහැර පිහිටි මෙන්ම වඩාත් දරිද්‍රතාවයෙන් යුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වශයෙන් හඳුනාගෙන ඇත. එබැවින් ඉහත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණින් 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පස් අවුරුදු ආයෝජන සැලැස්මක් සකස් කරන ලදි. මෙම ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පදිංචි කරවූවන් සඳහා කෘෂිකර්මය මත පදනම් වූ ඵලදායී මෙන්ම තිරසාර ආර්ථික ප්‍රවේශයන් විවර කරදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු විය.මේ යටතේ (අ) වාණිජ බෝග නිෂ්පාදනය වැඩිදියුණු කිරීම(ආ) පශු සම්පත් සංවර්ධනය (ඇ) ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි මූලික ලෙස අවධානය යොමු කෙරේ. ව්‍යපෘතිය සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 1,100 කි.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මි. 150 ක් වන අතර මෙම වර්ෂයේ ජුනි මස අවසන් වනවිට රු. මි. 18.07 ක් වැය කර ඇත. මෙම කාලය තුලදී කි. මී. 5 ක මාර්ග පද්ධතියක්ද කදුබැද්ද වෛද්‍ය මධ්‍යස්ථානය සහ කෘෂිළිං 2 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. තවදුරටත් කලාපයේ ජනතාවගේ දක්ෂතා හා හැකියාවන් ඉහළ නැංවීම සඳහා විවිධ විෂයන් ඔස්සේ පුහුණු වැඩසටහන් 44 ක් පවත්වා ඇත.





රිදීමාලියද්දඒකාබද්ධසංවර්ධනව්‍යාපෘතිය


- **වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - *L* කලාපය**

මෙම ව්‍යාපෘතිය අනුරාධපුරය, වවුනියා, ත්‍රිකුණාමලය හා මුලිතිවු යන දිස්ත්‍රික්කවලට අයත් හෙක්ටයාර 62,000 කට වඩා වැඩි භූමි ප්‍රමාණයක පැතිර පවත්නා මහවැලි එල් කලාපයේ සංවර්ධන කටයුතු ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරයි. ව්‍යාපෘති ප්‍රදේශය කලාප 09 කින් සමන්විත වන අතර 1981 වර්ෂයේදී පවුල් 3,100 පදිංචිකරවමින් 4 සහ 5 කලාප කලාපවල මූලික යටිතල පහසුකම් සැපයීම සම්පූර්ණ කර ඇත. 1980 මැද භාගයේ සිට නැගෙනහිර පළාතේ පැතිරී තිබූ අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට නොහැකි විය.

ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට දැඩි ලෙස බලපාන අයුරින් ග්‍රාමීය වැව්, වාරි පද්ධතිය, මාර්ග ජාලය මෙන්ම පොදු ගොඩනැගිලි ද ත්‍රස්තවාදී කටයුතු හේතුවෙන් දැඩි ලෙස හානියට පත් විය. මෙම කරුණු හේතු කොට ගෙන ඉහත ව්‍යාපෘතිය මගින් (අ) පවුල් 6,900 ක් පමණ නැවත පදිංචි කරවීම හා (ආ) එම ප්‍රදේශයේ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම රු.මි. 3,957 ක ඇස්තමේන්තුගත පිරිවැයක් දරා සිදු කිරීමට සැලසුම් කරන ලදි.

මෙම ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මි. 500 ක් වන අතර ජුනි මස අවසන් වනවිට එයින් රු. මි. 57.49 ක් වැය කර ඇත. මෙම කාලය අවසන් වනවිට අක්කර 158 ක කැළෑ එළිකිරීම් සහ රළු මට්ටම් කිරීමේ කටයුතුද කි. මී. 2 ක කෙත්ඇල හා කි. මී. 2 ක බෙදුම් ඇලමාර්ග ඉදිකිරීමේ කටයුතුද අවසන් කර ඇති අතර මීට අමතරව කි. මී. 8 ක් සඳහා විදුලි සැපයුම්ද ලබාදීම , පානීය ජල ළිං 20 ක් හා වැසිකිලි 250 ක ඉදිකිරීමේ කටයුතුද , කෘෂි ළිං 61 ක කැණීම් කටයුතුද අවසන් කර ඇත.





වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - L කලාපය

- **මහවැලි ගැටඹේ හා ඉවුර ආරක්ෂාකිරීමේ වැඩසටහන**

ගැටඹේ ප්‍රදේශයේ ගංගා ඉවුරු ආශ්‍රිතව පැවති දැඩි පාංශු ඛාදනය හේතු කොට ගෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යයදෙපාර්තමේන්තුවේ සිට මහින්ද රාජපක්ෂ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පරිශ්‍රය දක්වා මී. 15 ක උසින් යුත් මීටර 49 දිගට ගේබියන් බැම්මක් ඉදි කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේදී ආරම්භ කෙරිණ. මෙම ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය (සංශෝධිත) රු.මී. 698.97 කි.

මෙම ව්‍යාපෘතියට 2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මී.125 කින් ජුනි මස අවසානය වනවිට රු. මී. 33.98 වැය කරයෝජිත ගේබියන් බැම්මෙහි මී. 41 ක ඉදිකිරීමේ කටයුතු සිදුකර ඇත. යෝජිත මී. 499 ක් දිග ගේබියන් බැම්මෙන් මී. 229 ක් ඉදිකිරීමේ කටයුතු 2016 ජුනි මස අවසානය වනවිට අවසන් කර ඇත.





මහවැලි ගැටඹේ ගං ඉවුරේ ගේබියන් බැම්ම ඉදි කිරීම

- **හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ගව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම**

(අ) මූලික වැඩ හා ජලාශ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම (ආ) වාරි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම හා (ඇ) උඩවලව, හුරුලුවැව, කලාප බී, සී, එච්, එල් හා මූලික වැඩ පාලන ක්‍රියා කරවුම් නඩත්තු හා මෙහෙයුම් අංශය යටතේ වන කාර්යය භාර ඉංජිනේරු අංශවල වාරි බෙදුම් ඇලවල් අතර ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණය අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ සමස්ථ ඇස්තමේන්තුගත පිරිවැය රු.මී. 825 කි.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මී. 200 ක් වේ. එයින් 2016 ජුනි මස අවසන් වන විට රු. මී. 35.24 ක් වැය කරසී කලාපයේ ඇල මාර්ග 4 ක්ද ජලාශ ප්‍රතිසංස්කරණ වැඩ 14 ක් සහ කි. මී. 5 ක මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුද අවසන් කර ඇත.

- **නඩත්තු සහ සංවර්ධනය**

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව කෘෂි කර්මාන්තය සංවර්ධන කිරීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එහි කලාප 10 තුළහෙක්. 105,522ක් වන වාරි ඉඩම් සඳහා ජල සැපයුම තහවුරු කරනු වස් විශාල, මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ ජලාශ 333 කින් සමන්විත කි.මී. 10,782 ක් වූ වාරි මාර්ග ජාලයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් වගකීම දරන ආයතනය වේ. මේ අතර පවුල් 240,000 කට වැඩි ප්‍රතිලාභ සපයනු වස් මහවැලි ප්‍රදේශවල කි.මී 4,027 ක් පමණ වූ මාර්ග පද්ධතිය හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට ගැනෙන කාර්යයන් වේ.

තවද, ප්‍රදේශය තුළ දැනට වෙසෙන හා ඉදිරි පරම්පරාවේ ප්‍රතිලාභය උදෙසා ඉඩම් පරිපාලනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, පරිසර සංරක්ෂණය සහ ආයතනික සංවර්ධන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වේ. මේ සඳහා 2016 වසරට සංශෝධිත අය වැය ප්‍රතිපාදන රු.මී.2,000ක් වන අතර 2016වර්ෂයේ ජූනි අවසන් වනවිට රු.මී.382.53 ක මුදලක් එම ප්‍රදේශයේ ජනතාවට පහසුකම් සැලසීම සඳහා යොදවා ඇත.

- **වාරිමාර්ග පද්ධතිය නඩත්තුව**

වාරිමාර්ග පද්ධතිය නඩත්තුව යටතේවාරිමාර්ග ඇල පද්ධතියෙහි රොන්මඩ ඉවත් කිරීම, වාරි මාර්ග පද්ධතිය හා නිර්මිත අළුත්වැඩියාව සහ සංවර්ධනය, මාර්ග බොරළු ඇතිරීම ආදිය මහවැලි වාරිමාර්ග පද්ධතිය නඩත්තුකටයුතු යටතට ගැනේ. 2016 වසර සඳහා රු.මී.337.09ක් වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති අතර ඉහත කාර්යයන් සාක්ෂාත් කර ගනු වස් ඉන් රු.මී.56.98 ක් මෙම කාලය තුළදී වැය කර ඇත.

මහවැලි කලාප තුල ගොවි සංවිධන 1,006 ක් පිහිටුවා ඇති අතර මෙම වර්ෂයේ පළමු 6 මස තුලදී බෙදා හැරීමේ ඇළ පද්ධති නඩත්තු හා මෙහෙයුම් කටයුතු ගොවි සංවිධාන 10 කට පවරා දී ඇත. තවද, ගොවි සංවිධාන 12 ක් ආදර්ශ ගොවි සංවිධාන මට්ටමටත්, ගොවි සංවිධාන 2 ක් වාණිජ මට්ටමටත් 2016 වර්ෂයේ ජනවාරි මස සිට ජූනි දක්වා ඉහළ නංවා ඇත.

- **ඉඩම් ප්‍රදානය**

මෙම කාලය තුලදී රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිවාස සඳහා ඉඩම් කට්ටි 70 ක් සහවාණිජ ඉඩම් කට්ටි02 ක් ද ලබාදී ඇත. තවද මෙම කාලය තුළදී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර 9,184 ක් නිකුත් කර ඇත.

මෙම කාලය තුළදී ප්‍රදාන පත්‍ර 16,890 ක් නිකුත් කර ඇති අතර ඉඩම් කට්ටි 9,146 ක මැනුම් කටයුතු සහ ඉඩම් ලකුණු කිරීමේ කටයුතු අවසන් වී ඇත. වර්ෂය සඳහා වාර්ෂික බදු කුලී අය කිරීම් ඉලක්කය රු. මි 976.74 ක් වූ අතර ඉන් රු.මි. 175.5 ක් 2016 වර්ෂයේ ජුනි මස අවසන් වනවිට අයකර ගෙන ඇත.

- **කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධනය**

කෘෂිකාර්මික ඵලදායීතා සංවර්ධන වැඩසටහන

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව දේශීය ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම, කෘෂිකාර්මික ආනයන අවම කිරීම, වැඩි ඵලදායී භෝග වගා හා සත්ව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම වැඩ සටහන ආරම්භ කර තිබේ. අනෙකුත් භෝග වගාව ප්‍රවර්ධනය කිරීම, දෙමුහුන් බිත්තර වී නිෂ්පාදනය හඳුන්වාදීම, කාබනික පොහොර භාවිතය වැඩි දියුණු කිරීම, ගොවිපලවල් හා පැල තවාන් ස්ථාපිත කිරීම මෙන්ම සුවදැල් වැනි පාරම්පරික දේශීය සහල් වර්ග වගා කිරීම දිරි ගැන්වීම වැනි වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදි.එමෙන්ම පශු සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ කිරිගව කළමනාකරණ, කුකුළු ගොවිපල පාලනය, මිරිදිය හා විසිතුරු මත්ස්‍ය කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු ක්‍රියාත්මක කරන ලදි.

- **කෘෂිකාර්මික භෝග වගාව**

2015/2016 මහ කන්නයේදී මහවැලි ප්‍රදේශ වල වී වගාකර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්. 89,922 ක් වන අතර මහවැලි කලාපවල වී නිෂ්පාදනය මෙ. ටො. 543,441 ක් විය. මෙම කන්නයේ දී සාමාන්‍යය වී අස්වැන්න හෙක්ටයාරයකට මෙ. ටො. 6.1 ක් වී ඇත. 2016 යල කන්නයේ වී වගාකර ඇති භූමි ප්‍රමාණය හෙක්. 59,776 වන අතර අපේක්ෂිත වී නිෂ්පාදනය මෙ. ටො. 358,588 වේ. 2015/2016 මහ සහ 2016 යල කන්නයේ අපේක්ෂිත වී නිෂ්පාදනය මෙ. ටො. 902,029 වේ.

අනෙකුත් බෝග වගා කිරීම හෙක්.60,941 ක් වූ අතර එය සෝයා බෝංචි හෙක්. 1,953 ක්ද, බඩ ඉරිඟු හෙක්. 3,948 ක්ද, ලොකු එණ්ඟු හෙක්. 398 ක්ද මිරිස් හෙක්. 753 ක්ද, කළු කවුපි හෙක්. 721 ක්ද, කවුපි හෙක්. 1,172 ක් සහ රට කජු හෙක්. 481 වශයෙන් සමන්විත විය.

- **කිරිගව සංවර්ධන වැඩ සටහන**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය හරහා මහවැලි ප්‍රදේශ වල අතිරේක ආදායම් මාර්ග හඳුන්වාදීම හා මහවැලි ජනපදිකයින්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන කිරිගව පාලනය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාකරනු ලැබේ. සෑම මහවැලි ප්‍රදේශයකම කිරි නිෂ්පාදනයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සහ මෙහෙයවීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වගකීම වේ.

2016 ජුනි මස අවසන් වනවිට මහවැලි ප්‍රදේශවල 109,800 මුළු ගව ගහනයක් වාර්තා වූ අතර කිරි ලීටර් මිලියන 12ක් නිෂ්පාදනය කර ඇත.

මෙම කාල පරිච්ඡේදය තුල පුහුණු වැඩසටහන් 56 ක් පවත්වා ඇති අතර ගවමඩු 28 ක් ඉදිකර ඇත. තවද මහවැලි කලාපයේ දරුවන් අතර නැවුම් දියරකිරි භාවිතය දිරිගැන්වීම සඳහා "කිරි සතිය" වැඩසටහන යටතේ වැඩසටහන් 03 ක්ද පවත්වා ඇත.

මිරිදිය මත්ස්‍ය හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය නංවාලීම

මහවැලි ජනපදිකයින්ගේ පෝෂණය හා ආර්ථික තත්වය නැංවීමෙහි ලා මහවැලි ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රධාන කාර්යයක් වේ. 2016 වර්ෂයේ ජුනි මස අවසන් වනවිට මත්ස්‍ය නිෂ්පාදනය මෙ. ටො. 3,170 ක් වේ. මහවැලි ප්‍රදේශයන්හි මත්ස්‍ය ගහණය ඉහළ නැංවීම සඳහා නව ජලාශ 03 ක් සහ අභිජනන මධ්‍යස්ථානයක් මෙම කාලය තුලදී ආරම්භ කර ඇත. තවදුරටත් ධීවර ජනතාව ශක්තිමත් කිරීම සඳහා ධීවර සංවිධාන 12 ක් පිහිටුවා ඇත.

ආයතනික සංවර්ධනය

ව්‍යවසායකත්ව අවස්ථා, පුද්ගල සංවර්ධනය,ආයතනික සවිබල ගැන්වීම, කාන්තාව සවිබලගැන්වීම, සමාජ හා සංස්කෘතික සංවර්ධනය ජනපදිකයන් වෙත ලබා දෙමින් මහවැලි පදිංචිකරුවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ඔවුන් පදිංචි කරවීමේ පශ්චාත් සමයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යන් වේ. ඒ අනුව පදිංචි කරුවන්ගේ දෙවන හා තුන්වන පරම්පරාවල අභිවෘද්ධිය තකා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආයතනික සංවර්ධන අංශය ඉහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විවධ වැඩ සටහන් හා වැඩමුළු සංවිධානය කරන ලදි.

2016 වර්ෂයේ 2 වන කාර්තුව අවසන් වනවිට ආයතන සංවර්ධන වැඩසටහන් 2,179 ක් , සමාජ සංවර්ධන වැඩසටහන් 233 ක් සහ කාන්තා සංවර්ධන වැඩසටහන් 79 ක් පවත්වා ඇත.

මහවැලි ගොවීන් සහ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා "මහවැලි මහ ගොවියා" තේරීමේ තරගය 2016 වර්ෂයේදී ආරම්භ වූ අතර ජුනි මස අවසන් වනවිට එහි පළමු වටයේ තේරීම් කටයුතු අවසන් කර ඇත. අවසන් වැඩසටහන සහ ත්‍යාග ප්‍රදානය 2016 අගෝස්තු 11 වනදින සිදුකිරීමට නියමිතය.

- **වන හා පරිසරය**

පරිසර හා වන සංරක්ෂණය


පරිසර අංශය විසින් මහවැලි ප්‍රදේශ වල පාරිසරික කටයුතු කළමනාකරණය හා සම්බන්ධීකරණය සිදු කරනු ලබයි. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතීන්හි පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා වලට අනුකූලව පාරිසරික කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම මේ වසර තුළදී ප්‍රමුඛතාවය දී ඇති අතර එහි ඉදිරි පියවර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිසර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

පරිසර හා වන සංරක්ෂණය සඳහා වාර්ෂික ප්‍රතිපාදන රු. මි. 50 ක් වන අතර ඉන් රු. මි. 10.29 ක් 2016 ජුනි මස අවසන් වනවිට භාවිතා කර ඇත. ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම යටතේ

මහවැලි ගඟෙහි ඇතිවිය හැකි හදිසි තත්වයන් මගහැරීම සඳහා ශුද්ධ ජල පෝෂිතයන්හි පවත්නා ගොවිබිම් තුල මී. 7,440 ක පාංශුසංරක්ෂණය සිදුකර ඇත. අලි මිනිස් ගැටුම වැලැක්වීම සඳහා කි. මී. 0.8 ක් දිග ජීව වැටක්ද මෙම කාලය තුල ඉදිකර ඇත. මහවැලි ප්‍රදේශයන්හි ජලයේ ගුණාත්මක බව සහතික කිරීම සඳහා ජලතත්ව අධීක්ෂණ වැඩසටහන යටතේ ජල සාම්පල් 12 ක් මෙම කාලය තුලදී පරීක්ෂා කර ඇත. පැල තවාන් කළමනාකරණය හා පැළ නිෂ්පාදන වැඩසටහන යටතේ පැළ 101,038 ක් නිෂ්පාදනය කර ඇති අතර පාසල් ළමුන්ගේ සහභාගිත්වයෙන් පාරිසරික වැඩසටහන් 49 ක්ද පවත්වා ඇත. තවද ආක්‍රමණශීලී ශාක විශේෂ පාලනය කිරීම යටතේ අක්කර 6 ක භූමි ප්‍රදේශයක් සහ ජලාශ 2 ක් පිරිසිදු කර ඇත.

- **කුඩා ජල විදුලිබල ව්‍යාපෘති**

මහවැලි ප්‍රදේශයන්හි කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතීන් 19ක් ඉදි කිරීම තුළින් මෙ.වො. 59.3 ක සමස්ත ජල විදුලි ඒකක ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙයින් ව්‍යාපෘතීන් 17 ක් සඳහා පාරිසරික තක්සේරු වාර්තා අනුමැතිය ලබාදී ඇති අතර 2016ජුනි මස අවසානය වනවිට ඉන් ව්‍යාපෘතීන් 10 ක වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කර ඇත.



කුඩා ජල විදුලිබල ව්‍යාපෘති

- **ව්‍යාපාර සංවර්ධනය**

සංචාරක බංගලා 6 ක මූලික සැලසුම් නිර්මාණය කිරීමේ කටයුතු 2016 ජුනි මස තුලදී අවසන් කර ඇති අතර සංචාරක බංගලා නවීකරණය කිරීම මගින් ඒවා ආදායම් උත්පාදිතයන් බවට පත්කිරීමට බලාපොරොත්තු වේ.

සී කලාපයේ සහ බී කලාපයේ "හෙළ බොජුන්" අවන්හල ආරම්භ කලහැකි සුදුසු ස්ථානයන් මේ වනවිට හඳුනා ගෙන ඇති අතර මීට අමතරව කෘෂි නිෂ්පාදන එකතු කිරීමේ මධ්‍යස්ථානයක් මොරගහකන්දෙහි ආරම්භ කිරීම සඳහා මූලික සැලසුම්ද සකස් කොට ඇත.

- **මහවැලි කලාපයන්හි ආයෝජන**

මහවැලි කලාපයේ වාණිජ කෘෂිකර්මාන්තය සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ආයෝජකයන් 10 දෙනෙකුට ඉඩම් ලබාදීමට අනුමැතිය ලබාදී ඇත.

- **කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර ප්‍රවර්ධනය**

2016 වර්ෂයේ මැද භාගය අවසන් වනවිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සහයෝගය ඇතිව "මහවැලි සවිය" වැඩසටහන යටතේ කුඩා හා මධ්‍යපරිමාණයේ ව්‍යාපාර 08 ක් සඳහා රු. මි. 1.4 ක් ලබාදී ඇති අතර "මහවැලි දිවිය" වැඩසටහන යටතේ ගොවි සංවිධාන 3 ක් සඳහා රු. මි. 0.3 ක් ලබාදී ඇත.

➢ **කාර්ය සාධක දර්ශක**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ජාතියට වඩා යහපත් සේවාවක් සැපයීමේ අරමුණින් කාර්යය දර්ශක පහක් ඔස්සේ එහි සේවාවන් සපයනු ලැබේ. (ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යය සාධනය මෙහෙයවනු ලබන වැදගත් මූලධර්ම ලෙස හඳුනාගෙන ඇත) මෙම දර්ශක සියල්ල ප්‍රමාණාත්මක වන අතර සෑම වර්ෂයක් අවසානයේදීම ඇගයීමට ලක් කරනු ලැබේ.

- මහවැලි හා ආශ්‍රිත ඉවුරුවල මතුපිට ජල ගබඩා ධාරිතාවය ඉහළ නැංවීම
- මහවැලි ප්‍රදේශවල මුළු වාරිමඟ ප්‍රමාණය ඉහළ නැංවීම (හෙක්.)
- වගා තීව්‍රතාවය ඉහළ නැංවීම
- භෝග විවිධාංගීකරණ භූමි ප්‍රමාණය ඉහළ නැංවීම
- මහජනතාවගේ පැමිණිලි හා දුක්ගැනවිලි පිළිබඳ කඩිනම් ප්‍රතිචාර දැක්වීම

මතුපිටජල ගබඩා ධාරිතාව ඝන මීටර් මිලියන 2,289 සිට 3,125 ක් දක්වා ඉහළ නැංවීම

උතුරු පලාතේ සංවර්ධන කටයුතු සඳහා අත්‍යවශ්‍ය නමුත් ප්‍රමාණවත් පමණින් නොමැති ජල සම්පතටකිවුල්ඔය ජලාශයේ ඉදිකිරීමත් සමග ඝනමීටර් මිලියන 66 ක් එකතු කිරීමට යෝජිතය. කෙසේ වුවද පාරිසරික ඇගයීම් වාර්තාවට අනුමැතිය ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතු කොට ගෙන 2016ජුනි අවසානය දක්වා මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් වාර්තා වී නොමැත. වසර 2017දී මොරගහකන්ද ව්‍යාපෘතිය මඟින් ඝන මීටර් මිලියන 570 ක් ද වසර 2019 දී කළුගඟ ව්‍යාපෘතිය මඟින් ඝන මීටර්මිලියන 266 ක ජල ධාරිතාවයක්ද එකතු වේ. වර්තමානය වන විට මොරගහකන්දකළුගඟ ව්‍යාපෘතියේ ඉදිකිරීම්කටයුතු සාර්ථක අයුරින් සිදු කෙරේ.

මහවැලිප්‍රදේශවලමුලුවාරිමඟ්ප්‍රමාණයහෙක්.105,522 සිට 121,725 දක්වාඉහළ නැංවීම

මොරගහකන්ද කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමත් සමග මහවැලි ප්‍රදේශවල මුළු වාරිබිම් ප්‍රමාණය වර්ධනය කරනු ඇත.

වගා තීව්‍රතාවය 192 සිට 195 දක්වා ඉහළ නැංවීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් වගා තීව්‍රතාවය ඉහළ නැංවීම හා එය පවත්වා ගැනීම සඳහා කටයුතු කරමින් සිටියි. කෘෂි කාර්මික ඵලදායිතා වැඩසටහන මගින් ඉදිරි වසර 2 තුල් වගා තීව්‍රතාවය 195 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂිතයි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අධීක්ෂණය යටතේ මූලික සැලසුම් සකස් කොට අවසන් වී ඇත.

භෝග විවිධාංගීකරණය හෙක්. 33,994 සිට හෙක්. 48,557 දක්වා ඉහළ නැංවීම

භෝග විවිධාංගීකරණ වැඩසටහන යටතේ ඉදිරි වසර 03 ඇතුළත **භෝග විවිධාංගීකරණභූමි ප්‍රමාණය** ක්‍රමයෙන් ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම අවශ්‍ය පහසුකම් ලබාදීම මගින් සෝයා බෝංචි, බඩ ඉරිඟු, ලොකු එෑණු සහ මිරිස්වල වගා ප්‍රමාණය ඉහළ නැංවීමට යෝජනා වී ඇත.

මහජනතාවගේ පැමිණිලි හා දුක්ගැනවිලි පිළිබඳ කඩිනම් ප්‍රතිචාර දැක්වීම

මහජනතාවගේ පැමිණිලි සහ දුක්ගැනවිලි පිළිබඳ කඩිනමින් ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සැලසුම් හා මෙහෙයුම් අංශය මගින් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන ගැටළුවලට කඩිනම් පිළිතුරු සැපයීමද සිදු කරමින්මහජන පැමිණිලි, පුවත්පත් සහ අනෙකුත් මාධ්‍ය වාර්තා මගින් සටහන් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරයි. 2016වර්ෂයේදීජුනි අවසන් වනවිට පැමිණිලි 8,254 ක් වාර්තා කර ඇති අතර ඊට අදාල සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත.

3.1 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - මහවැලි ව්‍යාපෘති (දේ.අ)

2017 යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්

ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	ඉලක්කය		
		භෞතික		මූල්‍ය (මි.)
මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය (රු. මි.500)				
යටිතල පහසුකම් සංවර්ධන	*බෙදුම් ඇල ඉදිකිරීම/ පුනරුත්ථාපන*	30	කි.මී	90.00
	කෙත් ඇල ඉදිකිරීම/ පුනරුත්ථාපන	150	කි.මී	350.00
	ජලාපවහන ඇළ මාර්ග ඉදිකිරීම	15	කි.මී	18.00

	ග්‍රාමීය වැව් පුනරුත්ථාපනය	4	ඒකක	8.00
	ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණ	4	කි.මී	4.00
	ජල සම්පාදන යෝජනා ක්‍රම පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම	4	ඒකක	8.00
	ගොඩනැගිලි අළුත්වැඩියා සහ වැඩිදියුණු කිරීම්	6	ඒකක	10.00
පරිපාලනය	පරිපාලනය			12.00
මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය (රු. මි.250)				
	කැලෑ එළි පෙහෙළි කිරීම	320	හෙක්.	40.00
	මාර්ග ඉදිකිරීම්	15	කි.මී	30.00
	බෙදුම් ඇල ඉදිකිරීම/ පුනරුත්ථාපන	9.74	කි.මී	75.00
	කෙත් ඇල ඉදිකිරීම/ පුනරුත්ථාපන	35.09	කි.මී	50.00
	ජලාපවහන ඇළ මාර්ග ඉදිකිරීම	8	කි.මී	10.00
යටිතල පහසුකම් සංවර්ධන	ළිං ඉදිකිරීම	4	ඒකක	3.30
	ඒකක කළමනාකාර කාර්යාල ඉදි කිරීම	1	ඒකක	6.30
	ඒකක කළමනාකාර නිල නිවාස ඉදිකිරීම	1	ඒකක	4.30
	ක්ෂේත්ර සහකාර නිල නිවාස ඉදිකිරීම	1	ඒකක	4.00
	පාසල් ඉදිකිරීම	1	ඒකක	5.80
	වී ගබඩා ඉදිකිරීම	1	ඒකක	1.90
	දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම	1	ඒකක	2.50
	කම්බි වැට ඉදිකිරීම	3.5	කි.මී	3.00
	ක්‍රීඩා පිටි ඉදිකිරීම	1	ඒකක	1.90
	විදුලි වැට ඉදිකිරීම	10	කි.මී	7.00
ආයතන සංවර්ධන	පශ්චාත් ජනාවාස සංවර්ධන කටයුතු	50	පවුල්	2.00
කෘෂිකර්ම සංවර්ධන	කෘෂි ව්‍යාප්ති සේවා, බිත්තර වී බෙදා හැරීම සහ ආධාර	100	පවුල්	3.00

වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - එල් කලාපය (රු. මි.400)				
	මාර්ග ඉදිකිරීම් (කාපට් සහ පැව්)	21.2	කි.මී	175.00
	ගොඩනැගිලි (නේවාසික වියාපෘති කළමනාකරු කාර්යාලය හා ගොවි සංවිධාන ගොඩනැගිලි සහ			20.50
යටිතල පහසුකම් සංවර්ධන	මධ්‍යස්ථානය)	6	ඒකක	
	කෙත් ඇල ඉදිකිරීම	8	කි.මී	10.00
	බෙදුම් ඇල ඉදිකිරීම/ පුනරුත්ථාපන	3.5	කි.මී	5.50
	විදුලිබල සැපයුම (ගොඩනැගිලි සහ ආදර්ශ ගොවිපල)	6	ඒකක	6.00
	බැම් සහ අමුණු ඉදිකිරීම			3.00
	රඳවා තබා ගැනීම			10.00
ඉඩම් සංවර්ධන	මූලික පිඹුරු - මහ ඉඩම්	2359	ඒකක	5.80
	මූලික පිඹුරු - කුඹුරු	1555	ඒකක	8.03
	මූලික පිඹුරු - කෘෂිකර්ම ඉඩම්	3366	ඒකක	18.58
	මිනින්දෝරු දෙපාර්තමේන්තුව සඳහා අධීක්ෂණය ගාස්තු			5.59
	අක්කර 01 කුඹුරු කැබලි සඳහා පිඹුරු	250	ඒකක	0.50
	ඉඩම් මායිම් සලකුණු කිරීම	150	ඒකක	0.30
	කැලෑ එළි පෙහෙළි කිරීම	2260	ඒකක	31.98
ආයතන සංවර්ධන	ආයතන හා ප්‍රජා සංවර්ධන	30	වැඩමුලු	5.50
	පදිංචිකරුවන් උදෙසා පුහුණු වැඩමුලු	2	වැඩමුලු	1.00
	කාන්තා සංවර්ධන	2	වැඩමුලු	0.50
	සමාජ සහ සංස්කෘතික සංවර්ධන	4	වැඩමුලු	1.00
	ක්‍රීඩා වැඩමුලු (මහවැලි ක්‍රීඩා)			1.80
	වැසිකිළි ඉදිකිරීම් වැඩසටහන (නව පදිංචිකරුවන්)	500	ඒකක	20.00
	පදිංචිකරුවන් සඳහා හදිසි සහන			1.00
කෘෂිකර්ම සංවර්ධන	කෘෂිකර්ම සංවර්ධන කටයුතු (බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම)	500	ගොවීන්	7.00

	පාරිසරික සමතුලිතතාව ආරක්ෂා වැඩසටහන	50	ළිං	20.00
	වාරිමාර්ග සඳහා ජලය බෙදා හැරීම	300	ඒකක ගොවීන්	5.00
	බීජ නිෂ්පාදන වැඩසටහන	2	වැඩමුලු	0.50
	ගොවිපල ආදර්ශණ	1	ඒකක	2.00
	පුහුණු පාඨමාලාවල හා ව්‍යාප්ති වැඩසටහන	10	වැඩමුලු	0.50
සත්ව පාලන සංවර්ධන	සත්ව පාලන වැඩසටහන	3	ඒකක	4.00
	ජීවර සංවර්ධන වැඩසටහන	1	වැඩමුලු	2.00
	සත්ව ගොවිපල සංවර්ධන	1	ඒකක	2.00
ව්‍යාපාර සංවර්ධන	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	4	වැඩමුලු	0.5
	නිපුණතා සංවර්ධන සහ කාක්ෂණ හුවමාරු වැඩසටහන	4	වැඩමුලු	0.52
	ආයෝජන ප්‍රවර්ධන	2	වැඩමුලු	0.5
	කළමනාකරණ වියදම්			0.3
පරිසර හා වන සංරක්ෂණ හා සංවර්ධන	පැළ නිෂ්පාදන වැඩසටහන	300000	පැල	2.50
	වාර්ෂික රුක් රෝපණ වැඩසටහන	5	වැඩමුලු	1.50
	පාංශු සංරක්ෂණ වැඩසටහන	20	වැඩමුලු	2.00
	ජල තත්ත්ව අධීක්ෂණය වැඩසටහන	400	සාම්පල	1.00
පරිපාලනය	පරිපාලනය			6.50
ප්‍රවාහන පහසුකම් සැපයීම	වාහන නඩත්තු, අලුත්වැඩියා හා ඉන්ධන සැපයුම්			10.10
රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය (රු. මි.110)				
යටිතල පහසුකම් සංවර්ධන	මාර්ග ප්‍රතිසංස්කරණ	16	කි.මී	21.00
	ගොඩනැගිලි ඉදිකිරීම්	6	ඒකක	20.00
	වාරිමාර්ග, - (ජලාශ හා බැම්ම වැඩිදියුණු කිරීම)	5	වැව්	20.00
	කඳවුරු පවත්වාගෙන යාම			4.50
ආයතන සංවර්ධන	ආයතන හා ප්‍රජා සංවර්ධන	45	වැඩමුලු	5.50
	පුහුණු හා සංවර්ධන (ගොවි,	40	වැඩමුලු	

	කාන්තා, සංස්කෘතික)			5.00
	වැසිකිළි ඉදිකිරීම් වැඩසටහන	350	ඒකක	3.50
	පදිංචිකරුවන් සඳහා හදිසි සහන			1.00
කෘෂිකර්ම සංවර්ධන	කෘෂිකර්ම ආදර්ශ	25	ආදර්ශ	2.50
	පාරිසරික සමතුලිතතාව ආරක්ෂා වැඩසටහන	75	ඒකක	4.00
	වාරිමාර්ග පහසුකම් සැපයීම	1000	ගොවීන්	3.00
	බීජ නිෂ්පාදන වැඩසටහන	1000	ගොවීන්	2.00
	පුහුණු පාඨමාලාවල හා ව්‍යාප්ති වැඩසටහන	8	වැඩමුලු	1.00
සත්ව පාලන සංවර්ධන	සත්ව පාලන වැඩසටහන	10	වැඩමුලු	2.00
	ධීවර සංවර්ධන වැඩසටහන	5	වැඩමුලු	2.00
	සත්ව ගොවිපල සංවර්ධන			3.00
ව්‍යාපාර සංවර්ධන	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	10	වැඩමුලු	1.00
	නිපුණතා සංවර්ධන සහ තාක්ෂණ හුවමාරු වැඩසටහන	8	වැඩමුලු	0.50
	ආයෝජන ප්‍රවර්ධන	8	වැඩමුලු	0.50
පරිපාලන	පරිපාලනය			3.00
ප්‍රවාහන පහසුකම් සැපයීම	වාහන නඩත්තු, අලුත්වැඩියා හා ඉන්ධන සැපයුම්			5.00
මහවැලි ගැටඹේ හා ඉවුර ආරක්ෂාකිරීමේ වැඩසටහන (රු. මි. 150)				
ගැටඹේ මහවැලි ගං ඉවුර ආරක්ෂා බැම්ම ඉදිකිරීම් (175m)	ගැටඹේ මහවැලි ගං ඉවුර ආරක්ෂා බැම්ම (175m)	175	මීටර්	150
හිදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළුව විශාල හා මධ්‍ය වාරි පද්ධති පුනරුත්ථාපන ව්‍යාපෘතිය (රු. මි.165)				
යටිතල පහසුකම් සංවර්ධන	ප්‍රධාන වේලි සහ හා ජලාශ නඩත්තු (ජලාශ 08)	8	ජලාශ	10.00

	ඇල මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය බී කලාපය	10	කි.මී	50.00
	ඇල මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය සී කලාපය	6	කි.මී	30.00
	ඇල මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය එච් කලාපය	6	කි.මී	30.00
	ඇල මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය එල් කලාපය	2	කි.මී	10.00
	ඇල මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය "හුරුලුවැව"	4	කි.මී	20.00
(ii) මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් දැව සංරක්ෂණයට පිටුවහලක් ලෙස දැව විශේෂ 10ක් පිළිබඳ සැකසූ අත්පත්‍රිකා වර්ග 10ක් සකස් කොට මුද්‍රණය කිරීම සඳහා යොමුකොට ඇත.

➢ **දැව ආශ්‍රිත පර්යේෂණ හා විද්‍යාත්මක පත්‍රිකා**

(i) රාජ්‍ය දැව සංස්ථාව විසින් ඵලදායි සහ කාර්යක්ෂම ක්‍රම අනුගමනය කරමින් මෘදු දැව එනම් පයිනස් සහ කායා වැනි දැව කල්පවතින දැව බවට පරිවර්ථනය කිරීම සඳහා බෝරෝන් ප්‍රතිකාරකය යොදාගැනීම.

(ii) 2015/2016 කාලය තුල දැව සාම්පල 113ක් පරීක්ෂාකොට දැව හඳුනාගැනීම/ගුණාත්මකභාවය පිළිබඳ සහතික පර්යේෂණ හා පුහුණු අංශය මගින් පාරිභෝගිකයන්ගේ ඉල්ලීම පරිදි නිකුත් කොට ඇත.

(iii) විශ්ව විද්‍යාල සිසුන් හා එක්ව පර්යේෂණ අධ්‍යන හතරක් නිමකිරීම මගින් රාජ්‍ය දැව සංස්ථාවේ දැව පර්යේෂණ පිළිබඳ නව ප්‍රවණතාවයක් ගොඩනැගී ඇත.

➢ 2015/2016 වර්ෂ තුල නිමකරන ලද පර්යේෂණ ව්‍යාපෘති

- finger joint නිෂ්පාදනයේ භෞතික හා ආර්ථික ඇගයීම
- ගෘහභාණ්ඩ ඉල්ලුමට බලපාන සාධක
- ජාතික වෘත්තීය සුදුසුකම්සම්මතමත පදනම්වවැඩබිම්නිලධාරියාසඳහාපුහුණු වැඩසටහන්වැඩි දියුණු කිරීම
- තේක්ක සහ මැහෝගනි දැව පදම් කිරීමේ සාම්ප්‍රදායක දැව වියළීමේ කාලසටහනසංවර්ධනය
- finger joint නිෂ්පාදනයේ විවිධ ඒකාබද්ධ කිරීමේ වින්‍යාස තුලින් ව්‍යුහාත්මක ක්‍රියාවලියේ දියුණුව පරීක්ෂණය
- finger joint නිෂ්පාදනයේ දී දැව යොදාගැනීමේදී භාවිතා කළ යුතු යෝග්‍ය දැව වර්ග හඳුනාගැනීම.

➢ පුහුණු වැඩසටහන්


- රාජ්‍ය දැව සංස්ථාවේ 352ක් පමණ සේවක පිරිසකට ආයතනය තුල සහ පිටත ආයතන මගින් විවිධ විෂයන් ආවරණය වන පරිදි පුහුණුවීම් ලබාදෙන ලදී.
- කල්දෙමුල්ල දැව තාක්ෂණික පුහුණු කිරීමේ ආයතනය මගින් දැව කඳන් ශ්‍රේණි කිරීමේ විද්‍යාත්මක ක්‍රමවේදය හඳුන්වාදීමේ වැඩසටහන් තුලින් ක්ෂේත්‍ර නිලධාරීන් 76 දෙනෙක් පුහුණු කරන ලදී.
- කල්දෙමුල්ල දැව තාක්ෂණික පුහුණු කිරීමේ ආයතනය මගින් රාජ්‍ය දැව සංස්ථා සේවකයින් 33 දෙනෙකු සඳහා දින 5ක වැඩමුළුවක් මෙහෙයවීම තුලින්පැලතවාන් කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව සංස්ථා පැල තවාන් තුලදී ලබාදෙන ලදී.
- රාජ්‍ය දැව සංස්ථා සාමාන්‍යාධිකාරිතුමන් විසින් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ප්‍රධාන කාර්යාලීය සේවකයන් 192ගේ සහභාගීත්වයෙන් එක් දින වැඩමුළුවක් පවත්වන ලදී.

08. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2015 ජූලි මස සිට 2016 ජූනි මාසය දක්වා

- භූ විද්‍යා සමීක්ෂණ අංශය
- ක්‍රියාකාරී සැලැස්මෙහි කටයුතු (භූ.ස.ප.කා. මුදල් ප්‍රතිපාදන)

භූ විද්‍යා සිතියම් මුද්‍රණය කිරීම :




මුළු රටම ආවරණය කරනු ලබන භූ විද්‍යා සිතියම් නිර්මාණය කර ප්‍රසිද්ධ කිරීම කාර්යාංශයේ ප්‍රධාන කටයුතුවලින් එකක් වේ. භූමිය පිළිබඳ භූ විද්‍යා තොරතුරු අඩංගු වන භූ විද්‍යා සිතියම් , ඛනිජ හා භූගත ජලය ගවේෂණය කිරීම, ප්‍රධාන ඉදිකිරීම් කටයුතු හා සිවිල් ඉංජිනේරු කාර්යයන් සහ නායයෑම් උවදුරු පිළිබඳ සිතියම් පිළියෙල කිරීම ආදී කාර්යයන් රාශියක් සඳහා යොදා ගනු ලැබේ. මුළු රටම ආවරණය කරනු ලබන භූ විද්‍යා සිතියම් 21 මුද්‍රණය කිරීම (1:100,000 පරිමාණයේ) 2014 වර්ෂය තුළදී නිම කරන ලද අතර දැනටමත් ප්‍රසිද්ධ කර ඇති 1 : 100,000 පරිමාණයේ සිතියම් මත පදනම්ව 1:500,000 පරිමාණයේ සහ 1:250,000 පරිමාණයේ සිතියම් සම්පාදනය කිරීම සඳහා සැලසුම් සකස් කරන ලදී.

පළමු පියවර ලෙස 1: 250,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් 04 ක් මුද්‍රණය කිරීමට අපේක්ෂා කරන ලද අතර එම සිතියම්වල සම්පාදන කටයුතු 2015 වර්ෂයේදී නිම කරන ලද අතර 2016 වර්ෂයේ දෙවන කාර්තුවතුළදී එය මුද්‍රණය සඳහා භාර දෙන ලදී.

- චාතුර්ථික සිතියම් (මුහුදුබඩ කලාපය) වැඩසටහන

භූ විද්‍යා කාල පරිමාණයෙහි 'චාතුර්ථික' කාල පරිච්ඡේදය දැනට අවුරුදු මිලියන 2කට ඉහත කාලයේ සිට වර්තමානය දක්වා දිව එයි. ශ්‍රී ලංකාවේ චාතුර්ථික සැකසීම් මුහුදුබඩ අවසාදිතයන්ට, ගංවතුර ඇතිවන තැනිතලා භූමි වල ඇති දියළු අවසාදිතයන්ට ප්‍රධාන වශයෙන්ම සීමා වී ඇති අතර පස් සැකසීම්ද මීට අයත් වේ. මෙකී සැකසීම් තුළ ආර්ථිකමය ලෙස වැදගත් මැටි හා වැලි නිධි, කොරල් නිධි, සශ්‍රික පස් ආවරණයන් සහ භූගත ජල ප්‍රභවයන් අඩංගු වන නිසා ඒවා අතිශයින්ම සුවිශේෂී වේ.


'චතුර්ථික භූ විද්‍යා සිතියම් සැකසීම' නම් වූ ව්‍යාපෘතියක් 2008 වර්ෂයේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ආරම්භ කරන ලදී.



මාතර, කළුතර සහ අම්බලන්ගොඩ - බලපිටිය කලාප ඇතුළත් 1 : 50,000 පරිමාණයේ චතුර්ථික සිතියම් සැකසීමේ කටයුතු පසුගිය වර්ෂවලදී නිම කරන ලදී. 2015 වර්ෂයේදී මේවායේ සංස්කරණ කටයුතු නිම කරන ලද අතර 2016 වර්ෂයේ පළමු අර්ධය තුළදී ඒවා මුද්‍රණය සඳහා භාර දෙන ලදී. පුත්තලම, කල්පිටිය, හම්බන්තොට, තංගල්ල සහ තිස්සමහාරාමය යන කලාප වල සිතියම් සැකසීමේ කළුයුතු බොහෝ දුරට නිම කර ඇත.

ගාල්ල, යාල, හලාවත, බත්තළුඔය සහ සිලාවතුර යන කලාපවල ක්ෂේත්‍ර කටයුතු නිම කර ඇති අතර විල්පත්තු කලාපයේ කෂේත්‍ර කටයුතු වලින් 75% 2015 වර්ෂය තුලදී සම්පූර්ණ කරනු ලැබ ඇත. කෙසේ වුවද, ඉහත කී ප්‍රදේශ සඳහා අතිරේක ක්ෂේත්‍ර කටයුතු සැලසුම් කරන ලද අතර එකී අමතර ක්ෂේත්‍ර කටයුතු අතරින් විදුම් කටයුතු 2016 වර්ෂයේ දෙවන භාගය තුළදී අරඹන ලදී.

- පාංශු භූ රසායන සිතියම් වැඩසටහන



පසෙහි භූ රසායනික ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා 2008 වර්ෂයේදී භූ රසායනික සිතියම් වැඩසටහන ආරම්භ කරන ලදී. බනිජ ගවේෂණය, පාරිසරික නිරීක්ෂණ කටයුතු, කෘෂිකාර්මික පර්යේෂණ සහ භූ - සෞඛ්‍ය උවදුරු අධ්‍යයන ක්ටයුතු සඳහා මෙම සිතියම් ප්‍රයෝජනවත් වේ. භූ රසායනික සිතියම් සැකසීම් කටයුතු 1 : 50,000 පරිමාණයේ සිතියම් යොදාගෙන සිදු කරනු ලැබේ. එක් වර්ග කිලෝමීටරයක භූමි ප්‍රදේශයක මතු පිටින් සහ මීටර් 2 ක් ගැඹුරු ප්‍රදේශයකින් පස් නියැදි 2 ක් එකතු කර ගනු ලැබේ. පරමාණුක අවශෝෂණ වර්ණාවලිමානය සහ ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශ විමෝචන වර්ණාවලිමානය යොදාගෙන රසායනික ලක්ෂණ විශ්ලේෂණය කරනු ලැබේ.

බදුල්ල, අනුරාධපුරය, මැදවච්චිය සහ හොරොව්පතාන යන කලාපවල විද්‍යාගාර විශ්ලේෂණ කටයුතු සිදු කරන ලදී. පොළොන්නරුව, කැකිරාව සහ කටුමුල්ල කලාප වල ක්ෂේත්‍ර කටයුතු වාර්තා කළ යුතු කාලය තුලදී නිම කරන ලදී. මොරවක, රක්වාන, තිඹොල්කැටිය, හම්බන්තොට, මාතර සහ තංගල්ල යන කලාපවල සිතියම් සම්පාදන කටයුතු පසුගිය මාස කිහිපය

තුළදී සිදු කරන ලද අතර ඒවා පළමු තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත 2016 වර්ෂයේ දෙවන අර්ධය තුළදී ඉදිරිපත් කරන ලදී.

➢ 'වාර්ෂික ඛනිජ' ග්‍රන්ථය - 2015

'2015 වාර්ෂික ඛනිජ ග්‍රන්ථය' සඳහා දත්ත එක්රැස් කිරීම 2015 වර්ෂය තුළදී සිදු කරන ලද අතර එම ග්‍රන්ථය සම්පාදන කටයුතු 2016 ජූනි මාසය අග වන විට බොහෝ දුරට නිම කරන ලදී.

➢ පළාත් තුළ ඛනිජ ගවේෂණය සිදු කිරීම සහ පළාත් ඛනිජ සිතියම්

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන තුලින් සබරගමුව පළාතේ සිදු කිරීමට තිබූ ඛනිජ ගවේෂණය වෙනුවට කර්මාන්ත අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පිහන් භාණ්ඩ සභාව විසින් සිදු කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාරයක් ලෙස මධ්‍යම හා උඌව පළාත් තුළ පිහන් භාණ්ඩ සඳහා අමුද්‍රව්‍ය ගවේෂණයක් සිදු කරන ලදී. සබරගමුව පළාතේ ඛනිජ ගවේෂණය 2015 වර්ෂයේ තුන්වන කාර්තුව තුලදී අරඹන ලද අතර 2016 වර්ෂය තුළද එය සිදු කරනු ඇත.




මධ්‍යම හා උඌව පළාත් ආශ්‍රිතව ඇති දත්ත යොදා ගනිමින් ඛනිජ සිතියම් සැකසීමේ කටයුතු බොහෝ දුරට නිම කර ඇති අතර මුද්‍රණ කටයුතු සිදු කිරීමට තිබේ. උතුරු මැද පළාතේ ඛනිජ සිතියම 2015 වර්ෂය අවසානය වන තෙක් සකස් කරමින් පැවතුනි.

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරියේ සහයෝගය සහිතව සිදු කරන ලද න්‍යෂ්ඨීක අමුද්‍රව්‍ය ගවේෂණ කටයුතු හා ඒ හා අනුබද්ධ කටයුතු

ගැමා විකිරණ මැන බැලීම සහ ක්‍රමානුකූල ලෙස නියැදි එකතු කිරීමේ කටයුතු මිටිපොල අවට ප්‍රදේශය සහ අවිස්සාවේල්ල හා ඊසානදිග වෙරළ අවට ප්‍රදේශය තුළ 2014 සහ 2015 වර්ෂවලදී සිදු කරන ලදී. මෙම ක්ෂේත්‍ර කටයුතු නිම කර ඇති අතර මාතලේ, දඹුල්ල, ඇලහැර සහ පල්ලෙගම යන ප්‍රදේශවල ක්ෂේත්‍ර කටයුතු 2015 වර්ෂයේ දෙවන අර්ධය තුළදී සිදු කරන ලදී. විද්‍යාගාර තුළ නියැදි විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබන අතර අතුරු වාර්තා ඉදිරිපත් කරනු ලැබ ඇත. බඹරකොටුව සහ රත්නපුරය යන ප්‍රදේශවල තෝරියම් සහ යුරේනියම් පවතීද යන්න විමර්ශනය කිරීම සඳහා මූලික ක්ෂේත්‍ර සංචාර කටයුතු සිදු කරන ලදී. අන්තර්ජාතික පරමාණුක බලශක්ති අධිකාරියේ අර්ධ පරිත්‍යාගයන් වන කාර් රථයක සිට ක්‍රියාත්මක වන විකිරණ අනාවරණ ඒකකය හා එක්ස් කිරණ ප්‍රතිදීප්ත වර්ණාවලිමානය 2015 වර්ෂයේදී ලබා දෙන ලදී.

භූ කම්පන තොරතුරු සහ සුනාමි අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානයට සිදු කරන ලද වැඩිදියුණු කිරීම් සහ භූකම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන තුන නඩත්තු කිරීම

යම් යම් සුළු සුළු ගැටළු පැවතුනද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ආධාර ආයතනවලද සහාය ඇතිව ස්ථාපනය කරන ලද භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන දෙකෙහි කටයුතු මැනවින් සිදු කරගෙන යනු ලබන අතර මෙම මධ්‍යස්ථානවලින් ලබාගනු ලබන තොරතුරු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රධාන කාර්යාලයේ පිහිටි දත්ත මධ්‍යස්ථානය වෙත ලබා දෙනු ලැබේ. භූ වලනයන්, භූමිය දෙදරීම් සහ ඉන්දියානු සාගරය තුළ ඇතිවන භූමිකම්පා පිලිබඳව මහජනයා විසින් සිදුකරනු ලබන විමසීම් සඳහා දත්ත මධ්‍යස්ථානය සාර්ථක ලෙස ප්‍රතිචාර දක්වා ඇත.

පල්ලෙකැලේ පිහිටි භූ කම්පන නිරීක්ෂණ මධ්‍යාෂ්ඨානයෙහි ගැටළු නිරාකර
සඳහන් කටයුතු ඇතුළත් වේ.

(1) පැරණි උපකාරක බැටරි පද්ධතිය සඳහා නව බැටරි යෙදීම

(2) ව්‍යාපෘතියෙහි IDA පද්ධතිය සහ CTBTO පද්ධතිය අතර සන්නිවේදන සම්බන්ධතාවය අළුත්වැඩියා කිරීම පරණ උපකරණ ඉවත් කොට නව උපකරණ සම්බන්ධ කිරීම

(3) පල්ලෙකැලේ භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානයෙහි හානි වී ඇති පර්යේෂණ ආරක්ෂණ උපකරණ වෙනුවට අලුත් ඒවා යෙදීම

(4) පල්ලෙකැලේ ප්‍රදේශය තුළ පිහිටි ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය නවීකරණය කිරීම සහ ඉවත් කොට නව පදධතියක් යෙදීම සහ

(5) පල්ලෙකැලේ පිහිටි අකුණු වල බලෑමට ලක් වූ සංඛ්‍යාංකකය ඉවත් කර නව සංඛ්‍යාංකකයක් සවි කිරීම

පල්ලෙකැලේ මධ්‍යස්ථානය තුළ ඉතාම හොඳ තත්ත්වයේ අකුණු ආරක්ෂණ පද්ධතියක් තිබුණද එය තවමත් අකුණුවල බලපෑමට ලක් වේ.

ජර්මන් පර්යේෂණ මධ්‍යස්ථානයෙහි භූකම්පන මධ්‍යස්ථානවල (පල්ලෙකැලේ හා මහකනදරාව) ගැටළු නිරාකරණ කටයුතුවලට පහත සඳහන් කටයුතු අයත් වේ. (1) මහකනදරාව භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානයෙහි විදුලිබල පද්ධතියෙහි ගැටළුව (2) ජර්මන් පර්යේෂණ මධ්‍යස්ථානයෙහි භූකම්පන මධ්‍යස්ථාන දෙකෙහි වන්ද්‍රිකා සන්නිවේදන ගැටළුව සහ මහකනදරාව මධ්‍යස්ථානයෙහි පුළුල් කලාප ගෝලීය ප්‍රදේශ ජාලයේ සන්නිවේදන ගැටළුව 2016 වරෂය මුල් භාගයේදී ජර්මන් පර්යේෂන ආයතනයෙහි සහයෝගය (උපකරණ සහ තාක්ෂණික සහයෝගය) ඇතිව සන්නිවේදන ගැටළු විසඳන ලදී.

➢ අබලන් වූ විදුම් පෙට්ටි අනාවරණය කර ගැනීම සහ ගබඩා කිරීම

යක්කල පරිශ්‍රය තුළ දිරා ගිය ලී පෙට්ටි තුළ ගබඩා කර තිබූ පාෂාණ විදුම් පෙට්ටි සොයාගැනීමට සැලසුම් සකසන ලදී. විදුම් පෙට්ටි අබලන් වූ තත්ත්වයක තිබූ අතර නිවැරදි තොරතුරු මත ඒවායින් 60% පමණ අනාවරණය කර ගැනීමට හැකි විය. අනාවරණය කරගත් විදුම් 2013, 2014 හා 2015 වර්ෂවලදී ගැල්වනයිස් විදුම් පෙට්ටි 900 ක ගබඩා කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂය අවසන් වන විට බොහෝ දුරට අවසන් කරන ලද අතර අවසාන පිළියෙල කිරීම් සහ නිමැවුම් කාර්යයන් 2016 වර්ෂයේ මුල් භාගය තුළදී නිම කරන ලදී.

➢ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පුස්තකාලය නවීකරණය කිරීම

ජාතික ආයතනික ගබඩා ජාලයෙහි සාමාජික පුස්තකාලයක් ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පුස්තකාලය තෝරා ගන්නා ලදී. ජාතික විද්‍යා පදනමෙහි මූල්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතිය යටතේ මෙම පුස්තකාලය නවීකරණය කිරීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී. ජාතික විද්‍යා පදනම මගින් ලබා දෙනු ලබන පහසුකම් තුලට ශාස්ත්‍රීය ග්‍රන්ථ සංඛ්‍යාංකකරණය කිරීම විද්‍යුත් ගබඩාවක් නිර්මාණය කිරීම, දත්ත පදනම කළමනාකරණය කිරීම හා පරිපාලනය පිලිබඳ පුහුණුව ලබා දීම සහ වර්තමාන දත්ත පදනම් ඩී - ස්පේස් මෘදුකාංගය බවට පරිවර්තනය කිරීම, උපකරණ / දත්ත පදනම් ලබාදීමෙ පහසුකම්, දත්ත ඇතුලත් කිරීම සඳහා තාවකාලික කාර්ය මණ්ඩල ලබාදීම සහ ගැටළු විසඳීම සඳහා තාක්ෂණික සහයෝගය ලබා දීම ඇතුලත් වේ. 2015 වර්ෂය තුලදී සංඛ්‍යාංකකරණ කටයුතුවලින් 75% සම්පූර්ණ කර ඇත.

➢ *පාෂාණ විද්‍යා විද්‍යාගාරය*

වාණිජ පදනමකින් බාහිර කාර්යයන් ඉටු කිරීමට අමතරව ජාතික රත්නන් ගවේෂණය සහ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරියේ සහාය ලත් අමුද්‍රව්‍ය ගවේෂණයහා එක්ව ඛනිජ විද්‍යා විශ්ලේෂණයක් ක්‍රියාත්මක කිරීමට විද්‍යාගාර කාර්ය මණ්ඩලය කටයුතු කළේය.

2015 වර්ෂය තුළදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් නිතිපතා සිදුකරන කටයුතු සඳහා පාෂාණ විද්‍යා විද්‍යාගාරය මගින් ලබා දෙන සේවාවන් .

- කැළණිගහෙහි රත්නන් ගවේෂණය
- විකිරණමිතික ගවේෂණය
- තුනී කඩ පිළියෙල කිරීම
- මහේස්ත්‍රාත් උසාවි / පොලිසිය / රේගුව සහ අනිකුත් ආයතන මගින් ලබා දෙන ලද නිදර්ශක විශ්ලේෂණය කිරීම
- විශ්ව විද්‍යාල සිසුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා පහසුකම් ලබා දීම

➢ *විශ්ලේෂණ විද්‍යාගාරය*

බාහිර සේවාදායකයන් සඳහා රසායනික

විශලේෂණ කටයුතු සිදු කිරීම හුණුගල්, තිරුවානා, ඩොලමයිට්, මිනිරන්, ෆෙල්ඩ්ස්පාර්, පස්, වැලි, සිමෙන්ති, මයිකා, ඛනිජ වැලි, මැටි, ජලය, දිරා ගිය පාෂාණ, අනිකුත් ලෝහ මිශ්‍රණ සහ ගඩොල් හා පිහන් මැටි ආදිය අඩංගු වස්තු මිශ්‍රණ ආදිය අඩංගු නිදර්ශක 407ක විශ්ලේෂණ කටයුතු විවිධ ආයතන හා පුද්ගලයන්ගේ ඉල්ලීම් මත සිදු කරන ලදී.

➢ අභ්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘති සඳහා රසායනික විශ්ලේෂණ කටයුතු

භූ විද්‍යාඥයන් විසින් සිදු කරන ලද විවිධ පර්යේෂණ වලදී ලබාගන්නා ලද ඉල්මනයිට නියැදි දෙකක් සහ ගෝමේද නියැදි 10ක් මෙම විද්‍යාගාරය මගින් විශ්ලේෂණය කරන ලදී.

➢ භූ රසායනික සිතියම් සැකසීම

පහත සඳහන් භූ රසායනික සිතියම් කලාපවලින් එකතු කර ගන්නා ලද පස් නිදර්ශක සැකසීම,
ජීරණය කිරීම සහ විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී.

පර්යේෂණ වැඩසටහන්

අපගේ නිතිපතා සිදු කරනු ලබන කටයුතු වලට අමතරව භූ විද්‍යා අංශය විසින් පශ්චාත් උපාධි පර්යේෂණ සිදු කරන සිසුන්ට සහ භූ විද්‍යා සමීක්ෂණ හා පර්යේෂණ කාර්යාංශයෙහි කාර්ය මණ්ඩලයට තම පර්යේෂණ කටයුතු සිදු කිරීමට පහසුකම් ලබාදීම සිදු කරනු ලැබේ.

- **සේවාදායක ඉල්ලීම් මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ කටයුතු (ආදායම් උත්පාදන)**

1 වගුව : 2015 වර්ෂය තුළදී විවිධ ව්‍යාපෘති තුලින් උපයන ලද ආදායම පිළිබඳ සාරාංශය

සේවාදායකයා	ව්‍යාපෘතිය	2015 වර්ෂයේදී ආදායම භාණ්ඩ හා සේවා බද්ද ජාතිය ගොඩනැගීමේ බද්ද
පිහන් භාණ්ඩ සභාව	මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක තුළ තිරුවානා, ෆෙල්ඩ්ස්පාර්, කෙයොලින් සහ කැල්සයිට් නිධි පිහිටි ස්ථාන හඳුනාගැනීම	3,458,527.58
පිහන් භාණ්ඩ සභාව	බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්ක තුළ පිහන් භාණ්ඩ අමුද්‍රව්‍ය ගවේෂණය	
	මාඔය ඔස්සේ නව මැටි පිහිටි ස්ථාන හඳුනාගැනීම	1,412,456.81
සී/ස එම්.ආර්.එල්. ග්‍රැෆයිට් පුද්ගලික සමාගම	අළුකැටිය ප්‍රදේශයෙහි මිනිරන් ගවේෂණය කිරීම සඳහා විදුම් ගවේෂණය	6,304,530.25
සී/ස ටෝකියෝ සිමෙන්ති සමාගම	වලලෙයිපාදු / මන්නාරම ප්‍රදේශවල හුණුගල් පාක්ති පිළිබඳ ගණනය කිරීමක් සිදු කිරීම	3,667,107.85
සී/ස ලංකා ඛනිජවැලි සමාගම	කෝකිලායි කලපු මුවදොර සිට කොක්කුතුඩුවයි දක්වා සහ නයාරු දකුණ ප්‍රදේශයේ සිට මුලතිවු දිස්ත්‍රික්කයේ වෙම්මලයි දක්වා කිලෝමීටර් 3 ක් දිවයන වෙරළ තීරය ඔස්සේ බර ඛනිජ වැලි සඳහා භූ විද්‍යා පරීක්ෂණ කටයුතු සිදු කිරීම	1,825,878.25
සී/ස බෝරා බෝරා සමාගම	මල්සිරිපුර මිනිරන් නිධියේ විදුම් කටයුතු	12,267,381.70
මහවැලි උපදේශන කාර්යාංශය	උතුරු මැද පළාතේ උමං ව්‍යාපෘතිය	
සී/ස එම්.ආර්.අයි. ග්‍රැෆයිට් පුද්ගලික සමාගම	වරකාපොල ප්‍රදේශයේ මිනිරන් ගවේෂණය සඳහා විදුම් ව්‍යාපෘතිය	3,080,110.00
කර්මාන්ත තාක්ෂණ ආයතනය	චුන්නාකම් විදුලිබල උත්පාදන සංකීර්ණය තුළින් නියැදි එකතු කිරීම හා සාම්පල සැකසීම	833,371.14
ඝුනිත්‍ය බලශක්ති අධිකාරිය	බත්තරමුල්ල විදුම් වැඩසටහන	543,127.50

පුස්තකාලය		561,118.00
විශ්ලේෂණ විද්‍යාගාරය		2,577,000.00
පාෂාණ විද්‍යා විද්‍යාගාරය		872,210.00

- **අනිකුත් කටයුතු**

  - **2015 දින 100 වැඩසටහන : දිවයින පුරා ඛනිජවැලි ගවේෂණ කටයුතු කඩිනමින් සිදු කිරීම**

    2015 වර්ෂය ආරම්භයේදී භූ විද්‍යාඥයෙකුගේ නායකත්වය යටතේ කන්ඩායම් 9ක සහභාගිත්වය ඇතිව මුළු මහත් දිවයිනම ආවරණය කරනු ලබන පළාත්බද වැලි ගවේෂණයක් සිදුකරන ලදී. අවසන් වාර්තාව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

  - **2015 දින 100 වැඩසටහන - උතුරු මැද පළාතේ ආසනික් පර්යේෂණ වැඩසටහන් සිදු කිරීම**

    අනුරාධපුරය සහ පොලොන්නරුව යන ප්‍රදේශ වලින් ජලය, පස්, පාෂාණ සහ වී නියැදි එකතු කර ගන්නා ලද අතර එම නියැදි සකසා ඒවායේ ආසනික් සහ අනිකුත් බර ලෝහ අන්තර්ගත වේදැයි විශ්ලේෂණයකරන ලදී.

  - OSI/CTBTO පාඨමාලාව සංවිධානය කිරීම

    විස්තීරණ න්‍යෂ්ඨික පරීක්ෂණ තහනම් ගිවිසුමට අනුකූලව කටයුතු කරන්නේද යන්න තහවුරු කිරීම සඳහා ගනු ලබන අධ්‍යයනාත්මක තහවුරු කිරීමේ පියවර වන්නේස්ථානීය පරීක්ෂා කිරීම් සිදු කිරීමයි . ස්ථානීය පරීක්ෂා කිරීමක් සඳහා ඕනෑම රටක් විසින් ඉල්ලුම් කළ හැකි අතර විස්තීර්ණ න්‍යෂ්ඨික පරීක්ෂණ තහනම් ගිවිසුම බලාත්මක වූ පසු මෙය සිදු කළ හැකිය.

    2015 නොවැම්බර් මස 29 වන දින සිට 2015 දෙසැම්බර් මස 5 වැනි දින දක්වා දඹුල්ල නගරයේදී ස්ථානීය පරීක්ෂා කිරීම් පිලිබඳ කලාපීය වශයෙන් හඳුන්වාදීමේ පාඨමාලාවක් පවත්වන ලදී. ශ්‍රී ලංකා රජයේ ප්‍රධාන තාක්ෂණික කෙන්ද්‍රීය ආයතනය ලෙස භූ.ස.ප.කා. මෙම පාඨමාලාවට සම්බන්ධ විය. මෙම පාඨමාලාවේ අරමුණු වූයේ කලාපීය විද්වතුන් හට ස්ථානීය පරීක්ෂා කිරීම් පිලිබඳ සංකල්ප, තාක්ෂණයන් හා ක්‍රියාකාරිත්වයන් පිළිබඳ අවබෝධයක් ලබා දීමයි. ඉරානය, ඊශ්‍රායලය, ජෝර්දානය, කසකස්ථානය, කිර්ජිස්ථානය, මාලදිවයින, ඕමානය, කටාර්, දකුණු අප්‍රිකාව, ශ්‍රී ලංකාව, තායිලන්තය හා උස්බෙකිස්ථානය යන රටවල් 13ක විද්වතුන් මේ සඳහා සහභාගි විය.

    විද්‍යුත් ඉගෙනුම් මොඩියුල, සමාලෝචන දේශන, ප්‍රායෝගික පුහුණු සැසිවාරයන්, උපකරණ භාවිතය පිළිබඳ ආදර්ශනයන්, පන්ති කාමර අභ්‍යාස සහ ක්ෂේත්‍ර අභ්‍යාස තුලින් අන්තර් සම්බන්ධතාවයන් ගොඩනගමින් ස්ථානීය පරීක්ෂා කිරීමේ ක්‍රම පිලිබඳ දැනුම ලබා දෙන ලදී.

  - **මාඔය සඳහා කලමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම**

    ක්ෂේත්‍ර වාරිකා සිදු කරමින් සහ 'පස් අවුරුදු කළමනාකරණ සැලැස්ම' පිළිබඳ අදහස් ලබා දෙමින් මා ඔය කළමනාකරණ සැලැස්ම පිලියෙල කිරීම සඳහා භූ විද්‍යා අංශයේ භූ විද්‍යාඥයින් සම්බන්ධ විය.

- **ගිං ගඟෙහි වැලි ගවේෂණය :**

  වැලි කැනීම සඳහා සුදුසු පාරිසරික ලෙස හානියක් සිදු නොවන ස්ථාන සොයා ගැනීමට සහ ගිං ගඟ තුළ කැනීම සිදු කළ හැකි වැලි සම්පත් කවරේද යන්න නිර්දේශ කිරීම සඳහා 2015 දෙසැම්බර් මස 16 දින සිට 2016 ජනවාරි 01 දින දක්වා වැලි ගවේෂණයන් සිදු කරන ලදී.

- **උමා ඔය ව්‍යාපෘතිය**

  උමා ඔය ව්‍යාපෘතිය සඳහා උපදෙස් ලබා දීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කරන ලද විද්වත් කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කරන ලදී. ව්‍යාපෘතිය කළමනාකරණය කිරීම සහ විද්වත් කමිටුවේ සාමාජිකයන් සමග ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට සම්බන්ධ වන ලද අතර සවිස්තරාත්මක වාර්තාවක් අතිගරු ජනාධිපතිතුමා වෙත ලබා දෙන ලදී.

- **භූ භෞතික ගවේෂණ**
  - ✓ හබරණ මොරගහකන්ද භූ භෞතික ගවේෂණය සිදු කිරීම - තිරුක්කෝවිල් භූ භෞතික ගවේෂණය අධීක්ෂණය කිරීම
  - ✓ පදියතලාවේ භූ භෞතික ගවේෂණය (වුම්බක ගවේෂණය, ඩොලරයිට් වේලි පරීක්ෂා කිරීම)
  - ✓ පදියතලාව භූ භෞතික ගවේෂණය, ඩොලරයිට් වේලි සඳහා පරීක්ෂා කිරීම
  - ✓ භූ භෞතික විමර්ශනය, මඩකලපුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශ සමග
  - ✓ ත්‍රිකුණාමලය, උප්පුවේලි සහ නිලාවේලි පොලිස් කොට්ඨාශ තුළ භූ භෞතික විමර්ශනය
  - ✓ ගම්පහ, වයික්කාල, පුත්තලම, මැදවච්චිය, එප්පාවල සහ අම්බලන්ගොඩ යන ප්‍රදේශවල තිරිවාන ජීරණ ගවේෂණය
  - ✓ කච්චතිවු, ඩෙල්ෆ්ට්, කයිට්ස් දූපත්වල භූ භෞතික ගවේෂණය

කැනීම් අංශය

2015 ජූලි මස සිට 2016 ජූනි දක්වා කාලය තුළ කැනීම් අංශයෙහි ප්‍රගතිය

ආදායම් උත්පාදනය

2015 ජූලි මස සිට 2016 ජූනි දක්වා කාලය තුළ කැනීම් අංශ විසින් ලබා ගත් ආදායම

වර්ෂය	මාසය	ආදායම (රු.)	සමුච්චිත ආදායම
2015	ජූලි	290,233,306.02	290,233,306.02
	අගෝස්තු	127,159,714.76	417,393,020.78
	සැප්තැම්බර්	124,783,914.65	542,176,935.43
	ඔක්තෝබර්	180,342,668.45	722,519,603.88

	නොවැම්බර්	88,492,462.13	811,012,066.01
	දෙසැම්බර්	111,713,426.57	922,725,492.58
2016	ජනවාරි	177,848,684.41	1,100,574,176.99
	පෙබරවාරි	129,282,484.56	1,229,856,661.55
	මාර්තු	146,069,822.33	1,375,926,483.88
	අප්‍රේල්	188,773,911.44	1,564,700,395.32
	මැයි	122,240,513.46	1,686,940,908.78
	ජූනි	260,435,006.69	1,947,375,915.47

2016 ජූනි මාසය අවසානය දක්වා කැනීම් අශය විසින් සිදු කරන ලද ප්‍රධාන කටයුතු

- අධ්‍යාපන වැඩසටහන්

(a) කාර්මික කළුගල් පිපිරවීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

ශ්‍රී ලංකාවේ කළුගල් පිපිරවීමේ කර්මාන්තයේනිරත තාක්ෂණික හා අධීක්ෂණ මට්ටමේ සේවකයන් සඳහා සැලසුම් කරන ලද කළුගල් පිපිරවීම පිළිබඳ තුන්මාසික සහතික පත්‍ර පාඨමාලාවක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කැනීම් අංශය විසින් ආරක්ෂක අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය සහ මොරටුව විශ්ව විද්‍යාලය යන ආයතනවල සහයෝගය ඇතිව පවත්වනු ලැබේ.





මෙම කළුගල් පිපිරවීම පිලිබඳපාඨමාලාවේ ප්‍රධාන අරමුණ වන්නේ පිපිරවීම් ද්‍රව්‍ය, ක්‍රමවේදයන් සහ කළුගල් පිපිරවීම් කටයුතු මගින් ඇති විය හැකි සමාජ සහ පාරිසරික බලපෑම් පිලිබඳ වඩාත් හොඳ නාහායාත්මක සහ ප්‍රායෝගික දැනුමක් ලබා දීමකි.

මෙම පාඨමාලාව වාර්ෂිකව පවත්වනු ලබන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ආරක්ෂණ ප්‍රමිතීන් සහ පිපිරවීම් වල ඵලදායිත්වය ඉහළ යනු ඇත.


(b) **කැනීම් අංශය විසින් සංවිධානය කරනු ලබන වැඩමුළු හා සම්මන්ත්‍රණ**


කැනීම් කටයුතු හේතු කොටගෙන පැන නගින ප්‍රධාන කාර්මික ගැටළු නිරාකරණය කිරීම සහ පතල් හා ඛනිජ පනත ප්‍රකාරව කාර්යාංශය සතුව ඇති නියාමන කාර්යයන් පිළිබඳව රාජ්‍ය ආයතන හා බලපත්‍ර හිමිකරුවන් දැනුවත් කිරීම සඳහා කැනීම් අංශය විසින් විවිධ දිස්ත්‍රික්ක තුළ වැඩමුළු හා සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී. මෙම වැඩමුළුවල ප්‍රධාන අරමුණ වූයේ පතල් හා ඛනිජ පනත ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි රාජ්‍ය ආයතන සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමයි.



➢ **නීතිවිරෝධී කටයුතු අවම කිරීම**

පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ හිඳියගල ග්‍රාම නිලධාරී කොට්ඨාශයෙහි වලව්වත්ත යන ප්‍රදේශයෙන්දී 2016 මාර්තු 15 දින භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පානදුර වලාන මධ්‍යම දූෂණ මර්ධන ඒකකයේ සහයෝගය ඇතිව මෙම වැටලීම සාර්ථකව සිදු කරන ලදී.





➢ කොළඹ ප්‍රාදේශීය කාර්යාලය විවෘත කිරීම

කොළඹ නගරය ආශ්‍රිත ප්‍රාදේශීය කටයුතු සිදු කිරීම සහ කාර්මික ඛනිජ ප්‍රවාහන කටයුතු සඳහා නව කාර්යාලයක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ 2016 ජනවාරි 04 දින විවෘත කරන ලදී. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සේවාදායකන්ට වඩාත් හොඳ සේවයක් ලබාදීම මෙහි අරමුණ වේ.
රෙගුලාසි සංශෝධනයකිරීම

රෙගුලාසි සංශෝධනයකිරීම පිළිබඳව සාකච්ඡා කිරීමට දින දෙකක නේවාසික වැඩමුලුවක් කුරුනෑගල ලයා ලෙෂර් හෝටලයේ දිපවත්වන ලද අතර මෙයට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ විධායක කාර්ය මන්ඩලය සහ හිටපු අධ්‍යක්ෂ වරුන් හා අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහභාගිවූහ

➢ කැනීම් අංශය විසින් සිදුකරනු ලබන අනිකුත් කටයුතු :

- පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලයේ වර්ෂ පූර්ණය සැමරීම සඳහා පොලොන්රනුව ගල් විහාරයේදී ධර්ම දේශනයක් හා රුක් රෝපණ වැඩසටහනක් 2016.04.21 දින පවත්වන ලදී.

➢ මූල්‍ය කාර්යසාධනය

ආදායම් හා වියදම් ප්‍රකාශනය

	2015 ජනවාරි- දෙසැම්බර්	2016 ජනවාරි - ජුනි
රාජ්‍ය භාගය	1,293,433,031.76	744,307,715.84
බලපත්‍ර ගාස්තු	80,002,819.08	45,495,045.56
පරීක්ෂණ කිරීමේ ගාස්තු	182,943,929.26	110,593,531.92
කැනීම් ආදායම	1,556,379,780.10	900,396,293.32
විද්‍යාගාරය	3,568,174.29	603,400.00
ව්‍යාපෘතිය	30,429,845.06	5,852,997.33
භූ විද්‍යා ආදායම	33,998,019.35	6,456,397.33
අනෙකුත්	125,426,991.71	86,919,261.76
අනෙකුත් ආදායම	125,426,991.71	86,919,261.76
මුළු ආදායම	**1,715,804,791.16**	**993,771,952.41**
භූ විද්‍යා	60,936,938.27	26,434,989.58
සිතියම සැකසීම	8,201,413.15	3,096,172.56
ව්‍යාපෘති	13,308,901.10	1,930,035.60

ප්‍රාදේශීය	167,317,920.49	89,263,724.29
කැනීම්	37,795,642.21	15,124,087.95
පරිපාලනය	372,653,632.52	165,998,114.34
ආදායම් බදු	18,496,473.00	11,748,529.00
මුළු වියදම්	678,710,920.74	313,595,653.32
වියදම ඉකුත්වූ පසු ආදායම	**1,037,093,870.42**	**680,176,299.09**

4 වගුව : භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - 2016 - 2020 ආයතනික සැලැස්මට අනුව 2015වර්ෂයේ කථ්‍ය ආදායම සහ 2016 සහ 2017 වර්ෂවල මූල්‍ය සැලැස්ම

ආදායම් විස්තරය	2015 කථ්‍ය	2016 අයවැය	2017 අයවැය
රාජ්‍ය භාග			
කැනීම් සඳහා රාජ්‍යභාගය	1,293,433,032.00	1,431,889,000	1,646,673,000
බලපත්‍ර ගාස්තු			
ගවේෂණය	7,874,000.00	2,541,000	2,922,000
කර්මාන්ත	19,104,000.00	21,852,000	25,130,000
විශේෂිත බණිජ	-		-
ශිල්පීය කැනීම්	7,194,500.00	6,878,750	7,911,000
වෙළඳ	5,612,000.00	4,942,500	5,684,000
ආයතන	2,305,000.00	2,965,000	3,410,000
ප්‍රවාහන	37,913,319.00	41,107,500	47,274,000
බලපත්‍ර ගාස්තු	182,943,929.00	154,324,000	177,473,000
අනෙකුත් මෙහෙයුම් වියදම්			
පරීක්ෂණ පිපිරවීම්	4,326,000.00	9,174,000	10,550,000
කැනීම් ගාස්තු නැවත ගෙවීම (සේවා ගාස්තු)	44,250.00	586,000	674,000
සුළු ආදායම් කැනීම්	17,193,126.00	400,000	460,000
නිදර්ශක අපනයනය	619,500.00	600,000	690,000
පිපිරවීම් පාඨමාලා පැවැත්වීම	0.00	330,000	380,000
මුළු ආදායම	**1,578,562,656.00**	**1,677,589,750.00**	**1,929,331,000.00**

6.1 2017 - යෝජිත ක්‍රියාකාරී සැලැසුම් - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

2017 සඳහා ක්‍රියාකාරී සැලසුම් කටයුතු - භූ විද්‍යා සමීක්ෂණ අංශය

	ප්‍රධාන කාර්යය	අනුකාර්යය	ඉලක්ක	
			භෞතික	මූල්‍ය
01	පස් භූ රසායනික සිතියම් සැකසීම	1. ක්ෂේත්‍ර කටයුතු 2. විද්‍යාගාර කටයුතු	පාංශු භූ රසායනික සිතියම් (පරිමාණය 1:100,000) සංඛ්‍යාව : 2 පාංශු භූ රසායනික සිතියම්(පරිමාණය 1:100,000) සංඛ්‍යාව : 2	RS. 3,800,000.00 RS. 4,000,000.00
02	චාතුර්ථික සිතියම් සැකසීම (වෙරළබඩ කලාපය)	1. ක්ෂේත්‍ර කටයුතු 2. විද්‍යාගාර කටයුතු	චාතුර්ථික සිතියම් (පරිමාණය 1:5 0,000) සංඛ්‍යාව : 2 චාතුර්ථික සිතියම් (පරිමාණය 1:5 0,000) සංඛ්‍යාව : 2	RS. 1,600,000.00 RS. 600,000.00
04	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විද්‍යාගාර පහසුකම් වැඩි දියුණු කිරීම	යෝජිත විද්‍යාගාරය සඳහා මහල් 2 ක් ගොඩනැගීම	නව විද්‍යාගාරයේ මහල් 2 ක්	Rs.300,000,000.00
05	පළාත් ඛනිජ ගවේෂණ	1. ක්ෂේත්‍ර කටයුතු 2. පළාත් ඛනිජ සිතියම් සැකැසීම සිතියම සංඛ්‍යා 01	පළාත් ඛනිජ සිතියම් සංඛ්‍යාව 1	Rs.500,000.00

2017 සඳහා ක්‍රියාකාරී සැලසුම් කටයුතු - කැනීම් අංශය

	ප්‍රධාන කටයුතු	අනු කටයුතු	ඉලක්ක	
			භෞතික	මූල්‍ය රු. මිලියන
1	1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත ප්‍රකාරව බලපත්‍ර නිකුත් කිරීම	1.1 ශිල්පීය කැනීම් බලපත්‍ර		
		A	1,650	4.950
		B	2,380	2.975
		1.2 කාර්මික කැනීම් බලපත්‍ර		
		A	260	5.200
		B	1,490	11.920
		C	975	3.900
		1.3 වෙළඳබලපත්‍ර		
		A	15	0.113
		B	1,100	5.500
		1.4 ප්‍රවාහන බලපත්‍ර	525,260	47.274
		1.5 අපනයන බලපත්‍ර	682	3.410
		1.6 ගවේෂණ බලපත්‍ර		2.922
2	රාජ්‍ය භාගය අය කිරීම			1,646.673
3	කැනීම් පරීක්ෂා කිරීමේ ගාස්තු			177.473
4	පරීක්ෂණ පිපිරවීම් සිදු කිරීම			10.550
5	ආපසු ගෙවීම් සහ බැංකු ඇපකර			0.674
6	සුළු ආදායම් කැනීම්			0.460
8	නියැදි අපනයනය			0.690
9	පිපිරවීම් පාඨමාලා සිදු කිරීම			0.380
	මුළු ආදායම			**1,925.064**
10	වියදම	10.1 බලපත්‍ර ක්‍රියාපටිපාටීන් පිලිබඳ දැනුවත් කිරීමේ වැසටහන		2.000
		10.2 පුනරුත්ථාපන කටයුතු සංවිධානය කිරීම		4.000
	මුළු වියදම			**6.000**

09. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

වාර්ෂික වාර්තාව 2016 සහ ක්‍රියාකාරී සැලැස්ම 2017

2016 ජූනි මස අවසානය දක්වා අත්පත් කරගත් ජයග්‍රහණ

➢ උපදේශන අංශය

- උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය **(NRRP)**
  මෙම ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කර ඇත.

පැකේජය/විස්තරය		කොන්ත්‍රාත් මුදල ශ්‍රීලරු.	භෞතිකප්‍රගතිය %	සටහන්
C1A	මහනුවර - යාපනය මාර්ගය (A009) ගල්කුලම සහ කි.මී. 230 කණුව අතර	9,592,082,089.00	100	ඉලක්කගත කාලයට පෙර ව්‍යාපෘතිය නිම කරන ලදී
C1B	මහනුවර - යාපනයමාර්ගය(A009) යාපනය සහ කි.මී. 230 කණුව අතර	9,532,917,911.00	100	ඉලක්කගත කාලයට පෙර ව්‍යාපෘතිය නිම කරන ලදී
C2	නිවටකුලි – කරයිතිව් – මන්නාරම මාර්ගය (A032)	6,532,500,000.00	100	ඉලක්කගත කාලයට පෙර ව්‍යාපෘතිය නිම කරන ලදී
C3	පුත්තගම – මරිච්චකඩේ – මන්නාරම මාර්ගය	9,887,500,000.00	100	පෙර ව්‍යාපෘතිය නිම කර ඇත
C7	යාපනයේ පිහිටි AB16, AB18, AB20සහ AB32 මාර්ග	10,185,000,000.00	100	ඉලක්කගත කාලයට පෙර ව්‍යාපෘතිය නිම කරන ලදී
C11	පරන්තන් – මුලතිව් මාර්ගය (A035)	5,700,000,000.00	100	ඉලක්කගත කාලයට පෙර ව්‍යාපෘතිය නිම කරන ලදී
C11A	මුලතිව් – කෝකිලායි – පුල්මුඩේ මාර්ගය (B297)	5,777,446,236.00	100	ඉලක්කගත කාලයට පෙර ව්‍යාපෘතිය නිම කරන ලදී
C11B	ඔඩ්ඩුසුඩාන් – නැදුන්කර්නි මාර්ගය (B334) සහ මුලතිව් –	5,741,303,764.00	100	ඉලක්කගත කාලයට පෙර ව්‍යාපෘතිය නිම

	පුලියන්කුලම මාර්ගය (B296)			කරන ලදී
සමස්ථ NRRP		**62,948,750,000.00**	**100**	**ව්‍යාපෘතිය නිම කර ඇත**

- **දේශීය බැංකු අරමුදල් ලැබූ මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය (LBFP)**

පැකේජය/විස්තරය		**කොන්ත්‍රාත් මුදල ශ්‍රීලරු.**	**භෞතිකප්‍රගතිය %**	**සටහන්**
C1	නාගොඩ-නැබොඩ සහ අවිත්තාව-ලෙවන්දුවමාර්ග	**12,784,173,027.90**	**95**	ව්‍යාපෘතිය සිදු කරමින් පවතී
C2	නාඋල-ඇළහැර-පල්ලෙගම-හෙට්ටිපොළ සහ හසලක - හඳුන්ගමුව මාර්ග			
C3	හපුතලේ – බොරලන්ද – කැප්පෙටිපොළ මාර්ග			
C4	බෝදාගම-හම්බෙගමුව-කල්තොට මාර්ගය			

- උතුරු දුම්රිය මාර්ග නැවත ඉදිකිරීම
  මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇත.

පැකේජය/විස්තරය	කාර්යයන්වල මුළු පිරිවැය ශ්‍රීලරු. බිලියන	භෞතිකප්‍රගතිය %
මැදවච්චිය සිට මඩු මාර්ගය	10.6	100
ඕමන්තේ සිට පළාලි	24.0	100
මඩු මාර්ගයේ සිට තලෙයිමන්නාරම	19.5	100
පළාලි සිට කන්කසන්තුරය	19.4	100
සංඥා සහ විදුලි සන්දේශ ව්‍යාපෘතිය	11.2	100

- **මාතර – කතරගම දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය**
  මාතර – බෙලිඅත්ත කොටස: 62% සම්පූර්ණ කර ඇත.කාර්යයන්හි මුළු පිරිවැය රු.බිලියන 36කි.
- **මුල්ලේරියාව මූලික රෝහලෙහි ජාතික ආඝාත මධ්‍යස්ථානයක් ඉදිකිරීම.**

  මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන 1,220කි. සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රගතිය 35%කි.

- **කළුගඟ ඉහළ කාර්යයන් සංවර්ධන ව්‍යාපෘතිය**

  මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 12,723කි. අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය 35%කි.

- **බ්‍රෝඩ්ලැන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය**

  මෙම ව්‍යාපෘතියේ සැලසුම් සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණය සම්බන්ධයෙන් කාර්යාංශය වගකීම දරයි.මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 11,480කි. අත්පත් කරගෙන ඇති ප්‍රගතිය 10%.

- **කොළඹ 03,AVIC නේවාසික ව්‍යාපෘතිය ඉදිකිරීම**

  රු. බිලියන 25ක් වන මෙම ව්‍යාපෘතියේ ලේඛන සමාලෝචනය කිරීම, සැලසුම් කාර්යාලයෙන් තාක්ෂණික සහාය ලබාදීම සහ නේවාසික අධීක්ෂණය සඳහා කාර්යාංශය වගකිව යුතු වේ. කාර්යාංශය විසින් අත්පත් කරගෙන ඇති ප්‍රගතිය 50%කි. සේවාදායකයා ඇවික් හොටෙල්ස් ලංකා සමාගමයි.

- **අඟුණකොළපැලැස්ස යෝජිත බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම**

  රු.මිලියන 3,000ක මෙම ව්‍යාපෘතිය සඳහා මුළු උපදේශන සේවා සැපයීම සඳහා කාර්යාංශය වගකිව යුතු වේ. අත්පත් කරගෙන ඇති ප්‍රගතිය 84%කි.

➢ ඉදිකිරීම් අංශය

- **හම්බන්තොට මහරෝහල ඉදිකිරීම**

  පෞද්ගලික අංශ සමාගම් සමඟ තරඟකාරී ලංසු ක්‍රමවේදය හරහා මහල් 10ක් සහ ඇඳන් 850ක මෙම රෝහල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සාර්ථකව අත්පත් කර ගන්නා ලදී. මුළු ව්‍යාපෘති පිරිවැය රු.මිලියන 1,654කි.

  මෙම ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කර ඇත.

- **කොළඹ, මහල් 10ක දන්ත රෝහල් ගොඩනැගිල්ල සැලසුම් කිරීම සහ ඉදිකිරීම**

  මෙම ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණකර ඇත.මුළු පිරිවැය රු.මිලියන 624කි.

- **මොරාන ජලාශය ඉදිකිරීම**

  අත්පත් කරගත් ප්‍රගතිය 43%කි.මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 1,008කි.

- **බත්තරමුල්ල ජාතික පාරිසරික ලේකම් කාර්යාලය සැලසුම් කිරීම සහ ඉදිකිරීම**

  මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන **1,126**කි. අත්පත් කරගෙන ඇති ප්‍රගතිය 37%කි.

- **යාපනය පොලිස් ස්ථානය සැලසුම් කිරීම සහ ඉදිකිරීම**

  මෙම ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කර ඇත. මුළු පිරිවැය රු.මිලියන 484කි.

➢ අන්තර්ජාතික අංශය

- **මැලේසියාවේ, ක්වාලාලම්පූර්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාගේ නිල නිවස අළුත්වැඩියා කිරීම.**

  මෙම කාර්යයෙහි මුළු පිරිවැය රු.මිලියන 63කි.සාක්ෂාත් කරගත් ප්‍රගතිය 40%කි.

- **මියන්මාරයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාගේ කාර්යාලය සහ නිල නිවස අළුත්වැඩියා කිරීම/නැවත සැකසීම.**

  මෙම කාර්යයෙහි මුළු පිරිවැය රු.මිලියන 42 කි.සාක්ෂාත් කරගත් ප්‍රගතිය 75%කි.

7.1 2017 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්


කාර්යාංශය විසින් මෑතකදී භාරගත් ප්‍රධාන උපදේශන සහ ඉදිකිරීම් ව්‍යාපෘති කිහිපයක විස්තර. මෙම ව්‍යාපෘති 2017 වර්ෂය තුළදී සිදුකරගෙන යනු ඇත.

ව්‍යාපෘතියේ නම	කෙටිවිස්තරය	ව්‍යාපෘතියේ පිරිවැය(ශ්‍රීලරු. මිලියන
අංක 25, ගාලු මුවදොර ටෙරසය, කොළඹ 3 හි යෝජිත මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිකිරීම	මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ.	867
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සඳහා යෝජිත ස්වර්ණ ජයන්ති සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම සහ ව්‍යායාම් ශාලාව අළුත්වැඩියා කිරීම	මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ.	618
මාලිගාවත්ත යෝජිත වෘක්කවේද කාන්දු පෙරනය සහ ප්‍රතිබද්ධ ආයතනය සඳහා නව මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම	මෙම රෝහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන්ම කාර්යාංශය විසින් ලබා දෙනු ලැබේ.	1,184
බිංගිරිය දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම.	මෙම ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන්ම කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ.	863
මහවැලි ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන (MWSIP)	මෙම ව්‍යාපෘතිය සඳහා සියළු උපදේශන සේවාවන්ම කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ.	ඇ.ඩො.මිලියන 650
සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	කොළඹ 8 හි මෙම ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ උපදේශන සේවාවන් සඳහා කාර්යාංශය වගකිව යුතු වේ.	3,896

උපදේශන ව්‍යාපෘති




දේශීය බැංකු අරමුදල් ලැබූ මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය





උතුරු දුම්රිය මාර්ග පුනරුත්ථාපන කිරීම



අඟුණකොළපැලැස්ස බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම

ඉදිකිරීම් ව්‍යාපෘති



මියන්මාරයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාගේ කාර්යාලය සහ නිල නිවස අළුත්වැඩියා කිරීම/නැවත සැකසීම



කොළඹ, මහල් 10ක දන්ත රෝහල් ගොඩනැගිල්ලක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම

රූපමය පෙනුම





ඉදිකිරීම් සිදු කරමින්

බත්තරමුල්ල ජාතික පාරිසරික ලේකම් කාර්යාලය සැලසුම් කිරීම සහ ඉදිකිරීම

10.මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

වාර්ෂික ප්‍රගතිය 2015.07.01-2016.06.30

- 1.මැණික් කේෂ්ත්‍රයේ පර්යේෂණ ප්‍රගතිය
- 2.මැණික් හා ස්වර්ණාභරණ කේෂ්ත්‍රයේ පුහුණු පාඨමාලා ප්‍රගතිය
- මානව සම්පත් අංශයේ සංවර්ධනය
- මූල්‍ය ප්‍රතිපාදන හා වියදම්


මැණික් කේෂ්ත්‍රයේ පර්යේෂණ ප්‍රගතිය

- **ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රීලංකාව ඈත අතීතයේ දී රත්න දීප නොහොත් මැණික් දූපත ලෙස හඳුන්වා ඇති අතර මැණික් සම්පත ඊට ප්‍රකට කරුණක් වී ඇත. සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත්කර ඇති පරිදි 2015 සංඛ්‍යාත්මක දත්ත වාර්තාව අනුව පසුගිය වසර හතරක කාලය තුළ ජාත්‍යන්තර වෙළඳ පොල තුළ හුවමාරු භාණ්ඩ ලෙස අලෙවි කල ප්‍රධාන භාණ්ඩ හය අතර වූ එකම ඛණිජය මැණික්ය. 2014 වර්ෂයේ දී එහි දායකත්වය මැණික් වලින් රුමිලියන 21831ක් ලැබිණි. නමුත් ප්‍රභවයන් හා එහි විභවතාවයන් හඳුනා ගැනීම මැණික් කර්මාන්තය සතු අභියෝගයකි. මෙම ගැටළුවට විසඳුමක් ලෙස මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය මැණික් තැන්පතු සමීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය හඳුන්වාදී ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රීලංකාවම අවරණය වන පරිදි මැණික් තැම්පතු හා එහි විභවතාවයන් සම්බන්ධ

රත්නවිද්‍යාත්මක සිතියම් බිහිකිරීම හා ඒමඟින් ක්ෂේත්‍රයේ නියැලි සිටින කොටස්කරුවන්ට වාසිසලසමින් රටේ තිරසාර සංවර්ධනයට දායකවීමය. මේ සම්බන්ධව 2008 වර්ෂයේ දී විස්තර සහිත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත්කර අවශ්‍ය අනුමැතිය හා අරමුදල් ලබා දී ඇත.


මෙම ව්‍යාපෘතිය මේ වනවිට උඟව පළාතේමොණරාගල දිස්ත්‍රික්තය තුල ක්‍රියාත්මකව පවතී .





ව්‍යාපෘතියේ පාදක සිතියම් සහ අධ්‍යයන ප්‍රදේශය

මැදගම, බිබිල, මඩුල්ල සහ සිඹලාණ්ඩුව කොට්ඨාසවල ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු සහ රසායනාගාර විශ්ලේෂණකට යුතු අවසන්කර ඇත. මේ වනවිට එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මැණික් විහ වසිතියම් අවසන් කරමින් පවතී.













ක්ෂේත්‍රගවේෂණකටයුතු

රසායනාගාර විශ්ලේෂණ දත්ත











➢ සැකසීම හා විද්‍යාත්මක ආදර්ශනය






මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මූලික මැණික් විභව සිතියම




බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුලික මැණික් විභව සිතියම


- ශ්‍රීලංකාවේ වටිනාකමින් අඩු මැණික් වල අගය වැඩිකිරීම

අඩු වටිනාකමින් යුතු ෆෙල්ස්පාර් වල අගය වැඩිකිරීම




නියැදි ලබා ගැනීම සහ ක්ෂේත්‍ර ගවේෂණ සිදුකිරීම.






නියැදි විශ්ලේෂණය




කැටයම් ශිල්පය සඳහා යොදාගත් තාපජනිත කරන ලද ෆෙල්ස්පාර් පාෂාණ

➢ ශ්‍රී ලංකා වේ පබලු සහ නිමැවුම් සඳහා යොදාගත් පාෂාණයන්හි රත්නවිද්‍යාත්මක ගුණාංග අධ්‍යයනය

කානේලියන්, පළිඟු, කොරන්ඩම්, රබහ, කිරිංචි ආදී පාෂාණ වලින් සෑදූ ඉහත නිමැවුම් වල රත්න විද්‍යාත්මක ගුණාංග අධ්‍යනය කිරීම සිදුකෙරේ.



ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක ස්ථාන වලින් හමුවූ කැටයම් නිමැවුම්



ඇන්දන් දාදුකැටයක් (වමේ) සහ පළිඟු පබලුවක් (දකුණේ)

➢ වෙනත් වැඩසටහන්

ගෙවුඩ තාපකරණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.

රත්නපුර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී ගොඩනැගිලි පරිශ්‍රය තුළ අප ගෙවුඩතාපකරණ සේවා මධ්‍යස්ථානයක් ස්ථාපනය කරන ලදී.





පර්යේෂණ සොයා ගැනීම් මත පදනම්ව පර්යේෂණ පත්‍රිකා සහ සඟරා ලිපි පල කර ඇත.


1. S.V.T.D. Raveendrasinghe, R.M.N.P.K. Jayasinghe, 'Appraisal of gem deposita in Badalkumbura region of Sri Lanka with special emphasis on provanance', Proceedings of the 5th YSF Symposium, National Science and Technology Commission , 2016, pp 92-95.

2. S.V.T.D. Raveendrasinghe, 'Occurrence of Andalusite and Chistolite in Balanthota- Ginigathhena, Sri Lanka' (Abs.), Proceedings of the 32nd Technical Sessions of Geological Society of Sri Lanka (GSSL), 2016, pp 8.


➢ පුහුණු අංශයේ ප්‍රගති

පුහුණු පාඨමාලා

පසුගිය වර්ෂයන් හා සාපේක්ෂව පුහුණු පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වන සිසුන්ගේ වැඩිවීමක් නිබු අතර 2015.07.01 සිට 2016.06.30 දක්වා පුහුණු පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාව 635කි.



2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පුහුණු පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ශිෂ්‍ය කාර්යසාධනය




	2011	2012	2013	2014	2015
ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව	328	432	458	599	674
සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව	212	243	415	340	497

➢ විදේශීය පුහුණු පාඨමාලා

අප ආයතනය හා පකිස්ථානයේ ජාතික මෝස්තර නිර්මාණ මධ්‍යස්ථානය අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම මල්ළලගන්වමින් පළමු සිසුන් කණ්ඩායම දින 12ක මැණික් කැපුම් පුහුණුවක්නිමකර මැයි මස 29 වැනි දින සියරටබලා පිටත්විය. දහඅට දෙනකුගෙන් සමන්විත මෙම කණ්ඩායම ආයතනයේ රත්නපුර මධ්‍යස්ථානය ඇසුරු කරගෙන ආචාර්ය ප්‍රශාන් ෆ්‍රැන්සිස් සහ මැණික් කැපුම් ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු වන ගුන්තිල විජේසුරිය මහතාගේ මඟපෙන්වීම යටතේ මැණික් කැපුම් ශිල්පය හදාරන ලදි









➢ විදේශීය කෙටි පුහුණු පාඨමාලා


වියට්නාම් යුවලක් සඳහා කොළඹ කාර්යාලට තුලදී දින 03 ක රත්න විද්‍යා පුහුණු පාඨමාලා පවත්වන ලදි



➢ 2015.07.01 සිට 2016.06.30 දින දක්වා ක්‍රියාත්මක කරන ලද අනෙක් සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

- මොරගහකන්ද ප්‍රදේශයේ නව මැණික් හා ස්වර්ණාභරණ පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කර මැණික් කැපීම හා ඔප දැමීම පාඨමාලාව ආරම්භ කරන ලදි.
- මෙම කාල සීමාව තුළදී තාක්ෂණික වැඩමුළු තුනක් පවත්වන ලදි.
- 2015.12.28 දින මාලබේ ප්‍රධාන කාර්යාලයේදී පුහුණු උපදේශකවරුන් සඳහා පැවැත්වූ ස්වර්ණාභරණ නිෂ්පාදනය තාක්ෂණික වැඩමුළුව.
- 2015.12.22 දින මාලබේ ප්‍රධාන කාර්යාලයේදී පුහුණු උපදේශකවරුන් සඳහා පැවැත්වූ මැණික් කැපීම හා ඔප දැමීම තාක්ෂණික වැඩමුළුව.
- 2016.06.03 දින මොරගහකන්ද පුහුණු. මධ්‍යස්ථානයේදී පැවැත්වූ රළු මැණික් හඳුනාගැනීම හා ගෙවුඩ තාප පිරියම්කරණය තාක්ෂණික වැඩමුළුව .
- පහත ප්‍රදේශයන් ආවරණය වන පරිදි විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් 05ක් පැවැත්වූණි.සූරියවැව,නිවිතිගල,රත්නපුර,ගම්පහ

➢ ආයතනයේ නිවේදන සංවර්ධන පුවත් සමඟ ත්‍රෛමාසිකව පුවත් සඟරාවක් නිකුත් කිරීම



"හෙළමිණිවරුණ" නමින් අප ආයතනයේ පල කරන්නට යෙදුනේ අප ආයතනයේ මේ වනවිට කරගෙන යන වැඩපිලිවෙලවල් සමාජගත කිරීමටත් ආයතනය තුල සේවක මහත්මයන්ගේ සැඟවී ඇති කුසලතා මතුකරලීමටත් මේ වැඩපිලිවෙල තුලින් ආයතනයේ නාමය ජනතාවතුලට ගෙනගිය හැකි අතර ඒ තුලින් අපගේ ශිෂ්‍යය සංඛ්‍යාව වැඩි කර ලීමත් එක් පරමාර්ථයක් වේ. මේ සඳහා ලැබුණු ප්‍රතිචාරය තුලින් ඒ බව මනාවට ඔප්පුවිය.

➢ මානව සම්පත් හා පරිපාලන අංශයේ ප්‍රගති

අනු අංකය	නම	තනතුර	වැඩමුළුව/ පාඨමාලාව	ආයතනය
01	ජී.ඒ.කේ.එන්. පෙරේරා මෙනෙවිය	කළමණාකරණ සහකාර	Work Shop on Attitudes and Skill Development	Institute of Human Resourse Advancement
02	එච්.එල්.එල්. ජනිත්‍රි මෙනෙවිය	කළමණාකරණ සහකාර	Work Shop on Attitudes and Skill Development	Institute of Human Resourse Advancement
03	ජී.කේ. වික්‍රමාරච්චි මෙනෙවිය	කළමණාකරණ සහකාර	Work Shop on Attitudes and Skill Development	Institute of Human Resourse Advancement
04	ඩී.ජී.ඒ.ජී.ජී. කුලතුංග මෙනෙවිය	කළමණාකරණ සහකාර	Professional Development of MGT and Development assistant	Skill Development Fund
05	ඩී.එච්.කේ.සී.එම්. කෞශල්‍යා මිය	කළමණාකරණ සහකාර	Professional Development of MGT and Development	Skill Development

			assistant	Fund
06	අයි.ඩී.එන්. ප්‍රියංජිකා මිය	කළමණාකරණ සහකාර	Work shop on Motivation through right attitudes	Skill Development Fund
07	එස්.කේ. විතානගේ මෙනෙවිය	කළමණාකරණ සහකාර	Work shop on Motivation through right attitudes	Skill Development Fund
08	එච්.එල්.එස්.යූ. මදනායක මෙනෙවිය	කළමණාකරණ සහකාර	Work shop on Motivation through right attitudes	Skill Development Fund
09	එස්.පී.ඩී.පී. කමලසිරි මයා	ක්ෂේත්‍ර හා රසායනාගාර සහායක	Basic Productivity Programmes	National Productivity Secretariat
10	ඩබ් .එස්.එන්.ඒ. කුමාර මයා	ක්ෂේත්‍ර හා රසායනාගාර සහායක	Basic Productivity Programmes	Skill Development Fund
11	ජී .එස්.ඩී. රන්දිමාල් මයා	ක්ෂේත්‍ර හා රසායනාගාර සහායක	Basic Productivity Programmes	Skill Development Fund
12	කේමනෝජ් .ජී. අසංක මයා	ක්ෂේත්‍ර හා රසායනාගාර සහායක	Basic Productivity Programmes	Skill Development Fund
13	යූ.ඒ.ඩී.ඩී. රූපසිංහ මිය	කළමණාකරණ සහකාර	Workshop on Finance Essentials for Junior Accounting personnel	Skill Development Fund
14	ජේ.එම්. ගුරුසිංහ මිය	සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්)	Workshop on salary Conversance	Skill Development Fund
15	කේ.ඩී.ආර්. සිසිරකුමාර මයා	කළමණාකරණ සහකාර	Workshop on salary Conversance	Skill Development Fund
16	පී.ඒ.කේ.එන්. පෙරේරා මෙවිය	කළමණාකරණ සහකාර	Workshop on salary Conversance	Skill Development Fund

8.1 2017 වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරී සැලැස්ම

ප්‍රධාන ක්‍රියාකාරකම්	අතුරු උප/ ක්‍රියාකාරකම්	වාර්ෂික ඉලක්ක මූල්‍යමය භෞතික	
පර්යේෂණ අංශය			
01.ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය සහ තක්සේරුව ව්‍යාපෘතිය	i. ක්‍රියාවට නැංවීම හා නඩත්තු කිරීම	600	100%
	ii. පුද්ගලික වේතන	5600	100%
	iii. ක්ෂේත්‍ර සමීක්ෂණය	4000	කොට්ඨාස 10
	iv. විද්‍යාගාර විශ්ලේෂණ	1000	නියැදි 500
	v. GIS & remote Sensing කාර්යය	2000	සිතියම් 10

➢ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් 2015/2016

මාසය 2015/2016	භාණ්ඩාගාර ලැබීම්	පාඨමාලා හා අනිකුත් ආදායම්	මුළු ආදායම	මුළු වියදම	%
2015 - ජූලි	5,450,000.00	393,785.00	5,843,785.00	4,705,893.45	80.53
අගෝස්තු	11,100,000.00	589,668.50	11,689,668.50	4,842,413.06	41.42
සැප්තැම්බර්	7,600,000.00	769,426.97	8,369,426.97	5,315,156.22	63.51
ඔක්තොම්බර්		309,712.98	309,712.98	5,234,040.96	1,689.96
නොවැම්බර්	23,300,000.00	1,563,587.82	24,863,587.82	5,470,459.19	22.00
දෙසැම්බර්	2,535,000.00	1,517,911.21	4,052,911.21	16,895,501.83	416.87
2016 - ජනවාරි	4,616,000.00	1,070,332.60	5,686,332.60	6,503,648.97	114.37
පෙබරවාරි	5,850,000.00	1,013,856.32	6,863,856.32	7,634,752.09	111.23
මාර්තු	10,300,000.00	469,565.90	10,769,565.90	6,227,319.60	57.82
අප්‍රේල්		364,595.56	364,595.56	5,747,876.67	1,576.51
මැයි	4,750,000.00	2,298,608.75	7,048,608.75	10,256,005.49	145.50
ජූනි	4,861,000.00	1,402,744.50	6,263,744.50	7,796,226.43	124.47

	vi. දත්ත නිමානය කිරීම	100	ග්‍රාමසේවා කොට්ඨාස 10
	vii.දත්ත සත්‍යායනය	750	ග්‍රාමසේවා කොට්ඨාස 10
	viii.සිතියම්සහවාර්තාසකස්කිරීමහාමුද්‍රණය	1250	වාර්තා 10
02.අදියර 1 -තික්ගෙවුඩ **තාපකරණ ක්‍රම සංවර්ධනය තුළින් ශ්‍රී ලංකාවේ අඩු ගුණාත්මකභාවයෙන් යුතු කොරන්ඩම්වල වර්ණය හා පැහැදිලි බව වැඩිදියුණු කිරීම.**	i.ව්‍යාපෘතිආරම්භය	100	100%
	ii.නියැදී මිල දී ගැනීම හා පිළියෙල කිරීම	100	50g
	iii. පර්යේෂණාත්මක	300	30g
	iv. විශ්ලේෂණය	400	30g
	v. ව්‍යාපෘතිසම්පූර්ණකිරීම	100	වාර්ථා01
03.අඩු තත්වයෙන් යුතු තෝරමල්ලි පාෂාණ නැනෝ තෝරමල්ලි (Nano - Toumaline) බවට සකස් කිරීම.	i. ව්‍යාපෘතිආරම්භය	100	100%
	ii.නියැදී මිල දී ගැනීම හා පිළියෙල කිරීම	100	50g
	iii.පර්යේෂණාත්මක	300	30g
	iv.විශ්ලේෂණය	400	30g
	v.ව්‍යාපෘති සම්පූර්ණ කිරීම	100	වාර්ථා01
04.සිතියම් විද්‍යාමය අංශය ප්‍රතිස්ථාපනය සහ ක්‍රියාවට නැංවීම	i. සිතියම් සැලැස්ම නිර්මාණය සහ මුද්‍රණ පත්‍රිකාවල තත්වය හා මුද්‍රණ ආයතන හඳුනා ගැනීම	0	100%
	ii.සිතියම් හා නාමාවලි මුද්‍රණය	50	100%
	iii.ප්‍රමිතියෙන් යුතු මැණික් විභව සිතියම් හා නාමාවලි ප්‍රකාශයට පත්කිරීම	0	100%

	i. සාහිත්‍ය සමාලෝචනය	10	100%
	ii. නියැදි මිල දී ගැනීම	60	නියැදි40
	iii.පූර්ව රසායනික විශ්ලේෂණය	65	නියැදි 80
	iv. පිළියම්	45	නියැදි 40
	v.පසු රසායනික විශ්ලේෂණය	65	නියැදි40
	vi. වර්ථාකරණය	5	වාර්ථා 01
06. මැණික් වලට අදාල සාරවත් හා නිසරු බිම් පෙදෙස් නිරූපණයට සාමාන්‍ය භූරසායනික ක්‍රම සංවර්ධනය සහ දත්ත ගබඩා සංවර්ධනය	i. සාහිත්‍ය ග්‍රන්ථවිචාරය	10	100%
	ii.ආරම්භක ක්ෂේත්‍රචාරිකා	70	60
	iii. නියැදි එකතු කිරීම	150	නියැදි 100
	iv. නියැදි විශ්ලේෂණය	800	නියැදි 100
	v.සිතියම්,වර්ථා හා දත්ත ගබඩා සකස්කිරීම	90	1
07. GIS & remote Sensing තාක්ෂණය මඟින් සිතියම් ගතකරන ක්‍රමවේදයන් සංවර්ධනය කිරීම	i. සාහිත්‍ය ග්‍රන්ථවිචාරය	10	100%
	iiඅත්විඳුම් නියැදි ලබාගැනීම හා ක්ෂෙත්‍ර සමීක්ෂණය	0	100%
	iii.ඛණිජ විද්‍යාත්මක විශ්ලේෂණය	0	100
	iv.සංඛ්‍යාං දත්ත ගබඩා සකස්කිරීම	100	100%
	Vචන්ද්‍රිකා රූප තෝරාගැනීම හා අවකාශ විශ්ලේෂණය	200	ඔව්
	vi.සිතියම් හා වර්තා	60	1

	සකස් කිරීම .		
08 ප්‍රවර්ධනය හා දැනුවත්කිරීම	i. වැඩසටහන 01 - රත්නපුර	100	100%
	ii. වැඩසටහන 02 - බුත්තල/ මොණරාගල	100	100%
	iii. වැඩසටහන 03 - බකමුණ	100	100%
	iv. වැඩසටහන 04 - බේරුවල/ ගාල්ල	100	100%
පුහුණු අංශය			
පුහුණු පාඨමාලාවන්	පාඨමාලා ගාස්තු අය කර පවත්වන පාඨමාලාවන්	සිසුන් 520	1000
	පාඨමාලා ගාස්තු අය නොකර පවත්වන පාඨමාලාවන්	සිසුන් 300	1000
සංවර්ධන වැඩසටහන්	1. නව පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය	පුහුණු මධ්‍යස්ථාන 1	1000
	2. වාන්තු කිරීම හා ලොහ ආලේපනය පාඨමාලාව හදුන්වා දීම.	පුහුණු ඒකක 1	200
	3. රත්න විද්‍යාව ඩිප්ලෝමා පාඨමාලාව හදුන්වා දීම.	වැඩසටහන් 1	3000
	4. තාක්ෂණික වැඩමුළු පැවැත්වීම	වැඩසටහන් 1	
	5. දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු	වැඩසටහන් 6	
	6. ප්‍රචාරක වැඩසටහන්	වැඩසටහන් 6	

11. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

2016 වාර්ෂික වාර්තාව

උමා ඔය ද්‍රෝණියේ පාරිසරික හා අනෙකුත් ජල අවශ්‍යතා වලට බලපෑමක්ඇති නොවන අයුරින් එම ද්‍රෝණියේ සිට ජල ඌනතාවයෙන් පෙලෙන දක්ෂිණ කලාපයේ කිරිඳි ඔය ද්‍රෝණියට,ජලය සත මීටර් මිලියන 145 ක් හැරවීම උමා ඔයබහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. එමගින් මොණරාගල දිස්ත්‍රික්කයේ නව ඉඩම් හෙක්ටාර 4500 ක් හා දැනට වගා කෙරෙන ඉඩම් හෙක්ටාර 1500 කට වාරි ජලය සැපයීමත්මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල පානීය හා කර්මාන්ත සඳහා සත මීටර් මිලියන 30 ක ජලයසැපයීමත් අපේක්ෂා කෙරේ. තවද, ව්‍යාපෘතිය මගින් ඉදිකෙරෙන මෙ. වො. 120 ක ධාරිතාවයෙන් යුත් භූගත විදුලි බලාගාරයක් මගින් ගි.වො. 231 කවිදුලිය නිපදවනු ඇති අතර ව්‍යාපෘතිය මගින් ඉදි කෙරෙන ඩයරබා හා පුහුල්පොල ජලාශ මගින් බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල සහ ඇටැම්පිටිය ප්‍රදේශ වල පානීය ජල අවශ්‍යතාසැපයෙනු ඇත.

ව්‍යාපෘතිය, මූලස්ථායි වැඩ සහ කිරිඳි ඔය ද්‍රෝණිය ආශ්‍රිත පහළ නිම්න සංවර්ධනය වශයෙන් ප්‍රධාන අංග දෙකකින් සමන්විත වේ.

➢ අ. මූලස්ථායි වැඩ

ව්‍යාපෘතියේ මූලස්ථායි වැඩ වලට පහත දැක්වෙන ඉදිකිරීම් අන්තර්ගතය.


- උමා ඔය හරහා පුහුල්පොල දී මීටර් 35 ක් උසැති වේල්ලක් සහිත ජලාශයක් ද, මා තැටිල්ල ඔය හරහා ඩයරබා හීදී මීටර 50 ක් උසැති වේල්ලක් සහිත ජලාශයක් ඉදිකිරීම.
- එම ජලාශ දෙක සම්බන්ධ කරනමීටර් 3,718 ක් දිග උමඟ
- ඩයරබා සිට කරඳගොල්ල දක්වා ඉදිකෙරෙන මීටර් 15,466 දිග පෙරාර උමඟ(Headrace Tunnel)
- මීටර් 618 ක් උස සිරස් පීඩන උමඟ
- මීටර් 150 ක් උස කැලඹුම් ළිඳ
- මෙ.වො 120 ක භූගත ජල විදුලි බලාගාරය
- මීටර් 3,600 ක් දිග පසු-ආර උමඟ (Tailrace Tunnel)
- වහරු අංගනය (Switch Yard) හා බදුල්ල විදුලි උපපොල දක්වා දිවෙන කි.මී. 23 ක් දිග කි. වොල්ට් 132 විදුලි සම්ප්‍රේෂණ මාර්ගය
  සහ
- කි.මී.14 ක් දිග ප්‍රවේශ මාර්ග සහ නවාතැන් පහසුකම් හා කාර්යාල පහසුකම් ඇතුළු යටිතල පහසුකම්

ව්‍යාපෘතියේ මූලස්ථායි වැඩ,'ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම්' කොන්ත්‍රාත්තුවක් මත ඉටුකරනු ලබන අතර කොන්ත්‍රාත්තුවේ ආරම්භක දිනය 2010 මාර්තු 15 වෙනිදා වන අතර මෙම ඉදිකිරීම් සඳහා 2011 අප්‍රේල් 12 වෙනි දින පාරිසරික අනුමැතිය ලැබිණි. 2015 නොවැම්බර් 15 වෙනි දින මූලස්ථායි වැඩ අවසන් කිරීමට සැලසුම් මුලින් කළ අතර, එය දෝෂ නිවැරදි කිරීමේ මාස 12 ක වගකීම් කාලයද ඇතුළුව 2019ජූනි 30 දින දක්වා දැන් දීර්ඝ කර ඇත.

මූලස්ථායි වැඩ යටතේ 2015 ජූලි 01 දින සිට 2016 ජූනි 30 දින දක්වා කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

- **ඩයරබා ජලාශය ඉදිකිරීම:**


ව්‍යාපෘතිය යටතේ ඩයරබා හි ඉදි කෙරෙන රෝලර් සම්පීඩිත කොන්ක්‍රීට් වේල්ල මීටර් 32 ක උසකට එනම්, 72% ක ප්‍රමාණයක් 2016 ජූනි අග වන විට අවසන් කර ඇත.



1 වන රූපය. ඉදිකරමින් පවතින ඩයරබා වේල්ල

- **පුහුල්පොල ජලාශය ඉදිකිරීම:**

පුහුල්පොල ජලාශය ඉදිකිරීම නිසා වැලිමඩ - බදුල්ල මාර්ගයේ කොටසක් ජලයෙන් යට වන අතර ඒ වෙනුවට නව ප්‍රතිස්ථාපන මාර්ගයක් ඉදිකරන ලද අතර එම කොටස දැනට මහජනතාව සඳහා විවෘතව ඇත. මේ වන විට පුහුල්පොල ජලාශයේ අත්තිවාරම් කැණීම් සිදු කරනු ලබයි.




පුහුල්පොල දී ඉදිකෙරුනු වැලිමඩ - බදුල්ල නව ප්‍රතිස්ථාපන මාර්ග කොටස




ජලාශ යා කෙරෙන උමඟෙහි කැණීම් කටයුතු

පුහුල්පොල හා ඩයරබා ජලාශ යා කෙරෙන උමඟෙහි කැණීම් කටයුතු සාමාන්‍ය ගල් වෙඩි පිපිරීමේ ක්‍රමයට කරනු ලබන අතර අන්ත දෙකෙන්ම කැණීම් කරනු ලැබේ. 2016 ජූනි අගවන විට මුළු දිග වන මීටර් 3,718 න් මීටර් 2,450 ක් එනම්, 63% ක ප්‍රමාණයක් කැණීම් අවසන් කර ඇත.

- පෙරාර උමඟ **(Headrace Tunnel)**



උමං විදුම් යන්ත්‍රය මගින් පෙරාර උමඟෙහි පහළ කෙළවරේ සිට කි.මී 6 ක් පමණ දුරින් කැණීම් කටයුතු කෙරෙන අයුරු



